317 වන කාණ්ඩය - 05 වන කලාපය
தொகுதி 317 - இல. 05
Volume 317 - No. 05

2025 පෙබරවාරි 21වන සිකුරාදා
2025 பெப்ருவரி 21, வெள்ளிக்கிழமை
Friday, 21st February, 2025


# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**නිවේදන:**

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමාගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් විමර්ශනය කර වාර්තා කිරීම සඳහා පත් කළ විශේෂ කමිටුවේ වාර්තාව [තීරුව 835]

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග [තීරුව 836]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 839-859]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

විදේශ සංචිත ඉලක්ක සහ ණය සේවා ලබා ගැනීම සඳහා සැලසුම් [තීරුව 859]

**කොළඹ මහෙස්ත්‍රාත් අධිකරණයේ හා මිද්දෙනියේ සිදු වූ වෙඩි තැබීම්:**

මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 861]

**විසර්ජන පනත් කෙටුම්පත, 2025 - [හතරවන වෙන් කළ දිනය]:**

දෙවන වර කියවීම - විවාදය කල් තබන ලදී [තීරු 873 - 984]

**කල් තැබීමේ යෝජනාව:**

දුම්රියේ ගැටීමෙන් සිදුවන වනඅලි මරණ වැළැක්වීම [තීරු 985 - 998]


# பிரதான உள்ளடக்கம்


**அறிவிப்புகள்:**

மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனாவின் நடத்தை தொடர்பில் ஆராய்ந்து அறிக்கையிடுவதற்காக நியமிக்கப்பட்ட விசேட குழுவின் அறிக்கை [ப: 835]

பாராளுமன்ற உறுப்பினர்களின் பாதுகாப்பை உறுதிசெய்ய எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் [ப: 836]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப:839- 859]

**தனி அறிவித்தல் மூல வினா:**

வெளிநாட்டு ஒதுக்க இலக்குகளை அடைவதற்கும் கடன் சேவைகளைப் பெறுவதற்குமான திட்டங்கள் [ப: 859]

**கொழும்பு நீதவான் நீதிமன்ற வளாகத்திலும் மித்தெனியவிலும் இடம்பெற்ற துப்பாக்கிச் சூடுகள்:**

பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரினது கூற்று [ப: 861]

**ஒதுக்கீட்டுச் சட்டமூலம், 2025 - [ஒதுக்கப்பட்ட நான்காம் நாள்]:**

இரண்டாம் மதிப்பு - விவாதம் ஒத்திவைக்கப்பட்டது [ப: 873 - 984 ]

**ஒத்திவைப்புப் பிரேரணை:**

புகையிரதம் மோதி யானைகள் இறப்பதைத் தடுத்தல் [ப: 985 - 998]


# PRINCIPAL CONTENTS


ANNOUNCEMENTS:

Report of Special Committee to Investigate into Complaints Regarding Conduct of Hon. (Dr.) Ramanathan Archchuna [Col. 835]

Measures Taken to Assure Security of Members of Parliament [Col. 836]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 839-859]

QUESTION BY PRIVATE NOTICE:

Plans for Achieving Foreign Reserve Targets and Debt Servicing [Col. 859]

SHOOTING INCIDENTS IN COLOMBO MAGISTRATE'S COURT AND MIDDENIYA:

Statement by Minister of Public Security and Parliamentary Affairs [Col. 861]

APPROPRIATION BILL, 2025- [Fourth Allotted Day]:

Second Reading - Debate Adjourned [Cols. 873– 984]

ADJOURNMENT MOTION:

Prevention of Elephant Deaths Due to Collision with Trains [Cols. 985 - 998]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2025* පෙබරවාරි *21*වන සිකුරාදා**
*2025 பெப்ருவரி 21, வெள்ளிக்கிழமை*
*Friday, 21st February, 2025*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමාගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් විමර්ශනය කර වාර්තා කිරීම සඳහා පත් කළ විශේෂ කමිටුවේ වාර්තාව
### மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனாவின் நடத்தை தொடர்பில் ஆராய்ந்து அறிக்கையிடுவதற்காக நியமிக்கப்பட்ட விசேட குழுவின் அறிக்கை
### REPORT OF SPECIAL COMMITTEE TO INVESTIGATE INTO COMPLAINTS REGARDING CONDUCT OF HON. (DR.) RAMANATHAN ARCHCHUNA

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතාගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් මා වෙත ලද පැමිණිලි සැලකිල්ලට ගෙන ඒ සම්බන්ධයෙන් විමර්ශනය කර වාර්තා කිරීම සඳහා නියෝජ්‍ය කාරක සභා සභාපති ගරු හේමාලි වීරසේකර මහත්මියගේ සභාපතිත්වයෙන්, ගරු විජිත හේරත් මහතාගේ සහ ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතාගේ සාමාජිකත්වයෙන් යුත් මා විසින් පත් කරන ලද විශේෂ කමිටුවේ වාර්තාව සභාගත කරමි.

මෙම වාර්තාව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන බව දන්වනු කැමැත්තෙමි.



## II

### පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග
### பாராளுமன்ற உறுப்பினர்களின் பாதுகாப்பை உறுதிசெய்ய எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள்
### MEASURES TAKEN TO ASSURE SECURITY OF MEMBERS OF PARLIAMENT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් විසින් ඔවුන්ගේ ආරක්ෂාව සම්බන්ධව අවශ්‍ය කටයුතු කරන ලෙස ඉල්ලමින් වරින් වර මා වෙත යොමු කරන ලද ඉල්ලීම් පිළිබඳව සලකා බැලීමෙන් අනතුරුව, ඒ සම්බන්ධව සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා වැඩ බලන පොලිස්පතිවරයා වෙත එම ඉල්ලීම යොමු කර ඇති බව මෙම සභාවට දන්වනු කැමැත්තෙමි.

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)

ගරු කථානායකතුමනි, ඉඹුල්ගොඩ, අමුණුගොඩ, කළුවල පාර, අංක 3බී දරන ස්ථානයෙහි පදිංචි ඒ.ඩී. ප්‍රේමතිලක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්නම්.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු කථානායකතුමනි, කොට්ටුකච්චිය, පුරාණගම යන ලිපිනයෙහි පදිංචි එන්.සී.එස්. ප්‍රේමලාල් මෙන්ඩිස් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

ගරු කථානායකතුමනි, ඇඹිලිපිටිය, මොරකැටිය, නුගේ හරස් පාර, අංක 3393/5 දරන ස්ථානයෙහි පදිංචි ඒ. එදිරිසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු අශෝක ගුණසේන මහතා**
(மாண்புமிகு அசோக குணசேன)
(The Hon. Ashoka Gunasena)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) අලව්ව, පහළ වළකුඹුර, බලගල්ල වත්ත දරන ස්ථානයෙහි පදිංචි ඩී.ජී. ධර්මසිරි මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) අලව්ව, පහළ වළකුඹුර, අංක 312/3 දරන ස්ථානයෙහි පදිංචි ජේ.එච්.ජී. හේමචන්ද්‍ර මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු නන්දන පත්මකුමාර මහතා**
(மாண்புமிகு நந்தன பத்மகுமார)
(The Hon. Nandana Pathmakumara)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් අට පිළිගන්වමි.

(1) බණ්ඩාරගම, අටුළුගම, අඹගහවත්ත, අංක 52/ඩී දරන ස්ථානයෙහි පදිංචි අබ්දුල් රසීදු පාතුම්මා රාණි මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(2) පයාගල, කච්චාගොඩ දරන ස්ථානයෙහි පදිංචි ඩී.එස්. විජේසේකර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) නාගොඩ, බෝම්බුවල පාර, පරණ පොලිස්වත්ත, අංක 49 දරන ස්ථානයෙහි පදිංචි ඊ.ඩී. නන්දසිරි මහතාගෙන් ලැබුණු පෙත්සම;

(4) පානදුර, පිටවල, අළුබෝගහවත්ත, අංක 11/7 ඒ දරන ස්ථානයෙහි පදිංචි කේ.ඒ. ලලිත් කුමාර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(5) කළුතර, කලමුල්ල, 29 කණුව අසල දරන ස්ථානයෙහි පදිංචි එම්.පී. ජයසේකර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(6) පොකුණුවිට, හේනේගම, බණ්ඩාරවත්ත, අංක 58 දරන ස්ථානයෙහි පදිංචි නුවන් මුහන්දිරම් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(7) බොරලැස්ගමුව, වැව පාර, එගොඩවත්ත පාර, අංක 23/30 දරන ස්ථානයෙහි පදිංචි තිලකා හේවාවිතාරණ මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(8) වාද්දුව, හබරලගහලන්ද, සඳකැලුම් මාවත, අංක 65 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.ඩබ්ලිව්. ගාමිණී නානායක්කාර මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු රුවන් මාපලගම මහතා**
(மாண்புமிகு ருவன் மாபலகம)
(The Hon. Ruwan Mapalagama)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දහතුන පිළිගන්වමි.

(1) රඹුක්කන, හුරිමළුව, මස්කඩේ වත්ත, අංක ඩී 92/2 දරන ස්ථානයෙහි පදිංචි අකුරන්ගේ චන්ද්‍රලතා මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(2) ගෝනවිල, මාකඳුර (වයඹ), පන්සල පාර, අංක 349 දරන ස්ථානයෙහි පදිංචි බී.ඒ.ඒ. විමලවීර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) පිළියන්දල, මාම්පේ, වටනවත්ත පාර, අංක 306/බී දරන ස්ථානයෙහි පදිංචි ජී.පී.ටී.පී. වීරසේකර මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(4) ගනේමුල්ල, ගලහිටියාව, අංක 139 දරන ස්ථානයෙහි පදිංචි එච්.ඒ. රංජිත් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(5) රාගම, වල්පොල, උග්ගස්හේන, අංක 44/8 දරන ස්ථානයෙහි පදිංචි ජේ.ඒ.යූ.ඒ. පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සම;

(6) නිට්ටඹුව, රන්පොකුණුගම 11 අදියර, අංක එෆ්/226 දරන ස්ථානයෙහි පදිංචි ජේ.ආර්.එස්. රූපසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම;

(7) කොටුගොඩ, මිලේනියම් සිටි, කලාප 01, අංක 51 දරන ස්ථානයෙහි පදිංචි එම්.ඒ. ක්‍රිශාන්ති ෂ්‍යාමිනි මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(8) ගම්පහ, පෙතියාගොඩ, ඇහැලගහහේන, අංක 448 එන් 6 දරන ස්ථානයෙහි පදිංචි පී.සී.එස්. වීරසූරිය මහතාගෙන් ලැබුණු පෙත්සම;

(9) වේයන්ගොඩ, එස්සැල්ල, නයිවල, ජනඋදාන ගම, අංක 92 දරන ස්ථානයෙහි පදිංචි පී.ඩී.එන්. ද සිල්වා මහතාගෙන් ලැබුණු පෙත්සම;

(10) රාගම, වල්පොල පාර, අංක 128 දරන ස්ථානයෙහි පදිංචි පී.ඩී.පී. කුමාර ධර්මසේන මහතාගෙන් ලැබුණු පෙත්සම;

(11) මාබොදල, මාබොදල වත්ත, අංක 154/3/සී දරන ස්ථානයෙහි පදිංචි ආර්.ඒ.එම්. රණබාහු මහතාගෙන් ලැබුණු පෙත්සම;

(12) දෙවලපොළ, වල්පිටමුල්ල, අංක 137/1 බී දරන ස්ථානයේ පදිංචි ටී.ඒ. අයිරාංගනී මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(13) වැබඩ (උතුර), අංක 397/1 දරන ස්ථානයේ පදිංචි විජිතා කුමාරි වීරසූරිය මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

**ගරු කංචන වැලිපිටිය මහතා**
(மாண்புமிகு கஞ்சன வெலிப்பிட்டிய)
(The Hon. Kanchana Welipitiya)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) බෙලිගල, ඉහළ කලුගල, කරපනේ හන්දිය යන ලිපිනයේ පදිංචි බී.එස්. විජේකෝන් කුලතුංග මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) කොටියාකුඹුර, මත්තමගොඩ, "රත්නවාස", අංක ඒ 432 දරන ස්ථානයේ පදිංචි ඩබ්ලිව්.ඩී. වික්‍රමනායක මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු දේවානන්ද සුරවීර මහතා**
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හත පිළිගන්වමි.

(1) නාවල, කොස්වත්ත පාර, අංක 160/4 දරන ස්ථානයේ පදිංචි ඒ.එස්. හෙට්ටිආරච්චි මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) හෝමාගම, පිටිපන උතුර, අංක 50/1 දරන ස්ථානයේ පදිංචි කේ.කේ. මාතාංග පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) පන්නිපිටිය, ඇරැව්වල, බෝකුන්දර පාර, අංක 525/1 සී දරන ස්ථානයේ පදිංචි කේ.එස්. අතුල මහතාගෙන් ලැබුණු පෙත්සම;

(4) හොරණ, නර්තනගල, 03වන අදියර, අංක 81 දරන ස්ථානයේ පදිංචි එන්.එස්. රත්නවීර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(5) හම්බන්තොට, මිරිජ්ජවිල, අඩි 100 පාර, අංක 261 දරන ස්ථානයේ පදිංචි පී. ලොකුහෙට්ටි මහතාගෙන් ලැබුණු පෙත්සම;

(6) කෝට්ටේ, මාදිවෙල, සිගේරා පාර, අංක 115/1/1 දරන ස්ථානයේ පදිංචි ආර්. උපුල් නිශාන්ත මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(7) පන්නිපිටිය, පරණ පාර, අංක 32 වත්තේගෙදර බාහිර තැන්පත්කරුවන්ගේ සමිතියේ සාමාජිකත්වය දරන සුසිල් විජයරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
# வினாக்களுக்கு வாய்மூல விடைகள்
# ORAL ANSWERS TO QUESTIONS

## 2017 සිට ස්වාභාවික ආපදා හේතුවෙන් හානි වූ ජීවිත සහ දේපළ: වන්දි
## 2017 முதல் இயற்கை அனர்த்தங்களால் ஏற்பட்ட உயிர்ச்சேதம் மற்றும் அழிவடைந்த சொத்துக்கள்: இழப்பீடு
## LOSS OF LIVES AND PROPERTY DUE TO NATURAL DISASTERS FROM 2017: COMPENSATION

384/2025

**1. ගරු වරුණ ලියනගේ මහතා**
(மாண்புமிகு வருண லியனகே)
(The Hon. Waruna Liyanage)
ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) 2017 වර්ෂයේ සිට මේ දක්වා විවිධ ස්වාභාවික ආපදා හේතුවෙන් හානි වූ ජීවිත, විනාශ වූ දේපළ සහ ව්‍යාපාර වෙනුවෙන් ගෙවූ වන්දි මුදල සහ ගෙවීමට ඇති හිඟ වන්දි මුදල එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ජාතික රක්ෂණ භාර අරමුදල යටතේ ආරම්භ කරන ලද රක්ෂණ ක්‍රමය, අංක 03/2016 දරන චක්‍රලේඛය මඟින් ස්ථාපිත කරන ලද අතර එය ආපදාවන්ට ලක් වූ ජනතාවට විශාල සහනයක් බව පිළිගන්නේද;

(iii) අංක 01/2020 දරන චක්‍රලේඛය මඟින් රු. 10,000ට වැඩි වන්දි සඳහා ඉඩමේ අයිතිය සනාථ කළ යුතු බව නියම කිරීම හේතුවෙන් විශාල පවුල් සංඛ්‍යාවකට වන්දි මුදල් නොලැබුණු බව දන්නේද;

(iv) ආපදා හේතුවෙන් පීඩාවට පත් වූ පවුලකට වියළි සහ පිසූ ආහාර ලබා දීම සඳහා දිනකට වෙන් කර ඇති මුදල ප්‍රමාණවත් නොවන බව පිළිගන්නේද;

(v) ආපදා වන්දි තක්සේරු කිරීමේදී, 2020.09.09 දිනැති NBRO/FL/DA/IN/R5 චක්‍රලේඛය මඟින් නියම කරන ලද තක්සේරු වටිනාකම ප්‍රමාණවත් නොවන බැවින් තක්සේරු වටිනාකම වැඩි කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பாதுகாப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2017ஆம் ஆண்டு தொடக்கம் இன்றுவரை பல்வேறு இயற்கை அனர்த்தங்களால் ஏற்பட்ட உயிர்ச்சேதம், அழிவடைந்த சொத்துக்கள் மற்றும் தொழில்முயற்சிகளுக்காகச் செலுத்தப் பட்ட இழப்பீட்டுத் தொகை மற்றும் செலுத்தவேண்டியுள்ள இழப்பீட்டு நிலுவை ஒவ்வொரு மாவட்டத்துக்கும் ஏற்ப வெவ்வேறாக யாதென்பதையும்;

(ii) தேசிய காப்புறுதி நம்பிக்கைப் பொறுப்பு நிதியத்தின்கீழ் ஆரம்பிக்கப்பட்ட காப்புறுதித் திட்டமானது, 03/2016ஆம் இலக்க சுற்றறிக்கை யின்மூலம் தாபிக்கப்பட்டுள்ளதுடன், அது அனர்த்தங்களை எதிர்கொண்டுள்ள மக்களுக்குப் பெரும் நிவாரணமாக அமைந்துள்ளதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(iii) இலக்கம் 01/2020 கொண்ட சுற்றறிக்கையின்மூலம் ரூபாய் 10,000இலும் கூடிய இழப்பீட்டுத் தொகையைப் பெற காணி உரிமையை அத்தாட்சிப்படுத்த வேண்டுமென பணிக்கப்பட்டுள்ளதால் பெரும் எண்ணிக்கையான குடும்பங்களுக்கு இழப்பீடு கிடைக்காததை அறிவாரா என்பதையும்;

(iv) அனர்த்தங்களால் பாதிக்கப்படுகின்ற குடும்பம் ஒன்றுக்குத் தேவையான உலர் மற்றும் சமைத்த உணவுகளை வழங்க, நாளொன்றுக்கு ஒதுக்கப்பட்டுள்ள தொகை போதாததை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(v) அனர்த்த இழப்பீட்டு மதிப்பீடு நிமித்தம், 2020.09.09ஆம் திகதிய, NBRO/FL/DA/IN/R 5ஆம் இலக்க சுற்றறிக்கையின்மூலம் நிர்ணயிக்கப்பட்டுள்ள மதிப்பீட்டுப் பெறுமதி போதுமானதாக இல்லை என்பதால், மதிப்பீட்டுப் பெறுமதியை அதிகரிப்பதற்கான நடவடிக்கை மேற்கொள்ளப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Defence:

(a) Will he inform this House -

(i) the amount of compensation paid and the outstanding compensation yet to be paid for the lives lost and the properties and businesses devastated owing to various natural disasters in each year from 2017 until now district-wise, separately;

(ii) whether he admits that the insurance scheme introduced under the National Insurance Trust Fund and established by Circular No. 03/2016 is a great relief for the victims of the disasters;

(iii) whether he is aware that a considerable number of families have not received the said compensation due to the requirement made through Circular No. 01/2020 to the effect that the ownership of land should be established for compensation above Rs.10,000;

(iv) whether he admits that the amount allocated per day is insufficient to provide dry rations and cooked food to a family affected by disasters; and

(v) whether measures will be taken to increase the assessment value related to disaster compensation on account of the inadequacy of assessment value prescribed by Circular NBRO/FL/DA/IN/R5 dated 09.09.2020?

(b) If not, why?

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)

ගරු කථානායකතුමනි, ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) 2017 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා ස්වාභාවික ආපදා හේතුවෙන් විනාශ වූ දේපොළ හා ව්‍යාපාර සඳහා ගෙවූ වන්දි මුදල් පිළිබඳ තොරතුරු දිස්ත්‍රික් වශයෙන් ඇමුණුම 01 මඟින් ඉදිරිපත් කර ඇත

[ගරු අරුණ ජයසේකර මහතා]

**ඇමුණුම 01**

**නිවාස හා ව්‍යාපාර වන්දි ලබා දීම**

| | දිස්ත්‍රික්කය | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 | දිස්ත්‍රික්කයට අදාළ සමස්ථ වියදම |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | කොළඹ | 124,741,197.00 | 40,963,682.56 | 27,075,911.50 | 22,848,175.07 | 22,932,886.22 | 9,283,148.86 | 9,813,786.47 | 102,691,993.05 | 360,350,780.73 |
| 2 | ගම්පහ | 21,136,080.40 | 53,191,806.10 | 21,882,666.87 | 19,547,423.34 | 51,651,777.26 | 5,680,786.28 | 27,842,812.10 | 44,702,302.15 | 245,635,654.50 |
| 3 | කළුතර | 387,493,694.50 | 28,329,390.00 | 22,039,841.50 | 15,672,826.46 | 18,935,109.58 | 19,023,028.23 | 16,856,507.28 | 50,506,689.89 | 558,857,087.44 |
| 4 | මහනුවර | 12,748,355.00 | 9,085,671.00 | 12,854,270.00 | 16,062,650.95 | 34,892,103.93 | 1,077,323.60 | 21,941,077.33 | 42,614,956.96 | 151,276,408.77 |
| 5 | මාතලේ | 3,917,780.00 | 2,872,955.00 | 6,847,700.00 | 5,951,996.82 | 8,417,006.13 | 4,637,213.84 | 9,602,135.03 | 12,842,287.07 | 55,089,073.89 |
| 6 | නුවරඑළිය | 2,608,040.00 | 7,113,100.00 | 3,996,000.00 | 10,342,233.99 | 5,934,876.15 | 24,957,936.35 | 7,921,165.38 | 17,848,328.45 | 80,721,680.32 |
| 7 | ගාල්ල | 333,429,830.80 | 26,960,880.00 | 35,208,452.00 | 24,320,863.21 | 34,199,032.61 | 13,208,097.03 | 28,183,808.97 | 73,826,481.26 | 569,337,445.88 |
| 8 | මාතර | 606,809,682.90 | 2,853,157.50 | 18,629,970.00 | 13,216,409.30 | 13,819,439.21 | 3,443,757.04 | 21,893,000.02 | 72,629,194.20 | 753,294,610.17 |
| 9 | හම්බන්තොට | 24,184,455.00 | 3,252,260.00 | 8,903,714.00 | 8,493,468.55 | 4,923,820.12 | 3,434,470.53 | 5,765,210.23 | 12,370,523.36 | 71,327,921.79 |
| 10 | යාපනය | 4,110,000.00 | 15,238,650.00 | 3,990,000.00 | 2,670,727.78 | 17,667,046.13 | 11,303,930.40 | 3,414,733.66 | 4,787,469.01 | 63,182,556.98 |
| 11 | වවුනියා | 699,100.00 | 310,000.00 | 1,645,800.00 | 2,586,190.15 | 334,680.00 | 17,168,142.85 | 1,342,297.01 | 2,623,302.08 | 26,709,512.0[illegible] |
| 12 | මඩකලපුව | 400,500.00 | 2,740,150.00 | 3,921,260.00 | 931,400.00 | 1,564,900.00 | 27,307,655.01 | 1,815,324.40 | 2,707,566.25 | 41,388,755.66 |
| 13 | අම්පාර | 4,041,480.00 | 14,143,377.00 | 12,692,456.00 | 6,568,384.22 | 5,978,138.82 | 1,406,850.00 | 10,237,423.43 | 15,983,930.52 | 71,052,039.99 |
| 14 | ත්‍රිකුණාමලය | 1,910,000.00 | 1,112,500.00 | 3,360,000.00 | 4,763,957.36 | 1,624,107.63 | 16,812,290.87 | 2,896,813.50 | 2,638,485.55 | 35,118,154.91 |
| 15 | කුරුණෑගල | 4,220,710.00 | 30,354,552.58 | 12,278,917.58 | 16,398,791.99 | 35,120,383.32 | 144,764.72 | 20,419,470.94 | 41,820,117.14 | 160,757,708.27 |
| 16 | පුත්තලම | 55,000.00 | 21,896,135.00 | 16,352,186.00 | 12,722,484.00 | 9,019,510.55 | 7,779,668.86 | 2,120,981.09 | 8,900,285.31 | 78,846,250.81 |
| 17 | අනුරාධපුර | 5,015,300.00 | 5,848,650.00 | 10,991,884.63 | 15,086,390.06 | 9,610,841.98 | 11,472,628.31 | 10,101,284.10 | 17,216,202.56 | 85,343,181.64 |
| 18 | පොළොන්නරුව | 14,614,777.00 | 2,967,245.00 | 11,628,090.00 | 7,512,218.27 | 5,346,337.64 | 27,412,868.71 | 8,158,205.30 | 7,861,930.00 | 85,501,671.92 |
| 19 | බදුල්ල | 21,063,318.00 | 11,390,170.50 | 13,609,255.00 | 9,508,522.70 | 16,579,299.59 | 2,312,065.91 | 28,610,717.56 | 37,108,997.47 | 140,182,346.73 |
| 20 | මොනරාගල | 12,941,956.00 | 7,723,050.00 | 13,612,692.00 | 9,464,628.64 | 11,377,695.21 | 7,723,123.21 | 22,404,333.09 | 34,806,616.29 | 120,054,094.44 |
| 21 | රත්නපුර | 421,647,702.90 | 19,442,763.00 | 16,986,054.00 | 56,997,995.33 | 31,200,945.12 | 2,505,140.27 | 37,361,158.36 | 148,740,060.86 | 734,881,819.84 |
| 22 | කෑගල්ල | 23,352,688.02 | 22,281,862.00 | 7,396,520.00 | 28,260,532.21 | 34,676,550.56 | 3,743,490.13 | 22,951,611.80 | 47,196,581.10 | 189,859,835.82 |
| 23 | මන්නාරම | 0.00 | 0.00 | 40,000.00 | 5,819,765.00 | 459,040.00 | 33,281,659.76 | 198,864.81 | 364,960.00 | 40,164,289.57 |
| 24 | මුලතිව් | 462,975.00 | 29,556,000.00 | 604,850.00 | 1,075,384.06 | 339,782.00 | 2,651,496.15 | 2,298,986.04 | 1,354,668.94 | 38,344,142.19 |
| 25 | කිලිනොච්චි | 0.00 | 39,870,000.00 | 1,430,000.00 | 3,937,670.00 | 755,000.00 | 955,780.00 | 1,457,306.30 | 1,868,269.44 | 50,274,025.74 |
| | | **2,031,604,622.52** | **399,498,007.24** | **287,978,491.08** | **320,761,089.46** | **377,360,309.76** | **258,727,316.92** | **325,609,014.20** | **806,012,198.91** | |
| | **2017 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා සමස්ථ දේපළ හා නිවාස හානි සඳහා සමස්ථ වියදම** | | | | | | | | | **4,201,564,614.86** |

ස්වාභාවික ආපදා හේතුවෙන් සිදු වූ ජීවිත හානි සඳහා වන්දි ගෙවීම පිළිබඳ විස්තර දිස්ත්‍රික් අනුව සකස් කර ඇමුණුම 02 මඟින් ඉදිරිපත් කර ඇත.

**ඇමුණුම 02**

මරණ වන්දි ලබා දීම

| | දිස්ත්‍රික්කය | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 | දිස්ත්‍රික්කයට අදාළ සමස්ථ වියදම |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | කොළඹ | 3,000,000.00 | 85,000.00 | 100,000.00 | 250,000.00 | 250,000.00 | | | 750,000.00 | 4,435,000.00 |
| 2 | ගම්පහ | | | | 475,000.00 | 1,150,000.00 | | 925,000.00 | 725,000.00 | 3,275,000.00 |
| 3 | කළුතර | | 100,000.00 | 3,700,000.00 | | 1,210,000.00 | | | 250,000.00 | 5,260,000.00 |
| 4 | මහනුවර | 400,000.00 | 300,000.00 | 250,000.00 | 45,000.00 | 250,000.00 | 750,000.00 | 2,150,000.00 | 2,475,000.00 | 6,620,000.00 |
| 5 | මාතලේ | 100,000.00 | | | 500,000.00 | 225,000.00 | | 225,000.00 | 500,000.00 | 1,550,000.00 |
| 6 | නුවරඑළිය | 400,000.00 | | | | | 1,600,000.00 | 475,000.00 | 1,025,000.00 | 3,500,000.00 |
| 7 | ගාල්ල | | | | 460,000.00 | 1,185,000.00 | 675,000.00 | 450,000.00 | 1,750,000.00 | 4,520,000.00 |
| 8 | මාතර | | | | 485,000.00 | 725,000.00 | 250,000.00 | 1,625,000.00 | 2,000,000.00 | 5,085,000.00 |
| 9 | හම්බන්තොට | | | | 250,000.00 | 1,225,000.00 | 500,000.00 | | 275,000.00 | 2,250,000.00 |
| 10 | යාපනය | | | | | 250,000.00 | 525,000.00 | 225,000.00 | | 1,000,000.00 |
| 11 | වවුනියා | | | | 475,000.00 | 225,000.00 | | | 500,000.00 | 1,200,000.00 |
| 12 | මඩකලපුව | | | | | 250,000.00 | | | 500,000.00 | 750,000.00 |
| 13 | අම්පාර | | | | | 750,000.00 | 250,000.00 | 500,000.00 | 2,500,000.00 | 4,000,000.00 |
| 14 | ත්‍රිකුණාමලය | | | | | 750,000.00 | 250,000.00 | 250,000.00 | 250,000.00 | 1,500,000.00 |
| 15 | කුරුණෑගල | | 200,000.00 | 250,000.00 | 250,000.00 | 750,000.00 | 2,625,000.00 | 1,425,000.00 | 225,000.00 | 5,725,000.00 |
| 16 | පුත්තලම | | 400,000.00 | 250,000.00 | | 975,000.00 | 2,425,000.00 | 250,000.00 | 1,750,000.00 | 6,050,000.00 |
| 17 | අනුරාධපුර | | 200,000.00 | 250,000.00 | 250,000.00 | 725,000.00 | 750,000.00 | 2,000,000.00 | 750,000.00 | 4,925,000.00 |
| 18 | පොළොන්නරුව | 100,000.00 | 501,400.00 | 100,000.00 | 725,000.00 | 475,000.00 | 250,000.00 | 1,000,000.00 | 250,000.00 | 3,401,400.00 |
| 19 | බදුල්ල | | 730,000.00 | 170,000.00 | 250,000.00 | | 1,660,000.00 | 700,000.00 | 1,900,000.00 | 5,410,000.00 |
| 20 | මොනරාගල | 300,000.00 | 185,000.00 | 600,000.00 | 500,000.00 | 500,000.00 | 725,000.00 | 975,000.00 | 7,250,000.00 | 11,035,000.00 |
| 21 | රත්නපුර | 100,000.00 | 685,000.00 | 550,000.00 | 500,000.00 | 1,735,000.00 | 1,600,000.00 | 2,050,000.00 | 4,150,000.00 | 11,370,000.00 |
| 22 | කෑගල්ල | | 700,000.00 | | 925,000.00 | 1,175,000.00 | 1,625,000.00 | 950,000.00 | 250,000.00 | 5,625,000.00 |
| 23 | මන්නාරම | | | | 250,000.00 | | | 225,000.00 | | 475,000.00 |
| 24 | මුලතිව් | | | | 500,000.00 | | 675,000.00 | | 25,000.00 | 1,200,000.00 |
| 25 | කිලිනොච්චි | | | | | 250,000.00 | | | 250,000.00 | 500,000.00 |
| | | **4,400,000.00** | **4,086,400.00** | **6,120,000.00** | **7,090,000.00** | **15,030,000.00** | **17,135,000.00** | **16,400,000.00** | **30,300,000.00** | |
| | **2017 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා මරණ වන්දි ගෙවීම් සඳහා සමස්ථ වියදම** | | | | | | | | | **100,561,400.00** |

2024 වර්ෂය අවසන් වන විට 2017 වර්ෂයේ සිට ඇස්තමේන්තු කර අවසන් සියලු නිවාස සඳහා වන්දි මුදල් ගෙවා අවසන් කර ඇත.

විශේෂයෙන් දිස්ත්‍රික් ලේකම්වරු මඟින් ගෙවීම් කිරීමට යොමු කර ඇති අදාළ ප්‍රතිපාදන ඉතිරි වී ඇති බැවින් හිඟ ගෙවීම් නොමැති බවට නිරීක්ෂණ අප වෙත ලැබී තිබෙනවා. එසේම ඇස්තමේන්තු කිරීමේ ප්‍රමාදයන් හෝ වෙනත් ලියකියවිලිවල අඩු පාඩු හේතුවෙන් ගෙවීම් කිරීමට පවතී නම් එම අවශ්‍ය ප්‍රතිපාදන 2025.02.28 දිනට ප්‍රථම ඉල්ලුම් කරන ලෙස දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත දැනුම් දී තිබෙනවා.

(ii) පිළිගනිමි.

(iii) රුපියල් 10,000ට වැඩි ගෙවීම් යනු සාපේක්ෂව වැඩි අගයක් ගන්නා ඇස්තමේන්තු වන බැවින් ඉඩමේ අයිතිය නිසි පරිදි තහවුරු කර ගැනීම සඳහා කරුණු රාශියක් බලපානවා. ඔබතුමාට ඒ පිළිබඳව අවබෝධයක් ඇති කියලා හිතනවා.

- ප්‍රතිලාභ ලැබිය යුතු පුද්ගලායටම ප්‍රතිලාභ ලැබීම තහවුරු වීම. ඒක අත්‍යවශ්‍යයි.
- නඩු, ආරවුල් පවතින ඉඩම් සඳහා ද වන්දි මුදල් අයදුම් කරන බැවින් වන්දිය ලැබිය යුතු නිශ්චිත පාර්ශ්වය හඳුනා ගත යුතුයි.
- අනවසර ලෙස ඉදිකර ඇති දේපළ සඳහා අයිතිය විමසීමකින් තොරව වන්දි ලබා දීම එම නීති විරෝධී බව තහවුරු කිරීමක් වීම.
- ඇතැම් පුද්ගලයන් වංචනික ලෙස වන්දි ලබා ගැනීමට උත්සාහ කිරීම අගතියට පත් පාර්ශ්වයට ප්‍රතිලාභ හිමිකම් ලැබීම අවිනිශ්චිත වීම.
- ඒ හේතුවෙන් රක්ෂිත සහ අනවසර පදිංචිකරුවන් සහ නීතිමය ගැටලු සහිත සිද්ධීන් හැරුණු කොට අයිතිය සනාථ කිරීමට නීතිමය ලියකියවිලි නොමැති වුවද, පදිංචි කාලය ඒ වාගේම වෙනත් හිමිකරුවන් ඉදිරිපත් නොවීම ආදී කරුණු සලකා බලා නිවාස හානි ප්‍රතිපූර්ණය කිරීමට දිස්ත්‍රික් ලේකම්ට හැකියාවක් පවතිනවා. එසේම, අදාළ දේපළෙහි වත්මන් අයිතිකරුගේ අවසරය මත ද පදිංචිකරුවන්ට වන්දි මුදල් ගෙවීමේ කටයුතු සිදු කරනවා.

(iv) පුද්ගලයන් වෙත පිසූ ආහාර ලබා දීමේදී සුරක්ෂිත මධ්‍යස්ථානයන් තුළ හෝ ඒ ආසන්න ස්ථානයක තොග වශයෙන් ද්‍රව්‍ය මිලදී ගෙන එහි සිටින පුද්ගලයන්ගේද සහාය ඇතිව ආහාර පිසීම සිදු කරන බැවින් අඩු පිරිවැයක් යටතේ ආහාර ලබා දීම සිදු කළ හැකි වේ.

ඒකයි දැනට අපි කරගෙන යන පිළිවෙත.

ඒ අනුව පිසූ ආහාර ලබා දීම සඳහා එක් පුද්ගලයෙකුට දිනකට රුපියල් 600ක මුදලක් මේ වන විට ගෙවීම් කටයුතු ලෙස සිදු කරනු ලබයි.

වියළි සලාක ලබා දීමේදී, අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය පමණක් වියළි සලාක ලෙස ලබා දෙන බැවින් 2024.06.05 දිනැති ආපදා කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2020 (II) මඟින් ඉදිරිපත් කරන ලද සංශෝධිත නව මිල ගණන් යටතේ ප්‍රමාණවත් වියළි සලාකයක් ලබා දිය හැකිය.

ඒ අනුව වියළි සලාක සඳහා සතියකට,

තනි පුද්ගලයෙකුට රු. 1,800.00

සාමාජිකයන් දෙදෙනෙකුගෙන් යුතු පවුලකට රු. 2,400.00

සාමාජිකයන් තුන්දෙනෙකුගෙන් යුතු පවුලකට රු. 2,800.00

සාමාජිකයන් හතරදෙනෙකුගෙන් යුතු පවුලකට රු. 3,200.00

සාමාජිකයන් පස්දෙනෙකුගෙන් යුතු පවුලකට රු..3,600.00

ලෙස මේ වන විට ගෙවීම් කටයුතු සිදු කරනු ලබයි.

(v) ඔව්,

2020.09.09 දිනැතිව දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත නිකුත් කරන ලද ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය විසින් සකස් කළ දේපළ හානි ප්‍රතිපූරණ පිරිවැය ඇස්තමේන්තුව මේ දක්වා භාවිත වන අතර, ගොඩනැඟිලි ද්‍රව්‍ය මිල ගණන්හි ඇති වූ මිල ඉහළ යෑමත් සමඟ මෙම ඇස්තමේන්තුව සංශෝධනය කිරීමත් ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය මේ වන විට සිදු කර ඇත. ඒ අනුව සංශෝධිත ඇස්තමේන්තු අගයන් සහිත නව පිරිවැය ඇස්තමේන්තුව අනුමැතියට යොමු කර තිබෙනවා. එම අනුමැතිය ලැබුණාට පසුව ඒ අනුව අපි මිල සංශෝධන සමඟ තක්සේරු වටිනාකම ලබා දීමට කටයුතු කරනවා.

(ආ) පැන නොනඟී.

**ගරු වරුණ ලියනගේ මහතා**
(மாண்புமிகு வருண லியனகே)
(The Hon. Waruna Liyanage)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. අපේ රත්නපුර දිස්ත්‍රික්කයේ ආපදාවට ලක්වන ගම්මාන කිහිපයක් තිබෙනවා. ඒ අනුව ඇහැලියගොඩ, රත්නපුර, ඇලපාත, පැල්මඩුල්ල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ජනතාවට නිවාස ලබා දීලා තිබෙනවා. නමුත් මේ නිවාස ලබා දීපු ගම්මානවල යටිතල පහසුකම් සංවර්ධනය කරන්න බැරි වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි. ඒ කියන්නේ පානීය ජලය, මාර්ග යන මූලික අවශ්‍යතා එම ගම්මානවලට ලබා දෙන්න බැරි වෙලා තිබෙනවා. එම නිසා ජනතාව මේ ගම්මානවල පදිංචි වීමේ ප්‍රවණතාව නැති වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ඔබතුමා මේ වර්ෂයේදී යම් වැඩසටහනක් සකස් කරන්න බලාපොරොත්තු වෙනවාද කියලා මම දැනගන්න කැමැතියි.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම ඔබතුමා හරි. පසුගිය මාස එකහමාරක විතර කාලයක් තිස්සේ මේ ගැන දිස්ත්‍රික් ලේකම්වරුන් එක්ක අපි සාකච්ඡා කළා. අපේ ආපදා කළමනාකරණ ජාතික කමිටුවත් හෙට අනිද්දා රැස් කරනවා. ඊයේ පැවති ආරක්ෂක අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේදීත් ඒ කාරණය මත කළා. අනෙකුත් රේඛීය අමාත්‍යාංශ සමඟ එකතුව ආපදාවට ලක් වෙච්ච ප්‍රදේශවල යටිතල පහසුකම් දියුණු කිරීම සඳහා කටයුතු කරන්න අපි විශේෂ වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා. ඒ ගැන කැබිනට් පත්‍රිකා මඟින් ද දැනුම්දීමට අපි කටයුතු සැලසුම් කරගෙන යනවා.

**ගරු වරුණ ලියනගේ මහතා**
(மாண்புமிகு வருண லியனகே)
(The Hon. Waruna Liyanage)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

පසුගිය කාලයේ රක්ෂණ අරමුදල යටතේ යම් වැඩසටහනක් ක්‍රියාත්මක කරලා විශාල ශක්තියක් ලබා දුන්නා, ආපදාවට ලක් වෙච්ච ජනතාවට. ඒක හොඳ ක්‍රමයක් කියලා ඔබතුමාත් පිළිගත්තා. ඇත්තටම මම විශ්වාස කළා, මේ ආණ්ඩුවත් ඒ රක්ෂණ වැඩසටහන ඉදිරියට කරගෙන යයි කියලා. මොකද, අපි IMF එකත් එක්ක කථා කළා නම් ඒ රක්ෂණ අරමුදලට මුදල් ලබා ගන්න තිබුණා කියලා මම විශ්වාස කරනවා. අපි බලාපොරොත්තු වුණා, ඔබතුමන්ලා ඒ දේ ඉෂ්ට කරයි කියලා. නමුත් ඒක වුණේ නැහැ. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, රත්නපුර දිස්ත්‍රික්කය කියන්නේ හැම වසරකම ජලයෙන් යටවන දිස්ත්‍රික්කයක්. තව මාස දෙකකින් පස්සේත් මේ දිස්ත්‍රික්කය ජලයෙන් යට වෙනවා. ඒ නිසා මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කර, ලබන අවුරුද්දේ අය වැයට හෝ ඉදිරිපත් කර එම රක්ෂණ වැඩසටහන ලබා දෙන්න කියලා මා ඉල්ලා සිටිනවා.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)
ඒ ගැන අපි සටහන් කර ගන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 2 -386/2025- (1), ගරු චානක මාදුගොඩ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## මත්තේගොඩ නිවාස සංකීර්ණයේ මලාපවහන පද්ධතිය වටා වැටක් ඉදිකිරීම: විස්තර
## மத்தேகொட வீடமைப்புக் கட்டிடத்தொகுதியின் மலக்கழிவு அகற்றும் முறைமையைச் சுற்றி வேலி அமைத்தல்: விபரம்
FENCING OF SEWERAGE SYSTEM AT MATHTHEGODA HOUSING SCHEME: DETAILS

417/2025

**3. ගරු අරුණ පනාගොඩ මහතා**
(மாண்புமிகு அருண பனாகொட)
(The Hon. Aruna Panagoda)
නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) හෝමාගම, මත්තේගොඩ නිවාස සංකීර්ණයේ මලාපවහන පල්දෝරු පද්ධතිය වර්ෂ ගණනාවක සිට අකර්මණ්‍ය වී ඇති බවත්;

(ii) එම පල්දෝරු පද්ධතිය වටා ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් මේ වන විට වැටක් ඉදිකරමින් සිටින බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) ඉහත සඳහන් වැට ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු කර ඇති මුදල කොපමණද;

(ii) එහි ඉදිකිරීම් ආරම්භ කරන ලද දිනය හා ඉදිකිරීම් අවසන් කළ යුතු දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඒ සඳහා තෝරා ගෙන ඇති කොන්ත්‍රාත් ආයතනය කවරේද;

(iv) එම කොන්ත්‍රාත් ආයතනය තෝරා ගැනීමේදී නියමිත ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කර තිබේද;

(v) එම වැට ඉදිකිරීම හේතුවෙන් ජනතාව විසින් වර්ෂ 40ක පමණ කාලයක සිට භාවිත කරනු ලබන මාර්ග සම්පූර්ණයෙන්ම අවහිර වී ඇති බව දන්නේද;

(vi) එසේ නම්, එම තත්ත්වය නිවැරදි කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஹோமாகம, மத்தேகொட வீடமைப்புக் கட்டிடத்தொகுதியின் மலக்கழிவு அகற்றும் முறைமை பல வருடங்களாக செயலிழந்துள்ளது என்பதையும்;

(ii) தற்போது மேற்படி மலக்கழிவு அகற்றும் முறைமையைச் சுற்றி தேசிய நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்புச் சபை வேலியொன்றை நிர்மாணித்து வருகின்றது என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி வேலியை நிர்மாணிப்பதற்கான மதிப்பீட்டுத் தொகை எவ்வளவு என்பதையும்;

(ii) அதன் நிர்மாணப் பணிகளை ஆரம்பித்த திகதி மற்றும் நிறைவு செய்யவேண்டிய திகதி என்பன வெவ்வேறாக யாதென்பதையும்;

(iii) அதற்காகத் தெரிவுசெய்யப்பட்டுள்ள ஒப்பந்த நிறுவனம் யாதென்பதையும்;

(iv) மேற்படி ஒப்பந்த நிறுவனத்தைத் தெரிவுசெய்யும்போது, உரிய கேள்விப்பத்திர நடைமுறை பின்பற்றப்பட்டுள்ளதா என்பதையும்;

(v) மேற்படி வேலியை நிர்மாணிப்பதால் பொதுமக்கள் சுமார் 40 வருடங்களாகப் பயன்படுத்தி வருகின்ற வீதிக்கு அது முழுமையாக இடையூறாக உள்ளதை அறிவாரா என்பதையும்;

(vi) ஆமெனில், மேற்படி நிலைமையைச் சீர்செய்வதற்கு மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Urban Development, Construction and Housing:

(a) Is he aware that the -

(i) drainage sewerage system at the Maththegoda Housing Scheme, Homagama, has been defunct for a number of years now; and

(ii) National Water Supply and Drainage Board is constructing a fence around this sewerage system at present?

(b) Will he inform this House -

(i) the amount estimated for the construction of the fence referred to above;

(ii) the date on which its construction was commenced and date on which the construction is supposed to be completed, separately;

(iii) the construction firm that has been selected for the construction;

(iv) whether the specified tender procedure has been followed in selecting the firm concerned;

(v) whether he is aware that the roads that people had been using for around 40 years have been obstructed completely because of the construction of the fence; and

(vi) if so, the measures that will be taken to rectify this situation?

(c) If not, why?

**ගරු අනුර කරුණාතිලක මහතා (නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Urban Development, Construction and Housing)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය යොමු වන්නේ හෝමාගම, මත්තේගොඩ නිවාස සංකීර්ණයේ මලාපවහන පල්දෝරු පද්ධතිය සම්බන්ධයෙන්. එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) මෙම මලාපවහන පිරිපහදු තටාක පද්ධතිය මඟින් මත්තේගොඩ නිවාස සංකීර්ණයේ සහ කලාපුරයේ නිවාසවල අපජලය පිරිපහදු කිරීම සිදු කෙරෙන බව ජල සම්පාදන මණ්ඩලය විසින් දන්වා තිබෙනවා.

මෙම තටාක පද්ධතිය වසර 40කටත් වඩා පැරණි වන අතර, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් 1998.05.22 දිනැති ලිපිය මඟින් ක්‍රියාත්මක හා නඩත්තු කටයුතු සඳහා ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයට පවරා තිබෙනවා. මණ්ඩලයේ අධීක්ෂණය යටතේ මධ්‍යම පරිසර අධිකාරියේ පරාමිතීන්ට අනුකූලව පිරිපහදු කරන අපජලය ක්ලෝරීනීකරණයෙන් පසුව පරිසරයට මුදාහරින අතර ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලයෙන් සහ මධ්‍යම පරිසර අධිකාරියෙන් මෙහි තත්ත්ව පරීක්ෂාව නිරන්තරයෙන්ම සිදු කරනවා.

ඒ අනුව මෙම මලාපවහන පද්ධතිය පූර්ණ වශයෙන් අකර්මණ්‍ය වී නොමැති බව ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් දන්වා තිබෙනවා.

මෙම මලාපවහන පද්ධතියේ යම් කොටස් ප්‍රතිසංස්කරණය කළ යුතු අතර, ඒ සඳහා ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සැලසුම් සහ ඇස්තමේන්තු සකස් කර ප්‍රතිපාදන වෙන් කිරීමට සැලසුම් කර ඇති බව දන්වා සිටිනවා.

(ii) ඔව්. වැටක් ඉදිකරමින් පවතිනවා.

එම මලාපවහන තටාකය හරහා හා එය වටා ඇති මාර්ගය උපයෝගී කර ගනිමින් ප්‍රදේශවාසීන් ගමන් කිරීම සිදු කරනවා. ඒ වාගේම බර වාහන ගමන් කිරීමත් සිද්ධ කරනවා. එමෙන්ම 2023දී තටාකය තුළට ප්‍රදේශවාසියෙක් වැටිලා මිය ගිහිල්ලා තිබෙනවා. ඒ මිය ගිය පුද්ගලයාගේ පෙණහලු තුළට අපජලය ඇතුළුවීම හේතුවෙන් ඇති වූ ආසාදන තත්ත්වය ඔහුගේ මරණයට හේතු වූ බව මරණ පරීක්ෂණ වාර්තාවට අනුව තහවුරු වෙලා තිබෙනවා.

මෙම මලාපවහන තටාකය දැනට අවුරුදු 40ක් පමණ පැරණි වන අතර ප්‍රදේශවාසීන් විසින් බර වාහන මඟින් ගමන් කිරීම හේතුවෙන් එහි පැති බැම් දුර්වල වී ඇති අතර, නීති විරෝධී කටයුතු සඳහා සහ වාහන මඟින් අපජලය හා කසළ බැහැර කිරීම සඳහා ද මෙම මලාපවහන තටාකය හා තටාක භූමිය භාවිත කරනු ලබන බව ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය දන්වා සිටිනවා.

ඒ අනුව මත්තේගොඩ මලාපවහන තටාකය හා එම භූමිය දැනට ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් නඩත්තු කරනු ලබනවා. එම මලාපවහන තටාක භූමිය අවට පරිසරයේ නිවාස කිහිපයක් තිබෙනවා. එම ඇතැම් නිවාසවලින් බැහැර කරනු ලබන කසළ බැහැර කිරීමට ද මලාපවහන තටාකය භාවිත කරනු ලබන අතර මණ්ඩලය විසින් දෛනිකව සිදු කරනු ලබන නඩත්තු කටයුතුවලට එමඟින් බාධා සිදු වෙනවා. ඒ අනුව මලාපවහන තටාකය සහ එය පිහිටි භූමිය උපයෝගී කර ගනිමින් ප්‍රදේශවාසීන් ඔවුන්ගේ දෛනික කටයුතු පවත්වාගෙන යනු ලබන නමුත් යම්කිසි අකටයුත්තක් හෝ ජීවිත හානියක් සිදුවුවහොත් එහි දෝෂාරෝපණය ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත එල්ල කරන බැවින් ඒ කටයුතු වැළැක්වීම සඳහා වැටක් ඉදිකරන්න කටයුතු කරලා තිබෙනවා.

(ආ) (i) රුපියල් 1,000,000.00 + 7,100,850.00

Provisional Sum + සියයට 10ක අමතර වියදම්

(ii) කොන්ත්‍රාත්තුව ආරම්භ කළ දිනය 2024.10.30 වන අතර අවසන් කළ යුතු දිනය 2025.01.12 වන නමුත් 2024.12.12 දින ප්‍රදේශවාසීන්ගේ විරෝධය හේතුවෙන් ඇති වී ඇති ගැටලුකාරී තත්ත්වය සමතයකට පත් වන තෙක් හෝමාගම ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේ තීරණයක් අනුව එම ඉදිකිරීම් කටයුතු මේ වනවිට අත්හිටුවා ඇත.

(iii) M/s Meth Construction

261, 10/C1, පංචවත්ත, හිඹුටාන, අංගොඩ.

(iv) ඔව්. ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ජල පිළිසැකසුම් අංශයෙහි ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව - RPC-WR - විසින් නිවැරදි ටෙන්ඩර් ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් කටයුතු කර ඇති බව එම මණ්ඩලය විසින් දන්වා ඇත.

(v) මෙම වැට ඉදිකිරීම හේතුවෙන් තටාක පද්ධතියෙහි පහළ කොටස වටා ඇති මාර්ගය අවහිර වේ.

(vi) මේ සම්බන්ධව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී සහ ක්ෂේත්‍ර පරීක්ෂා කිහිපයකදී දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලද අතර ඒ සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අරුණ පනාගොඩ මහතා, හෝමාගම ප්‍රාදේශීය ලේකම්, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, හෝමාගම ප්‍රාදේශීය සභාව සහ පොලීසිය සහභාගී වී ඇත.

[ගරු අනුර කරුණාතිලක මහතා]

එහිදී අදාළ මාර්ගය සඳහා විකල්ප මාර්ගයක් යෝජනා වූ අතර, එම මාර්ගයේ ඉදිකිරීම් අවසන් වන තුරු වැට ඉදිකිරීමේදී මාර්ගය අවහිර වන සේ ඉදිකිරීම් අත්හිටුවා ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු අරුණ පනාගොඩ මහතා**
(மாண்புமிகு அருண பனாகொட)
(The Hon. Aruna Panagoda)

ගරු අමාත්‍යතුමනි, විශේෂයෙන් පසුගිය සම්බන්ධීකරණ කමිටු රැස්වීම් ගණනාවකදී මේ කාරණය පිළිබඳව සාකච්ඡාවට ගත්තා. මෙතැන ගැටලුව මතු වෙලා තිබෙන්නේ මෙවැනි වැටක් ඉදිකරන්න කිසිම කෙනෙක් ඉල්ලීමක් කරලා නැති නිසායි. මහ ජනතාවගේ පැත්තෙන් එහෙම අවශ්‍යතාවක් මතු වෙලාත් නැහැ; මහජන නියෝජිතයන්ගේ පැත්තෙන් එහෙම අවශ්‍යතාවක් මතු වෙලාත් නැහැ. මේක අත්තනෝමතික විධියට හිතලා ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය ගත්ත තීරණයක්. ඒ අයගෙන් ප්‍රශ්න කළාම ඒ අය කියන්නේ, මේකට කෙනෙක් වැටෙන්න පුළුවන් කියායි. එතකොට තිසා වැවටත් යම්කිසි කෙනෙක් වැටෙන්න පුළුවන් නේ, ගරු ඇමතිතුමනි. මොකද, තිසා වැව වටේ වැටක් ගහලා නැහැ.

අවුරුදු හතළිස් ගණනක් තිස්සේ මේ පල්දෝරු පද්ධතිය මේ විධියට තිබෙනවා. සිය දිවි නසා ගන්න කැමැති කෙනෙක් මේකට පැනලා මැරිලා තිබෙනවා. මේ වැට ගැහුවාය කියලා නැහැ, සිය දිවි නසා ගන්නා කෙනෙකුට ඕනෑ නම් ඒකෙන් පනින්නත් පුළුවන්, ගරු ඇමතිතුමනි. මෙතැන මතු වෙලා තිබෙන ගැටලුව මේකයි. මේ නිලධාරින් ඉතා අත්තනෝමතික විධියට තමයි මේ වැට ඉදි කරන්නේ කියන එක ඔබතුමා දන්නවාද දන්නේ නැහැ. ජනතාවට විශාල ගැටලුවක්, පීඩාවක් මතු වෙලා තිබෙනවා, අවුරුදු 40ක් තිස්සේ මේ මාර්ගය වසා දැමීම සම්බන්ධයෙන්. ඒ අයගේ ඉල්ලීම වෙන්නේ ඒ අයට මේ භාවිත කරපු මාර්ගයේ යන්න නිසි පරිදි අවස්ථාව දීලා, ගේට්ටු දමාගෙන සුදුසු වෙලාවට ඒ කටයුතු කළාට කිසිදු බාධාවක් තමන්ගෙන් එන්නේ නැහැ කියන එකයි. මම හිතන විධියට ඒ නිලධාරින්ට ඕනෑ වෙලා තිබෙන්නේ වැට ගහන එක මිස මේ කටයුතු ආරක්ෂා කර ගැනීම නොවෙයි කියන පැහැදිලි අදහස අපිටත් තිබෙනවා.

ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඔබතුමා මැදිහත් වෙලා හෝ කමක් නැහැ මේ පිළිබඳව නැවතත් පරීක්ෂා කරලා මේ තත්ත්වය නිවැරදි කරන්න කියලා.

ඊළඟට, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නයත් මම මේ ගමන්ම අහන්නම්, ගරු අමාත්‍යතුමනි. ඒ පල්දෝරු පද්ධතිය අවුරුදු හතළිස් ගණනක් පරණයි. මේ වෙනකොට එහි බැම්ම පෙරළිලා තිබෙන්නේ. එහි පිරිපහදු තත්ත්වයන් හරියට කෙරෙන්නේ නැහැ. පිරිපහදුවට පිටින් තමයි බැම්ම හිල් කරගෙන වතුර කාන්දු වෙන්නේ කුඹුරු යායට. ඒ නිසා මේ නිලධාරින් ඉදිරිපත් කරලා තිබෙන වාර්තා ඒ විධියටම පිළිගන්න බැහැ. මේ අවස්ථාවේදී ඒ කාරණාවත් මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. ගරු අමාත්‍යතුමනි, මේ සම්බන්ධයෙන් නැවත සොයා බලා මැදිහත්වීමක් වෙන්න කියලා මේ වෙලාවේ මම මතක් කරනවා.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ඔව්, මට ලැබිලා තිබෙන වාර්තාව අනුව තමයි පිළිතුරු සපයන්න වෙන්නේ. දෙවැනි කාරණයේදී ඔබතුමාගේ ප්‍රශ්නයක් තිබුණේ නැහැ. නමුත් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය පිළිගන්නවා, මේ මලාපවහන පද්ධතියේ යම් කොටස් ප්‍රතිසංස්කරණය කරන්න ඕනෑ කියලා. ඒ අනුව ජාතික ජලසම්පාදන මණ්ඩලය විසින් සැලසුම් සහ ඇස්තමේන්තු සකස් කරලා ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම පාර සම්බන්ධයෙන් තිබෙන තොරතුරුවලදී සඳහන් වනවා, අදාළ පාර්ශ්ව එක්ක සාකච්ඡාවලින් පසුව විකල්ප මාර්ගයක් යෝජනා වූ අතර, එම මාර්ගයේ ඉදිකිරීම් අවසන් වන තෙක් තමයි වැටේ කටයුතු අවසන් කරලා තිබෙන්නේ කියා. කොහොම වුණත්, ඔබතුමා සඳහන් කළ පරිදි මේ පිළිබඳ වැඩි තොරතුරු සොයා බලා ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්නම්.

## වනඅලින්: ගහනය සහ ක්‍රියාකාරකම්
காட்டு யானைகள்: எண்ணிக்கை மற்றும் செயற்பாடுகள்
WILD ELEPHANTS: POPULATION AND ACTIVITIES

420/2025

**4. ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
පරිසර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති වනාන්තර ප්‍රමාණය අක්කරවලින් කොපමණද;

(ii) ඒ අතරින් වනඅලින්ට ජීවත් වීම සඳහා සුදුසු වාතාවරණයක් සහිත වනාන්තර ප්‍රමාණය අක්කරවලින් කොපමණද;

(iii) එම වනාන්තරවල ජීවත්වන වනඅලින් සංඛ්‍යාව කොපමණද;

(iv) වනඅලින් විසින් මිනිසුන් සහ ඔවුන්ගේ දේපළ විනාශ කරන බව දන්නේද;

(v) වර්ෂ 2020 සිට 2024 දක්වා වනඅලි ප්‍රහාරයන්ට ලක්වූ පුද්ගලයන් සංඛ්‍යාව, එම ප්‍රහාර හේතුවෙන් මරණයට පත් වූ පුද්ගලයන් සංඛ්‍යාව සහ අලි-මිනිස් ගැටුම් හේතුවෙන් මිය ගිය වනඅලින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) වන සනත්වයට ඔරොත්තු නොදෙන වනඅලි ගහනයක් සිටින බව දන්නේද;

(ii) වන සනත්වයට උචිත පරිදි වනඅලි ගහනය පාලනය කිරීමට සිදුව තිබේද;

(iii) එසේ නම්, ඒ සඳහා පවතින යන්ත්‍රණ කවරේද;

(iv) ඒවා ඉදිරියේදී ක්‍රියාත්මක කරන්නේද;

(v) එසේ නම්, වනඅලින් සිදු කරනු ලබන විනාශය පාලනය කිරීම සඳහා යම් ක්‍රමවේදයක් තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுற்றாடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையிலுள்ள காடுகளின் அளவு ஏக்கர்களில் யாதென்பதையும்;

(ii) அவற்றுள் காட்டு யானைகள் வாழ்வதற்குப் பொருத்தமான சூழலைக்கொண்ட காடுகளின் அளவு ஏக்கர்களில் யாதென்பதையும்;

(iii) அக்காடுகளில் வாழும் காட்டு யானைகளின் எண்ணிக்கை யாதென்பதையும்;

(iv) காட்டு யானைகள் மனிதர்களுக்கும் அவர்களுடைய உடைமைகளுக்கும் அழிவை ஏற்படுத்துகின்றன என்பதை அறிவாரா என்பதையும்;

(v) 2020ஆம் ஆண்டு தொடக்கம் 2024ஆம் ஆண்டு வரை காட்டு யானைகளால் தாக்கப்பட்டவர் களின் எண்ணிக்கை, அத்தாக்குதல் காரணமாக இறந்தவர்களின் எண்ணிக்கை மற்றும் யானை-மனித மோதல் காரணமாக இறந்த காட்டு யானைகளின் எண்ணிக்கை என்பன வெவ் வேறாக யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) காடுகளின் அடர்த்தியைவிடவும் அதிகமான காட்டு யானைகள் காடுகளில் வாழ்வதை அறிவாரா என்பதையும்;

(ii) காடுகளின் அடர்த்திக்கு ஏற்ப காட்டு யானை களின் பெருக்கத்தைக் கட்டுப்படுத்த வேண்டி யேற்பட்டுள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், அதற்கான பொறிமுறைகள் யாதென்பதையும்;

(iv) அது எதிர்காலத்தில் நடைமுறைப்படுத்தப்படுமா என்பதையும்;

(v) ஆமெனில், காட்டு யானைகளால் ஏற்படும் அழிவுகளை கட்டுப்படுத்த ஏதேனுமொரு வழிமுறை உள்ளதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Environment:

(a) Will he inform this House -

(i) the extent of forests in Sri Lanka in acres;

(ii) the extent of forests having an environment conducive for wild elephants to live within the aforesaid extent;

(iii) the number of wild elephants living in such forests;

(iv) whether he is aware that wild elephants kill humans and destroy their properties; and

(v) the number of persons attacked by wild elephants, the number of those who were killed by those attacks and the number of wild elephants that were killed in the human -elephant conflicts from the year 2020 to the year 2024, separately?

(b) Will he also inform this House -

(i) whether he is aware that an elephant population overwhelming the forest cover is in existence; and

(ii) whether wild elephant population has to be controlled proportionate to the forest cover;

(iii) if so, the mechanisms available for it;

(iv) whether they will be implemented in future; and

(v) if so, whether there is any methodology for controlling the destruction caused by wild elephants?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2020 වර්ෂයේ වන සංගණනය අනුව,

| විස්තරය | ප්‍රමාණය (අක්කර) |
|---|---|
| ශ්‍රී ලංකාවේ මුළු වන ආවරණය (ස්වාභාවික වන ආවරණය අනුව) | 4,717,222.78 |

(ii) වනඅලින් ජීවත් වන දිස්ත්‍රික්කවල පිහිටි සියලුම වනාන්තර එම සතුන්ට යෝග්‍යය. එම ප්‍රමාණය අක්කර 4,553,641 වේ. ඉතිරි වනාන්තර තෙත් කලාපයේ හා කඳුකර ප්‍රදේශවල පිහිටා ඇති අතර එම වනාන්තරවල වනඅලින් වාසය නොකරයි.

(iii) වනාන්තර යනුවෙන් ගැනෙන පරිසර පද්ධතිය තුළ ජීවත් වන අලි සංඛ්‍යාව වෙන් වශයෙන් ගණනය කර නොමැත. 2011 වර්ෂයේ දී සිදු කරන ලද වනඅලි සමීක්ෂණය අනුව ශ්‍රී ලංකාවේ වනඅලි ගහනය අවම වශයෙන් 5,879කි.

(iv) ඔව්.

(v)

| වර්ෂය | වනඅලි ප්‍රහාරයන්ට ලක් වූ පුද්ගලයින් සංඛ්‍යාව | එම වනඅලි ප්‍රහාර හේතුවෙන් මරණයට පත් වූ පුද්ගලයින් සංඛ්‍යාව | වනඅලි-මිනිස් ගැටුම් හේතුවෙන් මිය ගිය වනඅලින් සංඛ්‍යාව |
|---|---|---|---|
| 2020 | 236 | 112 | 328 |
| 2021 | 212 | 142 | 375 |
| 2022 | 353 | 146 | 439 |
| 2023 | 423 | 184 | 488 |
| 2024 | 354 | 155 | 388 |

(ආ) (i) එක් එක් පරිසර පද්ධතිවලට දැරිය හැකි අලි ගහනය සම්බන්ධයෙන් යම් අදහස් ප්‍රකාශ වී තිබුණද, මෙරට සමස්ත අලි ගහනය පවත්නා ස්වාභාවික පරිසර පද්ධතියට දැරිය හැකිදැයි යන්න සම්බන්ධයෙන් අධ්‍යයන වාර්තා මෙතෙක් එළි දක්වා නොමැත.

(ii) නැත.

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ.

[ගරු දම්මික පටබැඳි මහතා]

(v) ඔව්.

වනඅලින් මිනිසුන් සමඟ ඇතිවන ගැටුම හේතුවෙන් ඇතිවන විනාශය පාලනය කිරීම පිණිස පහත දැක්වෙන ක්‍රියාමාර්ග ගනු ලැබේ.

- වනඅලි විසින් සිදුකරන වගා හානි, දේපළ හානි, ජීවිත හානි අවම කිරීම සඳහා 2024 වර්ෂයේදී ඉදිකිරීම් ආරම්භ කර විදුලි වැට ඉදිකිරීමේ කටයුතු මේ වන තෙක් කි.මී. 5,612ක ඉදිකර ඇති අතර වනජීවී කලාප දකුණ, ඌව, නැගෙනහිර, මධ්‍යම, වයඹ, ත්‍රිකුණාමලය, අනුරාධපුරය, වව්නියාව, කිලිනොච්චිය හා පොළොන්නරුව ආවරණය වන පරිදි කි.මී. 588ක් විදුලි වැට ඉදිකරමින් පවතී.
- දැනට ඉදිකර ඇති විදුලි වැට නඩත්තුව හා ආරක්ෂා කිරීම සඳහා සිවිල් ආරක්ෂක භටයින් 4,005ක් යොදවා ඇත.
- වනඅලි හානි බහුලව සිදුවන ස්ථානවල වනඅලි පලවා හැරීම සඳහා මුරපොළවල් ස්ථාපිත කර සිවිල් ආරක්ෂක භටයින් 737ක් යොදවා ඇත.
- දිවා, රාත්‍රී අඛණ්ඩව විදුලි වැට නඩත්තුව හා ආරක්ෂා කිරීමේ කටයුතු සඳහා බහුකාර්ය සංවර්ධන සහායකයන් 3,647ක් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත බඳවා ගැනීමට කටයුතු සිදු කරමින් පවතී.
- වනජීවී කලාපවල වනඅලි විසින් සිදු කරන වගා හානි අවම කිරීමටත් දෛනිකව වනඅලි පලවා හැරීමේ කටයුතු සඳහාත් වාර්ෂිකව 1,620,000ක් අලි වෙඩි මිලදී ගෙන බෙදා හැරීමට කටයුතු කර ඇති අතර ඒ සඳහා වියදම රුපියල් මිලියන 350කි.
- වනඅලි විසින් සිදු කරන ජීවිත හානි, දේපළ හානි සඳහා වන්දි ගෙවීම සඳහා 2023 වර්ෂයේ රුපියල් මිලියන 380ක් හා 2024 වර්ෂයට අදාළව මේ දක්වා ලබා දී ඇති තොරතුරු අනුව රුපියල් මිලියන 372ක්ද ලබා දී ඇත.
- වන අලින්ගේ සංචරණ රටාවන් හඳුනා ගැනීම සඳහා GPS කරපටි යොදවා විද්‍යාත්මක පර්යේෂණ සිදුකර ඇති අතර මෙම දත්ත සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ප්‍රදේශවල භාවිත කරමින් පවතී.
- හානිදායක වශයෙන් හඳුනාගත් වනඅලින් අල්ලා ඉවත් කිරීම සිදුකොට ඇත.
- වන අලින්ගේ සංචරණවලට වන බාධා ඉවත් කිරීම සඳහා වනඅලි සංක්‍රමණ මාර්ග (අලිමංකඩ) හඳුනා ගැනීම හා ඒවායේ වනඅලින්ගේ සංක්‍රමණවලට සිදුවන බාධා ඉවත් කිරීමට හා ආරක්ෂා කිරීමට කටයුතු කරමින් පවතී.
- 2023 වර්ෂයේ සිට වනඅලින්ගෙන් සිදුවන ජීවිත හානි අවම කිරීම සඳහා කළමනාකරණ ක්‍රමවේද කලාප මට්ටමින් ප්‍රායෝගිකව අනුගමනය කර ගනිමින් වනඅලි විසින් ජීවිත හානි සිදු කරන ග්‍රාම නිලධාරි වසම් හඳුනාගෙන ගම්වාසීන්, ග්‍රාම නිලධාරින්, ප්‍රාදේශීය ලේකම් හා අදාළ ප්‍රාදේශීය සභා සම්බන්ධ කර ගනිමින් ගෙයින් ගෙට ගොස් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති අතර වනඅලින් සැරිසරන අතුරු මාර්ගයේ වනඅලින් දර්ශනය වන අයුරින් යටි පඳුරු ඉවත් කිරීම හා අතුරු මාර්ගවල අඳුරු සහිත ස්ථානවල වීදි ලාම්පු සවි කිරීමට කටයුතු කර ඇත.
- වාසස්ථාන සුපෝෂණ කටයුතු 2023-2024

| වර්ෂය | ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීම (හෙක්.) | තෘණ භූමි කළමනාකරණය (හෙක්.) | මාර්ග දෙපස යටි රෝපණ ඉවත් කිරීම (හෙක්.) | ජල මූලාශ්‍ර වැඩිදියුණු කිරීම (සංඛ්‍යාව) |
|---|---|---|---|---|
| 2023 | 386.9 | 258.27 | 118.64 | 9 |
| 2024 | 105 | 222 | 365 | 5 |

- වනඅලි හානි අවම කිරීම සඳහා සාර්ථක හා අසාර්ථක භාවය අධ්‍යයනය සඳහා පහත සඳහන් නව තාක්ෂණය යොදා ගැනීම අත්හදා බලා ඇත.
  1. ලංකාවේ දේශීය වශයෙන් නිෂ්පාදනය කරන ලද energizers භාවිත කරමින් උඩවලව, අම්පාර, පුත්තලම යන ප්‍රදේශවල ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත.
  2. අලින්ට අප්‍රිය පරිදි තරංග නිකුත් කරන උපකරණ භාවිත කරමින් අම්පාර, ගල්ගමුව, පොළොන්නරුව වනජීවී කලාපවල වනඅලින් පලවා හැරීම හා වනඅලින් ගම්මානවලටඇතුළු වීම වැළැක්වීම සඳහා මෙම උපකරණ යොදා ගනිමින් අත්හදා බැලීම් සිදුකර ඇත.
  3. නාවික හා ගුවන් හමුදාවන් සම්බන්ධ කරගෙන ඩ්‍රෝන යාත්‍රාවන් යොදා ගනිමින් වනඅලි පලවා හැරීමේ කටයුතු පුත්තලම, අනුරාධපුර දකුණ යන වනජීවී කලාපවල සිදු කර ඇත.
  4. මීමැසි පාලනය උපයෝගී කරගෙන මීමැස්සන්ගේ ශබ්ද තරංග භාවිත කරමින් මාදුරුඔය, අම්පාර කලාපවල මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත.
  5. කළුතෙල් කලවම් කර කඹ පිලිස්සීමෙන් ඇතිවන දුම උපයෝගී කරගෙන වනඅලි විකර්ෂණය කිරීම සඳහා අත්හදා බැලීමක් සිදු කර ඇත.
  6. උඩවලව ජාතික උද්‍යානයේ ප්‍රධාන විදුලි වැට කඩා බිඳිමින් ගම්මානවලට පැමිණෙන මාර්ග හඳුනාගෙන එම ස්ථානවල කොන්ක්‍රීට් තැටි සකස් කර බිම ඇතිරීමෙන් අධ්‍යයනයන් සිදු කර ඇත.
  7. ඖෂධ ගැල් වූ හඳුන්කූරු වර්ගයකින් නිකුත් වන දුම උපයෝගී කරගෙන වනඅලින් විකර්ෂණය කිරීම සඳහා අත්හදා බැලීමක් සිදු කර ඇත.
  8. දැනට භාවිත කරන විදුලි වැට ව්‍යුහයේ වැඩිදියුණු කිරීම් සිදු කර ඒවායේ කාර්යක්ෂමතාව ඉහළ දැමීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)

கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் ஓரளவுக்கு எனது கேள்விகளுக்குரிய பதிலைத் தந்துள்ளீர்கள். இருப்பினும் எமது மக்கள் தற்போது நடைமுறையில் எதிர்நோக்குகின்ற பிரச்சினைகள் சம்பந்தமாக உங்களுக்குச் சில தகவல்களைத் தரலாம் என்று நினைக்கின்றேன். அந்த அடிப்படையில், விஞ்ஞானரீதியாகப் பார்க்கின்றபோது, விலங்குகளின் எண்ணிக்கையைக் கட்டுப்படுத்தக்கூடிய விதத்தில் இரைகவ்விகள் இருக்கின்றன. உதாரணமாக, மான் இனம் அதிகரிக்குமாக இருந்தால் அதனை வேட்டையாடி உண்ணக்கூடிய விலங்குகள் இருக்கின்றன; உணவுச் சங்கிலி இவ்வாறுதான் காணப்படுகிறது. ஆனால், யானையைப் பொறுத்தமட்டில் அதனை வேட்டையாடி உண்ணக்கூடிய விலங்குகளோ அல்லது யானை இனத்தை அழிக்கக்கூடிய சந்தர்ப்பங்களோ குறைவாகத்தான் இருக்கிறது.

எமது மாவட்டத்தில் யானை இனத்தின் பெருக்கமானது காடுகளின் அளவைவிட அதிகமாகி விட்டதன் காரணமாக யானைகள் தற்போது காடுகளை விட்டு வெளியேறி, கிராமங்களைக் கடந்து, பயிர்ச்செய்கை நிலங்களைக் கடந்து, நகரங்களுக்குள் பிரவேசிக்கக்கூடிய நிலை ஏற்பட்டுள்ளது. அண்மையில் கொக்கட்டிச்சோலை பிரதேசத்திற்குள் இரண்டு - மூன்று யானைகள் பிரவேசித்திருந்தபோது, நான் வனஜீவ ராசிகள் பாதுகாப்பு அதிகாரிகளுக்கு அறிவித்திருந்தேன். ஆனால், அவர்கள் குறித்த இடத்திற்குச் சென்றடைவதற்கான வாகனங்களும், சாரதிகளும் இல்லை என்ற குறைபாட்டைச் சொல்லியிருந்தார்கள். அதேபோன்று சித்தாண்டிப் பிரதேசக் கிராமத்தினுள் நுழைந்த யானைகள் இரண்டு குழந்தைகளைத் தாக்கிவிட்டுச் சென்றிருந்தன. ஆனால், தெய்வாதீனமாக அந்தக் குழந்தைகள் உயிர்தப்பியிருந்தார்கள்.

மேலும், மட்டக்களப்பு மாவட்டத்தைப் பொறுத்தமட்டில் வனசீவராசித் திணைக்கள அலுவலகங்கள் - பிரதான அலுவலகம் கல்லடியிலும், கிரான் பகுதியில் ஒன்றும் வெல்லாவெளியில் ஒன்றுமாக - 3 மூன்று மாத்திரமே இருக்கின்றன. அம்பாறை மாவட்டத்துடன் ஒப்பிட்டுப் பார்க்கின்றபோது, அங்கு 7 அல்லது 8 அலுவலகங்களும் அதனைக் கண்காணிப்பதற்காக அதிகமான காவலர்கள் அல்லது அலுவலர்களும் இருக்கிறார்கள். அம்பாறை மாவட்டத்திலும் யானைகளின் தாக்குதல் நடைபெறுகின்ற படியால் அங்கும் அதிகமான அலுவலர்களும் பாதுகாப்பு உத்தியோகத்தர்களும் தேவை. ஆனால், மட்டக்களப்பு மாவட்டத்தைப் பொறுத்தமட்டில் அலுவலர்கள் அல்லது காவலர்கள், சாரதிகள், வாகனங்கள் ஆகியவை இல்லாத குறைபாடு காணப்படுகிறது. கடந்த காலத்தில் ஓரிலட்சம் வேலைத்திட்டம் உருவாக்கப்பட்டு, அதன்மூலம் இந்த யானைகளின் தாக்கத்தைக் கட்டுப்படுத்தக்கூடிய உத்தியோகத்தர்கள் நியமிக்கப்படுவார்கள் என்று கூறப்பட்டபோதும் அது நடைபெறவில்லை. எனவே, நான் கூற விரும்புவது என்னவென்றால், மக்களின் உயிர் முக்கியமானது; அவர்களுடைய உடைமைகள் முக்கியமானது. யானைகளின் தொல்லையால் அந்த மக்கள் பயிர்ச்செய்கையில் ஈடுபடமுடியாத ஓர் அச்ச நிலையில் இருப்பதனால் மட்டக்களப்பு மாவட்டத்தில் வன சீவராசித் திணைக்கள அலுவலகங்கள் மற்றும் உத்தியோகத்தர்கள் அல்லது காவலர்களின் எண்ணிக்கை அதிகரிக்கப்படுவதுடன், அந்த அலுவலகங்களின் வாகனங்கள், சாரதிகளின் பற்றாக்குறை நிறைவு செய்யப்படுவது அவசியமாகவிருக்கின்றது. அவற்றை அங்கு விரைவாக வழங்கினால் மக்களின் உயிரிழப்புகளையும் உடைமை இழப்புகளையும் நாங்கள் கட்டுப்படுத்த முடியும்.

இது தொடர்பில் ஒரு விடயத்தைத் தங்களின் தகவலுக்குத் தருகின்றேன். அவுஸ்திரேலியாவில் கங்காருகளின் எண்ணிக்கை அளவுக்கதிகமாக அதிகரித்தபோது, அவை மக்களுக்குத் தொந்தரவாக இருந்தபடியால், அவர்கள் மேலதிகமானவற்றை அழித்தார்கள். அதேபோன்றுதான், மத்திய கிழக்குப் பிரதேசத்தில் ஒட்டகங்கள் அதிகரித்தபோது, அவை அதிகளவு நீரைக் குடிப்பதன் விளைவாக நிலத்தடி நீர்ப் பற்றாக்குறை ஏற்பட்டதன் காரணமாக, அந்நாட்டவர்கள் மனிதர்களின் தேவை கருதி மேலதிகமான ஒட்டகங்களை அழித்தார்கள். அதற்காக நான் யானைகளை அழிக்கச் சொல்லவில்லை. ஆனால், மனிதத் தேவை கருதி இவற்றின் பெருக்கத்தைக் கட்டுப்படுத்துவதற்கான அறிவியல் சார்ந்த - விஞ்ஞான பூர்வமான ஏதாவது பொறிமுறை ஒன்றைக் கண்டுபிடிக்கமுடியுமா? என நீங்கள் ஆலோசிக்க வேண்டும். இவ்வாறான விடயங்களைக் கவனத்திற்கொண்டு, எதிர்காலத்தில் மட்டக்களப்பு மாவட்டத்தில் மட்டுமல்ல, யானைகளால் பாதிக்கப்படுகின்ற ஏனைய மாவட்டங்களி லிருக்கின்ற மக்களையும் பாதுகாப்பதற்குரிய நடவடிக்கையை நீங்கள் எடுக்க வேண்டுமென்று மிகவும் விநயமாகக் கேட்டுக்கொள்கின்றேன்.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

බොහොම ස්තුතියි, ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මන්ත්‍රීතුමා.

ඔබතුමා ඉදිරිපත් කරපු කරුණු සම්බන්ධයෙන් අපි සැලකිලිමත් වෙන්නම්. අපි මෙවර අය වැයෙනුත් මේ ප්‍රශ්නය ගැන විශේෂයෙන්ම සලකලා, ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙනදාට වඩා අපි ටිකක් වැඩිපුර වඩා වෙන් කර තිබෙනවා. අපට මේ ප්‍රශ්නය ගැන විශේෂයෙන්ම සලකා බැලිය යුතු වෙනවා. මොකද, එක පැත්තකින් මිනිස් ජීවිත සහ දේපළ විනාශය සිදු වන අතරේම, අනෙක් පැත්තෙන් වනඅලි මියයෑමත් සිද්ධ වෙනවා. අලි-ඇතුන් කියන්නේ අපේ රටේ සංරක්ෂණය කළ යුතු සත්ව කොටසක්. ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ ඕස්ට්‍රේලියාවේ කැන්ගරුවන් සම්බන්ධයෙන් හෝ සවුදිඅරාබියේ ඔටුවන් සම්බන්ධයෙන් අනුගමනය කරන ප්‍රතිපත්ති, අපේ රටේ අලි-ඇතුන් සම්බන්ධයෙන් අනුගමනය කරන්න බැහැ. අපි අලි-ඇතුන් සංරක්ෂණය වෙනුවෙන් තමයි පෙනී සිටින්නේ. නමුත්, මිනිස් ජීවිත හානි, දේපළ හානි සම්බන්ධයෙන් සහ වනඅලි සංරක්ෂණය සම්බන්ධයෙන්, -ඒ හැම පැත්තක්ම සලකා බලා තමයි- අපට මෙහිදී මැදිහත් වෙන්න සිද්ධ වෙන්නේ. ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු අම්පාර සහ මඩකලපුව දිස්ත්‍රික්කවල තිබෙන මේ ප්‍රශ්නය ගැන අපි අවධානය යොමු කරන්නම්. අපි මේ සඳහා විශාල මැදිහත්වීමක් කර තිබෙනවා සහ කරමින් තිබෙනවා. මේ ප්‍රශ්නයට ස්ථිරසාර සහ විද්‍යාත්මක විසඳුමක් ලබා ගන්න අපි ඔබතුමන්ලාගේ සහායත් අපේක්ෂා කරනවා.

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthtu Srineshan)

நன்றி! கௌரவ அமைச்சர் அவர்களே, திருகோணமலை யிலும் பாதிப்பு இருக்கின்றது. எனினும், மட்டக்களப்பு மாவட்டத்துக்கான அலுவலகங்களினதும் உத்தியோகத்தர் களினதும் வாகனங்களினதும் சாரதிகளினதும் எண்ணிக்கையை அதிகரிக்குமாறு நான் உங்களிடம் அவசர உதவியாகக் கேட்டு நிற்கின்றேன்.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

හොඳයි, ගරු මන්ත්‍රීතුමා, අපි ඒ සඳහා මැදිහත්වීමක් කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවැනි වටය.

## E-8 වීසා ක්‍රමය යටතේ දකුණු කොරියාවේ රැකියා කිරීමට වීසා ලැබූ ශ්‍රී ලාංකිකයන්: මතුව ඇති බාධා
E-8 வீசா முறையின்கீழ் தென் கொரியாவில் தொழில்புரிய வீசா பெற்ற இலங்கையர்கள்: ஏற்பட்ட தடைகள்
SRI LANKANS WITH E-8 VISA LEAVING FOR JOBS IN SOUTH KOREA: OBSTRUCTIONS ARISEN

386/2025

**2. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු චානක මාදුගොඩ මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சானக மாதுகொட சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Chanaka Madugoda)

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ලෝකයේ රටවල් ගණනාවක පුරවැසියන් E - 8 වීසා ක්‍රමය යටතේ දකුණු කොරියාවේ රැකියා සඳහා යොමු වන බව දන්නේද;

(ii) E - 8 වීසා ක්‍රමය යටතේ දකුණු කොරියාවේ රැකියා කිරීම සඳහා වීසා ලැබූ ශ්‍රී ලාංකිකයන් කටුනායක ගුවන් තොටුපළේදී නැවත හරවා එවීමට හේතු කවරේද;

(iii) එම ශ්‍රී ලාංකිකයන්ට දකුණු කොරියාවේ රැකියා කිරීමට ඇති බාධා කවරේද;

(iv) E - 8 වීසා ක්‍රමය යටතේ දකුණු කොරියාවේ රැකියා කිරීම සඳහා වීසා ලැබූ ශ්‍රී ලාංකිකයන් සඳහා සාධාරණත්වය ඉටු කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) உலகின் பல நாடுகளைச் சேர்ந்த பிரஜைகள் E-8 வீசா முறையின்கீழ் தென் கொரியாவுக்குத் தொழில் நிமித்தம் செல்வதை அறிவாரா என்பதையும்;

(ii) E-8 வீசா முறையின்கீழ் தென் கொரிய தொழில் வீசா பெற்ற இலங்கையர்கள் கட்டுநாயக்க விமான நிலையத்தில் திருப்பி அனுப்பப்பட்ட மைக்கான காரணங்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி இலங்கையர்களுக்குத் தென் கொரியாவில் தொழில்புரிவதில் காணப்படு கின்ற தடைகள் யாவை என்பதையும்;

(iv) E-8 வீசா முறையின்கீழ் தென் கொரியாவில் தொழில்புரிய வீசா பெற்ற இலங்கையர்களுக்கு நியாயத்தை நிலைநாட்ட மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல் ஏன்?

asked the Minister of Foreign Affairs, Foreign Employment and Tourism:

(a) Will he inform this House -

(i) whether he is aware that the citizens of many countries of the world find employment in South Korea under the E-8 visa scheme;

(ii) the reasons for turning the Sri Lankans who have obtained work visas for South Korea under the E-8 visa scheme back at the Katunayake Airport ;

(iii) the barriers for aforesaid Sri Lankans to work in South Korea; and

(iv) the measures that are being taken to accord justice to the Sri Lankans who have obtained visas to work in South Korea under the E-8 visa scheme?

(b) If not, why?

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா - வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Arun Hemachandra - Deputy Minister of Foreign Affairs and Foreign Employment)

ගරු කථානායකතුමනි, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) ශ්‍රී ලංකා රජය E-8 වීසා ක්‍රමය යටතේ ශ්‍රී ලාංකිකයන් හට දකුණු කොරියාවේ රැකියා කිරීම සඳහා කොරියානු රජය සමඟ විධිමත් පරිදි ගිවිසුමකට එළඹ නොමැත. එසේම, E - 8 කාණ්ඩය යටතේ වූ වීසා මත බඳවා ගැනීම් රජයන් දෙකක් අතර සිදුවන ක්‍රියාවලියක් වන අතර, එය පෞද්ගලික පාර්ශ්වයක් මඟින් සිදු කළ නොහැක්කකි. එබැවින්, අදාළ වීසා කාණ්ඩය යටතේ රැකියා සඳහා විදේශගත වීමට පැමිණි පුද්ගලයන් ගුවන් තොටුපළේදී හරවා යැවීමට සිදුවිය.

(iii) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පනත අනුව ලියාපදිංචිවීමට නොහැකි බැවින් රැකියා සඳහා E-8 වීසා කාණ්ඩය යටතේ විදේශගත වීමට නොහැක. E-8 වීසා යනු කෙටිකාලීන (මාස 5-8) ඍතුමය වීසා වන බැවින්, රැකියාව ලබා ගැනීම සඳහා ගෙවිය යුතු මුදල සහ අදාළ රැකියාව මඟින් කෙටි කාලයක් තුළ උපයා ගනු ලබන ආදායම සැලකීමේදී මෙමඟින් ලැබෙන ප්‍රතිලාභය පිරිවැයට සාපේක්ෂව අඩු අගයක් වේ. කාර්යාංශයේ විමර්ශනවලින් අනාවරණය වන පරිදි මෙම එක් ශ්‍රමිකයකුගෙන් රුපියල් 1,200,000ක් වැනි අධික මුදලක් අය කරගෙන අදාළ රැකියා සපයා දී ඇත. එම කාල පරිච්ඡේදයෙන් පසු ඔවුන් නැවත මව් රටට පැමිණිය යුතු අතර, ඉන්පසු ඊළඟ ඍතුවේ රැකියා සඳහා පිටත්වීම මෙහි ස්වභාවය වුවද, තමන් වියදම් කරන ලද මුදල ආවරණය කර ගැනීම සඳහා වලංගු වීසා කාලයෙන් පසුව නැවත මව් රටට නොපැමිණ නිතැතින්ම නීත්‍යානුකූල නොවන ආකාරයෙන් තවදුරටත් එරට රැඳී සිටීමේ අවදානමක් ඇති අතර, එය 2004 වර්ෂයේ සිට මේ දක්වා වාර්ෂිකව ශ්‍රී ලාංකික තරුණ තරුණියන් 6,000කට පමණ රැකියා අවස්ථා ලබාදෙන ශ්‍රී ලංකා ජනරජය හා කොරියානු ජනරජය අතර ඇති කර ගත් අවබෝධතා ගිවිසුම යටතේ ක්‍රියාත්මක වන රැකියා අවසර පත් ක්‍රමය (Employment Permit System) වෙත දැඩි අහිතකර

බලපෑමක් සිදු විය හැකි අතර, එමඟින් ලබා දෙනු ලබන රැකියා කෝටාව අඩු කිරීම හෝ අත්හිටුවීමේ අවධානමක් මෙමඟින් ඇති කරනු ලබයි.

(iv) අනීතිකව දකුණු කොරියාවේ රැකියා සඳහා යොමු කිරීමට උත්සාහ ගත් 07 දෙනෙකු සම්බන්ධයෙන් ඔවුන් විසින් ගෙවා ඇති සම්පූර්ණ මුදල නීතිමය ක්‍රියා මාර්ග තුළින් අදාළ ආයතනයෙන් අය කරදී ඇති අතර, එම ආයතනයේ බලපත්‍රය අත්හිටුවා ඇත. මෙම මුදල රුපියල් මිලියන 7.1ක් පමණ වන අතර, මෙලෙස මුදල් ගෙවා ඇති තවත් පාර්ශ්වයන් සිටී නම් නිසි ලෙස සාක්ෂි සහිතව එම අය කාර්යාංශයේ පැමිණිලි කරන්නේ නම්, එවැනි අයට ද අදාළ මුදල නීතිමය ක්‍රියා මාර්ග තුළින් අය කරදීමේ හැකියාවක් පවතී. මෙම වීසා කාණ්ඩය යටතේ නියමු ව්‍යාපෘතියක් ලෙස ශ්‍රමිකයන් කොරියාව වෙත විදේශගත කිරීම සම්බන්ධයෙන් කැබිනට් පත්‍රිකාවක් සහ සංකල්ප පත්‍රිකාවක් (Concept Report) සකස් කර ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කර ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### විදේශ සංචිත ඉලක්ක සහ ණය සේවා ලබා ගැනීම සඳහා සැලසුම්
### வெளிநாட்டு ஒதுக்க இலக்குகளை அடைவதற்கும் கடன் சேவைகளைப் பெறுவதற்குமான திட்டங்கள்
### PLANS FOR ACHIEVING FOREIGN RESERVE TARGETS AND DEBT SERVICING

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ස්තුතියි, ගරු කථානායකතුමනි. ස්ථාවර නියෝග 27(2) යටතේ මා මෙම ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

(අ) මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කර ඇති පරිදි 2024 අවසානයේ නිල සංචිත වත්කම් ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 6,122ක් වූ අතර 2023 අවසානයේදී ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 4,392ක් විය. අමාත්‍යවරයා විසින්,

1. 2023 සහ 2024 අවසානයේදී සංචිතවලට දායක වූ මූලාශ්‍ර හා අදාළ ප්‍රමාණය ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර්වලින් වෙන වෙනම මාසික පදනමින් දක්වන්නේද?
2. 2024 අවසානයේදී රජයේ මුළු විදේශ ණය තොගය ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් වටිනාකමින් කොපමණද?
3. 2024 අවසානයේ පැවති මුළු විදේශ ණය සංයුතිය මත පදනම්ව, 2025, 2026, 2027 සහ 2028 සඳහා රජයේ මුළු විදේශ ණය සේවා වාර්ෂික මුදල් ප්‍රමාණය ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර්වලින් වෙන් වෙන් වශයෙන් දක්වන්නේද?
4. ඉහත සඳහන් ණය සේවා ගෙවීම් සඳහා විදේශ විනිමය සැපයීමේ හෝ සැකසීමේ වගකීම දරන්නේ මහ බැංකුවද නැතහොත් රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයද යන්න පැහැදිලි කරන්නේද?
5. 2025-2028 සහ 2028-2033 කාලය සඳහා ණය සේවා ගෙවීම් වෙනුවෙන් ප්‍රමාණවත් විදේශ විනිමය සම්පාදනය කිරීමට - sourcing foreign currency - රජය සතුව නිශ්චිත සැලසුම් තිබේද?
6. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය වැඩසටහන අනුව, කාල සීමාව අවසානයේ භාවිත කළ හැකි නිල සංචිත වත්කම් 2025දී ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 8,520ක් ද, 2026 දී ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 10,888ක්ද, 2027 දී ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 14,208ක්ද, 2028දී ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 15,875ක්ද වේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් නියම කර රජය විසින් එකඟ වී ඇති මෙම සංචිත වත්කම් ඉලක්කවලට අනුකූලවීම සඳහා මහ බැංකුව සතුව ස්වාධීන මූල්‍ය ප්‍රතිපත්ති මෙවලම් තිබේද යන්න මුදල් අමාත්‍යවරයා පැහැදිලි කරන්නේද?

(ආ) 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත - Public Debt Management Act - අනුව දේශීය වෙළෙඳ පොළේ රාජ්‍ය සුරැකුම්පත් නිකුත් කිරීමේ වගකීම රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය සතු වුවද, මහ බැංකුවේ පුවත් පත් නිවේදන අනුව භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම, වෙන්දේසි හා තැන්පතු, ලංසු භාර ගැනීම හා ඵලදායී අනුපාත -yield rate - තීරණය කිරීම මහ බැංකුව විසින් සිදු කරනු ලබයි.

1. 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනතේ විධිවිධාන පැවතියදී ද, මහ බැංකුව විසින් රාජ්‍ය සුරැකුම් පත් නිකුත් කිරීම නොකඩවා සිදු කරනු ලැබීමට හේතුව මුදල් අමාත්‍යවරයා පැහැදිලි කරන්නේද?
2. මහ බැංකුව විසින් වෙන්දේසි හා තැන්පතු මඟින් සිදු කරනු ලබන රාජ්‍ය සුරැකුම් පත් නිකුත් කිරීමේ ප්‍රතිවිපාක සම්බන්ධයෙන් රජය වගකීම භාර ගන්නේද?
3. ණය කළමනාකරණ කාර්යාලයේ සේවය කරන්නේ කවුරුන්ද?
4. 2025 ජනවාරි සිට මේ දක්වා ගතයුතු ණය ප්‍රමාණය දැනුම් දෙන්නේ කවුරුන්ද, කෙසේද යන්නත්, මෙතෙක් නිර්මාණය කර ඇති ණය ප්‍රමාණය, භාවිත කර ඇති මූල්‍ය උපකරණ ප්‍රමාණය හා අනුපාත කවරේද යන්නත් පැහැදිලි කරන්නේද?

ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ ගරු රවි කරුණානායක මැතිතුමා විසින් අසන ලද ප්‍රශ්නයට පිළිතුරු ලබා දීමට මුදල් නියෝජ්‍ය අමාත්‍ය ගරු මහාචාර්ය අනිල් ජයන්ත මැතිතුමා සූදානම්ව සිටියා. නමුත්, අද උදේ වරුවේ හදිසි

[ගරු බිමල් රත්නායක මහතා]

අවශ්‍යතාවක් වෙනුවෙන් පිටත් වෙන්න සිදු වූ නිසා, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා සමඟ සාකච්ඡා කරලා එතුමාට දැනුම් දී තිබෙනවා, හෙට උදේ මේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙන්නම් කියලා. එම නිසා ස්ථාවර නියෝග 27(2) යටතේ අසනු ලැබූ මෙම ප්‍රශ්නයට එතුමා හෙට උදේ පිළිතුර ලබා දෙයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මම ඒක පිළිගන්නවා. ඒක ප්‍රශ්නයක් නැහැ.

ගරු බලශක්ති ඇමතිවරයාත් ප්‍රශ්නයකට උත්තරයක් ලබා දෙන්න තිබෙනවා. නමුත්, එතුමා තවමත් පිළිතුරක් දීලා නැහැ. කරුණාකරලා ඒකටත් උත්තරයක් දුන්නොත් හොඳයි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)
එතුමාගේ පිළිතුර හෙට දිනයේ ලබා දෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අමාත්‍යාංශ නිවේදනය, මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය ගරු ආනන්ද විජේපාල මහතා.

## කොළඹ මහෙස්ත්‍රාත් අධිකරණයේ හා මිද්දෙනියේ සිදු වූ වෙඩි තැබීම්: මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## கொழும்பு நீதவான் நீதிமன்ற வளாகத்திலும் மித்தெனியவிலும் இடம்பெற்ற துப்பாக்கிச் சூடுகள்: பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரினது கூற்று
## SHOOTING INCEDENTS IN COLOMBO MAGISTRATE'S COURT AND MIDDENIYA: STATEMENT BY MINISTER OF PUBLIC SECURITY AND PARLIAMENTARY AFFAIRS

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)
ගරු කථානායකතුමනි, පසුගිය 19වැනි දින කොළඹ මහෙස්ත්‍රාත් අධිකරණයේ සිදු වූ වෙඩි තැබීමත්, ඒ වාගේම මිද්දෙණියේදී සිදු වූ වෙඩි තැබීමත් සම්බන්ධයෙන් පසුගිය දින දෙක පුරාවට මේ සභාව තුළ විවිධ කාරණා මතු වුණා. ඒ වාගේම මේ සිද්ධි නිසා ජාතික ආරක්ෂාව බිඳ වැටී ඇති බවත් විපක්ෂය විසින් චෝදනා කරනු ලැබුවා. මීට අනුගතව විනිසුරුවන්ගේ ආරක්ෂාව අඩු කර තිබෙනවාය කියන කාරණය පිළිබඳවත් යම් යම් කරුණු සහ මතවාද මේ ගරු සභාව තුළදී ඉදිරිපත් කරනු ලැබුවා.

ගරු කථානායකතුමනි, 2025.02.19වෙනි දින කොළඹ මහෙස්ත්‍රාත් අධිකරණයේදී සිදු වූ වෙඩි තැබීම ගැන පාර්ලිමේන්තුවේදී විපක්ෂය මතු කළ ප්‍රශ්න කිහිපයක් සම්බන්ධයෙන් මේ අවස්ථාවේදී අදහස් ප්‍රකාශ කිරීමට මම කැමැතියි.

මුලින්ම මම ප්‍රකාශ කරන්න කැමැතියි, පසු ගිය දා අධිකරණයේ සිදු වූ ඒ වෙඩිතැබීම පිළිබඳව රජය වශයෙන් අපේ කනගාටුව ප්‍රකාශ කරන බව. මෙම සිදුවීම පිළිබඳව ශ්‍රී ලංකා පොලීසිය විසින් නිසි පරීක්ෂණ පවත්වලා වෙඩිතැබීම සිදු කළා යැයි සැක කරන පුද්ගලයා වෙඩි තබා පැය 8ක් ගතවීමටත් පෙර අත්අඩංගුව ගෙන තිබෙනවා. මෙහිදී විශේෂයෙන් ශ්‍රී ලංකා පොලීසියේ කැපවීම, දක්ෂතාව අගය කළ යුතු දෙයක් ලෙස මම දකිනවා. අපේ රටේ පසුගිය කාලවල සිදු වූ සමහර අපරාධ තිබෙනවා, අද වෙනකම් කිසිදු සැකකරුවකු අත්අඩංගුවට ගැනීමට නොහැකි වූ අපරාධ ලෙස. ඒවා සියල්ලම දේශපාලන සම්බන්ධතා මත සිදු වූ අපරාධ කියලා අපි කවුරුත් දන්නවා. නමුත් ශ්‍රී ලංකා පොලීසියේ දක්ෂ නිලධාරින්ට පරීක්ෂණ සඳහා අවශ්‍ය නිදහස අපි රජයක් විධියට ලබා දීලා තිබෙනවා. ඒ නිසා අපරාධ සම්බන්ධයෙන් කාර්යක්ෂම පරීක්ෂණ ඉතා ශක්තිමත්ව සිදු වෙනවා.

ගරු කථානායකතුමනි, පසුගිය දිනකදී මිද්දෙනියේදී අරුණ ප්‍රියන්ත විදානගමගේ මහතා සහ ඔහුගේ දරුවන් දෙදෙනා ඝාතනය කිරීමේ සිද්ධියට සම්බන්ධ සැකකරුවන් මීට පැයකට පමණ පෙර අත්අඩංගුවට ගැනීමට හැකියාව ලැබුණා. ඒ සිද්ධිය සම්බන්ධ තිදෙනෙකු මේ වන විට අත්අඩංගුවට ගෙන තිබෙනවා. මේ සිද්ධියට සම්බන්ධ යැයි සැක කරලා ජීවන් ප්‍රසාද් කුමාර, ප්‍රභාත් තුෂාර සහ පොලිස් කොස්තාපල් 82493 අයි.එල්. ජනක ප්‍රසාද් මීට ස්වල්ප මොහොතකට පෙර අත්අඩංගුවට ගත්තා.

මම මේ සභාවට කියන්න කැමැතියි, යම් සිද්ධියක් වුණොත් අපි ඒ පිළිබඳව වහාම පරීක්ෂණ පවත්වලා අදාළ සැකකරුවන් නීතියේ රැහැනට කොටු කර ගැනීම සඳහා අවශ්‍ය සියලු පියවර ගන්නා බව. ඒ සම්බන්ධයෙන් මේ ගරු සභාව දැනුවත් කරන්න කැමැතියි. විශේෂයෙන්ම මේ සිදුවීම් හරහා ජාතික ආරක්ෂාවට තර්ජනයක් පවතින බවට සමාජයට බොරු බිල්ලෙක් නිර්මාණය කරන්න විපක්ෂයේ සමහර කණ්ඩායම් උත්සාහ දරමින් ඉන්නවා. ඉතිහාසය පුරාම කළ දෙයක් තමයි ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් සැකයක්, කැලඹීමක් සමාජය තුළ නිර්මාණය කිරීම. මේ සිදුවීම අධිකරණය ඇතුළේ සිද්ධ වුණු පළමුවෙනි වෙඩිතැබීම නොවෙයි. හැබැයි එහෙම කියලා මේ සිද්ධිය ලඝු කරන්න අපි සූදානම් නැහැ. මේ පිළිබඳව රජය බරපතළ ලෙස අවධානය යොමු කරලා තිබෙනවා. මේ පිළිබඳව රජයේ දැඩි කැපවීම, මැදිහත්වීම සිද්ධ කරලා තිබෙනවා.

අපි දන්නවා පසුගිය දශක දෙක තුනක කාලය පුරාම පාතාලය කොහොමද වර්ධනය වුණේ කියලා. මේ පාතාල කල්ලි නිර්මාණය වුණේ දේශපාලන අනුග්‍රහය ඇතිව. ඒ පාතාල කල්ලිවලට දේශපාලන රැකවරණ ලබා දීලා තිබුණා. ඒ විතරක් නොවෙයි. මේ පාතාලයත් එක්ක මත්ද්‍රව්‍ය ජාවාරම ඇතුළු විවිධ හොරකම්, මැරකම්, ජාවාරම් සම්බන්ධයි. ඒවා එකිනෙකට සම්බන්ධයි. ඒ සේරම පිටුපස දේශපාලන රැකවරණය තිබුණා. ඒ වාගේම මෙහිදී සිහිපත් කරන්න කැමැතියි, පසුගිය සමයේ මේ විධියට විටින් විට වාර්තා වූ වෙඩිතැබීම්, පාතාල ක්‍රියාකාරකම් සිදු වුණේ විවිධ පාතාල කල්ලි සහ පුද්ගලයන් අතර සිදු වූ ගැටුම් විධියට බව.

එම ගැටුම් නිසා මිය ගිය අය අතර පාතාල නායකයන් විධියට නම් දරපු පුද්ගලයෝ ඉන්නවා. ඔවුන් එහෙම ඝාතනය වීම අපි කිසිසේත්ම සාධාරණීකරණය කරන්නේ නැහැ. නමුත් එලෙස මිය යන අය අතර මනුෂ්‍ය ඝාතන විශාල ප්‍රමාණයක් කිරීම සම්බන්ධයෙන් චෝදනා තිබෙන පුද්ගලයන් ඉන්නවා. මම මෙයින් මතු කරන්න උත්සාහ කරන්නේ වෙනත් කිසිවක් නොවෙයි, මනුෂ්‍ය ඝාතන විශාල ප්‍රමාණයක් කරපු පුද්ගලයන් පසුගිය කාලයේ මේ රට තුළ බිහි වුණේ කොහොමද කියන කාරණාවයි.

එම පුද්ගලයන් බිහි වුණේ, දැන් විපක්ෂයේ සිටින - ඔවුන්ගේ ආණ්ඩු කාලයේ බලය හොබවපු - සමහර කණ්ඩායම්වල අනුග්‍රහයෙන්. එම පිරිස් දැන් විශාල ඝෝෂාවක් කරන්න පටන් අරගෙන තිබෙනවා. ඒ විතරක් නොවෙයි. පසුගිය සමයේ පැවති ආණ්ඩුවල, ඒ කියන්නේ දැන් විපක්ෂයේ සිටින සමහර කණ්ඩායම් බලය හොබවන කාලයේදී සිදු වුණු පාතාල ක්‍රියාකාරකම්, මිනීමැරුම් මොනවාද කියලා අපට මතකයි. සමහර ක්‍රීඩකයෝ, මාධ්‍යවේදීන් ඇතුළු විශාල පිරිසක් ඝාතනය වුණා; අතුරුදහන් වුණා. ඒ විතරක් නොවෙයි. සමහරුන්ගේ අත පය කඩා දැම්මා. ඒ සිදුවීම් පිළිබඳවත් අද මේ විපක්ෂයේ ඉඳගෙන ජාතික ආරක්ෂාව යැයි කියමින් කෑ කෝ ගසන කිසිම කෙනෙක් ඔවුන්ගේ ආණ්ඩු කාලයේ කිසිම සාධනීය මැදිහත්වීමක් කළේ නැහැ. ඔවුන්ගේ කාලයේ තමයි ලංකා දේශපාලනයේ කළු පැල්ලම් බඳු ඒ සිදුවීම් සිදු වුණේ. අද වෙනකල් ඒ අපරාධවල වින්දිතයන්ට යුක්තිය ඉෂ්ට වෙලා නැහැ. ඒ වින්දිතයන්ට යුක්තිය ඉෂ්ට කිරීමට අපි මැදිහත් වන බව මේ ගරු සභාවට ප්‍රකාශ කරන්න මා කැමැතියි.

ජාතික ජන බලවේගය බලයට පත් වුණාට පස්සේ, පසුගිය සමයේ මෙම පාතාලයට තිබුණු දේශපාලන රැකවරණ සියල්ලම සම්පූර්ණයෙන් ඉවත් කරලා තිබෙනවා. අපේ කිසිම මන්ත්‍රීවරයකු, ඇමතිවරයකු කිසිදු පාතාල කණ්ඩායමක් සමඟ සම්බන්ධකම් පවත්වන්නේ නැහැ. පාතාල සාමාජිකයන් සම්බන්ධයෙන් කටයුතු කරන්න අපි පොලීසියට නිදහස ලබා දීලා තිබෙනවා. ඒ වාගේම කිසිදු දේශපාලන බලපෑමක් පොලීසියට සිදු කරන්නේ නැහැ. පරීක්ෂණ දේශපාලනීකරණයෙන් තොරව සිදු වෙමින් පවතිනවා.

විපක්ෂය විසින් විවිධ අවස්ථාවලදී මතු කරපු තවත් ප්‍රශ්නයක් තමයි, විනිසුරුතුමන්ලාගේ ආරක්ෂාව සම්බන්ධයෙන් වන කාරණය. පොලිස්පතිවරයා විසින් නිකුත් කර ඇති 2011 දෙසැම්බර් 03වැනි දින චක්‍රලේඛය ප්‍රකාරව මේ වනවිට විනිසුරුතුමන්ලාගේ ආරක්ෂක රාජකාරිය විධිමත්ව සිදුවන බව මේ ගරු පාර්ලිමේන්තුවට අවධාරණය කරන්න කැමැතියි. ඒ අනුව ආරක්ෂාවේ කිසිදු වෙනස්කමක් සිදු කරලා නැහැ. එතුමන්ලාගේ ආරක්ෂාව ඒ ආකාරයෙන්ම ලබා දීලා තිබෙනවා. ඒ අනුව මහෙස්ත්‍රාත්වරයෙකු, අතිරේක මහෙස්ත්‍රාත්වරයෙකු, දිසා විනිසුරුවරයෙකු, අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා, නියෝජ්‍ය ලේකම්වරයා, සහකාර ලේකම්වරුන්, මහාධිකරණ විනිසුරුවන්, පළාත්බද සිවිල් අභියාචනාධිකරණ විනිසුරුවන්, වාණිජ මහාධිකරණ විනිසුරුවන්, අභියාචනාධිකරණ විනිසුරුවන්, ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවන් කියන සියලුදෙනාට පෙර පැවති ආරක්ෂාව එලෙසම පවත්වාගෙන යනවා. 2011.12.03වැනි දා නිකුත් කරපු චක්‍රලේඛයේ ඒ පිළිබඳව පැහැදිලිව සඳහන් වෙනවා. කිසිවකු, කිසිම විනිසුරුතුමෙකුගේ ආරක්ෂාව පිළිබඳව ගැටලුවක් මතු කරලා නැහැ. මම එහෙම කියන්නේ මේ නිසායි. පොලිස්පතිවරයා විසින් දෙසැම්බර් මාසයේ නිවේදනයක්, නැත්නම් චක්‍රලේඛයක් නිකුත් කරලා මහාධිකරණ විනිසුරුවන් ඇතුළු අනෙකුත් විනිසුරුවන්ගේ ආරක්ෂාව සඳහා සම්බන්ධීකරණ නිලධාරියෙකු පොලීසිය පැත්තෙන් පත් කරලා තිබෙනවා.

යම් ගැටලුවක් තිබෙනවා නම් එතුමා හරහා සම්බන්ධීකරණය කිරීම සඳහාත් පසුගිය දෙසැම්බර් මාසයේ පියවර අරගෙන තිබෙනවා. එම නිසා විනිසුරුවරුන්ගේ ආරක්ෂාව පිළිබඳව ගරු සභාවේ මතු කරපු කාරණා සත්‍යයෙන් තොරයි කියා මමත් ප්‍රකාශ කරන්න කැමැතියි.

19වැනි දා මහෙස්ත්‍රාත් අධිකරණයේ සිදු වුණු සිද්ධිය සම්බන්ධයෙන් පොලිස්පතිතුමා මා වෙත වාර්තාවක් ලබා දී තිබෙනවා. ඒ අනුව, 19වන දින කොළඹ මහෙස්ත්‍රාත් අධිකරණයේ සිදු වුණු අපරාධය සම්බන්ධයෙන් පොලිස්පතිතුමාගේ උපදෙස් පරිදි කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරින්, පොලිස් විශේෂ කාර්ය බලකායේ නිලධාරින්, ඒ වාගේම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරින් එක්ව තොරතුරු හුවමාරු කරමින් විමර්ශන පවත්වාගෙන යනවා. ඒ අනුව අංක 202, 1/ඒ, දඹහේන පාර, මහරගම පදිංචි, වයස අවුරුදු 27ක් වන සමිඳු දිල්ෂාන් පියුමංග කඳනආරච්චි යන සැකකරු පාලවිය හන්දිය ප්‍රදේශයේදී පැය 16.30ට පුත්තලම පොලීසියේ විශේෂ කාර්ය බලකායේ නිලධාරින් විසින් මනුෂ්‍ය ඝාතනයක් සිදු කිරීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන තිබෙනවා. වැඩිදුර පරීක්ෂා කිරීමේදී සැකකරු සන්තකයේ තිබුණු ගමන් මල්ලේ විදේශ රටක නිෂ්පාදිත කොළ පැහැති ජීව අත්බෝම්බයක් හමු වී ඇති අතර, එය නඩු භාණ්ඩ වශයෙන් පොලිස් නිලධාරින් භාරයට ගෙන තිබෙනවා. ඊට අමතරව NW PE 5293 දරන KDH වර්ගයේ වෑන් රථයේ රියැදුරු වශයෙන් සිටි ගල්ගොඩැල්ලහේන, මිල්ලෑව ලිපිනයේ පදිංචි, වයස අවුරුදු 47ක් වන මහේෂ් සම්පත් ප්‍රියදර්ශන කියන සැකකරු අපරාධයේ වෙඩික්කරුට අපරාධය සම්බන්ධයෙන් ආධාර අනුබල දීම චෝදනාව යටතේ අත්අඩංගුවට අරගෙන තිබෙනවා. ඔහුගේ අංක NW PE 5293 දරන වෑන් රථය මේ වනකොට පොලිස් භාරයට ගෙන තිබෙනවා. වෙඩික්කරුගෙන් ප්‍රශ්න කරන විට, අපරාධය සිදු කරන විට ඇඳ සිටි ඇඳුම්, බෑගයක දමා කොච්චිකඩේ රිදීවැල්ල මාර්ගයේ දමා ගිය බවට අනාවරණය කරගෙන තිබෙනවා. මේ වනකොට එම බෑගය පොලිස් නිලධාරින්ගේ භාරයට ගෙන තිබෙනවා. වෙඩික්කරු සමඟින් අපරාධය සඳහා පැමිණි බවට හඳුනාගෙන ඇති, කටුවැල්ලේගම පාර, මීගමුව පදිංචි, වයස අවුරුදු 25ක් වන ඉෂාරා සෙව්වන්දි වීරසිංහ නමැති සැකකාරිය අත්අඩංගුවට ගැනීමට විමර්ශන නිලධාරින් විමර්ශන පවත්වමින් සිටිනවා. විමර්ශනයේදී අනාවරණය වූ තොරතුරු අනුව එම සැකකාරිය සමඟින් අපරාධයට පෙර සහ පසුව සබඳතා පවත්වන ලද මීගමුව පොලිස් ස්ථානයට අනුයුක්තව රාජකාරි කරනු ලබන චේපත් අංග, පාදෙනිය ලිපිනයේ පදිංචි පොලිස් කොස්තාපල් 102216 ලහිරු ප්‍රසන්න ඇතුගල යන නිලධාරියා එම වෙඩි තැබීම සහ මනුෂ්‍ය ඝාතනය සිදු කිරීමේ අපරාධය සඳහා ආධාර සහ අනුබල දීම සම්බන්ධයෙන් ඊයේ දිනයේ අත්අඩංගුවට ගනු ලැබුවා. අපි පොලිස් නිලධාරියෙක් ද, හමුදා නිලධාරියෙක් ද, අපරාධකරුවෙක්ද කියන පදනමකින් තොරව -කිසිදු භේදයකින් තොරව- ඕනෑම සිද්ධියකට සම්බන්ධ ඕනෑම කෙනෙක් අත්අඩංගුවට ගැනීමට පසුබට වන්නේ නැහැ.

ඒ අනුව මෙම පොලිස් නිලධාරියා ඊයේ දිනයේදී අත්අඩංගුවට ගනු ලැබුවා. අපරාධයෙන් පසුව අධිකරණ භූමියෙන් පලා ගිය වෙඩික්කරු "පික්මී" කුලී ගමන් ත්‍රිරෝද රථයක නැඟී ගමන් කර ඇති අතර, කඩොල්කැලේ හන්දිය අසලට ගොස් නිල් පැහැති ත්‍රිරෝද රථයක නැඟ ගොස් කොච්චිකඩේ, රිදීවැල්ල මාර්ගයේ නැවතී සිට ඇති අතර, සැකකරු අපරාධය සිදු කරන අවස්ථාවේ ඇඳ සිටි ඇඳුම් බෑගය පාළු ස්ථානයකට විසිකර තිබියදී ඉහත භාරයට ගෙන තිබෙනවා. මෙම සැකකරු සිටින ස්ථානයට ඉහත සැකකාරිය වෙනත් ත්‍රිරෝද රථයකින් පැමිණ ඇති අතර, ඒ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු අනාවරණය කරමින් විමර්ශන කටයුතු සිදුවෙමින් පවතිනවා.

[ගරු ආනන්ද විජේපාල මහතා]

මෙම වෙඩික්කරු 2019.12.12 දින ශ්‍රී ලංකා යුද හමුදාවේ තුන්වන කමාන්ඩෝ රෙජිමේන්තුව වෙත බැඳී, සෙබල අංක 559189 යටතේ රාජකාරි කර 2024 මැයි මාසයේදී පොදු සමාව යටතේ ඉන් ඉවත්ව සිටි බව සඳහන් වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් කරුණු තහවුරු කර ගැනීම සඳහා පනාගොඩ යුද හමුදා වැටුප් හා ලේඛන අංශයට වාර්තාව යොමු කරලා තිබෙනවා. අත්අඩංගුවට ගන්නා ලද අංක NW PE 5293 දරන KDH වෑන් රථය පරීක්ෂා කිරීමේදී එහි තිබී වාහන සේවා කිරීමට අදාළ බිල්පතක් හමු වී තිබෙනවා. එම බිල්පතේ අංක PF 7824 යනුවෙන් සඳහන් වෙලා තිබෙනවා. ඒ අනුව එහි හිමිකාරිත්වය සම්බන්ධයෙන් කරුණු තහවුරු කර ගැනීමට විමර්ශන පවත්වමින් තිබෙනවා. ඒ අනුව භාරයට ගත් වෑන් රථයේ එන්ජින් අංකයට සහ චැසි අංකයට අදාළව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුවෙන් පරීක්ෂා කිරීමේදී ඊට අදාළ නිවැරදි ලියාපදිංචි අංකය වෑන් රථය තුළ තිබූ රිසිට් පතේ සඳහන් PF 7824 දරන අංකය බවට අනාවරණය කර ගන්නා ලද අතර, වෑන් රථයේ සවි කර ඇති අංක NW PE 5293 දරන අංක තහඩුව ව්‍යාජ එකක් බවට අනාවරණය වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, අපරාධය සිදු කිරීමට පෙර වෙඩික්කරු සහ ඔහු සමඟ පැමිණි කාන්තාව ලැගුම් ගෙන සිටි කඩුවෙල පිහිටි ලැගුම්හලක් පරීක්ෂා කළා. එහි කාමරයක් වෙත නුගේගොඩ අපරාධ ස්ථානයේ පරීක්ෂණ නිලධාරින් ගොස් ඇඟිලි සටහන් පරීක්ෂක කැඳවා එම ස්ථානය නිලධාරින්ගේ පරීක්ෂාවට ලක් කරලා තිබෙනවා. ලැගුම්හලේ CCTV දර්ශන පරීක්ෂා කිරීමේදී සැකකරු සහ සැකකාරිය අපරාධ ස්ථානයට රැගෙන ඒමට භාවිත කරන ලද හොන්ඩා පිට් වර්ගයේ සුදු පැහැති කාර් රථයේ ලියාපදිංචි අංකය WP CAC 8711 බවට අනාවරණය වෙලා තිබෙනවා. මේ වෙනකොට එම කාර් රථය නඩු භාණ්ඩයක් වශයෙන් භාරයට ගෙන තිබෙනවා. එහි ලියාපදිංචි අංකයේ නිවැරදිතාව සහ හිමිකාරිත්වය සම්බන්ධයෙන් අනාවරණය කර ගැනීමට වැඩිදුර පරීක්ෂණ පවත්වනවා. අපරාධයට පෙර දින ඉහත කාර් රථයෙන් පැමිණි අයෙකු විසින් මෙම ලැගුම්හලේ සිටි සැකකරුට සහ සැකකාරියට පාර්සලයක් ලබා දී ඇති බවත්, එම අපරාධයට යොදා ගත් ගිනි අවිය සහ සැකකරු අපරාධය සිදු කිරීමට ඇඳ සිටි නීතිඥයකුගේ ඇඳුමට සමාන ඇඳුමද එහි අඩංගුව තිබී ඇති බවත් සැකකරුගේ ප්‍රකාශ සහ මඟ පෙන්වීම යටතේ අනාවරණය කරගෙන තිබෙනවා.

අපරාධය සිදු වුණු අවස්ථාවේ අධිකරණ භූමියේ අංක 5 මහේස්ත්‍රාත් අධිකරණයේ රාජකාරියේ නිරතව සිටි පොලිස් නිලධාරින්, අධිකරණ කටයුතු සඳහා පැමිණි පොලිස් නිලධාරින්, අධිකරණයේ සේවය කරන නිලධාරින් සහ නීතිඥයන් සහ අධිකරණයේ ප්‍රධාන දොරටුවේ ආරක්ෂක රාජකාරි සඳහා යොදවා සිටි පෞද්ගලික ආරක්ෂක අංශයේ නිලධාරින්ගේ ප්‍රකාශ මේ වනකොට සටහන් කරගෙන තිබෙනවා. ඒ වාගේම මේ සිද්ධිය සම්බන්ධයෙන් තවත් පුද්ගලයන් කිහිප දෙනෙකුගේ ප්‍රකාශ සටහන් කර ගැනීමට අවශ්‍යව තිබෙනවා.

වෙඩි තැබීමෙන් මිය ගිය සංජීව කුමාර සමරරත්න නොහොත් "ගනේමුල්ලේ සංජීව" යන අයගේ පශ්චාත් මරණ පරීක්ෂණය කොළඹ අධිකරණ වෛද්‍ය නිලධාරි කාර්යාලයේදී සහකාර අධිකරණ වෛද්‍ය නිලධාරි දූලංග බලල්ල මහතා විසින් 2025.02.20 දින, එනම් ඊයේ දින සිදු කෙරුවා. මෘත දේහය මරණකරුගේ මව වන අංක 141/ඩී, මාකිලංගමුව, ගනේමුල්ල යන ලිපිනයේ පදිංචි ඇලන් නෝනා මෙන්ඩිස් යන අයට භාර දීමට කටයුතු කර තිබෙනවා. ඒ අනුව දැනට සැකකරුවන් රැඳවුම් නියෝග මත රඳවා ගෙන තවදුරටත් විමර්ශනය කරමින් පවතිනවා. මෙම වාර්තාව පොලිස්පතිතුමන් විසින් මා වෙත ඉදිරිපත් කර තිබුණා.

ඒ වාගේම මිද්දෙනිය සිද්ධියේ සැකකරුවනුත් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. එම සැකකරුවන් අතරත් පොලිස් නිලධාරියෙක් සිටින බව පැහැදිලි වෙලා තිබෙනවා. ඊයේ දිනයේදී ගරු ජනාධිපතිතුමා උපදේශක කාරක සභාවේදී අවධාරණය කළා වාගේම මේ පාතාල ක්‍රියාකාරකම් සඳහා සමහර රාජ්‍ය ආයතනවල අනුග්‍රහය ලැබෙන බවත් පැහැදිලියි. විශේෂයෙන්ම පොලීසියේ. පොලීසිය භාර, එහෙම නැත්නම් මහජන ආරක්ෂක ඇමතිවරයා හැටියට මා ඒ පිළිබඳව දැඩි අවධානය යොමු කර තිබෙනවා. ඒ පිළිබඳව තීන්දු තීරණ අරගෙනත් තිබෙනවා. ඉදිරියටත් එවැනි තීන්දු තීරණ ගන්න බලාපොරොත්තු වෙනවා. ඒ නිසා මම මේ ගරු සභාවට කියන්න කැමැතියි, කිසි ලෙසකින් -බිඳකින්- හෝ මේ රටේ ජාතික ආරක්ෂාවට බාධාවක් වෙන්න අපි ඉඩකඩ තබන්නේ නැති බව. මේවා තැන තැන සිදු වන පාතාල ක්‍රියාකාරකම් හැටියට සහ සංවිධානාත්මක අපරාධකරුවන්ගේ අපරාධ හැටියට තමයි අපි හඳුනාගෙන තිබෙන්නේ. ඒවා මර්දනය කිරීමට අවශ්‍ය සෑම වැඩ පිළිවෙළක්ම මේ ආණ්ඩුව ඉදිරියේදී ගන්නා බවත්, මේ වෙනකොටත් බොහෝ ක්‍රියාමාර්ග ගෙන තිබෙන බවත් මා සඳහන් කරන්න කැමැතියි. එම විමර්ශනවලට බාධා වෙන නිසා ඒ සමහර දේවල් මේ සභාවට ප්‍රකාශ කරන්න අපහසුයි. එහෙත් එම විමර්ශනවල ප්‍රගතිය වරින් වර ඔබතුමන්ලාට; මේ ගරු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න අදහස් කරනවා, ගරු කථානායකතුමනි.

බොහොම ස්තුතියි.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ගරු කථානායකතුමනි, -

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ගරු කථානායකතුමනි, එම පැහැදිලි කිරීම සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා කෙසේ කිව්වත් ජාතික ආරක්ෂාව පිළිබඳව ලොකු ගැටලුවක් මේ රටේ ජනතාවට තිබෙනවා. මොකද, දිගින් දිගටම ඇති වන මේ තත්ත්වය නිසා.

කෙසේ වෙතත්, ඔබතුමා පැහැදිලි කළා, මේක අද ඊයේ වෙච්ච දෙයක් නොවෙයි, දිගින් දිගටම වෙච්ච දෙයක් කියලා. ඔව්. හැබැයි, ඔබතුමා ඒ අතරතුර චෝදනාවකුත් එල්ල කළා, පසුගිය රජයන් නියෝජනය කරපු දේශපාලනඥයන් මේවාට සම්බන්ධයි කියලා. ඒ ප්‍රකාශය පොදුවේ කිරීමේදී අපි හැමෝටම ඇඟිල්ල දිගු වෙනවා. එම නිසා ඔබතුමා ඉතා පැහැදිලිව කියන්න, පසුගිය රජයන් නියෝජනය කරපු ඒ දේශපාලනඥයන් කවුද, ඔවුන්ට පාතාලයත් එක්ක තිබෙන සම්බන්ධය මොකක්ද කියලා.

ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, මේ සිද්ධියත් එක්ක මත් ද්‍රව්‍යවල සම්බන්ධතාවක් තිබෙනවා කියලා. ඒ කාරණාවලට සම්බන්ධ වෙලා තිබෙන දේශපාලනඥයන් නීතිය හමුවට ගෙනැල්ලා කරුණාකරලා අපි හැමෝටම සාධාරණයක් ඉටු කරන්න. ඔබතුමන්ලා හැම දේකටම පසුගිය අවුරුදු 75ක, 76ක කාලයේ පැවති ආණ්ඩුවල වෙච්ච සිදුවීම් කියලා කිව්වාට, ඒක හේතුවක් කරගන්න එපා අනාගතයේ වෙන දේවල්වලට. ඔබතුමන්ලා අතීතයට චෝදනා කරන එක නතර කරලා, මේවාට මැදිහත් වෙලා ඉන්න දේශපාලන අධිකාරිය කවුද කියන එක ඉතාම පැහැදිලිව මේ රටට ප්‍රකාශ කරලා, ඒ අය සම්බන්ධව නීතිය ක්‍රියාත්මක කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, මේ සිදුවීමේ බරපතළකම, බැරෑරුම්සහගතභාවය අපි තේරුම් ගෙන තිබෙනවා. ඒ ගැන අපි පරීක්ෂණ කරගෙන යන බව ගරු ඇමතිතුමාගේ ප්‍රකාශයෙන් තහවුරු වුණා. අමාත්‍යවරයා ඒ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට කරුණු ඉදිරිපත් කළා. අමාත්‍යතුමාගේ ප්‍රකාශය සම්බන්ධයෙන් මේ වෙලාවේ වාදයකට යන්න බැහැ. ගරු මන්ත්‍රීවරුනි, ඔබතුමන්ලා points of Order මතු කරනවා නම් ඒ කුමන කාරණයටද කියලා පැහැදිලි කරන්න. එහෙම නැතිව මේක වාදයක් කරගන්න බැහැ. ඔබතුමන්ලාට මේ ගැන කරුණු ඉදිරිපත් කරන්න අවස්ථාව තිබෙනවා. ඒ නිසා ඒ පාර්ලිමේන්තු සම්ප්‍රදායයන් අනුගමනය කරන්න කියා මම ඉල්ලා සිටිනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි,-

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු චාමර සම්පත් දසනායක මැතිතුමා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගරු කථානායකතුමනි, පොලීසිය භාර ඇමතිතුමාගෙන් තමයි මම මේ කාරණය අහන්නේ. පොලිස් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් ඒ සිද්ධියට අදාළ අපරාධකරු පැය 8ක් තුළ දක්ෂ ලෙස අත්අඩංගුවට ගැනීම ගැන අපි සතුටු වෙනවා. හැබැයි, සිද්ධියට සම්බන්ධ කාන්තාව තවම අත්අඩංගුවට අරගෙන නැහැ. කාන්තාවයි, වෙඩික්කරුයි මීගමුවට ගිහිල්ලා තිබෙනවා. ඊට පස්සේ දෙන්නා බෙදිලා ගිහින් -කාන්තාව අයින් වෙලා, වෙඩික්කරු තමයි ගියේ- තිබෙනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමා මෙහෙම කිව්වාට ඊයේ රාත්‍රි ප්‍රවෘත්තිවලදී කිව්වා, ඩුබායිවල ඉඳන් කෙනෙක් වෙඩික්කරු පාවාදුන් හින්දා තමයි ඔහු ඇල්លුවේ කියලා. වෙඩික්කරු ඇල්ලුවේ අපේ ආරක්ෂක අංශවල දක්ෂකමට නොවෙයි. ඩුබායිවල ඉන්න පාතාලයේම කෙනෙකු ඔහුව පාවා දුන්නා කිව්වා. ඒක ගැන මම දන්නේ නැහැ. හැබැයි, ඩුබායිවල ඉන්න කෙනාගේ දක්ෂතාවෙන් මේ අත්අඩංගුවට ගැනීම වුණා කියලායි මාධ්‍යයෙන් කියන්නේ. එතකොට අපේ ආරක්ෂක අංශවල දක්ෂතාවෙන් නොවෙයි, ඩුබායිවල ඉන්න අයගේ දක්ෂතාවෙන් තමයි ඒ වෙඩික්කරු අල්ලාගෙන තිබෙන්නේ. ඒක තමයි කියන්නේ. හැබැයි, තවමත් ඒ කාන්තාව අල්ලා ගන්න බැරි වුණා නේ.

ඊළඟ කාරණය මෙයයි. මොන දේ කළත් ෆොටෝ දාලා සැකකරු රටට වීරයෙක් කළා නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, point of Order එකට අදාළව කථා කරන්න.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගරු ඇමතිතුමනි, ෆොටෝ දමන්න දෙන්න එපා. ෆොටෝ දමන්න දෙන්නේ නැතුව පොඩ්ඩක් ඒ ගැන සොයා බලන්න කියන්න. දැක්කාද? එයා අත්අඩංගුවට ගත්ත ගමන්ම නිකම් "ලව්" කරනවා වාගේ ෆොටෝ දාලා තිබෙනවා. ඒවා වැරැදියි. කවුද එහෙම දමන්නේ? අනික, එච්චර ලොකු අපරාධකාරයෙක්! ඒ ෆොටෝවලින් අපි දැක්කා, "ලව්" කරනවා වාගේ නේ වෑන් එක ඇතුළේ ඒ පුද්ගලයා හිටියේ. ඒකාව නිකම් වීරයෙක් කළා. එහෙම කරන්න එපා කියන්න. ඒ ගැන ඔබතුමා පරීක්ෂණයක් පවත්වන්න.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

ගරු කථානායකතුමනි, සමහර ඡායාරූප මාධ්‍යයට එන්නේ AI තාක්ෂණය ඔස්සේ. ඒවා පිළිබඳව පොඩ්ඩක් අවබෝධ කර ගන්න අවශ්‍යයි. මාධ්‍යයේ යන හැම එකකින්ම සත්‍ය දේ කියැවෙනවා වෙනවා කියලා අදහස් කරගෙන, මේ පාර්ලිමේන්තුවට ඒවා කියන්න එපා. ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමනි, AI තාක්ෂණය පිළිබඳව ටිකක් අවබෝධ කරගන්න.

ඒ වාගේම ගරු මන්ත්‍රීතුමන්ලා ප්‍රකාශ කළා, විපක්ෂයේ දේශපාලන පක්ෂ ගැන මම කිව්වා කියලා. මම කිව්වේ, සමහර දේශපාලනඥයෝ කියලායි. මීද්දෙනියේ සිද්ධිය සම්බන්ධව ඕනෑ තරම් තොරතුරු සමාජ මාධ්‍යවල සංසරණය වෙනවා. ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමාට ඒ සමහර තොරතුරු ලැබිලාත් ඇති. මම දන්නේ නැහැ, ඒවා කොහොමද ලැබුණේ කියලා. මාධ්‍යවල යන හැම තොරතුරක්ම සත්‍යයි කියලා මට මේ වෙලාවේ ප්‍රකාශ කරන්න බැහැ. අපි මේ තොරතුරු කිව්වේ, පොලීසියේ විමර්ශන ආශ්‍රයෙනුයි.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ප්‍රවෘත්තිවලට කිව්වේ.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

ප්‍රවෘත්තිවල කියන හැම දෙයක් පිළිබඳවම අපට වගකීමක් නැහැ. ඔබතුමාට වගකීමක් ඇති. ඒක මම දන්නේ නැහැ. මම වගකීමක් ඇතිවයි මගේ ප්‍රකාශය කළේ. *[බාධා කිරීමක්]* ඒ නිසා කාන්තාවක්ද, පිරිමියෙක්ද කියලා නැහැ, පොලිස් නිලධාරීන් ඒ සියලුදෙනා අත්අඩංගුවට ගන්නවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට අවශ්‍ය නම් ඉදිරියේදී වැඩිදුර තොරතුරු බලාගන්න පුළුවන්. අවශ්‍ය නම් අපට සතිපතා ඒ විමර්ශන පිළිබඳ තොරතුරු ලබා දෙන්නත් පුළුවන්. ඒ නිසා පොලීසිය ගන්නා ක්‍රියාමාර්ග ලඝු කරන්නවත්, ඒවා අවතක්සේරු කරන්නවත් ඔය වාගේ ප්‍රකාශ කරන්න එපා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මම කිව්වේ මාධ්‍යයේ ගිය තොරතුරු.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
මාධ්‍යයේ බොහෝ දේ යනවා. Social mediaවලත් තව බොහෝ දේ යනවා නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, අපට පෙරවරු 10.30ට ප්‍රධාන වැඩකටයුතු ආරම්භ කරන්න තිබෙනවා. මේ සිද්ධිය පිළිබඳව ගරු ඇමතිතුමා ප්‍රකාශයක් කළා. ගරු මන්ත්‍රීවරුන් දෙදෙනෙකුත් දැනට ඒ සම්බන්ධයෙන් මැදිහත් වී තිබෙනවා. අනෙක් එක, මේක අපරාධයක් සම්බන්ධයෙන් පවත්වන පරීක්ෂණයක්. ඒ නිසා අනවශ්‍ය ලෙස හෙළිදරව් කර ගන්න හදන මේ සමහර කරුණුවලින් ඒ පරීක්ෂණයට අනවශ්‍ය බාධා ඇති වෙන්න පුළුවන්. ඊට අමතරව, පාර්ලිමේන්තුවේ ප්‍රධාන වැඩකටයුතු ආරම්භ කිරීමේ අවශ්‍යතාවත් තිබෙනවා. ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් කථා කරන්න ඔබතුමා ගරු මන්ත්‍රීවරුන් දෙදෙනෙකුට අවස්ථාව ලබා දුන්නා. අපි ආණ්ඩුව වශයෙන් ඉල්ලා සිටිනවා, කරුණාකරලා සභාවේ ප්‍රධාන වැඩකටයුතු ආරම්භ කරන්න කියලා. මොකද, අනෙක් කටයුතු සියල්ල මේ නිසා ප්‍රමාද වෙනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 92(2)(ආ) යටතේ මම බොහොම වැදගත් කාරණයක් මේ මතු කරන්නේ. මට විනාඩියක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක ඉදිරිපත් කරන්නේ මොන ස්ථාවර නියෝගය යටතේද?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ස්ථාවර නියෝග 92(2)(ආ) යටතේ.

ගරු කථානායකතුමනි, මම විශේෂයෙන්ම ගරු ඇමතිතුමාගෙන් අහන්නේ කරුණු දෙකක්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු මන්ත්‍රීතුමා, ස්ථාවර නියෝග 92(2) (ආ) මොකක්ද කියන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට කරුණු දෙකක් අහන්න තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා කියන්න, ස්ථාවර නියෝග 92(2)(ආ)හි සඳහන් වෙන්නේ මොකක්ද කියලා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමා ස්ථාවර නියෝග 92(2)(ආ) යටතේ සඳහන් වෙන්නේ මොකක්ද කියලා කියන්න. පාසල් දරුවෝත් ගැලරියේ ඉන්නවා. ඒ අයටත් අහගන්න පුළුවන්.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඒක තමයි මම මේ කියන්නේ, 92(2)(ආ) යටතේ. විනාඩියක් අපිට කථා කරන්න ඉඩ තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ. නැහැ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මේක වැදගත් කාරණයක්. මම ගරු ඇමතිතුමාගෙන් අහන්න කැමතියි, මේ නීතිඥයා,- *[බාධා කිරීමක්]* ඊයේ අනුරාධ ජයරත්න මැතිතුමා මේ සම්බන්ධව,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ස්ථාවර නියෝග 92 (ආ)හි තිබෙන්නේ,-

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 92(2)හි තිබෙන්නේ රීති ප්‍රශ්න සම්බන්ධයෙන්. රීති ප්‍රශ්නයක් යටතේ මට මේ කාරණය අහන්නත් බැරි නම් ඉතින් වැඩක් නැහැ නේ. මම කියන්නේ ඔබතුමාට,-

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
හොඳයි, ඔබතුමා එය කියවන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔබතුමා කියවා ගන්න. මම ගරු ඇමතිතුමාගෙන් වැදගත් ප්‍රශ්නයක් අහන්නේ, නීතිඥවරයෙක් විධියට.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මම එය කියවන්නම්. "රීති ප්‍රශ්නයක් මතු කිරීමේදී,...-

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 92(2)(ආ) යටතේ මෙසේ සඳහන් වෙනවා:

> "රීති ප්‍රශ්නයක් මතු කිරීමේ දී, මන්ත්‍රීවරයෙකුට මිනිත්තු එකකට වඩා කථා කරනු ලැබිය නොහැකි අතර සැලකිල්ලට භාජනය කරනු ලබමින් තිබෙන ප්‍රශ්නයක් පිළිබඳව කථා කරනු ලැබිය නොහැකි වන්නේ ය."

ඊළඟට, ස්ථාවර නියෝග 92(2)(අ) යටතේ සඳහන් වන කාරණයත් මම කියන්නම්.

එහි මෙසේ සඳහන් වෙනවා:

> "ඡන්දයක් ප්‍රකාශ කිරීමට බෙදීමක් පවතින විටක දී හැර පාර්ලිමේන්තුවේ කවර හෝ කටයුත්තක දී නිවැරදි ක්‍රමවේද අනුගමනය කරනු ලැබ තිබේ ද ...."

මම අහන්නේ ඒකයි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමා රීති ප්‍රශ්නය මතු කරන්නේ ස්ථාවර නියෝග 92(2)(අ) යටතේද, 92(2)(ආ) යටතේද?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඒ දෙකටම අදාළයි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මේ Standing Order එක මෙතුමා කථා කරන එකට විරුද්ධයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන එකට එය විරුද්ධයි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මේ Standing Order එක මෙතුමා කථා කරන එකට විරුද්ධයි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔබතුමා මට කියලා දෙන්න ඕනෑ නැහැ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
කවුරුත් කියන්න ඕනෑ නැහැ. මේ ස්ථාවර නියෝග පොත තිබෙනවා නේ. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේදී යෝජනා.

## පාර්ලිමේන්තුවේ කටයුතු
## பாராளுமன்ற அலுவல்
## BUSINESS OF THE PARLIAMENT

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(5)හි විධිවිධාන ප්‍රකාරව, 2025 පෙබරවාරි 27 බ්‍රහස්පතින්දා, 28 සිකුරාදා සහ 2025 මාර්තු 01 සෙනසුරාදා, 03 සඳුදා, 04 අඟහරුවාදා, 05 බදාදා, 06 බ්‍රහස්පතින්දා, 07 සිකුරාදා, 08 සෙනසුරාදා, 10 සඳුදා, 11 අඟහරුවාදා, 12 බදාදා, 14 සිකුරාදා, 15 සෙනසුරාදා, 17 සඳුදා, 18 අඟහරුවාදා, 19 බදාදා, 20 බ්‍රහස්පතින්දා සහ 21 සිකුරාදා "විසර්ජන" පනත් කෙටුම්පත (2025) සලකා බැලීම සඳහා වෙන් කළ දිනයන් විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(2)හි විධිවිධාන ප්‍රකාරව, "විසර්ජන" පනත් කෙටුම්පත (2025) සලකා බැලීම සඳහා 2025 පෙබරවාරි 27 බ්‍රහස්පතින්දා සහ 2025 මාර්තු 01 සෙනසුරාදා, 03 සඳුදා සිට 06 බ්‍රහස්පතින්දා දක්වා, 08 සෙනසුරාදා, 10 සඳුදා සිට 12 බදාදා දක්වා, 15 සෙනසුරාදා සහ 17 සඳුදා සිට 20 බ්‍රහස්පතින්දා දක්වා යන වෙන් කළ දිනයන්හි පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද අ.භා. 1.00 සිට අ.භා. 6.30 දක්වා ද විය යුතු ය. අ.භා. 6.00 ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) සහ (6) ඡේදවල විධිවිධාන ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 6.30 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## II

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(2)හි විධිවිධාන ප්‍රකාරව, "විසර්ජන" පනත් කෙටුම්පත (2025) සලකා බැලීම සඳහා 2025 පෙබරවාරි 28 සිකුරාදා, 2025 මාර්තු 07 සිකුරාදා සහ 14 සිකුරාදා යන වෙන් කළ දිනයන්හි රැස්වීම පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.30 සිට අ.භා. 6.30 දක්වා ද විය යුතු ය. අ.භා. 6.00 ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) සහ (6) ඡේදවල විධිවිධාන ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 6.30 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## III

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(2)හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, "විසර්ජන" පනත් කෙටුම්පත (2025) සලකා බැලීම සඳහා 2025 මාර්තු 21 සිකුරාදා වෙන් කළ දිනයෙහි පාර්ලිමේන්තු රැස්වීම පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද අ.භා. 1.30 සිට අ.භා. 6.00 දක්වා ද විය යුතු ය. අ.භා. 6.00ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

න්‍යාය පත්‍රයේ විෂය අංක 1. විසර්ජන පනත් කෙටුම්පත 2025, දෙවන වර කියවීම. සිව්වැනි වෙන් කළ දිනය.

# විසර්ජන පනත් කෙටුම්පත, 2025
## ஒதுக்கீட்டுச் சட்டமூலம், 2025
## APPROPRIATION BILL, 2025

***කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී.***
***ඊට අදාළ ප්‍රශ්නය - [පෙබරවාරි 17]***
***"පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතු ය".- [ගරු අනුර කුමාර දිසානායක මහතා]***
***ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.***
*ஒத்திவைக்கப்பட்ட விவாதம் மீளத் தொடங்குதற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*சம்பந்தப்பட்ட வினா - [பெப்ருவரி 17]*
*"சட்டமூலம் இப்பொழுது இரண்டாம்முறை மதிப்பிடப்படுமாக" .- [மாண்புமிகு அநுர குமார திஸாநாயக்க]*
*வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.*
*Order read for resuming Adjourned Debate on Question - [17th February]*
*"That the Bill be now read a Second time".- [The Hon. Anura Kumara Dissanayake]*
*Question again proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

විවාදය ආරම්භ කිරීම, විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා. ඔබතුමාට විනාඩි 45ක කාලයක් ලැබෙනවා.

[පූ.භා. 10.40]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, 2025 අය වැය පිළිබඳව සාකච්ඡා කරන මේ අවස්ථාවේ විශේෂයෙන්ම මේ අය වැය තුළින් රටට ලබා දිය යුතු විසඳුම පිළිබඳව විශ්ලේෂණයක් කරනකොට ඉතාම වැදගත් වෙනවා, මෙවන් අය වැයක් ක්‍රියාත්මක කරන්නට ලැබුණු වරම සහ ඒ වරම ක්‍රියාත්මක කිරීම පිළිබඳව සන්සන්දනයක් කිරීම. "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්; රට අනුරට" කියන මේවා යටතේ තමයි තමයි එදා ජන වරමට ඉදිරිපත් කරපු ප්‍රතිපත්ති මාලාව සැකසුණේ.

අපි බලන්න ඕනෑ, මේ ප්‍රතිපත්ති මාලාවේ තිබෙන ඒ ගුණාංගයන්, කර්තව්‍යයන් 2025 අය වැය කථාවේ කොතෙක් දුරට අඩංගු වී තිබෙනවාද කියන කාරණාවයි. විශේෂයෙන්ම අය වැය ගැන කථා කරනකොට, මේ අය වැයේ රාමුව දිහා බැලුවොත්; නිර්මාතෘත්වය දිහා බැලුවොත්; ඉදිරිපත් කිරීම දිහා බැලුවොත්; එළිදැක්වීම දිහා බැලුවොත් ඉතාම පැහැදිලියි, පොරොන්දු වුණු ආකාරයට, ලබා ගත්ත වරමට සරිලන ආකාරයට මේ අය වැය නිර්මාණය වෙලා නැහැ කියන එක. ඒක තමයි අපේ අදහස. මම කැමැතියි, ඒ තර්කය සාක්ෂි සහිතව, දත්ත සහිතව ඔප්පු කරන්න.

විශේෂයෙන්ම මේ "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති මාලාවේ 105වැනි පිටුවේ තිබෙනවා, වත්මන් රජය බලයට පත් වනකොට විකල්ප ණය තිරසරකරණ විශ්ලේෂණයක් පිළියෙල කිරීම පිළිබඳව. ඉංග්‍රීසියෙන් කියනවා නම්, Alternative Debt Sustainability Analysis. ඒ පොරොන්දුව සහමුලින්ම බැහැර කරලා මොකක්ද අද සිදු වෙලා තිබෙන්නේ? අද සිදු වෙලා තිබෙන්නේ ජනතාව මත අසීමිත පීඩනයක් පටවන; අසහනයක් පටවන; ජනතාවට ලබා දිය යුතු ප්‍රතිලාභ සීමා කෙරෙන තත්ත්වයක් ඇති කර තිබීම. 2024 රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතට අනුව ප්‍රාථමික වියදම් දළ දේශීය නිෂ්පාදිතයේ කොටසක් හැටියට සියයට 13ට සීමා කරලා, ප්‍රාථමික ශේෂය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.3කට සීමා කරලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, විශ්ලේෂණයක් කරලා තිබෙනවා, ලෝකයේ රටවල් 106ක. රටවල් 10යි එහෙම සීමා කරලා තිබෙන්නේ. ඒ තමයි, ග්වාතමාලාව, ඉතියෝපියාව, ශ්‍රී ලංකාව, වෙනිසියුලාව, නයිජීරියාව, ඉරානය, යේමනය, බංග්ලාදේශය, ලෙබනනය, හයිටිය කියන රටවල්. එහෙම සීමා කරලා තිබෙන්නේ ඒ රටවල් ටික විතරයි. එතකොට දළ දේශීය නිෂ්පාදිතයේ කොටසක් හැටියට සියයට 13ක ප්‍රාථමික වියදම කියන්නේ රජයේ මැතිවරණ පොරොන්දුවක් නොවෙයි; දළ දේශීය නිෂ්පාදිතයේ කොටසක් හැටියට සියයට 2.3ක ප්‍රාථමික ශේෂය කියන්නේ මැතිවරණ පොරොන්දුවක් නොවෙයි. ඒක වරම ක්‍රියාත්මක කිරීමක් නොවෙයි.

ඒක ඇත්තවශයෙන්ම ඔබතුමන්ලා ලබපු වරම පාවාදීමක්. ඒ වරම සහමුලින්ම විනාශ කරලා, කියපු දේවල් ඔක්කෝම අමතක කරලා තිබෙනවා. අපි විශ්වාස කරන ආකාරයට ඒ IMF

එකඟතාව; ඒ ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර එකඟතාව දැඩි ලෙස පීඩාකාරී, අසහනකාරී ගිවිසුමක්. එයින් අපි කිසිසේත්ම අදහස් කරන්නේ නැහැ, මේ IMF වැඩ පිළිවෙළෙන් ඉවත් වෙන්න කියලා. ඒක නොවෙයි අපි අදහස් කරන්නේ. ජනතාවගේ පැත්තෙනුත් හිතලා බලලා වඩාත් ජනතාවාදී, මානුෂීයවාදී අලුත් ගමනකට ප්‍රවේශ වන්න තිබුණා.

දැන් මොකක්ද මේ සීමාවන් තුළ වෙන්නේ? මේ සීමාවන් තුළ බාහිරතාවලට අදාළ නිවැරදි කිරීම කරගන්න බැරි වෙනවා; you cannot correct the externalities. සමාජ පිරිවැයක් නිර්මාණය වෙනවා, ඒ සමාජ පිරිවැය මඟහරවා ගන්නට බැරි වෙනවා. Providing public goods will be impacted. රජයක වගකීමක් තමයි, පොදු භාණ්ඩ - public goods - සැපයීම. ඒකට මේ සීමාවන් බාධාවක් වෙනවා. ඒ වාගේම, සමාජමය පුනර් බෙදා හැරීමත් - social redistribution - වැළැක්වෙනවා.

ඕනෑ තරම් තිබෙනවා, ජාත්‍යන්තරව කරපු සමීක්ෂණ. ඒ හැම එකකින්ම පෙන්වලා දෙන්නේ මේ විධියට ප්‍රාථමික වියදම් සහ ප්‍රාථමික ශේෂය සීමා කරනකොට ඒක රටක දියුණුවට අගතිගාමී වෙනවා, ඍණාත්මක බලපෑමක් වෙනවා කියලායි. එදා කිව්වා, නැවත සාකච්ඡා කරනවා, - renegotiate කරනවා - අලුත් ගිවිසුමකට යනවා කියලා. ජනතාවගේ වරමෙන් බලය ලබාගත්ත වර්තමාන රජය ඒ ඔක්කෝම අමතක කරලා, ඒ ජනවරම සම්පූර්ණයෙන්ම පාවාදීලා තිබෙනවා කියන එක තමයි මට මේ අවස්ථාවේ කියන්න සිද්ධ වෙන්නේ. විශේෂයෙන්ම මේ අවස්ථාවේ වැදගත් වෙනවා, ජෝන් එෆ්. කෙනඩි ජනාධිපතිතුමා එක්තරා අවස්ථාවක කරපු ප්‍රකාශයක්: "The great enemy of the truth is very often not the lie, deliberate, contrived and dishonest, but the myth, persistent, persuasive and unrealistic". ඒ කියන්නේ, "සත්‍යයේ මහා සතුරා වනුයේ, බොහෝ විට සිතාමතා සැලසුම්සහගත සහ වංක ලෙස ප්‍රකාශ කරනු ලබන අසත්‍ය නොව, අඛණ්ඩව පවත්වන්නා වූ ඒත්තු ගැන්වීමේ හැකියාව සහිත යථාර්ථවාදී නොවන මිථ්‍යාව වේ" යන්නයි. මම හිතන විධියට එතුමාගේ ප්‍රකාශය අද දවසට විශේෂයෙන්ම වැදගත් වෙනවා.

දැන් අද සමාජයේ බොහෝදෙනා මැසිවිලි නඟනවා. වැටුප් වැඩිවීම තේරෙන්නේ නැහැ, වැටුප් වැඩි වුණේ කොච්චර ප්‍රමාණයකින්ද, වැටුප වැඩි වුණාද, දීමනාවලට මොකක්ද වෙන්නේ, දීමනා ටික කොහොමද හැඩ ගැහෙන්නේ කියන කරුණු ගැන සම්පූර්ණයෙන්ම ව්‍යාකූලත්වයක් නිර්මාණය වෙලා තිබෙනවා. මේ ව්‍යාකූලත්වය අපි තේරුම් ගන්නට ඕනෑ. මේ අය වැය සකස් වෙලා තිබෙන්නේ මේ සියයට 13ක ප්‍රාථමික වියදම් සීමාව තුළ, සියයට 2.3ක ප්‍රාථමික ශේෂය තුළ. ඇත්තවශයෙන්ම ඉතාම සොච්චම් ප්‍රමාණයක් තමයි ලැබිලා තිබෙන්නේ රට ගොඩනඟන්න, ජනතාවට ශක්තිය, රැකවරණය, ආරක්ෂාව ලබා දෙන්න.

මම මේ අවස්ථාවේ බොහොම පැහැදිලිව මේ කාරණය කියන්න කැමැතියි. අපි විටින් විට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නියෝජිතයින්ව හමු වුණා; පීටර් බෲවර් මැතිතුමාව හමු වුණා. මමත්, හර්ෂ ද සිල්වා මැතිතුමාත්, කබීර් හෂීම් මැතිතුමාත්, ඉරාන් වික්‍රමරත්න මැතිතුමාත්, අපේ තවත් ගරු මන්ත්‍රීවරුනුත්, ආර්ථික විශේෂඥයෝත් ඉතාම පැහැදිලිව කිව්වා, IMF එකත් එක්ක තමයි අපි වැඩ කරන්නේ, IMF වැඩ පිළිවෙළේ තමයි අපි යන්නේ, හැබැයි අපි කියන කියන පදයට නටන්න සූදානම් නැහැ කියලා. අපි පිළිගන්නවා, IMF වැඩසටහනක් තුළ අසහනය නිර්මාණය වෙනවා, පීඩනය නිර්මාණය වෙනවා, යම්කිසි පිරිවැයක් යනවා කියලා. ඒ අසහනය, පීඩනය පුළුවන් තරම් දුරකට අවම කරන්න ඕනෑ.

ඒක තුනී කරන්නට ඕනෑ. නමුත් මොකක්ද සිද්ධ වුණේ? ගරු ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා දසවැනි පාර්ලිමේන්තුවේ මංගල සැසිවාරය විවෘත කරමින් මොනවාද කිව්වේ? එතුමා අර වේදිකාවල කරපු ප්‍රකාශ ඔක්කෝම ටික අමතක කරලා, ජන පීඩනය, ජන දුක, ජන කඳුළ, ජන වේදනාව, ඒ අසීමිත පීඩනයන් තුළ තැළුණු, පොඩි වුණු ඒ ජන ජීවිතවල, ඒ දුෂ්කරතා, ඒ ගැටලු සියල්ල අමතක කරලා, 2024 නොවැම්බර් 21වැනි දා ජනාධිපතිතුමා විධියට කියනවා, "ඉතාම සියුම් හුයකින් එල්ලා තිබෙන ආර්ථිකයක් අප හමුවේ තිබෙන්නේ. මේ ආර්ථිකයට විශාල කම්පන ඔරොත්තු දෙන්නේ නැහැ" කියලා. එසේ කියලා එතුමා ගෙඩිය පිටින්ම බාර ගන්නවා රනිල් වික්‍රමසිංහ හිටපු ජනාධිපතිවරයා සාකච්ඡා කරපු ඒ ගිවිසුම. අපි දකිනවා, එක පැත්තකින් ඒක ජනවරම පාවාදීමක් හැටියට. තවත් පැත්තකින් රටේ ජනතාව ඇන්දවීමක්.

ඒ වාගේම එතුමා කථා කරනවා, අහිමි වුණු දශක පිළිබඳව. මේ ගත්ත තීන්දුවෙන් අපට දශක කීයක් අහිමි වෙයි ද කියලා පොඩ්ඩක් හිතලා බලන්න. රට වෙනුවෙන් අපට තිබුණා මීට වඩා වාසිදායක තීන්දුවක් ගන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි විශ්වාස කරනවා, ඓතිහාසික වරදක් සිදු වෙලා තිබෙනවා කියලා. ජනාධිපතිතුමා අහිමි වුණු දශක ගැන කථා කරනකොට මේ ගත්ත තීන්දු තුළ දශක කීයක් අපට අහිමි වෙයිද කියන එක ගැන පොඩ්ඩක් කල්පනා කර බලන්න. රට වෙනුවෙන් මීට වඩා වාසිදායක තීන්දුවක් ගන්නට තිබුණා. ජනතාවට වැඩි පීඩනය වෙනුවට අඩු පීඩනය; වැඩි අසහනය වෙනුවට යම් සහනයක්; මේ මහා ජනතා මැසිවිල්ලට යම් ප්‍රමාණයක විසඳුමක් ලබා දෙන්නට පුළුවන්කම තිබුණා. මේ ප්‍රාථමික ශේෂය, ප්‍රාථමික වියදම් පිළිබඳව රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා එකඟ වුණු අවබෝධතා බැහැර කරලා, වඩාත් මානුෂීය වැඩ පිළිවෙළකට ප්‍රවේශ වන්නට තිබුණා.

දැන් මම කැමැතියි, විශේෂයෙන්ම අපේ ගරු සභාවේ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාටත්, රටේ ජනතාවටත් අතිවැදගත් කාරණාවක් කියන්න. ජනාධිපතිතුමා මේ සභාවට ඇවිල්ලා අය වැය කථාවේදී බොහොම ස්ථිර ලෙස කිව්වා, "2028 වෙනකොට අපි සූදානම් ණය ගෙවන්න" කියලා. ඒක බොහොම හොඳයි. අපෙත් ප්‍රාර්ථනාව ඒ දේ කරන්නට පුළුවන් වෙන්න කියායි. ඒක අවංකවමයි කියන්නේ. මොකද, රට තුළ තවත් ව්‍යසනයක් නිර්මාණය කරලා, බලහුවමාරු කරන ඒ ගෝත්‍රික දේශපාලන සංස්කෘතිය අපි කිසිසේත්ම අනුමත කරන්නේ නැහැ. හැබැයි, මතක තබා ගන්න, 2028දී ණය ගෙවන්නට නම්, අනිවාර්යයෙන්ම ආර්ථික වර්ධනය ඉහළ මට්ටමකට ගෙන එන්නට ඕනෑ බව. ඒක

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

නැතිව ඒ කාර්යය කරන්න බැහැ. රාජ්‍ය ආදායම ඉහළ මට්ටමකට ගෙනෙන්නට ඕනෑ. ඒක නැතිව කරන්නටත් බැහැ. දැන් කවුරුත් නොකියන කාරණාවක් තිබෙනවා. ඒක මේ සභාවේත් වැඩිය කියන්නේ නැහැ, රටටත් කියන්නේ නැහැ, මේක හැමෝම හංගාගෙන ඉන්නවා. හැමෝම නොවෙයි, මේ දත්ත පිළිබඳව අවබෝධයක් තිබෙන අය මේක හංගාගෙන ඉන්නවා.

මෙන්න මේක පොඩ්ඩක් අහගන්න. 1975 ඉඳලා මේ දක්වා IMF ගිවිසුම් ක්‍රියාත්මක වුණු රටවල් 75ක් තිබෙනවා. මේ රටවල් 75න් සියයට 59කට අනිවාර්යයෙන්ම යන්න සිද්ධ වෙලා තිබෙනවා දෙවැනි, තුන්වැනි, හතරවැනි ණය ප්‍රතිව්‍යුහගතකරණ වැඩසටහන්වලට.

මේක කවුරුවත් කියන්නේ නැහැ. මේක රටේ ජනතාවට කියන්නේ නැහැ. එක ගිවිසුමකින්, එක ණය ප්‍රතිව්‍යුහගතකරණයකින් එම කටයුත්ත හරි ගිහිල්ලා තිබෙන්නේ රටවල් 75න් සියයට 41කට පමණයි. අපි අවංකවම ප්‍රාර්ථනා කරනවා, අපට ඒ සියයට 41 කොටසේ ඉන්න ලැබේවා කියලා; එනම්, ආපහු ණය ප්‍රතිව්‍යුහගතකරණයකට යන්නට සිදු නොවේවා කියලා. ඒ මොකද, එසේ කළොත් ඒක බරපතළ ආර්ථික විනාශයක් -ව්‍යසනයක්- බවට පත් වෙනවා. හැබැයි, අද දවසේත් ණය තිරසරකරණ - debt sustainability - රේඛාව දිහා බැලුවොත්, ඒ debt sustainability රේඛාවේ, ඒ curve එකේ අපේ රට ඉන්න ඕනෑ. නමුත්, අපේ රට එතැන නැහැ; එයින් බැහැරව ඉන්නේ. ඇයි, එයින් බැහැරව ඉන්නේ? අපේ රටට මීට වඩා ආර්ථික වර්ධන වේගයක් අවශ්‍යයි; මීට වඩා රාජ්‍ය ආදායම එකතු කර ගැනීම අවශ්‍යයි. එසේ නොකළහොත් ලැබෙන ඵල විපාකය රටත් දැන ගන්නට ඕනෑ. ඒ තමයි, තව ණය ප්‍රතිව්‍යුහගතකරණයකට යෑමට සිදු වීම. කරුණාකර කියන්න එපා, මම බිල්ලෙකු මවා පානවා කියලා. මේ තොරතුරු, කරුණු කාරණා අපට අනාවරණය වුණේ, වර්තමාන IMF ගිවිසුම නිර්මාණය කරන්නට, ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර නිර්මාණය කරන්නට පසුගිය රජයට අවසාන මොහොත වන තෙක් උපදෙස් දුන් කණ්ඩායමක් Chatham House Rules මත කරපු සාකච්ඡාවකට මමත් සහභාගි වුණු නිසා. අපට ඒ නම් ගම් කියන්නට බැහැ. නමුත්, ඒ සිදු වුණු දේවල් මම කියන්නම්. බැරි වෙලාවත් අපට ණය තිරසර කරන රේඛාවේ ඉන්න බැරි වුණොත් අපට යන්න වෙනවා, දෙවැනි තුන්වැනි හතරවැනි restructuring එකකට. එවැනි restructuring එකකට යන්න වුණොත් අපි ලොකු අමාරුවක වැටෙනවා. එසේ නොකරන්නට නම් අපි ආර්ථිකය වේගවත්ව වර්ධනය කරන්නට ඕනෑ, රාජ්‍ය ආදායම වැඩි කර ගන්නට ඕනෑ.

ඇත්තවශයෙන්ම අපේ රටේ දත්ත පිළිබඳව බරපතළ ගැටලුවක් තිබෙනවා. මම උදාහරණයක් පෙන්වන්නම්. ගරු ජනාධිපතිතුමා අය වැය කථාවේදී කිව්වා, 2025 වසරේ සියයට 5ක ආර්ථික වර්ධන වේගයක් ලබා ගන්නවා කියලා. බොහොම හොඳයි, ඒක ලබා ගන්න පුළුවන් නම්. හැබැයි, ජනාධිපතිතුමාගේ කථාවේම කියනවා, ලෝක බැංකුව සඳහන් කරන ආකාරයට අපේ රටේ දුප්පත්කම සියයට 25.9යි කියලා. මේවා, අය වැය කථාවේදී ජනාධිපතිතුමා ඉදිරිපත් කළ සංඛ්‍යාලේඛන. ජනාධිපතිතුමා කියනවා, 2025 වසරේ ආර්ථික වර්ධන වේගය සියයට 5ක් අපේක්ෂා කරනවා කියලා. ලෝක බැංකුව කියනවා, 2023දී දුප්පත්කම සියයට 25.9යි කියලා. හැබැයි අනුර කුමාර දිසානායක මැතිතුමනි, දරිද්‍රතාව පිළිබඳ ලෝක බැංකුවේ සංඛ්‍යාලේඛන පිළිගන්නා ගමන්ම පොඩ්ඩක් හොයලා බලන්න, ලෝක බැංකුව 2025දී අපේ රටේ ආර්ථික වර්ධන වේගය ගැන මොකක්ද කියන්නේ කියලා. ලෝක බැංකුව තමයි 2025 ජනවාරි මාසයේ ආර්ථික වර්ධන වේගය සියයට 3.5යි කියලා කියන්නේ. ඒකත් එක්ක තර්ක කරන්න බැහැ නේ. මොකද, අනුර කුමාර දිසානායක මැතිතුමා ලෝක බැංකුවේ සංඛ්‍යාලේඛන උපුටා දක්වමින් 2023දී දුප්පත්භාවය සියයට 25.9යි කියන එක පිළිගෙන තිබෙනවා. මම මේක පෙන්වන්න හදන්නේ ජනාධිපතිතුමාට සංඛ්‍යාලේඛන වැරදුණා වාගේ තර්කයක් ගොඩ නඟන්න නොවෙයි. ජනාධිපතිතුමා කියන ආකාරයට 2025දී ආර්ථික වර්ධන වේගය සියයට 5යි. ලෝක බැංකුව කියනවා, 2025දී -ජනවාරි මාසයේ පෙනෙන ආකාරයට- ආර්ථික වර්ධන වේගය සියයට 3.5යි කියලා. එහෙම කියන කොට ආර්ථික වර්ධන වේගයේ බරපතළ gap එකක් තිබෙනවා, විෂමතාවක් තිබෙනවා, ඌනතාවක් තිබෙනවා. ඒ gap එක bridge කර ගත්තේ නැත්නම් අපි ලොකු අමාරුවක වැටෙනවා. ඒ නිසා මෙය ලෙහෙසි පහසු දෙයක් නොවෙයි. අනිවාර්යයෙන් ශීඝ්‍ර ආර්ථික වර්ධනයකට රටක් හැටියට අපි යන්නට ඕනෑ. හැබැයි, ඒ යන ආකාරය මේ අය වැයේ නම් පැහැදිලිව සඳහන් වෙලා නැහැ කියන එක මම මේ අවස්ථාවේ කියන්න කැමැතියි.

අපි දළ දේශීය නිෂ්පාදිතය - GDP එක - වැඩි කර ගන්නට ඕනෑ. දැන් දළ දේශීය නිෂ්පාදිතය ගණනය කරන්නට expenditure approach එක තිබෙනවා, income approach එක තිබෙනවා, production approach එක තිබෙනවා. දැන් ඒ වැඩ පිළිවෙළ තුනම -වියදම් ක්‍රමවේදය, ආදායම් ක්‍රමවේදය, නිෂ්පාදන ක්‍රමවේදය- ගත්තොත්, මේ අය වැයෙන් පැහැදිලි කරලා නැහැ, 2028 ණය ටික ගෙවීම ආරම්භ කිරීම සඳහා අපි ඉහළ ආර්ථික වර්ධන වේගයක් නඩත්තු කරගෙන යන්නේ කොහොමද, ඉහළ ආර්ථික වර්ධන වේගයක් පවත්වාගෙන යන්නේ කොහොමද, රාජ්‍ය ආදායම වැඩි කර ගන්නේ කොහොමද කියලා. එම කාරණාව පිළිබඳව කිසිම පැහැදිලිතාවක් මේ අය වැයෙහි නැහැ. සංඛ්‍යාලේඛන නම් ගණනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. අප නම් දකින්නේ ඒවා ඔක්කෝම සුරංගනා කථා ලෙසයි. ඒවා යථාර්ථවාදී නැහැ. සංඛ්‍යාලේඛන ඉදිරිපත් කරන කොට අපි සත්‍යවාදී වෙන්නට ඕනෑ, යථාර්ථවාදී වෙන්නට ඕනෑ.

ප්‍රාථමික ශේෂය සහ ප්‍රාථමික වියදම් පිළිබඳව වැරදි එකඟතාවකට ආපු නිසා අද රටම මැසිවිලි නඟනවා. මම ඒ ගැන පැහැදිලි කර දුන්නා. වැටුප් වැඩි කිරීම් ගැන තේරුම් ගන්න බැහැ. එහි ව්‍යාකූලත්වයක් තිබෙන්නේ. ඒ ඒ ශ්‍රේණිවලට, ඒ ඒ තලවලට කොහොමද වැටුප ලැබෙන්නේ, මේ අවුරුද්දේ කීයක් හම්බ වෙනවා ද, ලබන අවුරුද්දේ කීයක් හම්බ වෙනවා ද, ඊළඟ අවුරුද්දේ කීයක් හම්බ වෙනවා ද, කොහොමද මේවා ගළපා ගන්නේ, වැටුපට අමුණලා ද, නැත්නම් එල්ලලා ද, එහෙම නැත්නම් මූලික වැටුපට දාලා ද කියලා හිතා ගන්න බැහැ. හැම තැනකම ව්‍යාකූලත්වයක් තිබෙන්නේ. සාමාන්‍යයෙන් අය වැය කථාව කියෙව්වාම රටේ සාමාන්‍ය ජනතාවට තේරෙන්න ඕනෑ, මොකක්ද මේ වෙන්නේ කියලා. මම විශේෂයෙන්ම වැටුප් ගැනයි මේ කියන්නේ. ඒ ගැන කිසිම පැහැදිලි කිරීමක් නැහැ. මම කියන්නේ, ශීඝ්‍ර ලෙස ආර්ථිකය වර්ධනය වන ආකාරය ගැන පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ, රාජ්‍ය ආදායම වැඩි කර ගන්නා ආකාරය පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ කියලායි.

ඒ වාගේම මම මේ ගරු සභාවට කියන්න කැමැතියි, IMF ගිවිසුමටයි, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ගිවිසුමටයි ප්‍රවේශ වෙලා තිබෙන්නේ scenarios කිහිපයක් මත පදනම්ව බව. අවශ්‍ය නම් ඔබතුමන්ලා ඒ ගැන මුදල් ඇමතිතුමාගෙන් හෝ නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අහන්න. මම හිතන විධියට scenarios 6ක් ද කොහේද තිබෙනවා. ඔබතුමන්ලා දන්නවා ද, මේ ගිවිසුම පදනම්

කර ගත් ඒ scenario එක සම්පූර්ණයෙන් වැරැදියි කියලා? ඒකයි අපි කිව්වේ, අලුත් negotiation එකකට යන්නට ඕනෑ කියලා; අලුත් සාකච්ඡාවකට යන්නට ඕනෑ කියලා. මොකද, මේ ගිවිසුම පදනම් කරගෙන හදපු මේ ක්‍රියාවලිය, ආර්ථික වර්ධන වේගයක් සපුරා ගන්නට බැරි යථාර්ථවාදී නොවන ඉලක්කයක් නිර්මාණය කර තිබෙනවා. රාජ්‍ය ආදායම පිළිබඳව යථාර්ථවාදී නොවන ඉලක්කයක් සඳහා තමයි එකඟතාවකට ඇවිල්ලා තිබෙන්නේ. ඒකට ප්‍රධානතම හේතුව තමයි, ඔබතුමන්ලාත් negotiate කර ගත්තේ දුර්වල ගිවිසුමක් සම්බන්ධයෙන් වීම. ඇත්ත වශයෙන්ම ඒක ගෙඩිය පිටින්ම භාරගෙන හිටපු ජනාධිපතිවරයාගේ අඩි පාරේ යන ගමනක් ක්‍රියාත්මක කර තිබෙනවා. ඒ නිසා මම මේ කාරණය ඔබතුමන්ලාට කියන්න ඕනෑ. ඇත්ත වශයෙන්ම ජනාධිපතිවරණ ජයග්‍රහණයත් එක්ක ජනාධිපතිතුමාගේ පාර්ශ්වය මන්ත්‍රීවරු 159දෙනෙක් පත් කර ගන්නා කාල වකවානුව දක්වා දළ වශයෙන් මාස දෙකක කාලයක් තිබුණා. ඒ මාස දෙකක කාලය තුළ IMF එකත් එක්ක සාකච්ඡා කරලා, ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර හිමියන් එක්ක සාකච්ඡා කරලා, "අපි අලුත් ආණ්ඩුවක්, අපි ආවේ ජනතා වරමකින්, දැන් පාර්ලිමේන්තු එතැනදීත් ජනතාවගේ හඬ ඉස්මතු වෙයි" කියලා, වහාම මේ ගිවිසුම් වෙනස් කරලා ජනතාව මත අඩු පීඩනයක්, වැඩි සහනයක් සහ අඩු අසහනයක්, වැඩි ශක්තියක් ලබා දෙන අලුත් ගිවිසුමකට යන්න තිබුණා. දැන්වත් ඒක ගැන පොඩ්ඩක් හිතලා බලන්න කියලා මම කාරුණිකව ඉල්ලා සිටිනවා. දැනටත් ප්‍රමාද ද දන්නේ නැහැ. විස්තීර්ණ ණය පහසුකම - Extended Fund Facility එක - ගැනම හිතමින් ඉන්නේ නැතුව වහාම IMF එකත් එක්ක සාකච්ඡා කරන්න. මොකද, මේ ආර්ථික වර්ධන ඉලක්ක යථාර්ථවාදී නැහැ, රාජ්‍ය ආදායම් ඉලක්ක යථාර්ථවාදී නැහැ, ප්‍රාථමික ශේෂය, ප්‍රාථමිකමැතිවරණයකුත් පැවැත්වෙනවා, වියදම් පිළිබඳ ඉලක්ක යථාර්ථවාදී නැහැ. ඔබතුමන්ලා දන්නවා ද, අර සාකච්ඡාවේදී මේ ගිවිසුමට උපදෙස් දුන් කණ්ඩායම මහා භයානක කථාවක් කිව්වා.

ඒ තමයි, 2028දී ණය ගෙවන්න ඉස්සෙල්ලා අපේ රටට සිද්ධ වෙයි දෙවෙනි ණය ප්‍රතිව්‍යුහගතකරණයකට - second debt restructuring එකකට - යන්න. ඒක බරපතළ තත්ත්වයක්. ඒ නිසා මම රජය නියෝජනය කරන ගරු මන්ත්‍රීවරුන්ට, මන්ත්‍රීවරියන්ට, - ඒ කණ්ඩායමට - යෝජනා කරනවා, මේ පිළිබඳව හොඳට සාකච්ඡා කරලා බලන්න කියලා. මොකද, මේ යන්නේ බොහොම අමාරු තැනකට, මේ යන්නේ බොහොම වැරදි තැනකට. අපි මේ බිල්ලෝ මවනවා නොවෙයි. අපි මේ ඇත්ත කථාව කියන්නේ. මේ කථාව කියන්නේ IMF ගිවිසුම්, ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර ගිවිසුම් මේ විධියට නිර්මාණය කරන්න උපදෙස් දුන්නු කණ්ඩායම. ඇත්ත වශයෙන්ම අහගෙන ඉන්නකොට මම තිගැස්සුණා. ඇයි? ගිවිසුම අවසානය ගැන කථා කරලා මාස තුනක්වත් ගිහිල්ලා නැහැ, ඒගොල්ලන් ආපහු කියනවා ණය ප්‍රතිව්‍යුහගතකරණයකට යන්න ඕනෑ කියලා. ඒකට කියන්නේ preemptive restructuring කියලා. ඒ කියන්නේ ණය ගෙවන්නේ නැහැ කියලා, ණය moratorium එකකට යන්න ඉස්සෙල්ලා වෙලාසනින්ම යන්න ලූ, ණය ප්‍රතිව්‍යුහගතකරණයට. මේවා විහිළු කථා නොවෙයි; සෙල්ලම් කථා නොවෙයි. ඇත්ත වශයෙන්ම මේවායින් අසහනයට, පීඩනයට පත් වෙන්නේ අපේ රටේ ජනතාවයි.

මම වැඩ කරන ජනතාව වෙනුවෙන් රජයෙන් අහන්න කැමැති කාරණයක් තිබෙනවා. දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණයේදී EPF එකට සහ ETF එකට තට්ටු කළා. දැන් ඔබතුමන්ලාට තිබෙනවා විශාල වරමක්; මන්ත්‍රීවරු 159දෙනෙක්. ඇයි මේ පාර්ලිමේන්තුවට යෝජනාවක් ගෙනැල්ලා ඒ EPF එකේයි, ETF එකේයි තිබෙන වැඩ කරන ජනතාවගේ ඉතිරි කිරීම්වලට සාධාරණයක් ඉෂ්ට කරලා දෙන්නට බැරි?

දැන් විශේෂයෙන්ම කථා කරනවා දරිද්‍රතාව ගැන. ජනාධිපතිතුමාත් ඒ ගැන කථා කරනවා. නමුත් අස්වැසුම දරිද්‍රතාව තුරන් කරන්න විසඳුමක් නොවෙයි. දුප්පත්කම තුරන් කරන්න නම් නිෂ්පාදන වැඩසටහනක් තිබෙන්න ඕනෑ, ආයෝජන වැඩසටහනක් තිබෙන්න ඕනෑ, පාරිභෝජන වැඩසටහනක් තිබෙන්න ඕනෑ, ඉතිරි කිරීමේ වැඩසටහනක් තිබෙන්න ඕනෑ, අපනයන වැඩසටහනක් තිබෙන්න ඕනෑ. නමුත් ඒ එකක්වත් නැහැ. එතකොට අස්වැසුමට තෝරා ගැනීම්, බැහැර කිරීම් ගැන බලමු. දරිද්‍රතා රේඛාව හඳුනා ගන්නේ නැතිව, ගෘහයක ආදායම් වියදම් සමීක්ෂණය කරන්නේ නැතිව, දුප්පත්කම දිහා බලන්නේ නැතිව, ආහාර වියදම්, ආහාර නොවන වියදම් පිළිබඳ තොරතුරු නොදැන කොහොමද දුප්පත්කම තුරන් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නේ කියන එක අපි හැමෝටම ප්‍රහේලිකාවක්.

ඔබතුමන්ලා විසින්ම නිර්මාණය කර ගත්ත සීමා තුළ අද බරපතළ ප්‍රශ්න තිබෙනවා. අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගුරුවරුන්ගේ, විදුහල්පතිවරුන්ගේ, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ හෙද නිලධාරින්ගේ, වෛද්‍ය නිලධාරින්ගේ, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරින්ගේ, කම්කරුවන්ගේ සහ කාර්යාල කාර්ය සහායක සේවය වාගේ හැම සේවයකම බරපතළ ව්‍යාකූලත්වයක් තිබෙනවා. රජයටත් පොරොන්දු වුණු ආකාරයට 20,000ක වැටුප් වැඩිවීම දෙන්න බැරි වෙලා තිබෙනවා. මොකක්ද හේතුව? හේතුව තමයි ප්‍රාථමික වියදම් කිරීමේ සීමාව. ඒක සියයට 13යි. දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 13ක්; ප්‍රාථමික ශිෂුමෙහි 2.3ක අතිරික්තයක් පවත්වා ගැනීම. ඒ සීමාව තුළ ඔබතුමල්ලා පොරොන්දු වුණු "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්; රට අනුරට" ප්‍රතිපත්තිය කිසිසේත්ම ක්‍රියාත්මක කරන්න බැහැ. ඇයි? ඒක ක්‍රියාත්මක නොකරන්න අවශ්‍ය සීමා ටික ඔබතුමන්ලාම දාලා, ඔබතුමන්ලාම හිරකාරයෝ වෙලා සිටිනවා, මේ අඩු සම්පත් ප්‍රමාණය තුළ.

වැඩිහිටි විශ්‍රාමික ප්‍රජාවගේ ඉතිරි කිරීම්වලට කාලයක් මුළුල්ලේ සියයට 15ක් ලැබුණා, ලක්ෂ 15ක deposit එකට. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? ඒක ලක්ෂ 10ට අඩු කරලා, ඒ ඉතිරිකිරීමේ පොලී අනුපාතය සියයට 3කින් වැඩි කිරීම නිසා දැන් සියයට 10ක් වාගේ හම්බ වෙනවා. ලක්ෂ සංඛ්‍යාත වැඩිහිටි ප්‍රජාවට මේක බරපතළ ප්‍රශ්නයක්.

ඊළඟට, කාන්තාවන් වෙනුවෙන් යම් යම් ප්‍රතිලාභ ලබා දීලා තිබෙනවා, ගර්භිණී මව්වරුන්ගේ පෝෂණ සලාකය යනාදී වශයෙන්. ඒවා ගැන හොඳ කියනවා, අපි. හැබැයි, බරපතළම ප්‍රශ්නය තමයි ශ්‍රම බලකායේ කාන්තාවන්ගේ සහභාගිත්වය. එය සියයට 33යි, 34යි.

අපි ඒක සියයට 45කට ගෙනෙන්නට ඕනෑ. ඒ සඳහා Verité Research ආයතනය දත්ත කේන්ද්‍රීයව සකස් කරලා තිබෙනවා, ඒ මව්වරුන්ගේ ප්‍රසූත දීමනාව රාජ්‍ය අනුග්‍රහයෙන් ක්‍රියාත්මක කරන්න කියලා. ඒ අය ගණනය කර තිබෙන ආකාරයට රුපියල් බිලියන 6ක්, 7ක් වාගේ වැය වෙනවා ඒකට. ඒ වාගේ මුදල් ප්‍රමාණයක් වැය කළොත් පුළුවන්කම ලැබෙනවා, ශ්‍රම බලකායේ කාන්තාවගේ සහභාගිත්වය ඉහළ මට්ටමකට ගෙනෙන්න.

ඒ වාගේම අපි අවංකව හදවතට තට්ටු කරලා මේ ගැන අහන්න ඕනෑ. මත්පැන්, සිගරට් නිෂ්පාදනය කරන ආයතනවලින් ඇත්ත වශයෙන්ම අය විය යුතු බදු මුදල් ටික අය වෙන්නේ නැහැ. එතැන වැරදි බදු සූත්‍රයක් ක්‍රියාත්මක වෙන්නේ. අන්න ඒක ගැන සොයා බලා රාජ්‍ය ආදායම වැඩි කර ගන්නට මද්‍යසාර සහ දුම්කොළ සමාගම්වල අයත් එක්ක සාකච්ඡා කරලා ඒ අයගෙන් අය විය යුතු ඒ බදු ප්‍රමාණය අය කර ගන්න කටයුතු කරන්න. එතකොට පුළුවන් රාජ්‍ය ආදායම ඉහළට දමා ගන්න.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

පෙර පාසල් පද්ධතියට උදව් කරන්නට මේ අය වැයේ යෝජනා තිබෙනවා. පෙර පාසල් ගුරුතුමියලාගේ, සහායක ගුරුතුමියලාගේ දීමනා වැඩි කරනවා කියලා තිබෙනවා. හැබැයි, මේ රටේ රාජ්‍ය ක්ෂේත්‍රය තුළ කීයද පෙර පාසල් තිබෙන්නේ? සුළු ප්‍රමාණයක්. පෙර පාසල් දරුවාට උදව් කරන කොට, පෙර පාසල් ගුරුවරුන්ට උදව් කරන කොට තෝරලා බේරලා කරන්න එපා. ඒක සමස්ත වැඩසටහනක් හැටියට ක්‍රියාත්මක කරන්නට ඕනෑ. අපි සතුටු වෙනවා මහපොළ ආධාරය වැඩි කිරීම ගැන. හැබැයි, ඔබතුමන්ලා දන්නවාද පසුගිය මාස කීපයක් මහපොළ ආධාරය ගෙවලාත් නැහැ කියලා? එතකොට නොගෙවපු ආධාරයක් වැඩි කරනවා කියනවා. වැඩි කරන එක හොඳයි. මම ඉල්ලීමක් කරනවා, ඒ වැඩි කිරීම් වාගේම නොගෙවපු මහපොළත් ගෙවන්න කටයුතු කරන්න කියලා.

අද ගොවි ජනතාව ලොකු පීඩනයකට ලක් වෙලා තිබෙනවා. වී මිලදී ගැනීමේ ක්‍රියාවලිය පමණක් නොවෙයි, අනෙකුත් භවභෝග මිලදී ගැනීමේ ක්‍රියාවලිය නිසා ඔවුන් ලොකු පීඩනයක ඉන්නේ. මේ චෝදනා මම මේ රජයට විතරක් කරන්නේ නැහැ. පැවැති ආණ්ඩු සියල්ලක්ම ඇත්ත වශයෙන්ම හරියාකාර වගා සූත්‍රයක් ක්‍රියාත්මක කළේ නැහැ. ඒ කියන්නේ වගා කිරීම, වගාවට යෙදවුම් දැමීම, නිෂ්පාදනය, නිෂ්පාදනය වූ ඒ නිෂ්පාදන ටික සහතික මිලකට මිලදී ගැනීම ක්‍රියාත්මක කළේ නැහැ. මේක පිළිබඳ පැහැදිලි චක්‍රයක් නැහැ. අපි යෝජනා කරනවා, මෙය නීතිගත කළ යුතුමයි කියලා. ඒවා පාර්ලිමේන්තු පනතකින් නීතිගත කරන්නට ඕනෑ. මතකයි නේ, නාමල් කරුණාරත්න මැතිතුමනි, මමත් ඔබතුමාට සහයෝගය දුන්නා, දැනට අවුරුදු ගණනාවකට ඉස්සෙල්ලා ස්ථාවර මිල නීතිගත කළ යුතුයි කියලා. ඒක අපි හැමෝම එකඟ වුණු යෝජනාවක්. දැන් ඒක ක්‍රියාත්මක කරන්නට ඔබතුමන්ලාට තිබෙනවා, කදිම අවස්ථාවක්. අපි ඒ දේ ඉෂ්ට සිද්ධ කරමු.

ධීවර ජනතාව බලාගෙන ඉන්නවා තෙල් සහනාධාරය ලැබෙනකල්. විශාල ප්‍රමාණයක් ධීවර ප්‍රජාව රැකියාවට යන්නේ නැහැ. ඒ අය අනාථ වෙලා.

ඒ වාගේම "මලයගම" ප්‍රජාවගේ වැටුප් දීමනා ගැන කථා කළා. අපි විශ්වාස කරනවා, එයින් ඔබ්බට ගිහිල්ලා කටයුතු කරන්න ඕනෑ. ඒ "මලයගම" ප්‍රජාවට ඉඩම් අයිතියක් නැහැ. නිවසක අයිතියක් නැහැ. වගා කිරීමේ ඉඩමක අයිතියක්, තමන්ගේ නිවාසයක ජීවත්වීමේ අයිතියක් ලබා දීමට ඒ අය සව්බලගැන්වීමක් කරන්නට ඕනෑ. එතකොට ඒ ඉඩම්වලින් සියයට 40ක් පමණ පරිහරණය කරලා තමන්ගේම කුඩා තේ වත්තෙන් මේ රටේ ජාතික නිෂ්පාදනයට සියයට 60ක, 70ක දායකත්වය ලබා දෙන කුඩා තේ වතු හිමියකු බවට ඒ ප්‍රජාව පත් කරන්න පුළුවන්. ඔවුන් පමණක් නොවෙයි, රැකියා විරහිත තරුණ ප්‍රජාවටත් වගා නොකරපු භූමි ප්‍රමාණයක් යම්කිසි ක්‍රමයකට බෙදා දීම තුළ අපට තිරසර විසඳුමකට එන්නට පුළුවන්. මෙවන් ක්‍රියාදාමයක් තුළ ජාතික නිෂ්පාදනයට එකතුවක් වෙනවා කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි. ඒ අයගේ වැටුප් වැඩි කිරීමටත් වැඩිය ඒක වටිනවා.

මම මේ අවස්ථාවේදී විශේෂයෙන්ම මේ කාරණය කියන්න කැමැතියි. ජන සමාජයේ විශාල ප්‍රමාණයක් භෙදියන් හැටියට පුහුණු වෙලා පත්වීම් ලැබෙන කල් බලාගෙන ඉන්නවා.

පවුල් සෞඛ්‍ය ක්ෂේත්‍රයේත් එසේමයි. රැකියා විරහිත උපාධිධාරීන් 35,000ක්, 40,000ක් පමණ ඉන්නවා. අපි හැමෝම දන්නවා අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා ප්‍රමුඛ ඔබතුමන්ලාගේ රජය පොරොන්දු වුණා, රැකියා විරහිත උපාධිධාරීන් 35,000කට වැඩ පිළිවෙළක් සකස් කරනවා කියලා. එය ඉටු කරන්න. රජයේ අත්‍යවශ්‍ය රැකියා පුරප්පාඩු 30,000ක් පුරවනවාය කියන එක හරි. නමුත්, රැකියා විරහිත උපාධිධාරීන් 35,000කට, 40,000කට ලබා දුන් පොරොන්දුව කරුණාකරලා අමතක කරන්න එපා. එය ක්‍රියාත්මක කරන්න කටයුතු කරන්න.

ඒ වාගේම මම කියන්නට ඕනෑ, විමධ්‍යගත අරමුදල් ගැනත්. ඔබතුමන්ලා බලයට ආවේ system එක change කරනවා කියලා. දැන් මෙතැන system change එකක් නැහැ. මෙතැන තිබෙන්නේ ගෝඨාභය රාජපක්ෂ, මහින්ද රාජපක්ෂ ප්‍රතිපත්තිය නේ. මන්ත්‍රීවරු 225දෙනෙක් ඉන්නවා. මන්ත්‍රීවරු 225දෙනාට ලක්ෂ 100 ගණනේ වෙන් කරනවා. මම දන්නේ නැහැ, රාජ්‍ය පාර්ශ්වයේ මන්ත්‍රීවරුන්ගේ තත්ත්වය මොකක්ද කියලා. මන්ත්‍රීවරයෙකුට විමධ්‍යගත අරමුදල් වෙන් කිරීමේ වැඩ පිළිවෙළක්, ක්‍රමවේදයක් නැහැ. අපට පෙනෙන විධියට එක් මන්ත්‍රීවරයෙකුට මිලියන 10 - ලක්ෂ 100 - ගණනේ මන්ත්‍රීවරු 225දෙනා වෙනුවෙන් වෙන් කරලා ඒ මුදල් ටික දිස්ත්‍රික්ක මට්ටමින් pool කරලා, මන්ත්‍රීවරු 159කගේ අභිමතය පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදයක් තිබෙන්නේ. කෝ, මෙතැන system change එකක්? මේක ගෝඨාභයගේ system එක නේ; මේක මහින්ද රාජපක්ෂගේ system එක නේ. ඒකෙන් බැහැර වෙන්න, එතැනට යන්න එපා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම තව කාරණයක් කියන්න කැමැතියි. මම මෙය සාක්ෂි සහිතව කියන්නේ. බරපතළ ලෙස දේශපාලන පළිගැනීම් සිද්ධ වනවා. මම උදාහරණ සහිතව කියන්නම්. සබරගමුව පළාතේ ප්‍රධාන ලේකම් මහින්ද වීරසූරිය. එයාව pool එකට දැම්මා. දැන් එයා විශ්‍රාම ගිහිල්ලා. වයඹ පළාතේ ප්‍රධාන ලේකම් දීපිකා ගුණරත්න මහත්මිය. එතුමියවත් pool එකට දාලා තිබෙන්නේ. ඌව පළාතේ ප්‍රධාන ලේකම් දමයන්ති පරණගම මහත්මිය. එතුමියව ප්‍රධාන ලේකම් ධුරයෙන් ඉවත් කරලා. ප්‍රධාන ලේකම්වරුන්ගෙන් කරන එම පළිගැනීම් නතර වෙලා නැහැ. දිසාපතිවරුනුත් අයින් කරලා. නුවරඑළියේ දිසාපති, නන්දන ගලගොඩ. ඔහුත් ඉවත් කරලා. රත්නපුර දිසාපති, වසන්ත ගුණරත්න. ඔහුත් ඉවත් කරලා. මාතර දිසාපති, ගනේෂ් අමරසිංහ. ඔහුත් ඉවත් කරලා. ඇයි මෙහෙම කරන්නේ? රාජ්‍ය සේවකයින් අතිවිශාල ප්‍රමාණයක්, මම හිතන විධියට ඓතිහාසික ප්‍රමාණයක් ඔබතුමන්ලාට ඡන්දය දුන්නේ මේ වාගේ දේශපාලන පළිගැනීම් කරන්න නොවෙයි. මේක වැරදියි. මේ ක්‍රියාදාමයට ඔබතුමන්ලා කොටු වෙන්න එපා. මේ පළිගැනීම් නතර කරන්න. රාජ්‍ය සේවකයින් හිංසනයට ලක් කිරීම නතර කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

අවසාන වශයෙන් මට තව කරුණු දෙකක් කියන්න තිබෙනවා. මේ අය වැය සාර්ථක වේවා කියලා මම අවංකව ප්‍රාර්ථනා කරනවා. ඒ විතරක් නොවෙයි. මෙහි තිබෙන සාධනීය ජනතාවාදී, ජනහිතකාමී ප්‍රතිපාදන ක්‍රියාත්මක කරන්නට අපිත් සහයෝගය දෙන්නම්; අපිත් හවුල් වෙන්නම්. රටට වටිනාකමක් එකතු කරන්න අපිත් ශක්තිය දෙන්නම්. කරුණාකරලා විමධ්‍යගත මුදල් ලබා දෙනකොට ඒ චින්තනයෙන්, ඒ spirit එකෙන් අපි කටයුතු කරමු. අලුත් වැඩ පිළිවෙළක් තුළින් අපි කටයුතු කරමු. හැබැයි, මේ අය වැය කථාවේ බරපතළම ප්‍රශ්නය මොකක්ද? බාහිර පරිසරය ගැන කිසිම අවබෝධයක් නැහැ. Taking due recognition and cognizance of the external environment කියලා ඒකට කියනවා. පොඩ්ඩක් හිතලා බලන්න. මොකක්ද අද ලෝකයේ වෙන්නේ? මොකක්ද අද ලෝකයේ වෙළෙඳ ක්ෂේත්‍රය තුළ වෙන්නේ? ඇමෙරිකානු ජනාධිපතිතුමාට වරමක් ලැබුණා. ඒක එතුමා ලබපු වරම. ඇමෙරිකාවේ ජනාධිපතිතුමා බහුතර ඡන්දයෙන් පත් වුණා. මොකක්ද ඒ ප්‍රතිපත්තිය? දැන් ක්‍රමානුකූලව ඒ අය සංවෘත වෙනවා.

දැන් විවිධ රටවලට ආරක්ෂක බදු - ඒවාට කියනවා, protective tariffs කියලා - පනවලා තිබෙනවා. ඒ ඒ රටවල අපනයන ඇමෙරිකා එක්සත් ජනපදයට එනවා. මෙහෙම යනකොට අපේ රටේ අපනයනවලට මොකක්ද වෙන්නේ? ඒවා පිළිබඳව පුරෝකථනයක් කරලා තිබෙනවාද; හිතලා තිබෙනවාද; analysis එකක් කරලා තිබෙනවාද? American market එක අපට අහිමි වෙනකොට අපේ garmentsවලට සිද්ධ වෙන්නේ මොකක්ද? ඔබතුමා දන්නවා, ඇඟලුම් කම්හල් 200 වැඩසටහන ගැන. මේ රටේ ආර්ථික වර්ධනයට රුකුලක් වුණු, දුප්පත්කම තුරන් කරන්නට රුකුලක් වුණු, රැකී රක්ෂා බිහි කරන්නට ශක්තියක් වුණු එම ක්ෂේත්‍රයේ අපනයනවලට, කිසිම දවසක protective tariff බලපෑමක් අපේ රටට එන්න එපා කියලා මම ප්‍රාර්ථනා කරනවා. නමුත් අපේ ඇස් ඉදිරියේ අද මොකක්ද වෙන්නේ? කැනඩාවට tariffs ගහලා තිබෙනවා; මෙක්සිකෝවට ගහලා තිබෙනවා; චීනයට ගහලා තිබෙනවා. තවත් රටවල් ගණනාවකට වැදිලා තිබෙනවා. මම අහන්නේ ඒ පිළිබඳව - external environment එක පිළිබඳව - මේ අය වැය කථාවට අවබෝධයක් අරගෙන නැද්ද කියලායි. ඒක බරපතළ ගැටලුවක්. අපනයන වෙළෙඳ පොළ විවිධාංගීකරණයකට යන්න ඕනෑ කියලා අපි විශ්වාස කරනවා. ඇමෙරිකා එක්සත් ජනපදය වේවා, යුරෝපය වේවා, එක්සත් රාජධානිය වේවා, export markets කිහිපයකින් අපි depend වෙනවා. African Continent එක, Latin America, South America, ASEAN States යනාදි අනෙකුත් බලප්‍රදේශවල අපනයන ගමනාන්ත විවිධාංගීකරණ - export destination diversification - වැඩසටහනකට යන්න අපට පුළුවන්. ඒක මම මේ අය වැය කථාවේ දකින්නේ නැහැ.

ඒ වාගේම අපි යෝජනා කරනවා, මේ රට ගොඩගන්නට නම් අනිවාර්යයෙන්ම විශාල වශයෙන් සෘජු විදේශ ආයෝජන අපේ රටට ගෙන්වා ගන්නට ඕනෑ කියලා. ඒ සඳහා විශේෂිත වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කරන්නට ඕනෑ. සෘජු විදේශ ආයෝජන මෙරටට ගෙන්වා ගන්න අපේ සහයෝගයත් ලබා දෙන්න අපි සූදානම්. නිකම් බලාගෙන සිටියාට සෘජු විදේශ ආයෝජන එන්නේ නැහැ. දැන් විවිධ බදු ක්‍රමවේද මත යම් යම් රටවලින් කර්මාන්තශාලා ඉවත් වෙලා එනකොට ඒවා අපේ රටට ගෙන්වා ගන්නට අපට තරගයක් කරන්නට තිබෙන බව මතක තියා ගන්න. අපි වියට්නාමය එක්ක තරග කරන්නට ඕනෑ; Cambodia එක්ක තරග කරන්නට ඕනෑ. Indonesia, Malaysia, India, Singapore යන රටවල් එක්ක තරග කරලා තමයි ආයෝජකයන් අපේ රටට ගෙන්වා ගන්න ඕනෑ. ඒවා පිළිබඳව පැහැදිලි වැඩසටහනක් මම මේ අය වැය කථාවේ දකින්නේ නැහැ.

ඊළඟට මම මේ කාරණයත් කියන්න ඕනෑ. ආර්ථික දැක්ම, ආර්ථික වැඩ පිළිවෙළ පිළිබඳව මේ පාර්ලිමේන්තුවේ සාකච්ඡා වෙනවා අපි දැක්කා. අපි අනුගමනය කරන දේශපාලන ප්‍රතිපත්තිය තුළ; දස වැදෑරුම් ක්‍රමවේදය තුළ අපි අනුගමනය කරන්නේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී වැඩ පිළිවෙළයි. සමාජ ප්‍රජාතන්ත්‍රවාදී වැඩ පිළිවෙළ තුළ රටක ධනය උත්පාදනය කරන්නට මානුෂීය ධනවාදය අවශ්‍යයි. මානුෂීය ධනවාදය තුළ ඇති වෙන අසමබරතා, අසමතුලිතතා නිවැරදි කරන්නට සීමාසහිත රාජ්‍ය මැදිහත්වීම අවශ්‍යයි. සුබසාධන රාජ්‍යය රැකගනිමින්, එහි කාර්යක්ෂමතාවය වැඩි කරමින් එයට සම්පත් ලබා දීම වැඩි වැඩියෙන් ක්‍රියාත්මක කළ යුතුයි. ප්‍රතිඵල කේන්ද්‍රීය කාල වකවානු සහිත දුප්පත්කම තුරන් කිරීමේ වැඩ පිළිවෙළක් අවශ්‍යයි. රටේ පළාත් නවයේම ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශ මට්ටමින් සමබර ආර්ථික වර්ධනයක්, ඒ කියන්නේ දළ දේශීය නිෂ්පාදිතයට දායකත්වය ලබා දීමක් සිදු විය යුතුයි. නව තාක්ෂණයෙන් පරිපූර්ණ වූ කෘෂි කර්මාන්තයක්, ධීවර ක්ෂේත්‍රයක්, කර්මාන්ත ක්ෂේත්‍රයක් අපි නිර්මාණය කළ යුතුයි. වෙනස්කමකින් තොරව සියලු දෙනාම ශ්‍රී ලාංකිකයින් ලෙස සවිබලගැන්විය යුතුයි. ප්‍රජාතන්ත්‍රවාදය සවිබලගැන්විය යුතුයි. තිරසර සංවර්ධනය ශක්තිමත් විය යුතුයි.

තිරසර සංවර්ධනය ගැන කථා කරනකොට මම මේ කාරණයත් මතක් කරන්න කැමැතියි. වර්තමාන රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනවල වනජීවී ක්ෂේත්‍රයට ලොකු අගයක් දීලා තිබෙනවා අපි දැක්කා.

ජනාධිපතිතුමාත් කථා කළා, වනෝද්‍යාන පිළිබඳව. විශේෂයෙන්ම දුම්රිය මාර්ගවල සිදු වන අනතුරු ගත්තාම, පසුගිය දවසක අපි දැක්කා, දුම්රියක ගැටීමෙන් වනඅලි 5ක්, 6ක් පමණ මිය ගොස් තිබුණු ආකාරය. අපි පරිසර කේන්ද්‍රීය තිරසර සංවර්ධනය - environmental sustainable development - ගැන කථා කරනවා වාගේම, ඒක ක්‍රියාවෙනුත් ඔප්පු කරන්නට ඕනෑ.

10වැනි point එක, රටට අගයක් එකතු කරන විදේශ සම්බන්ධතා ක්‍රියාත්මක කිරීම. මෙන්න මේක තමයි දස වැදෑරුම් වැඩසටහන; අපේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී වැඩසටහන; අපි අනුගමනය කරන වැඩසටහන. ඒ රාමුව තුළ හිඳිමින් මේ රට ගොඩනහන්නට අපි අනිවාර්යයෙන්ම අපේ ශක්තිය ලබා දෙනවා.

ඊයේ දවසේද කොහේද කියනවා මට ඇහුණා, මේ රජයේ න්‍යාය ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදයයි කියලා. මට ඒක හිතාගන්න අමාරුයි. මොකද, මේ ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය තුළ ගුරුවරුන්, හෙද-හෙදියන්, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරින්, වෛද්‍යවරුන් ඇතුළු මුළුමහත් රාජ්‍ය සේවයම අසරණ වෙලා තිබෙනවා. මම අහන්න කැමැතියි, ඒකද ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය කියලා. ගොවීන්ට, ධීවරයන්ට, කම්කරුවන්ට, දුප්පතුන්ට, ක්ෂුද්‍ර-කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන්ට පොරොන්දු වුණු ඒ සහන ටික ලැබී නැහැ. අපි නහපු හඬ තුළ එදා නිර්මාණය වුණු පරාටේ නීතිය තාවකාලිකව අත්හිටුවීම පමණයි මේ වන විට ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ. සැලකිය යුතු ප්‍රමාණයකින් ඒ අයගේ දඩ පොලිය ඉවත් කිරීම, පොලී සහන ලබා දීම සිදු විය යුතුයි. එසේ කෙරෙන දේවල් ද මේ ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය නමින් හඳුන්වන්නේ කියන එක මම අහන්නට කැමැතියි.

අවසාන වශයෙන්, ඒබ්‍රහම් ලින්කන් මැතිතුමාගේ ප්‍රකාශයකින් මගේ කථාව අවසන් කරන්න බලාපොරොත්තු වෙනවා. එතුමා එක් අවස්ථාවක ප්‍රකාශ කර තිබෙනවා, "You can fool some of the people all of the time, and all of the people some of the time, but you cannot fool all of the people all of the time" යනුවෙන්. ඒ කියන්නේ, "ඔබට ඇතැමෙකු සෑම කල්හිමද, සියලුදෙනා යම් කලකටද රැවටිය හැකි නමුත් සියල්ලන් සියලු කල්හි රැවටීම සිදු කළ නොහැක" කියන එකයි.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. (Mrs.) Samanmali Gunasingha. You have twelve minutes.

[පූ.භා. 11.27]

**ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුලින්ම මම වර්තමාන ජාතික ජන බලවේග ආණ්ඩුවේ පළමු අය වැය ලේඛනය සම්බන්ධයෙන් කරුණු කිහිපයක් මතු කරන්න කැමැතියි. මොකද,

[ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය]

අපට කලින් අවුරුදු ගණනාවක් මේ රටේ පාලනයට හවුල් වුණු අද විපක්ෂයේ ඉන්න කණ්ඩායම් මේ විවාදයේදී ඉතාම හොඳ අනුශාසනා, මහ පෙන්වීම්, ආර්ථික දත්ත, විශ්ලේෂණ ගොඩක් ඉදිරිපත් කරමින් සිටිනවා. එම ආර්ථික දත්ත අනුව, එම විශ්ලේෂණ අනුව හැදුණු රටක් තුළ නේ අපි මේ ඉන්නේ. ඒ දැක්ම අනුව, ඒ න්‍යාය අනුව, ඒ ආර්ථික විශ්ලේෂණ අනුව ඔවුන් බංකොලොත් කළ, කඩාවට්ටපු, IMF එකේ සරණ යන්න වුණු, ඒ වාගේම ලෝකයේ රටවල් අතර ආර්ථික වර්ධන වේගය අතින් පහළට වැටුණු ආර්ථිකයකින් සහ සමාජ ප්‍රශ්නවලින් මිරිකී ගිය පරිසරයක් තුළ තමයි අපි මේ ඉන්නේ.

විපක්ෂය ඉතාම ලස්සන තර්ක මතු කරමින්, ගළපමින් කියන්න හදන්නේ IMF එක හරහා අපි නොමඟ යනවා කියන එකයි. මම හිතන විධියට මේක ඔවුන් හැම දාමත් කියන කථාවක්. ඔවුන් එයින් පිටත ගිහිල්ලා පසුගිය කාලයේ ක්‍රියාත්මක කළ ඔවුන්ගේ ආර්ථික වැඩ පිළිවෙළත් අපි දැක්කා. ඔවුන් උත්සාහ කළේ දිගින් දිගටම රාජ්‍ය පංගුව අහිමි කරගන්නයි.

ඔවුන්ගේ වැඩ පිළිවෙළ තුළ අපි දැක්කේ නැහැ, අපේ රටේ අපනයන ආදායම, දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීමක්. ඒ වාගේම තරගකාරී විධියට ලෝක වෙළෙඳ පොළේ කොටස තහවුරු කර ගන්නේ කොහොමද කියලා අපි දැක්කේ නැහැ. ඔය කියන ඒවා එම වැඩ පිළිවෙළ තුළ අපි දකින්න ඕනෑ නේ. හැබැයි, අපි එහෙම දෙයක් දැක්කේ නැහැ. ඒ වෙනුවට පසුගිය කාලයේ තිබුණේ අකාර්යක්ෂම ආර්ථික ප්‍රතිපත්තියක්. ඒ වාගේම පසුගිය කාලයේ මූල්‍ය විනයක් තිබුණේත් නැහැ. ඔබතුමන්ලා හිටපු ඒ පාලන කාලයේ මූල්‍ය විනයක් තිබුණා නම්, ආර්ථික ප්‍රතිපත්තිය කාර්යක්ෂම වුණා නම්, දූෂණය, වංචාව තිබුණේ නැත්නම් අද මෙතැන නොවෙයි මේ රට තිබෙන්නේ. එතකොට අපට වෙනස් කරන්න වෙන්නේ ඒ තිබුණු තැන ඉඳලායි. අපි ළිඳට වැටිලා ඉන්නවා නම්, ළිංකටෙන්ම තමයි ගොඩ එන්න වෙන්නේ. හැබැයි, අපි ළිංකටෙන් ගොඩ එනවා. අකාර්යක්ෂම, වැරදි ආර්ථික ප්‍රතිපත්ති අපි නිවැරදි කරගන්නවා. ආර්ථික උපාය මාර්ග අපි නිවැරදි කරගන්නවා; වෙනස් කර ගන්නවා. ඒ වාගේම දූෂණය ඉහ වහා ගිය රාජ්‍ය කොටස වෙනුවට ජනතාවට වග කියන, රාජ්‍යයට වග කියන කාර්යක්ෂම රාජ්‍ය ප්‍රතිපත්තියකුත් අපි අනුගමනය කරනවා. ඒක තමයි වෙනස වෙන්නේ.

අපේ රටේ එකතු කර ගත් බදු මුදල්වලට පසුගිය කාලයේ මොකද වුණේ? ඒ බදුවලින් වැඩිම කොටසක් කා ළඟද තිබුණේ? කවුරු වෙනුවෙන්ද වියදම් කළේ? තමන්ගේ ළඟ හැන්ද තිබෙද්දී තමන්ට ඕනෑ ඕනෑ විධියට ඒවා බෙදා ගත්තා. එහෙම තමයි ඒවා ක්‍රියාත්මක වුණේ. ඒ නිසා තමයි මේ රට මෙච්චර දුප්පත් වුණේ. දැන් කියනවා, දුප්පත්කම මෙච්චරයි කියලා. අපි අවුරුදු 5ක් මේ රට පාලනය කරලා දුප්පත්කම මෙච්චරයි කියලා පෙන්වනවා නම් කමක් නැහැ. ඔවුන් පාලනය කරපු, ඔවුන් හවුල් වුණු, ඔවුන්ගේ ආර්ථික ප්‍රතිපත්ති අනුව වැඩ කරපු, හදපු රට තුළ දුප්පත්කම ගැන ඔවුන්ම කථා කරනවා. ඔව්, ඔබතුමන්ලා ප්‍රශ්න ඇති කළා; ඒ ආර්ථිකය තුළ ප්‍රශ්න වැඩි වුණා; ඒ ආර්ථිකය තුළ ජනතාව හිර වුණා. හැබැයි, අපි ආවේ ඒවාට විසඳුම් දෙන්න. එතකොට අපේ ආර්ථික ප්‍රතිපත්තිය ඔබතුමන්ලාට දරාගන්න බැරි වෙනවා. ඒ ආර්ථික ප්‍රතිපත්තිය ගම, නගරය, උතුර, දකුණ, නැඟෙනහිර, බටහිර දක්වා අපි ක්‍රියාත්මක කරනවා. ඒ හැම අංශයක්ම පදනම් කරගෙන තමයි මේ අය වැය තුළ සංවර්ධන යෝජනා ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ. උතුරට කොච්චර මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවාද? රජරටට, වාරි කර්මාන්තයට කොච්චර මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවාද? ඒ වාගේම කොළඹ නගරයේ ඉන්න ජනතාවගේ ප්‍රශ්නවලට කොච්චර මුදල් ප්‍රමාණයක් වෙන් කර තිබෙනවාද? යටිතල පහසුකම්වලට වාගේම කර්මාන්ත දියුණු කරන්න අපි කොච්චර මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවාද? ඒවා කිසිම දෙයක් දකින්නේ නැතුව, IMF එකේ ඊළඟ වටයට අපට යන්න වෙනවා ලු. ඒ, ඔබතුමන්ලාගේ ප්‍රාර්ථනාව වුණාට මේ රටේ කිසිම කෙනෙකුගේ ප්‍රාර්ථනාව නොවෙයි, IMF එකේ දෙවැනි ණය ප්‍රතිව්‍යුහගතකරණයට යෑම.

ඔබතුමන්ලාට හිතාගන්න බැරි විධියට ඉතාම කෙටි කාලයක් තුළ බංකොලොත්භාවයෙන් නිදහස් වුණා කියන තැනට අපට මේ රට ගේන්න පුළුවන් වුණේ මේ රටේ ජනතාවගේ, නිලධාරින්ගේ කැප කිරීම නිසා නොවෙයිද? ඒ, අකාර්යක්ෂමතාව, හොරකම නවත්වා වැරදි track එකේ ඉඳන් නිවැරදි track එකට මේ රට දැම්ම නිසා නොවෙයිද? ඒ ගැන අදහාගන්නත් බැරි වුණාම, හිතාගන්නත් බැරි වුණාම ඔබතුමන්ලා තව ප්‍රාර්ථනාවකුත් කරනවා. දෙවැනි වටයටත් යන්න වෙයිද දන්නේ නැහැ කියනවා. රටවල් 55ක් අසාර්ථක වෙලා දෙවැනි වටයට යන්න වුණාට අපි මේ ලබාගෙන තිබෙන කෙටි කාලීන ආර්ථික වර්ධනය තුළ ජනතාව එකතු කරගත් ආර්ථික වැඩ පිළිවෙළ තුළ අපි හිතනවා, ඉතාම කෙටි කාලයකින් මේ බංකොලොත්භාවයෙන් මිදුණා වාගේම ණය ප්‍රතිව්‍යුහගතකරණයෙනුත් ඉක්මනට නිදහස් වෙලා අපි බලාපොරොත්තු වෙන අපේ දේශීය නිෂ්පාදනයේ, ජාතික නිෂ්පාදනයේ වැඩි කරගත් කොටස අත්පත් කර ගැනීමේ ආර්ථික වෙනසකට යන්න පුළුවන් වෙයි කියලා. ඒ විශ්වාසය අපට තිබෙනවා. මේ රටේ ජනතාව ඒකට සූදානම්. ඔබතුමන්ලා අසාර්ථක නිසා, ඔබතුමන්ලාගේ ආර්ථික ප්‍රතිපත්ති අසාර්ථක නිසා තමයි ජනතාව අපට මේ රට දුන්නේ, අලුත් ආර්ථික වැඩ පිළිවෙළකට යන්න. දැන් ඒ රට අපි හොඳට කරගෙන යනවා.

අපි රට එහෙම පවත්වාගෙන යද්දී ආර්ථික වර්ධනය කලින් අවුරුද්දට වඩා වැඩි වුණේ නැද්ද? ඒ විධියට ආර්ථික වර්ධනය වැඩි වෙනවා. ඒ වාගේම, දැන් මෙතුමන්ලාට ඉවසා ගන්න බැරි වෙලා තිබෙන්නේ මෙවර අය වැය තුළින් ඉතා විශාල සහන ප්‍රමාණයකුත් ජනතාවට ලබා දුන්නු නිසායි. "කොහොමද ඒක කරන්නේ?" කියලා අහනවා. මේ තරම් වැටුප් වැඩි කරන්නේ කොහොමද, ජනතාවට මෙච්චර සහන දෙන්නේ කොහොමද කියලා අහනවා. ඊට පස්සේ කියනවා, "මේක සහන අය වැයක් නේ" කියලා. "කෝ, නිෂ්පාදන අංශයට මොනවාද තිබුණේ?" කියලා අහනවා. නිෂ්පාදන අංශයට තිබෙන සහන මොනවාද කියන එක ගරු අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාගේ කථාවේදී කිව්වා. ඒ වාගේම, මමත් ඔබතුමන්ලාට ඒ ගැන කියන්නම්. කාන්තාව ආර්ථිකයට හවුල් කර ගන්නේ කොහොමද කියාත් ඇහුවා.

කුරුඳු කර්මාන්තය යළි පණගැන්වීම සඳහා ඒ කර්මාන්තයේ නිරත අයට සහාය දීමට, කුඩා තේ වතු සංවර්ධනය කිරීමට, පොල් නිෂ්පාදනය හා කෘෂි කාර්මික නිෂ්පාදනයේ ඉහළ ඵලදායීතාවක් ගැනීමට, වැවිලි ක්ෂේත්‍රයේ යටිතල පහසුම් සංවර්ධනය කිරීමට මෙවර අය වැයෙන් කටයුතු කර තිබෙනවා. කුරුඳු ආදී කර්මාන්ත ප්‍රවර්ධනය කිරීමට රුපියල් බිලියන 11.3කුත් මේ අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. මම ඒ කිව්වේ එකක් ගැන විතරයි. ගමේ ජනතාව, ප්‍රාදේශීය ජනතාව මේ ආර්ථිකයට එකතු කර ගන්න, කාන්තාවන් එකතු කර ගන්න, කාන්තා ශ්‍රමය එකතු කර ගන්න, ඔවුන්ට අගයක් එකතු කරන්න තමයි මෙවැනි ආකාරයට රුපියල් බිලියන 11.3ක් වැවිලි කර්මාන්තයේ එක අයිතමයක් සඳහා වෙන් කරලා තිබෙන්නේ. ඒ නිසා මේවා දකින්නේ නැතුව, අර හැමදාම කියන කථා කිය කියා යනවාට වඩා, මේ පෙනෙන වෙනස, එහෙම නැත්නම් මේ අය වැය තුළින් අපි මතු කර ගන්න හදන, ජනතාව පුල පුලා බලා සිටි ආකාරයට ඒ ජනතාවට සහන දෙද්දී, ඒ ගැන ජනතාව සතුටු වෙද්දී විපක්ෂය අසතුටු වෙන එක විපක්ෂයේ රාජකාරියක්. ඒකට කමක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය වැය මොන වාගේ අය වැයක්ද කියලා මා කියන්න කැමැතියි. නව රජයේ පළමු අය වැය මට හඳුන්වන්න පුළුවන්, කාන්තාවාදී අය වැයක් කියලා; නව රජයේ පළමු අය වැය කාන්තාවාදී අය වැයක්. ඇයි, අපි එහෙම කියන්නේ? විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මහත්මයාටත් දැන් පිළිගන්න සිද්ධ වුණා නේ, ගර්භිණී මව්වරුන්ට පෝෂ්‍යදායී ආහාර ලබා දීම සඳහා මාසික ආධාරයක් ලබා දුන්නු එක හොඳයි, ත්‍රිපෝෂ වැඩසටහන වාගේ වැඩසටහන් ක්‍රියාත්මක කරපු එක හොඳයි කියලා. ඔව්. මොකද, අපි අය එකතු කර ගන්නේ දේශීය හා විදේශීය වශයෙන් නම්, රාජ්‍ය ආදායම එකතු කර ගන්නේ විවිධ බදුවලින් නම්, ඒවා යන්න ඕනෑ කාටද? ඒවා යන්න ඕනෑ, මේ පාර්ලිමේන්තුවේ ඉන්න මැති ඇමතිවරුන්ට නොවෙයි. ඒගොල්ලන්ගේ ගෙවල් හදා ගන්න නොවෙයි. ඒගොල්ලන්ට වාහන ගන්න නොවෙයි. කාටද ඒවා යන්න ඕනෑ? ඒවා යන්න ඕනෑ තැනින් තමයි අපි මේ පටන් අරගෙන තිබෙන්නේ. ගැබිනි මව්වරුන්ගේ පෝෂණ ආහාර සඳහා රුපියල් බිලියන 7.5ක් මෙවර අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. ත්‍රිපෝෂ වැඩසටහන ගැන ගොඩක් අය අඬ අඬා සිටියා නේ. ඒ වෙනුවෙනුත් අපි රුපියල් බිලියන 5ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම, ග්‍රාමීය රෝහල් දියුණු කිරීම සඳහා රුපියල් බිලියන 9.9ක් වෙන් කරලා තිබෙනවා. ඒවා දියුණු කිරීම සඳහා වත්කම් වැඩිදියුණු කිරීමට තවත් රුපියල් බිලියන 3.8ක් වෙන් කර තිබෙනවා.

ඒ වාගේම, මුල් ළමාවිය දරුවන් ගැන කථා කළා. පෙර පාසල් ගුරුවරියන් හා දෙමව්පියන් පසු ගිය කාලයේ පැවති ආණ්ඩුවලින් ඉල්ලුවා, තමන්ගේ දරුවෝ වෙනුවෙන් උදෑසන ආහාර වේල සැපයීමේ වැඩසටහන සඳහා වෙන් කරපු මුදල වැඩි කරලා දෙන්න කියලා. ඒ උදෑසන ආහාර වේල සැපයීමේ වැඩසටහන යටතේ එක් ආහාර වේලකට කරනු ලබන ගෙවීම රුපියල් 60 සිට රුපියල් 100ක් දක්වා මේ අය වැයෙන් වැඩි කරලා තිබෙනවා. පෙර පාසල් ගුරුවරියකට දැනට ලැබෙන දීමනාවට රුපියල් 1,000ක් එකතු කරලා තිබෙනවා.

ඒ වාගේම, 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සමත් අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ගේ ශිෂ්‍යාධාර මුදල රුපියල් 750 සිට රුපියල් 1,500ක් දක්වා වැඩි කරලා තිබෙනවා. එමෙන්ම, ක්‍රීඩා කරන දරුවන්ට ලබා දෙන මාසික පෝෂ්‍යදායී ආහාර දීමනාව රුපියල් 5,000 සිට රුපියල් 10,000ක් දක්වා වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම, කවුරුත් අගය කරන විශ්වවිද්‍යාල සිසුන් සඳහා ගෙවනු ලබන මහපොළ ශිෂ්‍යාධාර ගෙවීම රුපියල් 5,000 සිට රුපියල් 7,500ක් දක්වා වැඩි කරලා තිබෙනවා. ශිෂ්‍යාධාර දීමනා රුපියල් 4,000 සිට රුපියල් 6,500 දක්වා වැඩි කරලා තිබෙනවා. මේ මම කථා කළේ කිහිපයක් ගැන විතරයි. මේ සියල්ල දැනෙන්නේ කාටද? මේ සියල්ල දැනෙන්නේ ගැහැනියට; අම්මාට.

මේ රටේ කිසිම නායකයෙකුට අහු වුණේ නැති කාන්තාවන්ගේ සංවේදී ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න වර්තමාන ජනාධිපතිතුමාට මේ අය වැය තුළින් පුළුවන් වෙලා තිබෙනවා. එවැනි අය වැයක් නිසා තමයි මම කියන්නේ මේ අය වැය කාන්තාවාදී අය වැයක් කියලා. කොහොමද එහෙම කියන්නේ? ඔබතුමන්ලා දන්නවා, ඔටිසම් වාගේ ස්නායු රෝගවලින් පීඩාවට පත් වෙන දරුවෙක් ඉන්න අම්මා කෙනෙකුට මොකද වෙන්නේ කියලා. මම ඒ ගැන දන්නවා, මගේ යාළුවෙකුට එවැනි දරුවෙක් සිටින නිසා. ඒ අම්මාට සිද්ධ වුණා, දරුවා අරගෙන පිට රට යන්න. මොකද, දරුවාට උගන්වන්න, ලෙඩවලට බෙහෙත් ගන්න ලංකාවේ පහසුකම් නැහැ. ඒ පවුල ආරක්ෂා කර ගන්න වැඩ පිළිවෙළක් නැහැ. එම නිසා එවැනි හැකියාව තිබෙන දෙමව්පියෝ තමන්ගේ දරුවන් අරගෙන පිට රටවලට ගියා. සමහර අය අතරමං වෙලා ඉන්නවා, මේ ප්‍රශ්නය ගැන දන්නේත් නැතිව. එවැනි අය සඳහා අවුරුදු 5ක ජාතික වැඩ පිළිවෙළක් මෙවර අය වැය තුළින් සකසා තිබෙනවා. මොන තරම් පතුලටම ගිහිල්ලාද, මේ ප්‍රශ්න පිළිබඳව දකින්න? ඒක අවුරුදු 5ක ජාතික වැඩ පිළිවෙළක්. ඒ වැඩ පිළිවෙළ අපි පටන් ගන්නවා, රිජ්වේ ආර්යා ළමා රෝහලෙන්. ඒ වෙනුවෙන් මෙවර අය වැයෙන් රුපියල් මිලියන 200ක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම ඊට පස්සේ ඒ දරුවන් වෙනුවෙන් ආදර්ශ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ඇති කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Mrs.) Samanmali Gunasingha, your time is up.

**ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)
මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඉන් එහාට ගිහිල්ලා මෙවැනි දරුවන්ට දෙන්න ඕනෑ පහසුකම් ටික, දෙමව්පියන්ට දෙන්න ඕනෑ පහසුකම් ටික වෙනුවෙන් වැඩ පිළිවෙළක් සකස් කරනවා. ඒ වාගේම උප්පැන්නයක් නැති, නමක් නැති, රැකවරණයක් නැති දරුවෝ අනන්තවත් අනාථ නිවාසවල, පරිවාස නිවාසවල සහ විවිධ රැඳවුම් මධ්‍යස්ථානවල ඉන්නවා. රැඳවුම් මධ්‍යස්ථානවල ඉන්නා ඒ දරුවෝ ගැන කථා කරපු නායකයෙක් අපි මීට කලින් දැකලා නැහැ. ඔවුන් වෙනුවෙන් හැදුණු වැඩ පිළිවෙළක් අපි මීට කලින් දැකලා නැහැ. හැබැයි, ඒ දරුවන්ට මෙවර අය වැය තුළින් වටිනාකමක් ලබා දීලා තිබෙනවා. අම්මලාට බරක් වුණු, අතරමං වුණු, අම්මා කෙනෙක් නැති, සමහර විට උප්පැන්න නැති දරුවන්ට උප්පැන්නයක් විතරක් නොවෙයි, ඔවුන්ට අනාගතයක් හදන්න රුපියල් 5,000ක දීමනාවක් එක දරුවෙක් සඳහා මාසයකට වෙන් කරන්න තරම් කාන්තාවාදී අය වැයක් බවට පත් වෙලා තිබෙනවා, මේ අය වැය. මේක, කාන්තාවගේ බර කරට අරගෙන තිබෙන අය වැයක්.

ඔබතුමන්ලා දකින්න ඇති, ගනේමුල්ලේ සංජීවගේ මිනිය අන්තිමට භාර ගන්න වුණේ ඔහුගේ අම්මාටයි, නංගිටයි බව. මොන අපරාධකරුවෙක් එක්ක එකට හිටියත්, පාතාලයේ අයත් එක්ක එකට වැඩ කළත් අන්තිමට අසරණ තත්ත්වයට පත් වුණාම අම්මාටයි, එහෙම නැත්නම් පවුලටයි තමයි ඔවුන් භාර ගන්න වෙන්නේ. ඒ නිසා මේ ක්‍රමය වෙනස් වෙන්න ඕනෑ. එලෙස පවුලට, අම්මාට බරක් විධියට හැදෙන පාතාලය වෙනස් කිරීම වෙනුවෙන් වැඩ පිළිවෙළක් ගෙනාපු අය වැයක් තමයි මේ අය වැය. ඒ නිසා තමයි මෙවර අය වැයට කාන්තාවාදී අය වැයක් කියන්නේ. අය වැය කියන එකට වෙනස්ම අර්ථ කථනයක් දුන්නු අප රජයේ 2025 පළමු අය වැය ජනතාවට අලුතෙන් හිතන්න පුළුවන් අය වැයක් කියලායි මම හඳුන්වන්නේ.

මට කථා කරන්න වේලාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. (Prof.) Sena Nanayakkara. - *[Not in the Chamber.]*

Next, the Hon. Kaveenthiran Kodeeswaran. You have 16 minutes.

[மு.ப. 11.42]

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, புதிய அரசாங்கத்தினால் கொண்டுவரப்பட்ட 2025ஆம் ஆண்டுக் கான இந்த வரவு செலவுத்திட்ட விவாதத்திலே

[ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා]

கலந்துகொள்வதற்கு இன்றைய தினம் எனக்கும் சந்தர்ப்பத்தை வழங்கியமைக்காக நன்றியைத் தெரிவித்துக் கொள்கிறேன். விசேடமாக, NPP அரசாங்கத்தினால் கொண்டுவரப்பட்ட இந்த ஆண்டுக்கான வரவு செலவுத்திட்டமானது அதிகளவான நன்மைகளைப் பயக்கின்ற அதேவேளையில், மேலும் சில விடயங்கள் தொடர்பிலும் கவனம் செலுத்தவேண்டிய கடமைப்பாடு இருக்கின்றது. இதிலே பல நல்ல விடயங்கள் முன்மொழியப்பட்டிருக்கின்றன. ஆனாலும், திருத்தப்பட வேண்டிய சில விடயங்களும் உள்ளதென்பதை நான் இந்த இடத்திலே தெளிவாகக் கூற விரும்புகின்றேன்.

மிகவும் முக்கியமாக, கிழக்கு மாகாணம் தொடர்பில் இங்கே ஒரு கருத்தைத் தெரிவிக்கலாமென்று நான் நினைக்கின்றேன். இம்முறை வரவு செலவுத்திட்டத்தில் கிழக்கு மாகாணத்திற் கெனச் சில விடயங்களுக்கு நிதியொதுக்கப்பட்டிருக்கின்றது. அதாவது, ஏற்கனவே ஒப்பந்தங்கள் மேற்கொள்ளப்பட்ட வேலைத்திட்டங்களுக்கு அவற்றின் மிகுதி வேலைக்கான நிதி ஒதுக்கப்பட்டிருப்பதுடன், புதிய வேலைத்திட்டங்களுக்கான நிதியும் ஒதுக்கப்பட்டிருக்கின்றது. ஆனாலும், ஒதுக்கப்பட்ட இந்த நிதியிலே எந்தளவு அம்பாறை மாவட்டத் தமிழ்ப் பிரதேசங்களுக்கு ஒதுக்கப்பட்டதென்பது ஒரு கேள்விக் குறியாகவே இருக்கின்றது. மேலும், இந்திய அரசாங்கத்தின் அனுசரணையுடன், கிழக்கு மாகாணத்திற்கான அபிவிருத்தி வேலைத்திட்டங்களை முன்னெடுப்பதற்காக நிதியொதுக்கீடு செய்யப்படுவதாகக் கூறப்பட்டிருக்கின்றது. அவ்வாறு ஒதுக்கப்பட்ட நிதி எவ்வளவு? அவை எந்தெந்தக் கருத்திட்டங்களுக்கு - Projectக்கு - ஒதுக்கப்பட்டிருக்கின்றன? எந்தெந்தப் பிரதேசங்களுக்கு ஒதுக்கப்பட்டிருக்கின்றன? இது எங்களுடைய மக்களுக்கு எந்தவிதத்திலே பயனளிக்கப் போகின்றது? என்ற விடயம் இந்த வரவு செலவுத்திட்டத்திலே குறிப்பிடப்படவில்லை.

விசேடமாக, அம்பாறை மாவட்டத்திலே அதிகளவான பிரச்சினைகள் காணப்படுகின்றன. கிழக்கு மாகாணத்திற்கு ரூபாய் 75 கோடி INR நிதி இந்திய அரசாங்கத்தினாலே ஒதுக்கப்பட்டுள்ளதாக நாங்கள் அறிகின்றோம். அதற்கான MoU கூட இன்னும் sign பண்ணப்படவில்லை. அதற்காக உண்மையாகவே இந்த இடத்திலே இந்திய அரசுக்கு எங்களுடைய நன்றியைத் தெரிவிக்க வேண்டிய கடமைப்பாடு இருக்கிறது. அவ்வாறு இந்திய அரசாங்கத்தினாலே ஒதுக்கப் பட்ட நிதியினை இலங்கை அரசாங்கம் கையாளுகின்ற பொழுது அம்பாறை மாவட்டத்திலே காணப்படுகின்ற பிரச்சினைகளைக் கவனத்திற்கொள்ள வேண்டும்.

திருக்கோவிலிலே ஓர் ஆதார வைத்தியசாலை காணப்படுகிறது. இந்த ஆதார வைத்தியசாலைக்காக ஒதுக்கப் பட்ட நிதி கடந்தகால அரசின் ஆட்சியாளர்களால் - அரசியல்வாதிகளால் - தடுத்து நிறுத்தப்பட்டிருந்தது. அம்பாறை மாவட்டத்திலே அதிகளவான ஆதார வைத்திய சாலைகள் இருக்கின்றது. ஏனைய ஆதார வைத்தியசாலை களுக்கு குவைத் fund அல்லது ஐக்கிய அரபு இராச்சியங்களிலே இருந்து வருகின்ற ஒதுக்கீடுகளின்மூலம் நிதியுதவி வழங்கப்படுகிறது; அங்குள்ள அரசியல்வாதிகளினாலே இது கொண்டுசெல்லப்பட்டிருக்கின்றது. ஆனால், தமிழ்ப் பிரதேசத்திலே இருக்கின்ற மிக முக்கியமான ஆதார வைத்தியசாலையான திருக்கோவில் வைத்தியசாலைக்கு நிதி ஒதுக்கப்படவில்லை.

பழைமை வாய்ந்த அந்த ஆதார வைத்தியசாலை, இன்றும்கூட எந்த அபிவிருத்தியும் இல்லாமல், எந்தவிதமான நவீன செயற்பாடுகளுமற்ற நிலையிலே குறைந்தளவு வசதிகளுடன் காணப்படுகின்றது. வைத்திய உபகரணங்கள் இருந்தும்கூட அதற்கான கட்டிட வசதிகள் இல்லை; வைத்தியர்கள் இல்லை. சுமார் 26 வைத்தியர்கள் இருக்க வேண்டிய நிலையிலே, வெறுமனே 6 வைத்தியர்கள்தான் அந்த வைத்தியசாலையிலே இருக்கிறார்கள். அங்கே VOG இல்லை; ஆனால், cadre இருக்கின்றது. Specialist எவரும் இல்லை; கிட்டத்தட்ட 6 பேருக்கான cadre இருந்தும் விசேட வைத்தியர்கள் எவரும் இல்லாத வெறும் வைத்தியசாலையாகத் திருக்கோவில் ஆதார வைத்தியசாலை இருக்கின்றது. அதனால் அங்கு பல உயிரிழப்புகள் ஏற்படுகின்றன. அதிகளவான நோயாளர்கள் தங்களுக்குரிய சேவையைப் பெறமுடியாமல் திரும்பிப் போகின்ற துர்ப்பாக்கிய நிலை காணப்படுகின்றது. அங்கு சிகிச்சைபெற வருகின்ற நோயாளர்கள் ஏனைய வைத்தியசாலைகளுக்கு மாற்றப்படுகின்ற சந்தர்ப்பங்கள்தான் கூடுதலாகக் காணப்படுகின்றது. நான் நேற்றைய தினம் சிற்றுண்டிச்சாலையிலே ஜனாதிபதி அவர்களையும் சுகாதார அமைச்சர் அவர்களையும் சந்தித்தபோதுகூட இந்த விடயத்தைச் சுட்டிக்காட்டியிருந்தேன். இருவரும் அதனைச் செய்வோம் என்று சொன்னார்கள்; இது மூன்றாவது தடவையாகின்றது. எங்களது வரிப்பணத்திலிருந்து அந்த வைத்தியசாலையை அபிவிருத்தி செய்யாவிட்டாலும், Indian Governmentஆல் வழங்கப்படுகின்ற நிதியிலிருந்தாவது திருக்கோவில் ஆதார வைத்தியசாலைக்கு நிதியொதுக்கீடு செய்யும்படி கேட்டுக்கொள்கின்றேன்.

கடந்த 10 - 15 வருடங்களாக 500 மில்லியன், 700 மில்லியன், 1,000 மில்லியன், 1,800 மில்லியன் என்று அம்பாறை மாவட்டத்திலிருக்கின்ற அனைத்து ஆதார வைத்தியசாலைகளுக்கும் வழங்கப்பட்டிருக்கின்றது. மாவட்ட வைத்தியசாலைக்கும் கோடிக்கணக்கான பணம் வழங்கப் பட்டிருக்கின்றது. ஆனால், திருக்கோவில் ஆதார வைத்தியசாலை புறக்கணிக்கப்பட்டிருக்கின்றது. இது திட்டமிடப்பட்ட முறையிலே ஆட்சியில் இருந்த அரசியல்வாதிகளினாலே தங்களது நோக்கத்தை அடைவதற்காக மேற்கொள்ளப்பட்டிருக்கின்றது. மனித உயிர்கள் காவுகொள்ளப்பட்டாலும் பரவாயில்லை என்ற அடிப்படையில் அந்த வைத்தியசாலையின் உயர்வைத் தடுத்திருக்கிறார்கள். அதனை இந்த அரசு நிவர்த்தி செய்ய வேண்டும். ஏனென்றால், இந்த அரசுக்கு எமது மக்கள் வாக்களித்ததன் நோக்கமே, கடந்தகால அரசு விட்ட தவறுகளைத் திருத்த வேண்டும் என்பதுதான்.

இந்த வரவு செலவுத்திட்டத்தின்மூலம் உண்மையாகச் சில நல்ல விடயங்கள் முன்னெடுக்கப்பட்டிருப்பதற்காக இந்த அரசை நான் பாராட்டுகின்றேன். அரசின் டிஜிட்டல் பொருளாதாரம், உற்பத்தி விடயங்கள், கைத்தொழில் விடயங்கள் போன்றவற்றை நாங்கள் ஊக்குவிக்க வேண்டியவர்களாக இருக்கின்றோம். இந்த நாடு சிறந்த ஒரு பொருளாதார வளர்ச்சியை அடைய வேண்டும். உற்பத்திப் பொருளாதாரத்திலே நாங்கள் முன்னோக்கி நகரவேண்டியவர் களாக இருக்கின்றோம். இன்று பல வளர்ச்சியடைந்த நாடுகளைப் பார்த்தால், அவர்கள் உற்பத்திப் பொருளா தாரத்தைச் சிறந்த முறையிலே கட்டியெழுப்பியிருக்கிறார்கள்; கைத்தொழிலைச் சிறந்த முறையிலே கட்டியெழுப்பி யிருக்கிறார்கள்; டிஜிட்டல் பொருளாதாரத்தைக் கட்டியெழுப்பி யிருக்கிறார்கள். அந்த வகையில், ஏற்றுமதியை நோக்கமாகக் கொண்ட உற்பத்திப் பொருளாதாரத் திட்டங்களை இந்த வரவு செலவுத்திட்டத்தில் உள்ளடக்கி அவற்றை நெறிப்படுத்த வேண்டும் என்பதுதான் எங்களது நோக்கமாக இருக்கின்றது.

அடுத்ததாக, அம்பாறை மாவட்டத்திலே செய்யப்பட வேண்டிய பல விடயங்கள் இருக்கின்றன. ஏற்கனவே Indian High Commission ஊடாக, National Planning Department

ஊடாக நாங்கள் 2017, 2018இல் அதிகளவான proposalsஐக் கொடுத்திருந்தோம். அவற்றிலுள்ள சில விடயங்களையாவது செய்யுங்கள் என்றுதான் நாங்கள் கேட்கின்றோம். எங்களது வரிப்பணத்தில் செய்யாவிட்டாலும், இந்திய அரசினால் வழங்கப்படவிருக்கின்ற நிதியிலிருந்தாவது எங்களுக்கு இந்த விடயங்களைச் செய்து தாருங்கள்!

கல்முனையிலே இருக்கின்ற கலாசார மண்டபம் தொடர்பான சகல விடயங்களையும் நாங்கள் National Planning Department ஊடாக, Indian High Commission ஊடாக நாங்கள் முன்னெடுத்திருக்கின்றோம். அதனையும் செய்து தாருங்கள்!

இந்திய அரசாங்கம் வடக்கிலே அதிகளவான விடயங்களைச் செய்திருக்கின்றது; அதுபோல் மலையகத்திலும் செய்திருக்கின்றது; தற்போது கிழக்கிலும் தங்களது முன்னெடுப்புகளை அது செய்து வருகின்றது. இதற்காக உண்மையாகவே இந்திய அரசை நான் பாராட்டுகின்றேன். இந்திய அரசு இலங்கைக்குப் பெரும் பலமாக இருக்கின்றது. இந்திய அரசின் ஒத்துழைப்பை நாங்கள் தொடர்ச்சியாகப் பெற வேண்டியவர்களாக இருக்கின்றோம்.

விசேடமாக, இந்த வரவு செலவுத்திட்டத்தில் பண்ணையாளர்களைப் பாதுகாக்கின்ற, ஊக்குவிக்கின்ற விடயங்கள் பற்றிக் கூறப்பட்டிருக்கின்றது. இன்று உள்நாட்டுப் பால் உற்பத்தியானது எமது நுகர்வுத் தேவையில் 45 சதவீதத்தையே பூர்த்தி செய்கிறது. மிகுதி 55 சதவீதமான பால் உற்பத்தியையும் வெளிநாட்டிலிருந்து இறக்குமதி செய்ய வேண்டிய நிலைக்கு நாங்கள் தள்ளப்பட்டு இருக்கின்றோம். அந்த வகையில், அரசானது பாற் பண்ணையாளர்களை ஊக்குவிக்கின்ற விதத்தில், பால் உற்பத்தியை அதிகரிக்கும் விதத்தில் சிறந்த செயற்பாடுகளை இதில் உள்வாங்கியிருப்பதை நான் உண்மையாகவே பாராட்டுகின்றேன்.

அத்தோடு, ஊழற்ற பொருளாதாரத்தைக் கட்டியெழுப்புவதற்கான செயற்பாடுகளும் மேற்கொள்ளப்படவிருப்பதை நான் உண்மையில் பாராட்டுகின்றேன். அதுபோல், 'டிஜிட்டல்' பொருளாதாரத்தை வலுப்படுத்துவதற்கான செயற்பாடுகளும் உள்வாங்கப்பட்டு இருக்கின்றன. இவ்வாறு இந்த வரவு செலவுத்திட்டத்தில் நன்மை பயக்கின்ற பல விடயங்கள் உள்ளடக்கப்பட்டிருக்கின்றன.

ஆனாலும், இன்று எங்களுடைய பிரதேசங்களின் தேவைப்பாடுகள் கூடுதலாக இருக்கின்றது. இந்த நாட்டிலுள்ள தமிழர்கள் கடந்தகால அரசினால், ஆட்சியாளர் களினால், அரசியல்வாதிகளினால் பாதிக்கப்பட்டிருக்கின் றார்கள்; வலுவிழந்து இருக்கின்றார்கள்; திட்டமிடப்பட்ட முறையில் பின்தள்ளப்பட்டு இருக்கின்றார்கள். அதிலும் விசேடமாக அம்பாறை மாவட்டத் தமிழ் மக்கள் பல அடிபாடுகளை, பல பிரச்சினைகளைச் சந்தித்தவர்களாக இருக்கின்றார்கள். அதனால் கூடுதலான நிதி ஒதுக்கீடுகளை அந்தப் பிரதேசங்களுக்குச் செய்ய வேண்டியிருக்கின்றது. அங்கிருக்கின்ற அடிமட்ட மக்களின் வாழ்வாதாரத்தை உயர்த்த வேண்டிய கடமையும் பொறுப்பும் இந்த அரசுக்கு இருக்கின்றது. ஏனென்றால், இந்த அரசாங்கம் கடந்தகால அரசுகள் விட்ட தவறுகளிலிருந்து நீங்கி, புதிய, புத்துணர்ச்சியான ஆட்சியைக் கட்டியெழுப்ப வேண்டுமென்ற நோக்கத்துடன் அதிகாரத்துக்கு வந்திருக்கின்றது.

இந்த நாட்டில் பால் உற்பத்தியை அதிகரிக்கவேண்டுமானால், நீங்கள் பாற் பண்ணையாளர்களைப் பாதுகாக்க வேண்டும். அவர்களது கால்நடைக்கான மேய்ச்சல் தரைக் காணியை ஒதுக்க வேண்டிய கடமையும் பொறுப்பும் உங்களுக்கு இருக்கின்றது. குறிப்பாக, அம்பாறை மாவட்டத்தின் வட்டமடு பிரதேசத்தில் உள்ள 4,000 ஏக்கர் காணி 1976ஆம் ஆண்டு மேய்ச்சல் தரைக்கென்று gazette பண்ணப்பட்டு இருக்கின்றது. ஆனால், 2010ஆம் ஆண்டு Forest Departmentஆனது forest காணியுடன் அந்த மேய்ச்சல் தரைக்குரிய காணியையும் சேர்த்து எல்லை நிர்ணயம் செய்து, gazette பண்ணியிருக்கின்றது. கடந்த வெள்ள அனர்த்தம் காரணமாக இலட்சக்கணக்கான பெறுமதியான கால்நடைகள் உயிரிழந்திருந்தன. இதனால் பண்ணையாளர்கள் மிகவும் பாதிக்கப்பட்டார்கள். இன்று அங்கு மேய்ச்சல் தரைக்கான இடம் போதாமலிருக்கின்றது. ஏனென்றால், அந்த 4,000 ஏக்கர் மேய்ச்சல் தரைக் காணியிலே தற்போது காடு வளர்ந்திருக்கின்றது. அந்தக் காடுகளை, மரங்களைக் குறைத்து அவற்றை புற்றரையாக மாற்ற வேண்டும். ஆனால், Forest Department அதற்கான அனுமதியைக் கொடுப்பதில்லை. பண்ணையாளர்கள் அந்த இடத்துக்குப் போனால், அவர்களைக் கைது செய்கின்றார்கள். அந்த நிலைமையை மாற்ற வேண்டிய கடமைப்பாடு உங்களுக்கு இருக்கின்றது. நிச்சயமாக 4,000 ஏக்கர் காணியானது மேய்ச்சல் தரைக்குப் போதாமல் இருக்கின்றது. ஏனென்றால், அம்பாறை மாவட்டத்திலே 150,000க்கும் மேற்பட்ட கால்நடைகள் இருக்கின்றன. ஆனால், அங்குள்ள ஒரேயொரு மேய்ச்சல் தரையாக வட்டமடு காணி மட்டுமே இருக்கின்றது. ஆகவே, அங்கிருக்கின்ற பண்ணையாளர்களை நீங்கள் பாதுகாத்துக் கொள்ளுங்கள்! அந்தக் கடமையும் பொறுப்பும் உங்களுக்கு இருக்கின்றது. அவர்களின் வாழ்க்கையில் நீங்களும் பங்குதாரராக மாற வேண்டும். அவர்களுக்கு கடன் உதவிகளைச் செய்யுங்கள்! நட்டம் ஏற்பட்டால் இழப்பீட்டைக் கொடுங்கள்! மிருக வைத்தியர்களை அந்த இடங்களுக்கு நியமியுங்கள்! அப்பொழுதுதான் கால்நடைகளைப் பாதுகாத்து, பண்ணையாளர்களை ஊக்குவிக்க முடியும்.

மீள்குடியேற்றம் - resettlement செய்வதற்கு இதில் நிதியொதுக்கப்பட்டிருக்கின்றது. இன்று கிட்டத்தட்ட 40 வருடங்களாகியும்கூட அங்கிருந்து இடம்பெயர்ந்து மீளக் குடியமர்த்தப்பட்டவர்களுக்கான எந்த அடிப்படை வசதியும் செய்து கொடுக்கப்படவில்லை. அண்மையிலே பொத்துவிலில் உள்ள கனகர் கிராமத்தில் மீளக்குடியமர்ந்த 196 பேரில் 76 பேருக்குத்தான் காணி அனுமதிப் பத்திரம் கொடுக்கப்பட்டிருக்கின்றது. மிகுதியானவர்களுக்குக் கொடுக்கப்படவில்லை; அவர்களுக்கும் கொடுக்கப்பட வேண்டும். அவ்வாறு 76 பேருக்கு மீள்குடியமர்வதற்கு அனுமதி கொடுக்கப்பட்டாலும், அவர்களுக்கு எந்தவித அடிப்படை வசதிகளும் செய்து கொடுக்கப்படவில்லை. குறிப்பாக, வீட்டு வசதி, குடிநீர் வசதி, வீதி அபிவிருத்தி போன்றவற்றுக்கான எந்த வேலைத்திட்டமும் செய்து கொடுக்கப்படவில்லை.

அந்தப் பிரதேசங்கள் வெறுமனே காடுகளாகக் காணப்படுகின்றன. அவர்கள் தாங்களே அந்தப் பிரதேசத்தைத் துப்புரவு செய்திருக்கின்றார்கள். அவர்கள் மிகவும் கஷ்டமான நிலையில், விவசாயத்தை நம்பியிருக்கின்றவர்கள். வாழ்வாதாரத்திலே அடிமட்டத்திலிருக்கின்ற அவர்கள், பொருளாதாரத்திலும் குறைந்த மட்டத்தில் இருக்கின்றார்கள். எனவே, அவர்களுக்கான அடிப்படை வசதிகளை நீங்கள் செய்து கொடுக்க வேண்டும். அவர்கள் கிட்டத்தட்ட 400 நாட்களாக உண்ணாவிரதப் போராட்டத்தை மேற்கொண்ட பின்னர்தான் அந்த 76 பேருக்கும் அனுமதிப் பத்திரம் கிடைத்தது. மீதிப் பேருக்கு அது கிடைக்கவில்லை. எனவே, அவர்களுக்கான வீட்டுத் திட்டத்தை வழங்கி, அடிப்படை வசதிகளைச் செய்து கொடுங்கள்! அந்தப் பொத்துவில், கனகர் கிராமத்து மக்கள் என்றும் உங்களுக்கு விசுவாசமாக

[ගරු කවින්දිරන් කෝඩීස්වරන් මහතා]

இருப்பார்கள். அதேபோலதான், மேலும் அதிகளவான வேலைத்திட்டங்களை அங்கு செய்யவேண்டியிருக்கின்றது.

நீர் வழங்கல் திட்டத்திற்குக் கூடுதலான பணத்தை இந்த அரசாங்கம் ஒதுக்கியிருக்கின்றது; உண்மையாக அதைப் பாராட்டுகின்றேன். அவ்வாறு ஒதுக்கப்பட்ட நிதியிலிருந்து அம்பாறை மாவட்டத்தில் இருக்கின்ற தமிழ்ப் பிரதேசங்களுக்கும் நீர் வழங்கல் வேலைத்திட்டத்தைச் செய்ய வேண்டும். கடந்தகால ஆட்சியாளர்களால் குறிப்பாக அங்குள்ள தமிழ்ப் பிரதேசங்கள் புறக்கணிக்கப் பட்டிருக்கின்றன. நான் கடந்த காலத்தில் நீர் வழங்கல் அமைச்சராகவிருந்த ரஊப் ஹகீம் மற்றும் ஏனைய அமைச்சர்களுடன், "ஏன் எங்களது தமிழ்ப் பிரதேசத்தைப் புறக்கணித்தீர்கள்" என்று விவாதித்திருக்கின்றேன். ஆனால், இனம், மதம், ஜாதி பார்க்காமல் செயற்பாடுகளை முன்னெடுக்கக் கருதுகின்ற அரசாங்கமாக இருப்பதனால் எங்களுடைய அம்பாறை மாவட்டத்தில் நீர் வழங்கலைச் செய்ய வேண்டிய தேவை இருக்கின்ற பல இடங்களிலும் தங்களுடைய அரசாங்கத்தின்மூலம் நீங்கள் நீர் வழங்கலைச் செய்வீர்கள் என்று நான் நம்புகின்றேன். நீங்கள் கட்டாயமாக அவற்றைச் செய்ய வேண்டுமென்று இந்த இடத்திலே வலியுறுத்திக் கேட்கின்றேன். கௌரவ அமைச்சரவர்கள் இங்கே இருக்கின்றீர்கள்! நிச்சயமாக, நீங்கள் இதற்கான பதிலை வழங்க வேண்டும்.

அத்துடன், ஏற்கெனவே NHDAஇன் வீட்டுத் திட்டத்தின்கீழ் அமைக்கப்பட்ட வீடுகள் அரைகுறையாக இருக்கின்றன. அவ்வாறு அரைகுறையாகவிருக்கின்ற வீடுகளையும் பூரணமாகக் கட்டிமுடிப்பதற்கு நீங்கள் உங்களால் இயன்ற நிதியுதவிகளை வழங்கி, அவர்களை வலுப்படுத்த வேண்டுமென்று கேட்டு, எனது உரையை முடித்துக் கொள்கின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. (Prof.) Sena Nanayakkara. You have 12 minutes.

[පූ.භා. 11.59]

**ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார)
(The Hon. (Prof.) Sena Nanayakkara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ අප සංවාදයට ලක් කරන්නේ මෑත කාලීන ලාංකීය දේශපාලන ඉතිහාසයේ සුවිශේෂතම අය වැයක් ගැනයි කියන කාරණය ඉතා පැහැදිලියි. විශේෂයෙන්ම නිදහසින් පසු ලාංකීය දේශපාලන, සමාජ, ආර්ථිකය තුළ ඇති වෙච්ච ඉතාම ගැඹුරු, වඩාත්ම සංකීර්ණ සමාජ බෙදවාවක රාශියකට මුහුණ දුන් අපේ රටේ ජනතාව ඉතා විශාල විපත්ති, ව්‍යසන රාශියකටත් මුහුණ දුන්නා. ඉන් අනතුරුව රට කොයි තරම් විපතකට පත් වුණා ද කියතොත්, අපේ රට ලෝකය ඉදිරියේ හෙළිදරව් වුණේ බංකොලොත් රාජ්‍යයක් විධියටයි. ඒ තත්ත්වය තුළ මේ රටේ සාතිශය බහුතර ජනතාව විඳපු පීඩාව, ගත කරපු දුක්ඛිත ජීවිතය ඉතාම ඛේදනීයයි. ඒ ඇති වෙච්ච තත්ත්වයෙන් මේ රට මුදා ගන්න තමයි නව දේශපාලන ව්‍යාපාරයක් විධියට, පුළුල් මහජන ව්‍යාපාරයක් විධියට ජාතික ජන බලවේගය මහජනතාව එක්ක එකතු වෙලා ඒ නව ජාතික පුනරුදය සඳහා සටන් වැදුණේ. කාලාන්තරයක් තිස්සේ මේ රට පාලනය කරපු වැරදි දේශපාලන ක්‍රමය, අසාර්ථක ආර්ථික ප්‍රතිපත්ති, වගකීම් විරහිත දූෂිතව මූල්‍ය කළමනාකරණය වැනි කාරණා නිසා ජාතික ජන බලවේගය විධියට අපි මේ වන කොට තීරණය වෙලා තිබෙනවා, මේ රටට ඉතාම යහපත් අනාගතයක් උදා කිරීමේ වැඩකටයුතු රාශියක් පැහැදිලිවම දියත් කරන්නට. මම විශ්වාස කරනවා මේ ඉදිරිපත් කරපු 2025 අය වැය ප්‍රකාශය ඒ සඳහා ඉතාම සාධනීය ප්‍රවේශ මාර්ගයක් කියලා. ඒකයි මම විශ්වාස කරන්නේ මේ අය වැය ප්‍රකාශය මේ ජාතියට, මේ දේශයට යහපත් අනාගතයක් පිරිනමන්න කෙරෙන වඩා යහපත් ප්‍රවේශ මාර්ගයක් කියලා.

එදා අපේ රටේ මිනිසුන් කොයි තරම් අර්බුදයට පත් වුණා ද කියතොත්, පැය ගණන්, වරු ගණන්, දින ගණන් පෝලිම්වල හිර වෙච්ච මිනිසුන්ට සමහර විට ශාරීරිකව වාගේම මානසිකව බෙලහීනව එතැනම -පෝලිම්වලම- වැටිලා මියැදෙන්නට සිද්ධ වුණා. ඒ ඛේදනීය ඉරණමෙන් මේ රට ගලවා ගන්න තමයි ජාතික ජන බලවේග රජය මේ වන කොට මේ පිඹුරුපත් සකසා තිබෙන්නේ. ඒකට හොඳම උදාහරණය තමයි මේ ඉදිරිපත් කරපු 2025 අය වැය. මේ අය වැය තුළ වඩාත් විශේෂතම කාරණය විධියට අපි දකිනවා, මේ රටේ ප්‍රජාතාන්ත්‍රික තත්ත්වය ආරක්ෂා කර ගනිමින්, සාමාන්‍ය පොදු ජනතාවගේ සුබසිද්ධිය අභිලාෂ කොට ගනිමින් මේ හදලා තිබෙන සැලැස්ම. හරිම හාස්‍යජනකයි, මේ වන කොට විපක්ෂයේ අසුන් සියල්ල හිස් වෙලා ගිහින්. අප මේ රට කොයි තරම් දුරට යහපත් කරන්න උත්සාහ කළත්, කිඹුල් කඳුළු හෙළන විපක්ෂය මේ මොහොතේ මේ සභාවේ නැති එක බොහොම කනගාටුදායකයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුළු අය වැය ප්‍රකාශය පිළිබඳවම මම මගේ අවධානය යොමු කරන්නේ නැහැ. නමුත්, මගේ අවධානය දිනාගත් ඉතාම වැදගත්, සුවිශේෂ කාරණයක් පිළිබඳව පමණක් ගැඹුරින් කල්පනා කරන්න හිතුවා. ඒ, අධ්‍යාපනය කියන කාරණයයි. අධ්‍යාපනය කියන එක රටක අනාගතය තීරණය කෙරෙන වඩාත් සුවිශේෂතම, ප්‍රබලතම සාධකය විධියට තමයි අප ගණන් ගන්නේ. රටක අධ්‍යාපනය දුර්වල වුණොත් ඒ රටේ ජනතාව බුද්ධිමත්කමින් හීන වෙනවා, ඥානයෙන් අඩු වෙනවා, කාලීන අවබෝධයෙන් තොර වෙනවා, තමන්ට එළඹෙන අභියෝගයන්ට මුහුණ දිය නොහැකි වෙනවා. කොටින්ම කියතොත්, රටේ ජනතාව බුද්ධිමත්කමින් හීන වෙනවා. ඇත්ත වශයෙන්ම මේ රට ඉතාම ඉක්මනින් දීන රාජ්‍යයක් බවට පත් වන ලකුණු, අනුන්ගේ වහලුන් බවට පත් වන ලකුණු අපේ රටේ තිබෙනවා. ඒ තත්ත්වය මඟ හැර ගන්න තමයි අපි මෙවර අය වැයෙන් මේ රටේ ජනතාව සබුද්ධික ජනතාවක් වශයෙන් නිර්මාණය කරන්නට පිඹුරුපත් සකසා තිබෙන්නේ.

අධ්‍යාපනය කියන කාරණය ගත්තාම, අපේ ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශයේත් සඳහන් වෙනවා සබුද්ධික සමාජයක් නිර්මාණය කිරීම ගැන. ඒ තුළත්, විශේෂයෙන් අය වැය තුළත් අවධාරණය කරන කාරණා දෙකක් තිබෙනවා.

එකක් තමයි, මේ ජාතියේ දරුවන් සියලු දෙනාට අධ්‍යාපනය හිමියි, එය ඔවුන් සතු අනුල්ලංඝනීය අයිතියක් කියන කාරණය. දෙවැනි කාරණය තමයි, ඒ අයිතිය සපුරා ක්‍රියාත්මක කළ යුත්තේ රජය විසිනුයි කියන එක. රජයේ වගකීමක් තමයි ජාතියේ සියලු දරුවන්ට අධ්‍යාපනය ලබා දීම. මෙන්න මේ කියන කාරණය ඔස්සේ මෙම අය වැය තුළින් අධ්‍යාපනය කියන කාරණය ඉතා මැනවින් ස්පර්ශ කර තිබෙනවා; ආමන්ත්‍රණය කර තිබෙනවා කියා ඔප්පු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සාමාන්‍යයෙන් අප අහලා තිබෙන, ලංකාවේ මේ දක්වාම ප්‍රචලිත කියමනක් තිබෙනවා. ඒ තමයි, 'ළඟම පාසල-හොඳම පාසල' කියන එක. එය මෙතෙක් -දශක ගණනාවක්- මේ මහ පොළොව තුළ පිළිගත්තු කාරණාවක්. නමුත්, දරුවෙකු මවගේ කුසෙහි පිළිසිඳ ගත් දා ඉඳන්ම ඒ අම්මයි තාත්තයි දෙන්නාම පුළුවන් තරම් බොරු ගොතලා, බොරු හදලා

උත්සාහ කරන්නේ තමන්ගේ දරුවා උසස් පාසලකට; ජනප්‍රිය පාසලකට ඇතුළත් කරන්නයි. ඒ බව අපි පැහැදිලිවම දන්නවා. අධ්‍යාපනයේ ඒ විෂමතාව මේ රටේ මේ මහ පොළොව මත ඉතා බරපතළ විධියට දකින්න ලැබෙනවා. එය මේ රට විනාශකාරී මාවතකට යොමු කරන්න පුළුවන් කාරණයක් විධියට තමයි අප දකින්නේ.

රටේ සංවර්ධනය, අනාගතය සම්බන්ධයෙන් සලකා බලනකොට, අධ්‍යාපනයේ බෙදවාචකය යනු, ඉතා ප්‍රබල කාරණයක්. ලංකාවේ පාසල් 10,126න් පාසල් 1,500ක් තිබෙනවා, සිසුන් 50ට අඩු සංඛ්‍යාවක් ඉන්න. ඒවා කිසිම පහසුකමක් නැති පාසල්. මා ඉන්නේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ නුවර කලාවිය දුෂ්කර කොටු ගම්මානයකයි. ඒවායේ සමහර පාසල් තිබෙනවා, වැසිකිළියක් පවා නැති. ඉතින්, අපේ ආදරණීය අම්මාට, තාත්තාට හිතන්න වෙනවා මගේ දරුවා 'අ' යන්න 'ආ' යන්න කියන්න යන්නේ වැසිකිළියක් නැති පාසලකටයි කියලා. මෙය ඉතා බේදනීය තත්ත්වයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමහර පාසල්වලට පිහිනුම් තටාක තිබෙනවා, සමහර පාසල්වලට අවම වශයෙන් වැසිකිළියක්වත් නැහැ. මේක තමයි සාමාන්‍ය තත්ත්වය. ඉතින්, අපේ අය වැය ප්‍රකාශනය තුළින්, ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් ආමන්ත්‍රණය කරපු ඒ කිලෝමීටර 3කට ආසන්න වපසරියක් තුළ පාසලක් පිහිටුවිය යුතුයි කියන කාරණය කියැවෙනවා. විශේෂයෙන්ම මේ කාරණාව විතරක් නොවෙයි, පෙර පාසල් වියේ සිට විශ්වවිද්‍යාල අධ්‍යාපනය දක්වාත්, විශ්වවිද්‍යාල අධ්‍යාපනයෙන්, පශ්චාත් උපාධිය දක්වාත් අය වැය ප්‍රකාශනය තුළින් වෙන් කෙරෙන ප්‍රතිපාදන ඉතාම ප්‍රබලයි. එය ඉතාම වැදගත් කාරණාවක් විධියට අපි සලකනවා. ශිෂ්‍යත්ව විභාගයේ ශිෂ්‍යාධාරයේ ඉඳලා ඒ සියලු දීමනා වැඩි කරලා තිබෙනවා. වෘත්තීය අධ්‍යාපනයේ යෙදෙන ශිෂ්‍යයන්ට ලබාදෙන ශිෂ්‍යාධාරය රුපියල් 4,000 සිට 5,000 දක්වා වැඩි කරලා තිබෙනවා. විශ්වවිද්‍යාල සිසුන්ගේ මහපොළ ශිෂ්‍යාධාරය රුපියල් 5,000 සිට රුපියල් 7,500 දක්වා වැඩි කරලා තිබෙනවා. විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ගේ ශිෂ්‍යාධාරය රුපියල් 4,000 සිට රුපියල් 6,500 දක්වා වැඩි කරලා තිබෙනවා. විශ්වවිද්‍යාලවල ගුණාත්මකභාවය වර්ධනය සඳහා රුපියල් මිලියන 135,000ක් වෙන් කරලා තිබෙනවා. රුපියල් මිලියන 135,000ක් කියන්නේ ඉතා සුවිශාල මුදලක්. රටේ විශ්වවිද්‍යාලවල පර්යේෂණ කටයුතු සඳහා, ගුණාත්මක තත්ත්වය වර්ධනය සඳහා මෙතරම් සුවිශාල මුදලක් වෙන් කළ පළමු අය වැය විධියට තමයි අපි මේක දකින්නේ.

ඊට අමතරව, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උතුර, උතුරු මැද, ඌව, මධ්‍යම හා බස්නාහිර පළාත්වල ක්‍රීඩා පාසල් සංවර්ධනයට රුපියල් මිලියන 500ක මුදලක් වෙන් කරලා තිබෙනවා. යාපනය පුස්තකාලය සංවර්ධනයට රුපියල් මිලියන 100ක්, අනෙකුත් ප්‍රාදේශීය පුස්තකාල සංවර්ධනයට රුපියල් මිලියන 200ක් යනාදී වශයෙන් ඉතා සුවිශාල මුදලක් මේ රටේ අධ්‍යාපනයේ තිරසාර සංවර්ධනය සඳහා වෙන් කරලා තිබෙනවා. ඒ අභිලාෂය පෙරදැරි කරගෙන සකස් කළ අය වැයක් විධියට තමයි අපි මේ අය වැය දකින්නේ. අධ්‍යාපනය වෙනුවෙන් පැහැදිලිවම මේ වෙනකොට රුපියල් බිලියන 619කට වැඩි මුදලක් අපි පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් වශයෙන් වෙන් කරලා තිබෙනවා. මේක ඉතාම සාධාරණ, විශිෂ්ට අය වැයක් විධියට අපි සලකන්නේ, මේ රටේ සබුද්ධික සමාජයක් ගොඩනැගීමෙහිලා අත්‍යවශ්‍ය ඒ සාර්ථක, ජව සම්පන්න, ශක්ති සම්පන්න පදනම නිර්මාණය කරන තත්ත්වය යටතේ.

මට පුදුමයි කියන්න ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගෞරවනීය විපක්ෂ නායකතුමා පැහැදිලිවම කියනවා, system change එකක් ගැන. System change එකක් කරන්න පැහැදිලිවම අපට පුළුවන් වෙන්නේ මේ සියල්ල වෙනස් කිරීම තුළින් පමණයි. හැබැයි, එතුමා දේශපාලන පළි ගැනීම් කියලා කිඹුල් කඳුළු හෙළනවා, අපි යම් යම් වෙනස් කිරීම් කරනකොට. ඉතින් මේක ඉතාම පැහැදිලි තර්කයක් නැති තර්කයක්. ඒ නිසා මට හිතෙනවා, එතුමා කියපු දස වැදෑරුම් රාජ්‍ය තාන්ත්‍රික ලක්ෂණ අපේ අය වැය තුළ පැහැදිලිව තිබෙනවා කියලා. ඒ නිසා මෙය ඉතාම හොඳින් කියවන්න කියලා අපි ආරාධනා කරනවා. ජාතික ජන බලවේගය ඉදිරිපත් කරන මේ යම් යම් සාධනීය යෝජනා, සාධනීය වැඩ සැලසුම්, මඩ, අවලාද, බොරු ප්‍රචාර ඔස්සේ අවතක්සේරු කරන්න උත්සාහ කරන ඒ සියලුදෙනාට මම මෙන්න මේ කාරණය කියන්න කැමැතියි. අපේ සුභාෂිතයේ තිබෙනවා, කාව්‍යයක්; කවි කඩක්. ඒ තමයි,

"දිගත පතළ සුවඳැති සොඳ සඳුන් කඳ

සිඳිත මඬිත එක ලෙස පැතිරෙයි සුවඳ" කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්ත වශයෙන් සඳුන් කඳක් නිකම් තිබුණාට සුවඳවත් වෙන්නේ නැහැ. ඒ සඳහා ඒකට ගහන්න ඕනෑ, තලන්න ඕනෑ, කඩන්න ඕනෑ, කුඩු කරන්න ඕනෑ. ඒ තත්ත්වය යටතේ තමයි සඳුන් කඳ වඩාත් ලෝකය පුරා සුවඳවත් වෙන්නේ. ඉතින් මම හිතන විධියට ජාතික ජන බලවේගයත් ඒ වාගේයි. ජාතික ජන බලවේගය මේ සියලු චෝදනාවලින් පැහැදිලිවම සැලෙන්නේ නැහැ. අධ්‍යාපන ප්‍රතිපත්තිය මූලිකකොටගත් මේ අය වැය ප්‍රකාශනය මේ රටට පැහැදිලි තිරසාර සංවර්ධනයක්, යහපත් අනාගතයක් නිර්මාණය කරනවාය කියන කාරණය අවධාරණය කරමින් මා නිහඬ වෙනවා. ඔබතුමා මට කාලය ලබා දුන්නාට බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Rohitha Abeygunawardhana. You have 17 minutes.

[අ.භා. 12.10]

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම ජාතික ජන බලවේගයේ මංගල අය වැය ඉදිරිපත් කරලා, ඒ අය වැයේ දෙවන වර කියැවීමේ විවාදයට සම්බන්ධ වෙන්න ලැබීම ගැන මා සතුටු වෙනවා. අවුරුදු 24ක් එක දිගටම මේ පාර්ලිමේන්තුව තුළ අය වැය 24කට සම්බන්ධ වෙලා 25වෙනි අය වැය විවාදයට සම්බන්ධ වෙන්න ලැබීම ගැනත් මම සතුටු වෙනවා.

ගරු අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරපු මේ අය වැය පිළිබඳව නොයෙකුත් අදහස් මේ සභාව තුළ ඉදිරිපත් වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම දකින විධියට මේ අය වැය තුළ තිබෙන හොඳ-නරක, ජනතාවට තිබෙන වාසි, ජනතාවට තිබෙන අවාසි කියන දෙක ගැන අපට දැකගන්න පුළුවන් වෙන්නේ අද හෙට නොවෙයි. මේ අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ අවුරුද්දකටත් නොවෙයි, මාස 9කට. වෙන රජයන්වලින් ඉදිරිපත් කරපු අය වැය ඉදිරිපත් කළේ මාස 12කට. නමුත් මේ අය වැය ඉදිරිපත් කරන්නේ මාස 9කට - මේ අය වැය ක්‍රියාත්මක වෙන්නේ ලබන අප්‍රේල් මාසයේ 01වැනි දා ඉඳන් ලබන දෙසැම්බර් මාසයේ 31 වැනි දා දක්වා. මේ අය වැයේ හොඳ, නරක දෙක දැකගන්න අපට පුළුවන්කම ලැබෙන්නේ මේක ක්‍රියාත්මක වීමෙදී. මේ ලියවිල්ල සමාජයේ, මේ පොළොවේ පැළ කරලා ප්‍රතිලාභය දැනෙනකොට තමයි මේක හොඳද, නරකද කියන්න පුළුවන්. ඒ නිසා දැන් මේක හොඳද, නරකද කියලා කියන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ.

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

මේකේ තිබෙනවා හොඳ යෝජනා, හොඳ වැඩ පිළිවෙළ, නව අදහස්. ඒ වාගේම, සමාජය තුළ කවදාවත් සැලකිල්ලට නොගැණුනු යම් යම් සමාජ ක්ෂේත්‍රවල ඉන්න අය ගැන සොයා බැලීම් මේක තුළ තිබෙනවා. ඒ සොයාබැලීම් ගැන තිබෙනවා වාගේම, මේකේ ඇත්ත තත්ත්වය දැනගන්න පුළුවන් වෙන්නේ මේ වසරේ -2025 වර්ෂයේ- අවසානයේ; දෙසැම්බර් මාසයේ අවසානය වෙනකොට.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය වැයේ මේ කාරණය මම දකිනවා. මේ රටේ ලක්ෂ 16ක පමණ රාජ්‍ය සේවකයෝ ලොකු බලාපොරොත්තුවක් ඇතුව තමයි ජාතික ජන බලවේගයේ ආණ්ඩුවක් මේ රට තුළ පිහිටුවාගන්න කැමැත්ත පළ කරලා ජනවරම ලබා දුන්නේ. ඒ ජනවරම ලැබීමෙන් පසු මේ අය වැය ලේඛනය තුළ වැටුප් වැඩිවීමක් ගැන පැහැදිලිව සඳහන් කර තිබෙනවා. මේ වැටුප් වැඩිවීම ගැන පෞද්ගලිකව මම හරි සතුටු වෙනවා. මොකද, මේ තිබෙන ජීවන බරත් එක්ක, මේ තිබෙන ජීවන වියදමත් එක්ක රාජ්‍ය සේවයේ ඉන්න අයට ඔවුන්ගේ පඩි පැකට් එක ගළපාගන්නේ කොහොමද කියන ප්‍රශ්නය තිබෙනවා. අන්න ඒ නිසා මේ වැටුප් වැඩිවීම ගැන මම සතුටු වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය වැය යෝජනා අනුව, 2025 වර්ෂය, 2026 වර්ෂය, 2027 වර්ෂය කියන කාලය තුළ අවුරුදු තුනක සැලැස්මක් අනුව, මූලික වැටුප වැඩි කිරීමක් වෙලා තිබෙනවා. වැටුපට එල්ලලා තිබ්බ මුදල් ටික වැටුපට එකතු කරලා තිබෙනවා. අවුරුදු තුනක් යනකොට තමයි මේ මුළු මුදල සියයට 100කින් රාජ්‍ය සේවකයාට ලැබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වැටුප් වැඩිවීමෙන් 2025 වර්ෂයේ සියයට 30ක්, ආපහු 2026 වර්ෂයේ සියයට 30ක්, 2027 වර්ෂයේ සියයට 40ක් වාගේ පෙන්නුම් කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2027 වර්ෂය වෙනකොට බිලියන 325ක් රජය මේ රාජ්‍ය සේවකයා වෙනුවෙන් වියදම් කළ යුතු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයකු හැටියට මම කිව්වේ ඒකයි. පසුගිය අය වැය ඉදිරිපත් කළේ ඒ වසරට. ඒ අවුරුද්දට දෙන වැටුප ගැන තමයි සේවකයන්ගේ අවධානය යොමු කරලා තිබුණේ. එවකට හිටපු මුදල් ඇමතිවරයා, ජනාධිපතිවරයා කියනවා, අපි රුපියල් 10,000කින් පඩිය වැඩි කරනවා කියලා. එක්කෝ ඒක වැටුපට එල්ලනවා. නැත්නම් මූලික වැටුපට එකතු කරනවා. හැබැයි දැන් මෙන්න මේ ප්‍රශ්නය මුළු රට තුළ තිබෙනවා. මොකක්ද ප්‍රශ්නය ගරු නියෝජ්‍ය කථානායකතුමනි? මම මේ පාර්ලිමේන්තුවට ඇතුළු වෙනකොට පාර්ලිමේන්තුවේ අප පරීක්ෂාවට ලක් කරන පොලිස් නිලධාරි ***සාජන්*** මහත්තයාගෙන් මම ඇහුවා, "සාජන් මහත්තයා. කීයකින්ද, පඩි වැඩි වෙලා තිබෙන්නේ" කියලා. "දන්නේ නැහැ මන්ත්‍රීතුමා" කිව්වා. ඔහු දන්නේ නැහැ. මම පාර්ලිමේන්තුවේ කාර්යාල කාර්ය සේවකයෙකුගෙනුත් ඇහුවා. ඔහුත් දන්නේ නැහැ. හුඟක් වෙලාවට මම ගුරුවරුන්ගෙන් කථා කරලා අහනවා; විදුහල්පතිවරුන්ගෙන් අහනවා. ඒ අය කියනවා, "අනේ තවම දන්නේ නැහැ" කියලා. අප්‍රේල් මාසයේ සිංහල අවුරුද්දෙන් පස්සේ 22, 23 දින වෙනකොට වැටුප අතට ගන්නකොට තමයි ඒ අයට කොපමණ ප්‍රමාණයකින් පඩි වැඩි වෙලා තිබෙනවාද කියලා දැනගන්න පුළුවන්කමක් ලැබෙන්නේ.

වෛද්‍යවරයකුගේ වැටුප කොපමණ වැඩිවෙලා තිබෙනවා ද? ගුරුවරයකුගේ වැටුප කොපමණ වැඩි වෙලා තිබෙනවා ද? කාර්යාල කාර්ය සහායකයකුගේ වැටුප කොපමණ වැඩිවෙලා තිබෙනවා ද? හමුදා නිලධාරියකුගේ වැටුප කොපමණ වැඩි වෙලා තිබෙනවා ද? ඒ නිලධරයන්ගේ රැකියාවේ තිබෙන ස්වභාවයත් එක්ක කොපමණ වැටුප් වැඩිවෙලා තිබෙනවා ද කියලා බලාගන්න පුළුවන්කමක් ලැබෙයි. මේ ප්‍රශ්නාර්ථය රටේ තිබෙනවා. මේක තමයි ඇත්ත. රජය මේක තේරුම් ගන්න ඕනෑ. මේ වැටුප හරියාකාරව මෙන්න මෙච්චරයි වැඩි වෙන්නේ කියන එක ගැන ප්‍රශ්නයක් මුළු රට පුරාම තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජය සද්භාවයෙන් කරලා තිබෙන විධියටම ඒ වැටුප රාජ්‍ය සේවකයාට ලැබිය යුතුයි කියලා මම ප්‍රාර්ථනා කරනවා. සද්භාවයෙන් මම මේක කියන්නේ. ගරු ඇමතිතුමනි, කසාද බඳින්න ඉස්සෙල්ලා මනමාල පාර්ශ්වයයි, මනමාලිගේ පාර්ශ්වයයි දෙපැත්ත කථා කර ගන්නවා. ඊට පස්සේ පොරොන්දම් බලනවා. පොරොන්දම් ගැළපුනාට පස්සේ කසාදය තීන්දු කරනවා. කසාදය තීන්දු කරන්න ඉස්සෙල්ලා දෑවැද්ද ගැන කථා කරනවා. මනමාලයාගේ පැත්තෙන් අහනවා, දෑවැද්ද කොච්චර දෙනවා ද කියලා. එතකොට මනමාලිගේ පැත්තෙන් කියනවා, අපි මෙච්චර ගෙවල් දෙනවා; ඉඩම් දෙනවා; වාහන දෙනවා කියලා. එසේ කියලා විවාහය ලියා පදිංචි කරනවා; කසාද බඳිනවා; wedding එක තියෙනවා; homecoming එකත් තියෙනවා. Homecoming එකෙන් පස්සේ හුඟක් තැන්වල පොරොන්දු වෙච්ච දෑවැද්දෙන් සියයට 10යි දෙන්නේ. කුඹුරු ටික විතරයි දෙන්නේ, ගේ දෙන්නේ නැහැ. ඒක ඊළඟ අවුරුද්දේ දෙන්නම් කියනවා. දෙන්නම් කියලා තව පොරොන්දු වෙච්ච ඒවා තිබෙනවා නේ. ඒවා ඊළඟ අවුරුද්දේ දෙන්නම් කියලා කියනවා. මෙහෙම වෙච්ච කසාද අපේ ගම්වල තිබෙනවා. එහෙම තිබුණා වාගේ නොවෙයි. සමහර වෙලාවට අපි හිතමු කසාද බැන්දා කියලා. බැඳලා ඉවර වුණාට පස්සේ අවුරුද්දෙන් නේ ඊළඟ ඒවා හම්බ වෙන්නේ. බැඳලා අවුරුද්දක් දෙකක් යනවා, ළමයි නැහැ. එතකොට පොරොන්දු වෙච්ච දෑවැද්ද දෙන්නේ නැහැ. එහෙමත් වෙනවා නේ. දැන් wedding එකත් ඉවරයි.

රාජ්‍ය සේවකයෝ ජාතික ජන බලවේගයට ඡන්දය දුන්නා. මීට වැඩිය බලාපොරොත්තු ඇතිවයි ඔවුන් ඡන්දය දුන්නේ. දැන් wedding එක ඉවරයි. ඊට පස්සේ පාර්ලිමේන්තු මැතිවරණය කියන homecoming එකත් ජයට ගත්තා. මොකද හේතුව, දෑවැද්ද ෂුවර්. දෑවැද්ද ෂුවර් නිසා wedding එක අරගෙන, දැන් කියපු දේවල් ලබා දෙන්න අවුරුදු 3ක කාලයක් දීලා තිබෙනවා. අවුරුදු 3ක් දීලා තිබෙනකොට දැන් ඉදිරියේදී පළාත් පාලන මැතිවරණයත් එනවා නේ. පළාත් පාලන මැතිවරණයෙන් යම් විධියකින් ආණ්ඩුවට අඩු ප්‍රතිශතයක් හම්බ වුණොත්, මම කිව්වා වාගේ ළමයි නැති නිසා දෑවැද්ද අයින් කළොත් එහෙම මොකද වෙන්නෙ? එහෙමත් වෙනවා නේ. ඒ නිසා එහෙම වෙන්න දෙන්න එපා. ඒ රාජ්‍ය සේවකයාගේ බලාපොරොත්තුව සුනුවිසුනු කරන්න එපා කියලා බොහොම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. *[බාධා කිරීමක්]* බොහොම හොඳයි, ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමනි. අන්න එහෙම තමයි ඉන්න ඕනෑ. ඒ බලාපොරොත්තුව ඉටු කරන්න. මොකද හේතුව, දැන් තමුන්නාන්සේලා අපි දෙපැත්තේ ඉන්නවා නේ. එහෙත් හිටියා,-*[බාධා කිරීමක්]*

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**

(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)

(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Co-operative Development)

අපි ඒ වැඩේ අනිවාර්යයෙන්ම කරනවා, ගරු මන්ත්‍රීතුමා. ඒ ගැන සැකයක් තියා ගන්න එපා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**

(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)

(The Hon. Rohitha Abeygunawardhana)

බොහොම හොඳයි. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. මම කියන්නේ,- මම කියන දේ තමුන්නාන්සේලා පොඩ්ඩක් ඇහුම්කන් දෙන්න. ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක් දෙන අවවාද අනුශාසනා පිළිගැනීම වටිනවා නේ. හොඳයි නේද? *[බාධා කිරීමක්]* හොඳයි. අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවේ මේ සභාවේ ඔය පුටුවට ඇවිල්ලා 2026 අවුරුද්ද

වෙනුවෙනුත් අය වැය ඉදිරිපත් කරන්න ඕනෑ, ගරු ඇමතිතුමා. අන්න ඒ වෙලාවටත් පොඩි අත්පුඩියක් ගහන්න කික් එකක් එන්න එපැයි. මොකක්ද ඒ කික් එක? ඒ කික් එක තමයි මම කිව්වේ වෙලාසනින් දීලා තිබෙනවා කියලා. ඒක තියාගත්තා නම් හරි නේ 2026 අවුරුද්දට, 2027 අවුරුද්දට. එහෙම නම් 2026ට, 2027ට උත්සාහයක යෙදෙන්න, තව වැටුප් වැඩි කරන්න. ඒක එක. ගරු අමාත්‍යතුමනි, දෙවැනි එක තමයි මේ වෙනුවෙන් රුපියල් බිලියන 325ක මුදලක් වෙන් කරනවා. මුදල් වෙන් කිරීම විතරක් නොවෙයි, මුදල් හම්බ කරන්නත් ඕනෑ. මේ වියදම්. අපි හොයන්න ඕනෑ ආදායම්. මේවා වියදම්; අපි හොයන්න ඕනෑ ආදායම්. ඒකයි මම කිව්වේ, **අපි ඔය පැත්තේ** සිටියදී අවුරුදු 24ක් මේ පාර්ලිමේන්තුවේ අය වැයවල - සමහර නිලධාරින් අපට, - *[බාධා කිරීමක්]*

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු මන්ත්‍රීතුමනි, ඔය මුදල රුපියල් බිලියන 325ටත් වඩා වැඩි වෙනවා. මොකද හේතුව, මේ අවුරුද්දත්, ලබන අවුරුද්දත් අවසන් වෙනකොට තව 30,000කට වැඩියෙන් රාජ්‍ය සේවයට එකතු වෙනවා. ඒ එකතු වුණාම මීටත් වඩා ටිකක් වැඩි වෙනවා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

බොහොම සතුටුයි. ඕන්න ඔහොම තමයි ඉන්න ඕනෑ. එහෙම ඉන්න ඕනෑ. හැබැයි මතක තියා ගන්න ගරු ඇමතිතුමනි, මේ හැම එකක්ම හැන්සාඩ් වාර්තාවට ඇතුළත් වෙනවා කියලා.

මොකද, හේතුව පෙර කථා, - *[බාධා කිරීමක්]* මගේ වෙලාව දෙන්න. මම තවම කියලා ඉවර නැහැ. පෙර කථා - අවදානමෙන් කථා කරන්න එපා. පෙර කථා ඉතාම හොඳයි. අපේ ආණ්ඩුවේ අපට වෙච්ච දේවල් මම කියන්නම් කෝ. ගරු ඇමතිතුමාට මතකයි නේ. අපි හදා ගත්තා වියත් මඟක්. මතකයි නේ, ඔබතුමාට. අපි හදා ගත්තා, වියත් මඟක්. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ, ඔහොම ඉන්න කියනකල්. *[බාධා කිරීමක්]* දාලා ගියේ නැහැ. පොඩ්ඩක් ඔහොම ඉන්න. වියත් මඟක් අපි හදා ගත්තා. ගම්වල දේශපාලනය කරපු නායකයෝ ඔක්කොම පැත්තකට දාලා වියත් මඟෙන් ඇවිල්ලා මේ පාර්ලිමේන්තුව පිරෙන්න ආණ්ඩු පාර්ශ්වයේ හිටියා. බුදු අම්මේ! ආපු ගමන් අපටත් කියලා දුන්නා, මෙන්න මෙහෙමයි දිශානතිය, මෙන්න ආර්ථික වැඩ පිළිවෙළ කියලා. මට එක්කෙනෙකුව හොයලා දෙන්න, දැන් බෙහෙතකට අඹරා ගන්න. මේ විපක්ෂයෙන් එක වියතෙක් මට හොයලා දෙන්න, බෙහෙතකට අඹරා ගන්න. මට එක්කෙනෙකුව හොයලා දෙන්න, පින් සිද්ධ වෙනවා. *[බාධා කිරීමක්]* අද වියත් මඟත් නැහැ, අපිත් මඟ මඟ; ගෝඨාභය මහත්මයාත් මඟ මඟ. සමාවෙන්න! මෙන්න, වැරදිච්ච හැටි. මම මේ කියන්නේ වැරදිච්ච හැටි. හැබැයි, මම කියන්නේ ඒක ඔබට නොවේවා කියලායි. හේතුව, මතක තබා ගන්න, බලය හැම දාම නැහැ කියන එක. ජනතාවගේ අතේ තමයි අපි ගැන තීන්දුව තිබෙන්නේ. ජනතාව අපි දිහා හොඳට බලාගෙන ඉන්නවා. ඒ නිසා පරිස්සමෙන් වැඩ කිරීම තමයි හොඳ වෙන්නේ.

ඒ වාගේම මම තව අවවාදයක් දෙන්නම් කෝ, පරණ මිනිහෙක් විධියට. ඔබතුමන්ලාගේ 159දෙනෙකු මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. ඒ 159න් ජ්‍යෙෂ්ඨයෝ ඉන්නවා, කලින් පාර්ලිමේන්තුවේ හිටපු. අපි එකට හිටපු අය. අලුත් අය ඔක්කොම ආධුනිකයි. මම ඉල්ලීමක් කරනවා, පරිස්සමින්ම කථා කරන්න කියලා. මොකද, මාධ්‍යයට පරිස්සමෙන් කථා කරන්න. අපේ පාර්ශ්වයේ මම කියපු අයට වුණේ, කට ඇරපු තරමට බඩු බිම. කට අරින තරමට ඡන්ද නැත. ඒ නිසා හැම වෙලාවේම කට අරිනවාද, නැද්ද කියලා පරිස්සම් වෙන්න. මොකද, මාධ්‍යයත් එකක් කිව්වාම දෙකක් අහනවා නේ. මම මේ අවවාද දෙන්නේ, මේවා වෛරයෙන්, ක්‍රෝධයෙන්, කුහකත්වයකින් කියන ඒවා නොවෙයි. අපි ඇත්ත ඇති සැටියෙන් කථා කරන මිනිස්සු.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආදායම් හොයන තැන් ගැන මම කියන්න ඕනෑ. සුරාබදුවලින්, රේගුවෙන්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන්, අපනයනයෙන්, සංචාරක ව්‍යාපාරයෙන් ආදායම හොයන්න ඕනෑය කියන එක තමුන්නාන්සේලා දන්නවා. හැබැයි, මේ දේශපාලන ඉතිහාසයේ කවදාද අය වැය පොතට මේ අය කියපු ඉලක්කම් අපට සපුරා දුන්නේ? මට පෙන්වන්න. මේ අය වැය ඉවර වෙන්න ඉස්සෙල්ලා පෙන්වන්න. ආණ්ඩු කරපු අපේ දෙගොල්ලන්ම මේ ගරු සභාවේ ඉන්නවා. හැබැයි, මේ කියන අය මේ ආයතනවලින් අපට ආදායම් උපයා දුන්නේ කවදාද? ඒ, ආයතනවලින් සියයට සියයක් ආදායම් ගෙනැවිත් දීලා නැහැ. *[බාධා කිරීමක්]* ඔව්, 2025 හොඳයි. බලමු, අපි දෙගොල්ලන්ම ඉන්නවා නේ.

මම කියන්නේ පරිස්සම් වෙන්න ඕනෑ කියලායි. මේක අවදානම් සහගත ගමනක්. හේතුව, පඩි වැඩි කිරීම් සහ මේ සියල්ල ගලේ කෙටුවා වාගෙයි. මේක ගලක කොටලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක reverse කරන්න බැහැ; ආපහු ඇද ගන්නත් බැහැ. අපි ආර්ථිකයෙන් වැටුණු රටක් නිසා මුදල් කළමනාකරණය ගැන දැඩි අවධානයක් යොමු කරන්න වෙනවා. ආදායම් නාවොත් මොකද කරන්නේ, ගරු ඇමතිතුමනි? එතකොට වෙන්නේ මොකක්ද? තමුන්නාන්සේලා මේ අය වැයෙන් බදුවලට අත තියලා නැහැ. ඒක බොහොම හොඳයි. හැබැයි, ආදායම් එන්නේ නැති වුණොත් මොකක්ද කරන්න තිබෙන්නේ? අකමැති වුණත්, බදු වැඩි කරන්න වෙනවා. මේක තමයි තිත්ත ඇත්ත. ඒ නිසා පරිස්සම් වෙන්න වෙනවා. මේ කියපු දේවල් දෙන්නේ කොහොමද කියන එක ගැන ඔබතුමන්ලා අවධානය යොමු කරන්න ඕනෑ.

එක කාරණයක් මම තමුන්නාන්සේලාට කියන්නම්. තමුන්නාන්සේලා වාහන ආනයනය කරනවා. ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමා, සහ ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් ඇමතිතුමන්ලා මේක හොඳට අහගෙන ඉඳලා මේ ගැන කැබිනට් එකේ කථා කරන්න. ඔබතුමන්ලා දැන් වාහන ආනයනය කරනවා. පසුගිය රජය වාහන ආනයනය නැවැත්තුවා, රටේ ආර්ථික තත්ත්වයත් එක්ක. වත්මන් වෙළෙඳ පොළේ තත්ත්වය බැලුවාට පස්සේ එන්ජින් ධාරිතාව 660cc සහිත Wagon R එකක් ලංකාවට ආනයනය කරනකොට ලක්ෂ 80න් ඉහළට යනවා. ඒ කියන්නේ, තිබුණු ගණනට වඩා සියයට සියයක් වැඩි වෙලා තිබෙනවා. සාමාන්‍යයෙන් Vitz car එකක් ලක්ෂ 90ක් විතර වෙනවා, Yaris එකක් ලක්ෂ 100ක් විතර වෙනවා. සාමාන්‍යයෙන් වැඩිම භාවිතය තිබෙන Vezel එකක් ලක්ෂ 180ක්, 190ක් බවට පරිවර්තනය වෙනවා. මේ තමයි අලුත් බදුවල ක්‍රියාත්මක වීම. එතකොට මේ බදු ක්‍රියාත්මක වෙනවාත් එක්කම අධිසුඛෝපභෝගී වාහන වන V8 එකක, Prado 150 එකක මිල, - V8 එකේ එන්ජින් ධාරිතාව 4,500cc. Prado 150 එකේ එන්ජින් ධාරිතාව 2,700cc. ගරු ඇමතිතුමනි, වත්මන් වෙළෙඳ පොළේ තිබෙන මිල ගණන් එක්ක පොඩි වාහනවල මිල ගණන් ඉහළ යනවා. වත්මන් වෙළෙඳ පොළේ ලොකු වාහනවල මිල අඩු වෙනවා.

ඒ ගැන හොයලා බලන්න. වාහන ආනයනයේදී ඔබ ලබා දුන් නිර්ණායක ගැන හොයලා බලන්න. කවුද V8 පාවිච්චි කරන්නේ? කවුද BMW 7 Series පාවිච්චි කරන්නේ? කවුද Prado 150 පාවිච්චි කරන්නේ? කවුද Audi පාවිච්චි කරන්නේ. ඒ, මේ රටේ සුඛෝපභෝගී ජීවිත ගතකරන යමක් කමක් තිබෙන මිනිස්සු. ඒ නිසා ඒවායේ මිල ගණන් වැඩි වුණාට කමක් නැහැනේ, ගරු

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

ඇමතිතුමනි. එහෙම නම් අපට බැරිද, ලොකු වාහනවල මිල වැඩි කරලා ඒකෙන් පොඩි වාහනවල මිල අඩු කරන්න? ඇයි, අපි පොඩි වාහනවලට වැඩියෙන් බදු ගහන්නේ? පොඩි මිනිහා පාවිච්චි කරන Wagon R එකට, Vessel එකට, Prius එකට, Vitz එකට වැඩි බද්දක් නොගහා ලොකු වාහනවලට වැඩියෙන් බදු ගහන්න.

ජනාධිපතිතුමා මෙතැනදී කිව්වා, රජයට අයත් මම කියපු වර්ගයේ ලොකු වාහන ටික වෙන්දේසි කරනවා කියලා. එහෙම වෙන්දේසි කරන්නේත් ආනයනය කරන වාහන ලංකාවට ආවට පස්සේ කියලායි එතුමා කිව්වේ. හැබැයි ජනාධිපතිතුමාට පැහැදිලි කරලා දෙන්න, ඒ කාලය වෙනකොට ඔය වෙන්දේසි කරන වාහනවල මිල තවත් අඩු වෙනවා කියලා. දැන් වෙන්දේසි කළොත් මිල වැඩියි. සාමාන්‍යයෙන් 2017, 2018, ඒ වාගේම 2020 වර්ෂයේ ලංකාවට ආපු V8 එකක් මේ වෙනකොට වෙළෙඳ පොළේ රුපියල් ලක්ෂ 1,200ට, රුපියල් ලක්ෂ 1,300ට යනවා. හැබැයි, අලුත් වාහන ටික ආවට පස්සේ මිල අඩු වෙනවා. මොකද, ඒ වෙනකොට ඒ වාහනවල කාලය අවුරුදු 12, අවුරුදු 15 ඉක්මවනවා. ඒක ඔබතුමන්ලා දන්නවා ඇතිනේ. එතකොට වෙන්නේ, මේ වාහන ඒ මිලට දෙන්න බැරිවෙන එක. ඒ නිසා මේ ගැනත් අවධානය යොමු කරන්න. මම මේ කථා කරන්නේ, පොඩි මිනිහෙකුට වාහනයක් ගන්න තිබෙන අවස්ථාව ගැනයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා මේ ගැන වැඩි අවධානයක් යොමු කරන්න කියලා මම කියනවා.

ඊළඟට, ගොවි ජනතාව ගැනත් මම කථා කරන්න ඕනෑ. විශේෂයෙන්ම ගරු නාමල් කරුණාරත්න නියෝජ්‍ය ඇමතිතුමාත් සභාවේ ඉන්න නිසා මම මේ කාරණය කියන්න ඕනෑ. මම දකින විධියට ගොවි ජනතාව කියන්නේ මේ රටේ ආණ්ඩු හදන, ඒ වාගේම හදපු ආණ්ඩු ගෙදර යවන පිරිසක්. ඒ නිසා අපට ඒගොල්ලන්ට ඇහුම්කන් දෙන්න වෙනවා.

ඉතිහාසය අරගෙන බලන්න. 2005දී වේළුපිල්ලේ ප්‍රභාකරන් මාවිල්ආරු සොරොව්ව වහලා ගොවි ජනතාවට යම්කිසි විධියකින් පහරගැහුවා. මාවිල්ආරු සොරොව්ව වහපු නිසා සිංහල විතරක් නොවෙයි, දෙමළ ඇතුළු එතැන හිටපු සියලුම ගොවි ජනතාවට ඔවුන්ගේ ගොවිතැන් කටයුතු කරන්න බැරිව ගියා. අවසානයේ මොකක්ද සිද්ධ වුණේ? මේ රටේ ජනතාව විශාල වශයෙන් මරපු වේළුපිල්ලේ ප්‍රභාකරන්ට 2009 මැයි මාසයේ 19වැනි දා තමන්ගේ සංවිධානයත් නැතුව මැරිලා යන්න සිද්ධ වුණා. ඒ, ගොවි ජනතාවට පහරගහපු නිසා.

අපේ හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ගැනත් මම කියන්නම්. අපිත් එතුමාගේ කැබිනට් මණ්ඩලයේ හිටියා. අපි එපා කියද්දී එක රැයකින් රසායනික පොහොර ආනයනය අයින් කරලා කාබනික පොහොර ගෙනාවා. අවුරුදු 5කට ගත්ත ආණ්ඩුව සෙත්තපෝච්චි; ජනාධිපති ගෙදර. දන්නේත් නැහැ, ගෙදර. අඩු ගණනේ අවුරුදු පහ ඉඳලාවත් යන්න වුණා නම්, හොඳයි. නමුත් අවුරුදු පහත් නැහැ, ගුටිත් කාලා, ගෙවලුත් නැතුව තමයි අන්තිමට ගියේ.

දැන් තිබෙන්නේ තුන්වැනි එක. ඒ තුන්වැනි එක ගැනත් මම කියන්නම්. හැම වෙලාවේම ගොවි ජනතාවට ඇහුම්කන් දෙන්න, ඔවුන් ගැන හිතන්න. ගරු නාමල් කරුණාරත්න නියෝජ්‍ය ඇමතිතුමාත් දැන් මේ සභාවේ ඉන්නවා. ඔබතුමන්ලා ගොවි ජනතාව ගැන හිතන්න. මොකද, නැත්නම් මම කියපු විධියට ඔබතුමන්ලාටත් ඒක කරකැවිලා එන්න පුළුවන්. පෙර අත්දැකීම් මම මේ කියන්නේ. ගොවි ජනතාවට කියන්න යන්න එපා, වතුර දෙන්නේ අපි, පොහොර දෙන්නේ අපි, ඒ නිසා අනිවාර්යයෙන් අපට වී ලබා දිය යුතුයි කියලා. එහෙම කියන්න එපා. ආණ්ඩු දඩබ්බර වීම නොවෙයි හොඳ. ආණ්ඩු ඇහුම්කන් දීමයි හොඳ. දඩබ්බර වුණු ආණ්ඩු හැමදාම ගෙදර ගියා. දඩබ්බර වුණු ආණ්ඩුවලට මිනිස්සු ගහන්නේ දැන් නොවෙයි, වැටෙනකල් ඉඳලා ගහන්නේ. එහෙමයි හැටි. ඒ නිසා ඒ අයව බලාගන්න. එක පැත්තකින් ඒ කාරණය තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Rohitha Abeygunawardhana, your time is up.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
මගේ කථාව විනාඩියකින් අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමාට මම විශේෂයෙන් මේ කාරණය කියනවා. ඇමතිතුමනි, පුළුවන් තරම් පාරිභෝගිකයා ආරක්ෂා කර ගන්න බලන්න. මොකද, එක පැත්තකින් අපි ගොවි මහත්තයාට වී සඳහා සහතික මිලක් දෙන්න ඕනෑ. හැබැයි, ඒ සහතික මිල දෙන ගමන් අපි මේ රටේ පාරිභෝගිකයාත් ආරක්ෂා කරන්න ඕනෑ. අපි තුන්වේල බත් කන මිනිස්සුනේ. ඔය මොනවා කිව්වත්, කොළඹ ඉන්න කිහිපදෙනෙක් රෑට එහෙන් මෙහෙන් එළවලු ටිකක් කෑවට, ගමේ අපි තුන්වේලම බත්නේ කන්නේ. මම කියන දේ හරිනේ. ඒ නිසා කරුණාකරලා මේ කාරණය ගැනත් බලන්න. හැබැයි, මේ රටට සහල් ආනයනය කරන්න ඉඩ තියන්න එපා. සහල් ආනයනය පුරුද්දකට ගියොත්, ඔබතුමන්ලා කොච්චර හොඳට, කොච්චර විනිවිදභාවයකින් කටයුතු කළත්, කොහෙන් හරි මාෆියාවක් ඇවිල්ලා මැද්දට රිංගනවා. මේ සම්බන්ධයෙන් තිබෙන්නේ මාෆියාවක්. ඒවා කඩන්න ලෙහෙසි නැහැ.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, සමහර දේවල්වලට එක පාරටම ගොවියා ප්‍රතිචාර දක්වන්නේ කොහොමද? ගොවියා හැදිලා තිබෙන්නේ මොන වාගේ ක්‍රමවේදයකටද? ගොවියා හැදිලා තිබෙන්නේ මෙහෙමයි. වගාව සඳහා කුඹුර මඩ කරනකොට වී කිලෝ එකක් සඳහා වී මෝල් හිමියන්ගෙන් රුපියල් 20ක් ඔවුන් අරන් ඉවරයි. මම කළුතර ඉපදුණාට ඒ ගැන දන්නවා. ඊළඟට, වී ටික ඉහිනකොට තව රුපියල් 10ක් අරන් ඉවරයි. එහෙමනේ වෙන්නේ. අනේ, ගොයම් ටික කැපෙනකොට ගන්න තිබෙන්නේ වී කිලෝවක් සඳහා රුපියල් 5යි, නැත්නම් රුපියල් 7යි. මේක තමයි තිබෙන ක්‍රමවේදය.

එතකොට අපි බලන්න ඕනෑ මේ ක්‍රමවේදය වෙනස් කරන්නේ කොහොමද කියලායි. හැබැයි, ගොවියාට රිද්දලා ඒක කරන්න බැහැ. ගොවියාට රිද්දලා ඒක කරන්න ගියොත් එක්කෝ වේළුපිල්ලේ ප්‍රභාකරන්ට වුණු දේ වෙනවා. එහෙම නැත්නම් ගෝඨාභය රාජපක්ෂ ආණ්ඩුව දාලා ගියා වාගේ තමුන්නාන්සේලාටත් ඒක කරන්න සිද්ධ වෙනවා. ඒ නිසා මේ ගැන විශේෂ අවධානයක් යොමු කරන්න. එහෙම විශේෂ අවධානයක් යොමු කිරීමෙන් තමයි තමුන්නාන්සේලාට පුළුවන්කමක් ලැබෙන්නේ ඒ ක්‍රමවේදය වෙනස් කරන්න.

මේ අය වැය ගැන මගේ පැහැදිලි අදහසයි මම මේ කිව්වේ. මේ අය වැය ගැන අපි නැවත කථා කරනවා, දෙසැම්බර් මාසයේ 31. අර මම කියපු විධියට දැවැද්ද දුන්නාද, පොරොන්දු වෙච්ච විධියට ආවාද, කසාදය තිබෙනවාද, කසාදය ආරක්ෂා වෙනවාද කියන එක ගැන එතකොට කථා කරමු. මම ප්‍රාර්ථනා කරනවා, මේ අය වැයේ තිබෙන හොඳ දේවල් හොඳින් කරන්න ලැබේවා කියලා.

බොහොම ස්තුතියි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Please state your point of Order, Hon. Member. We have to suspend the Sitting for lunch.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Sir, I represent the people of the North. I would like to make some points very clear. එතුමා අපේ නායකයා වන ප්‍රභාකරන් ගැන කථා කළා. 2009 වර්ෂය වෙද්දී ඔහුව නැති කළා කියලාත් කිව්වා. එහෙම නම් අද වෙනකම් PTA එක අයින් කළේ නැත්තේ ඇයි කියලා අපි අහනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, that is not a point of Order.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමා point of Order එකක් කියලා ඕනෑ නැති සාකච්ඡාවක් හදනවා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, - *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
( மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

We have to suspend the Sitting for lunch, Hon. Member. Could you please state it quickly? Hon. Rohitha Abeygunawardhana, please make it short.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

Yes, I will.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කිසි දවසක මෙතුමන්ලාගේ නායකයා කියලා හැඳින්වූයේ නැහැ, වේළුපිල්ලේ ප්‍රභාකරන්ව. ඕනෑ නම් හැන්සාඩ් වාර්තාව අරගෙන බලන්න. මට කාගේවත් නායකයෙක් කියන්න ඕනෑ නැහැ ඔහුව; ඒ ත්‍රස්තවාදියෙක්. එදත් ත්‍රස්තවාදියා; අදත් ත්‍රස්තවාදියා; හෙටත් ත්‍රස්තවාදියා; කොටියා. *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order please! The Sitting will be suspended till 1.30 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.30ට නියෝජ්‍ය කාරක සභාපතිතුමියගේ (ගරු හේමාලි වීරසේකර මහත්මිය) සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.30 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.30 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] in the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ආනන්ද විජේපාල ඇමතිතුමා. *[බාධා කිරීමක්]*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Madam, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Thank you, Madam, for granting me this opportunity. I would like to make something very clear. The Hon. Member who made the last speech before lunch targeted the Tamil community saying that Prabhakaran stopped the water flow of Mavil Aru anicut in 2006. I would like to make some points clear.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ඒක point of Order එකක් නොවෙයි නේ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

I am speaking under Standing Order No. 92(2).

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ඒක Standing Orders violate කිරීමක්.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Madam, I am a Party Leader. So, let me speak for one minute.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

එතැන point of Order එකක් නැහැ නේ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

You are granting opportunities to other Members to raise points of Order. But, when it comes to the Tamil minority, you look at the Standing Orders. Why is this happening in our country? You should allow us to speak. That day, another Member was allowed to speak. So, you are allowing other Members to speak, but -

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීතුමනි, කාලය කළමනාකරණය කර ගන්න අවශ්‍යයි. ගරු ආනන්ද විජේපාල අමාත්‍යතුමනි, ඔබතුමා කථා කරන්න.

[අ.භා. 1.31]

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, 2025 අය වැය ලේඛනය අපි පසුගිය මැතිවරණ දෙකේදී ලබා ගත් ජන වරමේ අභිලාෂය හොඳින් තේරුම්ගෙන එය ඉටු කිරීමේ පදනම දැමීම සඳහා ඉදිරිපත් කළ අය වැයක් හැටියට අපට හඳුනා ගන්න පුළුවන්. විශේෂයෙන් මේ අය වැය ලේඛනයේ තිබෙන කැපී පෙනෙන ප්‍රධාන ලක්ෂණය තමයි ජනතාව මත කිසිදු බදු බරක් පටවන්නේ නැතිව ජනතාවාදීව එය සකස් කිරීම. අපි දන්නවා, පසුගිය කාලය පුරාම සම්ප්‍රදායිකව අය වැය ලේඛන ඉදිරිපත් කරනකොට ප්‍රධාන වශයෙන්ම එම අය වැය ලේඛනවල තිබුණේ ජනතාවට සහන සලසනවාට වඩා ජනතාව මත බදු බර පැටවීමක් බව. ඇති තරම් බදු බර ජනතාව මත පටවනවා. ඒ විතරක් නොවෙයි. *[බාධා කිරීමක්]*

**ගරු සුරංග රත්නායක මහතා**
(மாண்புமிகு சுரங்க ரத்நாயக்க)
(The Hon. Suranga Rathnayaka)

ගරු ඇමතිතුමනි, පොඩි පැහැදිලි කර ගැනීමක් කර ගන්න තිබෙනවා.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාවෙන් පස්සේ ඉදිරිපත් කරන්න.

ආදායම් උපයා ගැනීම සඳහා රජයේ සම්පත් අළෙවි කිරීම, රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලීකරණය, රජය සතු වතු විකිණීම, බදු දීම වැනි දේවල් තමයි බොහෝදුරට පසුගිය අය වැය ලේඛන තුළ අපට දකින්නට ලැබුණේ.

එහෙත් මෙවර අය වැය ලේඛනය ජනතාව මත බදු බර නොපටවා, රටේ ජනතාවට සහන සැලසූ විශිෂ්ට අය වැයක් ලෙස තමයි මම දකින්නේ. විශේෂයෙන්ම මේක ජනතාවාදී, ප්‍රගතිශීලී අය වැයක්. රට බංකොලොත් වෙලා ආර්ථික වශයෙන් බිඳ වැටිලා තිබියදී තමයි අපි මේ රට භාර ගත්තේ. ඒ අවස්ථාවේ - පසුගිය මාස දෙක, තුනක කාලය තුළ - අපට දකින්න ලැබුණේ, අපට කටයුතු කරන්න ලැබුණේ, අපට විසඳන්න තිබුණේ ගොඩගැහිලා තිබුණු ප්‍රශ්න රාශියක්. අමාත්‍යාංශවල වුණත්, ආයතනවල වුණත් ඒ තිබෙන ගැටලු විසඳා ගැනීම සඳහා මාස දෙක තුනක් වැනි දීර්ඝ කාලයක් ගත කරන්න සිදු වුණා. ඒ අතරතුර තමයි මේ සාධනීය අය වැය ලේඛනය ඉදිරිපත් වෙන්නේ. ආර්ථික වශයෙන් විතරක් නොවෙයි රට බංකොලොත් වෙලා තිබුණේ. ආර්ථික වශයෙන් ඇති වුණු බංකොලොත්භාවයට අමතරව සමාජ, දේශපාලන පරිහානියකුත් ඒ තුළ තිබුණා. සෑම සමාජ තීරුවක්ම බිඳ වැටිලා තිබුණා; පරිහානියට පත් වෙලා තිබුණා. ඒ විතරක් නොවෙයි. නීතියේ ආධිපත්‍යය බිඳ වැටිලා තිබුණා. අල්ලස, දූෂණය රජ කරමින් තිබුණු රටක් බවට මේ රට පත් වෙලා තිබුණා. නීතියේ ආධිපත්‍යය විශාල වශයෙන් පරිහානියට ලක් වෙලා තිබුණා. සමාජ, ආර්ථික, දේශපාලන කියන හැම පැත්තෙන්ම ඇද වැටුණු රටක් තමයි අපි භාර ගන්න අවස්ථාවේ තිබුණේ. අපි පසුගිය මාස දෙක තුනක කාලය තුළ ක්‍රමක්‍රමයෙන් මේ රට යථාවත් කිරීම සඳහා පදනමක් දැම්මා. 2025 අය වැය ලේඛනය එහි මූලික අවස්ථාව හැටියට තමයි මම දකින්නේ. එහි පදනම අපි දාලා තිබෙනවා, 2025 අය වැය ලේඛනයේ. ජන වරමේ අභිලාෂය හොඳින් තේරුම්ගෙන, ඒ ජන වරමේ අභිලාෂය ඉෂ්ට කිරීම සඳහා පදනම දැමූ අය වැයක් විධියට තමයි අපි මේ අය වැය හඳුනා ගන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, රටේ ආර්ථිකය සංකෝචනය වෙමින් තිබුණා. ඒ සංකෝචනය වෙමින් තිබෙන ආර්ථිකය ප්‍රසාරණය කර ගැනීම සඳහා පියවර රාශියක් ගත් අය වැයක් හැටියට තමයි අපි මේ අය වැය හඳුනා ගන්නේ. සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ප්‍රවර්ධනය කරලා, ග්‍රාමීය ජනතාව සවිබලගන්වමින් ඔවුන්ගේ ආර්ථික, සමාජ තත්ත්වයන් වැඩිදියුණු කිරීම සඳහා පියවර ගැන්වූ අය වැයක් හැටියට තමයි අපි මේ අය වැය සමස්තයක් හැටියට දකින්නේ.

ඒ වාගේම මානව සම්පත සංවර්ධනය කිරීම අපේ ප්‍රතිපත්ති මාලාවේ ප්‍රධාන උපාය මාර්ගයක් හැටියට අපි හඳුනාගෙන තිබුණා. විශේෂයෙන් අපි අධ්‍යාපනය සඳහා විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කිරීමක් සිදු කළා. මේ රටේ මානව සම්පත සංවර්ධනය කරන්න අවශ්‍යයි. අපට ඒ සම්පත සංවර්ධනය කර ගැනීම සඳහා ඉහළ විභවතාවක් තිබෙනවා. ඒ සඳහා අපි මූලික වැඩසටහන් රාශියක් හඳුන්වා දෙනවා වාගේම අධ්‍යාපනය සඳහා විශාල මුදලක් වැය කරන්නත් තීන්දු කරලා තිබෙනවා. ඒ සඳහා මේ අය වැයෙන් පදනම දාලා තිබෙනවා, ඒ හැරවුම් ලක්ෂ්‍යය සනිටුහන් කරලා තිබෙනවා කියලා මේ අවස්ථාවේදී මම ප්‍රකාශ කරන්න කැමැතියි.

ඔබතුමන්ලා දන්නවා, අපේ ගමේ සිටින අම්මා, තාත්තාගේ සෞඛ්‍ය රැකවරණය, සෞඛ්‍ය ආරක්ෂාව බිඳ වැටිලා තිබුණු බව. බාල ඖෂධ වාගේම තිබෙන ඖෂධවල මිලත් විශාල ලෙස ඉහළ ගිහින් තිබුණා. දැන් අපේ රජය ගුණාත්මක ඖෂධ සෑම රෝහලකටම සපයන්නත්, ප්‍රාදේශීය රෝහල් සංවර්ධනය කරන්නත් අවශ්‍ය පියවර රාශියක් අරගෙන තිබෙනවා. මේ අය වැය ලේඛනයේ ඒ බව සනිටුහන් කරලා තිබෙනවා. මේ ආකාරයෙන් අපි කටයුතු කරන්නේ විශේෂයෙන් මේ රටේ සමස්ත ජනතාවගේ අභිවෘද්ධිය වෙනුවෙන් සහ සහන අවශ්‍ය සුවිශේෂ කොටස් හඳුනාගෙන ඔවුන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් මෙන්ම ඔවුන්ගේ ඉදිරි ගමන් මඟ වෙනුවෙනුයි. ඒ වාගේම සමාජයේ සෑම සමාජ තීරුවක්ම ඉහළින් ඔසවා තැබීමේ අවශ්‍යතාවක් තිබෙනවා. මොකද, මම මුලින් කිව්වා වාගේම සමස්තයක් හැටියට සමාජය පරිහානියට ගිහිල්ලා තිබුණු අවස්ථාවක තමයි මේ බල හුවමාරුව සිදු වුණේ. ඒ සමස්ත පරිහානියෙන් ක්‍රමක්‍රමයෙන් මේ රට ගොඩ ගැනීමේ අවශ්‍යතාව පදනම් කරගෙන තමයි 2025 අය වැය යෝජනා ඉදිරිපත් කරලා තිබෙන්නේ.

විශේෂයෙන් ඔබතුමන්ලා දන්නවා, Clean Sri Lanka වැඩසටහන යටතේ සෑම සමාජ තීරුවක්ම ආවරණය වන පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කරන බව. අපේ රජයේ ප්‍රමුඛ පෙළේ, ඉතා සාධනීය වැඩසටහනක් හැටියට අපට Clean Sri Lanka වැඩසටහන හඳුන්වන්න පුළුවන්. මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය හැටියට අපි ක්‍රියාත්මක වන ක්ෂේත්‍රයන්හි විශාල පරිවර්තනයක් ඒ තුළින් කරන්න පුළුවන් බව අපට පැහැදිලියි. විශේෂයෙන් මත්ද්‍රව්‍ය නිවාරණය වාගේ කාර්යයන්වලදී මේ රටට සුවිශාල සේවාවක් Clean Sri Lanka වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන්න ඉඩ ලැබිලා තිබෙනවා.

මොකද, මත් ද්‍රව්‍ය උවදුර රටේ සෑම අස්සක් මුල්ලක් නැරම පැතිරී තිබෙනවා. එම උවදුරෙන් රටේ වැඩිහිටියන් වාගේම, ළමා පරපුරත් විශාල පීඩාවකට පත් වෙලා තිබෙනවා. මෙම වැඩසටහන හරහා මත් ද්‍රව්‍ය උවදුර නැති කිරීම සඳහා කටයුතු කිරීමේ හැකියාව තිබෙනවා.

ඒ වාගේම Clean Sri Lanka වැඩසටහන යටතේ අපි විනයගරුක රියැදුරෙක් හදනවා. රියැදුරන්ගේ ආරක්ෂාව, මගීන්ගේ ආරක්ෂාව හා පදිකයින්ගේ ආරක්ෂාව හැදෙන වැඩ පිළිවෙළක් Clean Sri Lanka වැඩසටහන යටතේ අපි ක්‍රියාත්මක කරන්න සූදානම් කරලා තිබෙනවා. විනයගරුක රියැදුරෙක් හැදුවාම රියැදුරන්ගේ රැකවරණයත්, මගීන්ගේ රැකවරණයත් වාගේම පදිකයින්ගේ රැකවරණයත් සලසා ගන්න හැකියාව තිබෙනවා.

ඒ වාගේම බිඳ වැටිලා තිබෙන නීතිය යළි ශක්තිමත් කරන්න ඕනෑ. විශේෂයෙන් නීතිය ක්‍රියාත්මක කරන ආයතනවල විශාල පරිහානියක් තිබෙනවා. සිදු වුණු සමහර සිද්ධීන් දිහා බැලුවාම, එම පරිහානිය අපට නැවත නැවතත් සක් සුදක් සේ -මැනවින්- පැහැදිලි වනවා. එම නිසා නීතියේ ආධිපත්‍යය ක්‍රියාත්මක කරන්න අවශ්‍යයි. රටට නීති හදලා දෙන්න අවශ්‍යයි. මෙම භූමියට යුක්තිය ගෙනෙන්න අවශ්‍යයි; සාධාරණත්වය ගෙනෙන්න අවශ්‍යයි. අන්න ඒ වෙනුවෙන් නීති රීති හදා ගන්න, තිබෙන නීති රීති යථාවත් කර ගන්න අවශ්‍යයි. මේ රටේ සමස්ත ජනයාට නීතියේ රැකවරණය සැලසෙන, නීතියේ ආධිපත්‍යය සහිත රටක්, විනයගරුක රටක් හදන්න මෙම අය වැයෙන් පදනම දමා තිබෙනවා Clean Sri Lanka වැඩසටහන යටතේ.

මෙම අය වැයේ තවත් සුවිශේෂී දිශානතියක් තමයි, ඩිජිටල් ආර්ථිකයක් නිර්මාණය කිරීම සඳහා පියවර ගැනීම. ඒ වෙනුවෙන් යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. රාජ්‍ය සේවයට තාක්ෂණය කැඳවීම අත්‍යවශ්‍ය කාරණයක්. රාජ්‍ය සේවයේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කරන්න අවශ්‍යයි. අපි දන්නවා, රාජ්‍ය සේවකයන් විශාල ප්‍රමාණයක් කැපවීමෙන්, මැදිහත්වීමෙන් සහ වුවමනාවෙන් වැඩ කළත් රාජ්‍ය සේවය සඳහා ලැබී තිබෙන ලේබලය එතරම් හොඳ එකක් නොවන බව. එක පැත්තකින් කියනවා දූෂිතයි කියලා. තව පැත්තකින් කියනවා එය අකාර්යක්ෂමයි කියලා. නමුත් රාජ්‍ය සේවය තුළ ඉතාම කැපවීමෙන්, මැදිහත්වීමෙන් සහ අධිෂ්ඨානශීලීත්වයෙන් වැඩ කරන්න පුළුවන් විශාල පිරිසක් ඉන්නවා. ඔවුන් මේ වෙලාවේ සක්‍රිය කර ගැනීමේ අවශ්‍යතාව තිබෙනවා. අපගේ ජයග්‍රහණයෙන් පසුව මේ වනකොටත් ඔවුන් සක්‍රිය වෙලා රටට ලොකු දායකත්වයක් ලබා දෙනවා. ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය සහ රාජ්‍ය සේවය ශක්තිමත් කරන්න ඔවුන් විශාල දායකත්වයක් ලබා දෙමින් සිටිනවා.

මෙම අය වැය ලේඛනයේ තවත් විශේෂ කාරණා රාශියක් මා දකිනවා. එකක් තමයි, දුප්පත් ජනතාව වෙනුවෙන් මැදිහත් වෙලා තිබීම. බිමේ සහන ලැබිය යුතු කණ්ඩායම් හොඳින් හඳුනාගෙන, සමාජයේ පහළ ස්තරවල ඉන්න කණ්ඩායම් හොඳින් හඳුනාගෙන ඔවුන්ට සහන ලබා දීම සඳහා කටයුතු කර තිබෙන අය වැයක්, මේක. ඔබතුමන්ලා දන්නවා, අස්වැසුම වැඩසටහනට රුපියල් බිලියන 232ක් වෙන් කර තිබෙන බව. විශේෂයෙන් පසුගිය කාලය පුරා සහන ලැබිය යුතු වුවත්, එම සහන වැඩ පිළිවෙළින් විතැන් කරලා, ඉවත් කරලා යම් යම් දේශපාලන හේතු මත අහිමි කර තිබූ සහනාධාර ඒ ජනතාවට ලබා දීම අපි මේ වනකොට ආරම්භ කර තිබෙනවා. දේශපාලන පක්ෂ, පාට භේදවලින් සහ වෙනත් භේදවලින් තොරව එම සහනාධාර ලබා දෙනවා. විශේෂයෙන් මේ වැඩසටහන සඳහා සුදුසුකම් ලබන, මින් ඉවත් කර තිබුණු දුප්පත් ජනතාව නැවත මෙම වැඩසටහනට ඇතුළු කර ගැනීම අපේ අරමුණක්. ඒ වෙනුවෙන් රුපියල් බිලියන 232ක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම එම වැඩසටහනට ඇතුළත් විය යුතු පිරිස් හඳුනා ගන්නත් මේ වනකොට කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතිනවා.

ඒ විතරක් නොවෙයි. කාන්තා, ළමා සහ ආබාධිත ප්‍රජාව ඇතුළු සහන සැලසිය යුතු -මම සමස්තයක් හැටියටයි මේ විග්‍රහය කරන්නේ- විශාල පිරිසකට ඒ අවස්ථා, අවශ්‍ය රැකවරණය තහවුරු කරන්න රජය හැටියට අපි මෙම අය වැය ලේඛනයෙන් පදනම දමා තිබෙනවා.

ඒ වාගේම අධ්‍යාපනයට සහ සෞඛ්‍යයට විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කර තිබීමත් මේ අය වැයේ සුවිශේෂී කාරණාවක්. මොකද, සෞඛ්‍යයට වැය වන මුදලත්, අධ්‍යාපනයට වැය වන මුදලත් අවසානයේ දිගු කාලීන ආයෝජනයක් වෙනවා ආර්ථික සංවර්ධනයට. එහෙම නැත්නම් අධ්‍යාපනය සහ සෞඛ්‍ය වෙනුවෙන් වෙන් කරන මුදල් දිගු කාලීන ආයෝජනයක් හැටියටයි අපට හඳුනා ගන්න වෙන්නේ.

ඒ වාගේම මේ අය වැය තුළ තිබෙන තවත් සුවිශේෂී ලක්ෂණයක් තමයි උතුරු, නැගෙනහිර පළාත් පාදක කර ගනිමින් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට යෝජනා කර තිබීම. විශේෂයෙන් උතුරු පළාතේ ජනතාව පසුගිය මැතිවරණයේදී සියලුම සාම්ප්‍රදායික දේශපාලන පක්ෂ පරදවමින් සුවිශාල ජයග්‍රහණයක් අපට ලබා දුන්නා. ඔවුන්ගේ කැපවීම, ශ්‍රී ලාංකිය ජාතිය හැටියට එකට ජීවත් වෙන්න ඔවුන්ට තිබෙන අභිලාෂය, වුවමනාව ඔවුන් මැනවින් ප්‍රදර්ශනය කළා. ඒ කැපවීම අපි මේ වෙලාවේ අතිශයින් අගය කළ යුතු වෙනවා. උතුරේ ජනතාවගේ ආර්ථික දියුණුව, ආර්ථික සංවර්ධනය වෙනුවෙන් රජය හැටියට අපි විශාල මුදලක් මේ අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒකත් සුවිශේෂී ලක්ෂණයක් හැටියට අපි හඳුනා ගන්නවා.

මීට පෙර කථා කළ ගරු විපක්ෂ නායකතුමා ඉදිරිපත් කළ කරුණු කිහිපයක් පිළිබඳවත් අදහස් දක්වන්න මම කැමැතියි. එතුමා කිව්වා, රාජ්‍ය නිලධාරීන් විශාල වශයෙන් පළිගැනීම්වලට ලක් වෙලා කියලා. අපි මේ රජය භාර ගත්තේ කිසිම කෙනෙකුගෙන් පිළිගැනීම සඳහා නොවෙයි. ඔබතුමන්ලා දැක්කා, මැතිවරණ දිනයන් තුළ අපි මේ රටේ ජනතාවට ආරක්ෂාව සැපයූ ආකාරය, කිසිදු දේශපාලන පළිගැනීමකට ඉඩ නොදුන් ආකාරය. ඒක ඒ ආකාරයෙන් ඉදිරියටත් ක්‍රියාත්මක කරන්න රජය සියලු පියවර අරගෙන තිබෙනවා. ඒ නිසා කිසිදු නිලධාරියෙකුට දේශපාලන පළිගැනීම් හෝ වෙනත් පළිගැනීම් මත ස්ථාන මාරුවීම් ලබා දෙන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, සේවා අවශ්‍යතාව පරිදි යම් යම් ස්ථාන මාරුවීම් සිද්ධ වෙනවා. ඒත් කිසිදු දේශපාලන පළිගැනීමක් නැහැ. ඒවා සේවා අවශ්‍යතාව පරිදි සිදුවන ස්ථාන මාරුවීම් පමණයි. ඒක සාමාන්‍ය තතත්වයක්.

ඒ වාගේම බදු එකතු කර ගැනීමට නොහැකි බවට චෝදනාවක්, එහෙම නැත්නම් ඒ සඳහා ක්‍රමවේදයක් නැහැ, බදු එකතු කර ගැනීමට අසමත් වෙලාය වාගේ අදහසක් විපක්ෂ නායකතුමා මේ සභාවට ඉදිරිපත් කළා. ඔබතුමන්ලා දන්නවා, පසුගිය කාලය පුරාම එහෙම තත්ත්වයක් තිබුණා කියලා. නමුත් අපි බලයට ආවාට පස්සේ පසුගිය මාස දෙක තුන ගත්තාම, -අදට ඇත්තටම අපේ රජයට මාස තුනයි. අද 21වැනි දා- පසුගිය කාර්තුව -2024 අවසන් කාර්තුව- ගත්තාම බදු එකතු කර ගැනීම වේගයෙන් ඉහළ ගිහිල්ලා තිබෙනවා. කෙනෙකුට හිතෙන්න පුළුවන්, "මේ අය වැයෙන් මෙතරම් සහන දෙනවා. හැබැයි අලුතින් බදු පනවලා නැහැ. ජනතාව පිට බදු පනවලා නැහැ. ව්‍යාපාරික ප්‍රජාව පිට බදු පනවලා නැහැ. එහෙමනම් කොහොමද මේ සහන දෙන්නේ?" කියලා. ඔබතුමන්ලා දන්නවාද, අපි මේ වෙනකොට බදු යන්ත්‍රණය කාර්යක්ෂම කරලා බදු එකතු කර ගැනීම කාර්යක්ෂම කරලා

[ගරු ආනන්ද විජේපාල මහතා]

තිබෙන බව? දේශීය ආදායම් දෙපාර්තමේන්තුව 2023 වසරට සාපේක්ෂව 2024 අවසාන කාර්තුවේ රුපියල් බිලියන 104කින් බදු ආදායම වැඩි කර ගෙන තිබෙනවා. 2023 අවසාන කාර්තුවේ රුපියල් බිලියන 319යි; 2024 අවසන් කාර්තුවේ රුපියල් බිලියන 504යි. බදු එකතු කිරීම කළමනාකරණය කරලා බදු එකතු කිරීම මඟින් අපි බදු ආදායම වැඩි කරගෙන තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. රේගු ආදායම 2023 අවසාන කාර්තුවේ රුපියල් බිලියන 322යි; 2024 අවසන් කාර්තුවේ රුපියල් බිලියන 392යි. රුපියල් බිලියන 70කින් ආදායම වැඩිකරගෙන තිබෙනවා. අපි මේ විධියට බදු ආදායම් වැඩිකර ගන්නේ බදු කළමනාකාරිත්වය ඉහළ මට්ටමකට ගෙන ඒමෙන්.

සුරාබදු ආදායම 2023 අවසාන කාර්තුවේ රුපියල් බිලියන 47යි. ගිය අවුරුද්දේ, නැත්නම් 2024 අවසන් කාර්තුවේ -අපි බලයට පත් වුණාට පස්සේ- රුපියල් බිලියන 14කින් එය වැඩි කරලා රුපියල් බිලියන 61ක් කරලා තිබෙනවා. අපි බදු ආදායම එකතු කිරීම කාර්යක්ෂම කරලා තිබෙනවා. ඒ කාර්යක්ෂමතාව වැඩි කර ගැනීමට අපි අවශ්‍ය පියවර අරගෙන තිබෙනවා.

ඒ වාගේම තවත් සුවිශේෂ කාරණයක් විපක්ෂ නායකතුමාත්, අපේ රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමාත් මතු කළා. වැටුප් වැඩිකිරීම පිළිබඳ ලොකු ව්‍යාකූලත්වයක් තිබෙනවා කියලා කිව්වා. වැටුප් වැඩි කිරීමට අපි ප්‍රතිපත්තිමය තීන්දුවක් අරගෙන තිබෙනවා. ඒකට අදාළ table එකකුත් තිබෙනවා, අය වැය පොතේ. ඊට අමතරව රජය මඟින් චක්‍රලේඛ නිකුත් කරයි. කාලයකට පස්සේ මූලික වැටුප වැඩි කරලා තිබෙනවා. මූලික වැටුප වැඩි වීමත් සමඟ වැඩි වෙන බොහෝ දේ තිබෙනවා. මූලික වැටුප වැඩි වෙලා තිබෙනවා. වැටුප් වර්ධක වැඩි වෙලා තිබෙනවා. ආපදා ණය මුදල් වැඩි වෙලා තිබෙනවා. දේපළ ණය මුදල් වැඩි වෙලා තිබෙනවා. විශ්‍රාම වැටුපට සුවිශාල බලපෑමක් සිදු වෙලා තිබෙනවා. සමහරු මේ පිළිබඳව විවිධ සැක සංකා පළ කරනවා.

සමස්තයක් වශයෙන් මේ වැටුප් වැඩි වීමට රුපියල් බිලියන 325ක් වැය වෙනවා. මේ අවුරුද්දේ වැටුප් වැඩි වීමට රුපියල් බිලියන 110ක් වැය වෙනවා. සමස්තයක් හැටියට අවුරුද්දකට වැය වෙනවා, රුපියල් බිලියන 1,232ක්. මේ අවුරුද්දේ වැටුප් ගෙවීම සඳහා සමස්ත ඇස්තමේන්තුව රුපියල් බිලියන 1,232යි. ඒ රුපියල් බිලියන 1,232ට අමතරව මේ අවුරුද්දේ වැය වෙනවා, රුපියල් බිලියන 110ක්. මෙතැන කෙනෙකුට නඟන්න මහා ලොකු තර්කයක් නැහැ. සරල තර්කයක් තිබෙන්නේ. රුපියල් බිලියන 110ක් -රුපියල් මිලියන 110,000ක්- අමතරව වෙන් කරලායි තිබෙන්නේ, මේ වැටුප් වැඩි වීම සඳහා. ඒ අනුව පහළම ශ්‍රේණියක කෙනෙකුගේ අවම වැටුප මේ අවුරුද්දේ විතරක් රුපියල් 5,975කින් වැඩි වෙනවා. ඒ නිසා කිසිදු දෙගිඩියාවක් තබා ගන්න අවශ්‍ය නැහැ. මේ රුපියල් බිලියන 110 -රුපියල් මිලියන 110,000 - කියන්නේ මේ අවුරුද්දේ වැටුප් වැඩි වීමට වෙන් කළ මුදලයි. ඒ ආකාරයට මේ රටේ රාජ්‍ය සේවකයන්ට සුවිශාල වැටුප් වැඩි වීමක් මේ රජය ලබා දී තිබෙනවා.

සමස්තයක් හැටියට ගත්තාම, මේ අය වැය මෙකී සුවිශේෂතා රාශියම අන්තර්ගත වුණු ඉතාම සාධනීය අය වැයක්, මේ රටේ අනාගත දිශානතිය තීරණය කරන අය වැයක්, "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" කියන අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ හැරවුම් ලක්ෂ්‍යයට පදනම දමපු අය වැයක් හැටියට හඳුන්වා දෙන්න පුළුවන්. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු තිලංක යූ. ගමගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.50]

**ගරු තිලංක යූ. ගමගේ මහතා**
(மாண்புமிகு திலங்க யூ. கமகே)
(The Hon. Thilanka U. Gamage)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මම මුලින්ම කියන්න ඕනෑ, විපක්ෂයේ ගරු රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා කළ ප්‍රකාශයක් ගැන. ඒ ප්‍රකාශය ගැන සඳහන් කරමින් මගේ කථාව ආරම්භ කරන්නම්. වැටුප් වැඩි වීම පිළිබඳව කථා කරමින් ඒ ගරු මන්ත්‍රීතුමා කසාද බැඳීම සහ වැටුප් වැඩි වීම කියන කාරණා දෙක සම්බන්ධ කරගෙන ප්‍රකාශයක් කළා. මා හිතන විධියට තමන්ගේ දරුවන් කසාද බන්දන කොට තමන් කටයුතු කරන ආකාරය තමයි, ඒ සඳහා තමන් පෙළඹෙන ආකාරය තමයි එතුමා මේ ගරු සභාවට ප්‍රකාශ කළේ. මම විශේෂයෙන්ම කියන්න ඕනෑ, මේ වැටුප් වැඩි වීම සම්බන්ධයෙන් මේ ගරු සභාවටත්, මුළු රටටත් අය වැය කථාවේදී අපේ ගරු ජනාධිපතිතුමා ප්‍රකාශ කළ බව. ඒ වාගේම පසුගිය දවස් කිහිපයේම පැවැති විවාදයේදී වැටුප් වැඩි වන ආකාරය පිළිබඳව අපි බොහොම පැහැදිලිව කරුණු ඉදිරිපත් කර තිබෙනවා. එහෙම නැතුව, එතුමා කියන ආකාරයේ වැටුප් වැඩි වීමක් සම්බන්ධයෙන්; ඒ කියන ආකාරයේ දෙයක් සම්බන්ධයෙන් අපි පැහැදිලි කළේ නැහැ.

අපි බොහොම පැහැදිලිව කියන්න ඕනෑ, "වැටුප් වැඩි වෙන්නේ නැහැ" කියමින් විපක්ෂයේ මේ මන්ත්‍රීවරුන් එළියේ තැන් තැන්වල බිල්ලෙකු මවන බව. එහිදී පසුගිය කාලයේ වැටුපට ගෙවමින් තිබුණු -මුලින් නොගෙවපු රුපියල් 5,000- කොටසක් ගැනත් කියනවා. "ඒක කොහොමත් තිබුණා" කියනවා. ඒ මුලින් නොගෙවපු 5,000 කොටස තමයි පසුව ගෙවමින් සිටියේ. නමුත්, අපි මෙවර අය වැය තුළින් විශේෂයෙන්ම රුපියල් 5,000ක් මූලික වැටුපට එකතු කරමින්, රාජ්‍ය සේවකයාගේ අතට ලබා දෙන වැටුප ස්ථිරව වැඩි කරමින් තිබෙනවා. එතකොට පහළම මට්ටමේ සිටින රාජ්‍ය සේවකයාට පවා රුපියල් 5,975ක් වැඩි වෙනවා, මේ අවුරුද්දේ අප්‍රේල් මාසයේ සිට. ලබන 2026 අවුරුද්දට නැවත අය වැයක් ඉදිරිපත් කරනවා. ඒ අය වැය තුළිනුත් අපි එකතු කරනවා, ඊළඟ සියයට 35. එතැනින් පසුව 2027 අය වැයේදී එකතු වෙනවා ඊළඟ සියයට 35. සමස්තයක් විධියට ගත්තාම අවුරුදු 3ක් ගැන කථා කළාට, මාස 20ක් ඇතුළත තමයි මේ සම්පූර්ණ වැඩි වීම සිදු වෙන්නේ. ඒ බව මතක් කරන්න ඕනෑ. තවත් මාස 8කින් එන අය වැයෙන් මූලික වැටුපට ඊළඟ කොටසත් එකතු වෙන බව අපි විශේෂයෙන් මතක් කරන්න ඕනෑ.

වැටුප් වැඩි වීමකදී මූලික වැටුප වැඩි වෙනවා කියන එකේ විශේෂත්වයක් තිබෙනවා. අතට එන මුදල විතරක් නොවෙයි එයින් වැඩි වෙන්නේ. යම් කෙනෙකු විශ්‍රාම යන කොට, ඒ විශ්‍රාම වැටුපත් වැඩි වෙනවා. ඒ වාගේම, යම් කෙනෙක් ණය මුදලක් ලබා ගන්නවා නම්, ඔහුට වැඩි මුදලක් ලබා ගන්න පුළුවන් වෙනවා. ඒ මුදල ඔහුට යම් ආයෝජනයකට හෝ වෙනත් කටයුත්තකට යොදා ගන්න පුළුවන්. ඒ වාගේම ten-month distress loan එකෙන් ලබා දෙන මුදල ද වැඩි කර තිබෙනවා. ඒ වාගේම OT වාගේ දේවලුත් මේ වැටුප් වැඩි වීම හරහා වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා රාජ්‍ය සේවකයාට අවශ්‍ය කරන ගරුත්වය ලබා දීපු එකම ආණ්ඩුව ජාතික ජන බලවේගයේ ආණ්ඩුව ලෙස මේ රටේ ජනතාව අද දවස වන විට පිළිගෙන තිබෙනවා.

අපි දන්නවා, පසුගිය කාල වකවානුව පුරාම මේ රටේ රාජ්‍ය සේවකයාගේ අඩුම මූලික වැටුප වශයෙන් තිබුණේ, රුපියල් විසිහතරදහස් ගණනයි කියන එක. හැබැයි, අපි ඇවිල්ලා පළමු අය වැය -මංගල අය වැය- තුළින්ම එම මූලික වැටුප රුපියල් පහළොස්දහස් ගණනකින් වැඩි කරන්න සමත් වෙලා තිබෙනවා. අපි එවැනි අය වැයක් ගෙනැල්ලා තිබෙනවා. ඒ අනුව ගත්තාම, මෙය අපේ රටේ රාජ්‍ය සේවකයාගේ පැත්තෙන් ඉතා විශිෂ්ට අය වැයක් බව විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. මෙය, රාජ්‍ය සේවකයා ගැන හිතපු අය වැයක්.

පසුගිය කාලයේ මේ රටේ අය වැය රාශියක් ගෙනැල්ලා තිබුණා. අප ඒ ගෙනාපු අය වැය රාශිය සලකා බැලුවොත්, මේ රටේ ජනතාවට සහන ලබා දීලා කර්මාන්ත නඟා සිටුවනවා වෙනුවට ඒවායෙන් හැමදාම සිදු වුණේ මේ රටේ පාලකයන්ට විශේෂ වරප්‍රසාද ලබා ගැනීමයි. එවැනි අය වැය රාශියක් තමයි අපි පසුගිය කාලය පුරාම දැක්කේ. ඉතිහාසය පුරාවට පාලකයා සුර සැප විඳින ආකාරයෙන් වරප්‍රසාද වැඩි කර ගත්තා. හැබැයි, ඉතිහාසයේ පළමු වතාවට මේ ආණ්ඩුව නියෝජනය කරන අගමැතිතුමිය ද ඇතුළුව ජනාධිපතිවරයාගේ ඉඳලා සියලු මැති ඇමතිවරුන්ගේ වරප්‍රසාද කප්පාදු කර ගනිමින්, ඒ සියල්ල දරා ගනිමින් ජනතාවට සහන ලබා දෙන, මේ රට ගොඩ නඟන සැබෑම අය වැයක් අපි ගෙනැල්ලා තිබෙනවා.

අපි මේ රටේ බලයට පත් වෙන්න කලින් ජනතාවට කිව්වා, ඔබ ගොඩ නඟන්න අපි සහතික වශයෙන්ම ජනතාවාදී ආණ්ඩුවක් හදනවා කියලා; ඒ ජනතාවාදී ආණ්ඩුවෙන් ජනතාවාදී අය වැයක් ගෙනෙනවා කියලා. අපි අන්න එය සහතික කර කිව්වා. අපි ජනතාවාදී අය වැයක් ගෙනැල්ලා තිබෙනවා. ඉතිහාසයේ පළමු වතාවට මේ රටේ ජනතාව ගැන හිතන එකම අය වැය බවට මෙය පත් වෙලා තිබෙනවා. වෙනදා පාලකයා තමන්ට අවශ්‍ය වන ආකාරයට තමන්ගේ සියලු වරප්‍රසාද වැඩි කර ගත්තා. තමන්ට වාහන ගෙන්වන්න ඕනෑ වන කොට, වාහන ගෙන්වන්න අවශ්‍ය කරන මුදල් වෙන් කර ගත්තා; වාහන පර්මිට් ලබා ගත්තා; ඉන්ධන සහනාධාර ඇතුළු අනෙකුත් දීමනා සියල්ල ලබා ගත්තා. හැබැයි, අපි ඒ සියල්ල මෙවර අය වැයෙන් කප්පාදු කර ගෙන තිබෙනවා. මේ රටේ ජනතාවට මේ රටේ පාලකයන් හැමදාම කිව්වේ, පටි තද කර ගන්න කියලායි. පාලකයා බදු වැඩි කළා; බදු පිට බදු ගැහුවා. හැබැයි, පාලකයා පටි තද කර ගත්තේ නැහැ. ජනතාවට කන් හැන්දෙන් බෙදන කොට මේ රටේ පාලකයා බැකෝ පාරවලින්, සවල් පාරවලින් තමයි බෙදා ගත්තේ. අන්න, ඒ ක්‍රමය අපි වෙනස් කරලා තිබෙනවා. ඒ ක්‍රමය වෙනස් කරපු ජනතාවාදී එකම අය වැය බවට මෙවර අය වැය පත් වෙලා තිබෙනවා.

අපට අය වැයක් හොඳ වෙන්නේ කොහොමද කියන එක විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. අය වැයක් හොඳ වෙන්නේ, ඒකේ තිබෙන වැය, එහෙම නැත්නම් වැටුප් වැඩි වීම ආදි කාරණා නිසා පමණක් නොවෙයි. මේ අය වැය තුළ වැය වාගේම අයත් තිබෙනවා. පසුගිය කාලයේ වැටුප් වැඩි කිරීම් සිදු වුණාම නම් මොකක් ද කළේ කියලා අපි දන්නවා. ඒ හැම වැටුප් වැඩි කිරීමකටම අදාළව බදු සංශෝධනය කරපු බව, බදු පිට බදු ගහපු බව අපි දන්නවා. අපේ රටේ සාමාන්‍ය අහිංසක ජනතාවට ඒක දරා ගන්න සිදු වුණා. රාජ්‍ය සේවකයාට ගෙවන වැටුප ජනතාව මත පටවපු බදු බරක් බවට පත් වුණා. එක පැත්තකින් රාජ්‍ය සේවකයා තමන්ගේ වැටුප ගන්න කොට අනෙක් පැත්තෙන් භාණ්ඩ මිල ඉහළ යෑම තුළ ඔවුන්ගේ වැටුප නැවත වියදම් වුණා.

මුදල් ආදායමට වඩා වැදගත් වෙන්නේ, මූර්ත වැටුපයි. මූර්ත වැටුප කියන්නේ, මුදල් ආදායමෙන් මිල දී ගත හැකි භාණ්ඩ හා සේවා ප්‍රමාණය- *[බාධා කිරීමක්]* විශේෂයෙන්ම මූර්ත වැටුප වැඩි වුණොත්, අපේ භාණ්ඩ හා සේවා මිල දී ගැනීමේ හැකියාව වැඩි වෙනවා. අනෙක් පැත්තෙන්, බදු පිට බදු ගහලා ඒ මුදල සොයනවා. ඒ වාගේම රටේ සමස්ත සමාහාර ඉල්ලුම ඉහළ යෑම තුළ භාණ්ඩවල මිල ගණන් ඉහළ ගියොත් අන්න ඒ වැටුප් වැඩි වීම ප්‍රමාණවත් වන්නේ නැහැ; වැඩක් වෙන්නේ නැහැ.

ඒ නිසා අපි මෙවර අය වැය තුළින් ආර්ථිකය ස්ථායීකරණය කරලා තිබෙනවා. ආර්ථිකය ස්ථායීකරණය කරලා, භාණ්ඩවල මිල ඉහළ යන එක වළක්වලා, ඒ ස්ථායීකරණය ඇතුළේ තමයි මේ සියල්ල අපි සලකා බලා තිබෙන්නේ. එහෙම නැතුව මේ අය වැය හිතුමනාපයට හදපු අය වැයක් නොවෙයි. අවුරුදු ගණනක් මේ රටේ ඉදිරි අනාගතය ගැන හිතලා, අනාගත දරු පරම්පරාවට වාසියක් ගෙන දෙන්න, ඔවුන්ගේ අනාගතය හදන අය වැයක් විධියට තමයි අපි මේ අය වැය හදලා තිබෙන්නේ.

ඒ වාගේම අපි කොටස් වශයෙන් ගත්තාම, මේ අය වැයෙන් අධ්‍යාපනයට වෙන් කරලා තිබෙනවා රුපියල් බිලියන 619ක්. මේ රටේ බලය ලබා ගන්නකොට අපි කිව්වා, අංක එකටත් අධ්‍යාපනය, දෙකටත් අධ්‍යාපනය, තුනටත් අධ්‍යාපනය කියලා. අන්න, ඒ තැන අපි අධ්‍යාපනයට දීලා තිබෙනවා. මේ රටේ ඈත පිටිසර ගම්වල අහිංසක, දුප්පත් දරුවන් ඉන්නවා. ඔවුන්ට ඉගෙන ගන්න හරිහමන් පාසලක් නැහැ, පාසල් පද්ධතිය තුළ පහසුකමක් නැහැ. ඔවුන්ට පාසලකට යන්න අවශ්‍ය මූලික පහසුකම් නැහැ. මෙවර අය වැය තුළින් ඒ දරුවන්ගේ පාසල් පද්ධතිය නඟා සිටුවන්න අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. ඒ හරහා අපි සැමට සමාන අධ්‍යාපනයක් ලබා දෙන අය වැයක් ගෙනැල්ලා තිබෙනවා. විශේෂයෙන්ම ඉතිහාසයේ වැඩිම මුදල් වෙන් කිරීම ඒ වෙනුවෙන් කරලා තිබෙනවා.

ඒ වාගේම, සෞඛ්‍ය ක්ෂේත්‍රයටත් අපි විශේෂ තැනක් දීලා තිබෙනවා. රුපියල් බිලියන 604ක් සෞඛ්‍ය ක්ෂේත්‍රයට වෙන් කරලා තිබෙනවා. මේ හැම ප්‍රතිපාදන වෙන් කිරීමක් තුළින්ම මේ රටේ සියලුදෙනාට නැවත ප්‍රතිලාභ ගලා ගෙන යනවා. ඒ නිසා මෙතැනදී වැටුප් වැඩිවීම පමණක්ම ඉලක්ක කර ගන්න එපා. අධ්‍යාපනය ක්ෂේත්‍රය හදනවා කියන්නේ, සෞඛ්‍ය ක්ෂේත්‍රය හදනවා කියන්නේ, ඒවාට වෙන දා අපේ අතින් වියදම් කරපු මුදල් ඉතිරි වෙන එක. එතකොට ඒක තවත් පැත්තකින් අපට ආදායමක් බවට පත් වෙනවා.

මාසික ආදායම රුපියල් ලක්ෂය ඉක්ම වූ අයට PAYE Tax එක පැනවූවා. අද ඒ සීමාව රුපියල් 150,000 දක්වා වැඩි කරලා තිබෙනවා. ඒ තුළින් ඔවුන්ට ඉතිරි වෙන මුදලකුත් තිබෙනවා. ඒ තමයි කලින් බදු ගෙවපු මුදල් ප්‍රමාණය. අපි මතක් කරනවා නම්, පසු ගිය කාලයේ මේ රටේ පාලකයෝ බදු මුදල් පරිහරණය කළ විධිය ගැන කථා කළොත්, පසු ගිය කාලයේ ජනාධිපති පුතාලාගේ දොළ දුක සන්සිඳුවා ගන්න රොකට් යවන්න ඩොලර් මිලියන 326ක් වාගේ විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කළා. මේ රටේ ජනතාවගේ බදු මුදල්වලින් රොකට් යැව්වා. ඔවුන් එහෙමයි හැසිරුණේ. හැබැයි, අපි එහෙම කරන්නේ නැහැ. අද ඒ යවපු රොකට් එක සොයා ගන්නත් නැහැ. ඒකෙන් මේ රටට කිසිදු වාසියක් වෙලා නැහැ. ඒවා ජනතාවට නිකම්ම නිකම් පීඩනයක් බවට පත් වුණා විතරයි. අපි පසු ගිය කාලයේ තෙල් නැවක් ගෙන්වා ගන්න බැරිව දුක් වින්දා. හැබැයි, ඒ ගොල්ලෝ රොකට් යවන්න ඇමෙරිකානු ඩොලර් මිලියන 326ක් මේ රටේ ජනතාවගේ බදු මුදල් වියදම් කළා. එහෙමයි, මේ රටේ පාලකයන් හැසිරුණේ. එදා වැලි කොට්ට ගහලා, පාරවල් වහලා රේස් පැදපු අය හිටියේ. හැබැයි, අද වන විට අපි පාලකයෝ විධියට, ආණ්ඩුවක් විධියට මේ සියල්ල දරාගෙන,-

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දුන් කාලය අවසන්.

**ගරු තිලංක යූ. ගමගේ මහතා**
(மாண்புமிகு திலங்க யூ. கமகே)
(The Hon. Thilanka U. Gamage)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මට තව විනාඩියක් දෙන්න.

ඒ ගොල්ලෝ මේ බදු මුදල් පරිස්සමින් පාවිච්චි කළේ නැහැ. හැබැයි, අපි මේ බදු මුදල් ඉතා පරිස්සමින් පාවිච්චි කරනවා. ඒ වාගේම, මේ වියදම් සෑම එකක්ම කර්මාන්තවලට, ග්‍රාමීය ජනතාවට අතරට අරගෙන ගිහිල්ලා තිබෙනවා. සියලු ජනතාව, විශේෂයෙන්ම වතු කම්කරු ජනතාව ගැන අපි හිතලා තිබෙනවා. ඒ වාගේම, අපේ රටට, ජාතික ධනය උත්පාදනයට ඒ ජනතාව එකතු කර ගෙන, ඒ ජනතාව නඟා සිටුවන්න පුළුවන් වැඩසටහනක් අපි මේ අය වැය තුළ සනිටුහන් කරලා තිබෙනවා. අපේ මංගල අය වැයේ තිබෙන මේ යෝජනා ක්‍රියාත්මක කරලා, ඊළඟට ගෙන එන අය වැයත් එක්ක ඉදිරියේදී අපි හදන පොහොසත් රටක් ලස්සන ජීවිතයක් මේ රටේ ජනතාවට උදා කරලා දෙනවා කියලා සහතිකයක් මේ මොහොතේ දීලා තිබෙනවා. ඒ කාරණාවත් මතක් කරමින්, මට මේඅවස්ථාව ලබා දීම වෙනුවෙන් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියට ස්තුතිවන්ත වෙමින්, මගේ කථාව අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු තනුර දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.00]

**ගරු තනුර දිසානායක මහතා**
(மாண்புமிகு தனுர திசாநாயக்க)
(The Hon. Thanura Dissanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඇත්තටම මම සතුටු වෙනවා, අපේ රටේ හැරවුම් ලක්ෂයක් සනිටුහන් කරමින්, එක්තරා ආකාරයක නවතම අය වැයක් ඉදිරිපත් කරන අවස්ථාවේ, ඒ වෙනුවෙන් කථා කරන්න ලැබීම ගැන. ඒකට හේතුව තමයි, පසු ගිය දශක ගණනාව තුළම අපිත් ඉතා උනන්දුවෙන් අය වැය ලේඛනය ඉදිරිපත් කරන කාලයට අය වැය අහනවා; අය වැය ලේඛනය ගැන අවධානය යොමු කරනවා. ඒ වාගේම තමයි, අපේ රටේ ජනතාව අය වැය ගැන හුඟක් උනන්දුයි. ඒ උනන්දුව ඇති වෙලා තිබෙන්නේ කොහොමද කියලා හිතුවොත්, විවිධ ක්ෂේත්‍රවල ජනතාව -ගොවිතැන් කරන ජනතාව, රජයේ සහ පෞද්ගලික අංශයේ වෘත්තිකයන්, කර්මාන්ත කරන අය- අය වැය දිහා බලන්නේ තමන්ගේ ක්ෂේත්‍රයට අය වැයෙන් වෙන් වෙලා තිබෙන්නේ මොනවාද කියලායි. මොනවාද, තමන්ගේ ක්ෂේත්‍රයට අය වැයෙන් ලැබිලා තිබෙන ප්‍රතිලාභ කියලායි. අපට දීර්ඝ කාලයක් තිස්සේ තිබෙන අත්දැකීම තමයි, අපේ රටේ විවිධ ක්ෂේත්‍රවල වෘත්තිකයන් සහ ජනතාව අය වැය එනතුරුම බලා ගෙන ඉන්නවා, තමන්ගේ ක්ෂේත්‍රයට ලැබිලා තිබෙන්නේ මොනවාද කියලා සොයා ගන්න.

එක්තරා ආකාරයකින් රටේ කාරණා, අය වැය ගැන ජනතාවගේ අවධානය වැඩිවීම හොඳයි. හැබැයි, පසු ගිය කාල සීමාව පුරාම අපට තිබෙන නිරීක්ෂණය තමයි, ජනතාව වැඩි උනන්දුවක් දක්වන්නේ තමන්ට ලැබිලා තිබෙන්නේ මොනවාද කියලා බලාගන්න තමයි. ඒකෙන් තේරෙන දේ තමයි, පසු ගිය දශක ගණනාව තුළම නොවිසඳුණු ප්‍රශ්න පිළිබඳව, ඔවුන්ගේ ක්ෂේත්‍රයට අවශ්‍ය දේවල් නොලැබීම පිළිබඳව, ආර්ථිකයට ප්‍රවේශයක් නැතිකම නිසා ඔවුන්ට ලැබෙන්නේ මොනවාද කියලා නොදැනීම පිළිබඳව ජනතාව ඉතා උනන්දුවෙන් පසු ගිය අය වැය ලේඛන දිහා බලාගෙන හිටපු බවයි. එතැනට තමයි, පසු ගිය පාලකයෝ මේ ජනතාව කොටු කරලා තිබුණේ.

අද විපක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරුන් අපේ පොරොන්දු ගැන කථා කරනවා. හැබැයි, ඒ ගොල්ලන්ට අමතක වෙලා තිබෙනවා, අද රටේ දේශපාලනය වෙනස් වෙලා කියලා.

දේශපාලනය වෙනස් වීම නිසා තමයි ජනතාවාදී පාලනයක් බිහි වෙලා තිබෙන්නේ. දේශපාලනය නිකම් වෙනස් වෙන්නේ නැහැ නේ. ඒගොල්ලන් කාලයක් තිස්සේ රටේ ජනතාවට කියපු දේවල්, කරපු දේවල් හොඳට අත්දැකලා තමයි ජනතාව මේ පාලනය වෙනස් කරලා තිබෙන්නේ. ඒ නිසා අපි හදලා තිබෙන්නේ පොරොන්දු දේශපාලන ආණ්ඩුවක් නොවෙයි. ජනතාව හා අපි අතර ගනුදෙනුවක්, කොන්ත්‍රාත් එකක් නැහැ. අපි බලය ලබා ගන්න කලින් මේ ව්‍යාපාරය ගොඩනඟද්දී දේශපාලන වේදිකාවල ජනතාව එක්ක කථා කළේ මොනවාද? මේ වෙනස ඇති කර ගන්න ඕනෑ කොහොමද කියලා තමයි අපි කථා කළේ. ඒ නිසා ජනතාවටත් මේ ගැන හොඳ අවබෝධයක් තිබෙනවා. අපි අතර තිබෙන්නේ සම්මුතියක්. ජනතාව සහ මේ හදපු නව පාලනය -ජනතාවාදී පාලනය- අතර තිබෙන්නේ සම්මුතියක්. ඒ නිසා තමයි මේ සියලු ක්ෂේත්‍ර ගැන පුළුල්ව හිතපු, මූලිකව මේ රට ව්‍යුහාත්මක සහ සංවර්ධනාත්මක පැත්තට ගෙන යන, මේ සමාජය තව මට්ටමකට ඉහළට ඔසවන අය වැයක් අපට ඉදිරිපත් කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ. ජනතාව බලාපොරොත්තු වුණෙත් ඒක තමයි. ඒක ඇතුළේ අපි සමත් වෙලා තිබෙනවා මේ සියලු බාධා මැද හැකි තරම් ප්‍රතිලාභ, සහන හැම පැත්තෙන්ම ජනතාවට ලබා දෙන්න.

අපි දන්නවා මේ අය වැය ක්‍රියාත්මක කරන්න මාස 8ක් තමයි අපට කාලය තිබෙන්නේ. කෙසේ වෙතත්, ගොඩක් කල් රට පාලනය කරපු සමහර දේශපාලන පක්ෂ, ගොඩක් ප්‍රගතිශීලියි කියන අය, නවීන ලෝකයේ ආර්ථික මොඩල ගැන කථා කරන අය, අපි මේ ආවරණය කරලා තිබෙන මේ ක්ෂේත්‍ර ඉතිහාසයේ කවදාවත් අල්ලලාවත් තිබුණේ නැති ක්ෂේත්‍ර. හැබැයි, අපි අද වෙනකොට අපේ අය වැය හරහා ඒ මොඩල ගැන මේ සියලු ක්ෂේත්‍රවල ජනතාවට ප්‍රකාශ කරලා තිබෙනවා. ඒ වාගේම තමයි අපි උතුර, නැගෙනහිර, දකුණ, බටහිර, කඳුකරය යන මේ කිසිම ප්‍රදේශයක ජනතාව අත්හැරලා නැහැ. අපි ඒ වාගේ දේශපාලනයකට ගිහිල්ලා නැහැ. අපි මේ රට සමස්තයක් විධියට ගොඩනඟන්නයි කටයුතු කරලා තිබෙන්නේ. සියලුදෙනාම ශ්‍රී ලාංකිකයන් විධියට ගොඩ නඟන්න පුළුවන් අය වැයක් තමයි අපි ඉදිරිපත් කරලා තිබෙන්නේ. මේ රටේ හිටපු ආණ්ඩුවලට ඕනෑ තරම් කාලයක් තිබුණානේ උතුරු-නැගෙනහිර ජනතාවට සේවය සලසන්න. නමුත් ඒ සමහර තැන්වලට පාලමක් හදා ගන්න බැරි වෙලා තිබෙනවා නේ. අපි අද කොයි තරම් දේවල් කරලා තිබෙනවාද උතුරු පළාතත් මේ ආර්ථිකයට සම්බන්ධ කරන්න. හුදෙකලා පිරිසක් විධියට ඒ ජනතාව තවදුරටත් ඒ ප්‍රදේශවල තියන්න සුදුසු නැහැ. කඳුකරයේ ජනතාවත් එහෙම තමයි. පරිවර්තනයේ හැරවුම් ලක්ෂ්‍ය විධියට තමයි අපි මේ අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ.

මේ අය වැයේ ගැඹුරින්ම තිබෙන දේ තමයි මේ රටේ දේශපාලන සංස්කෘතිය වෙනස් කිරීම. දේශපාලන සංස්කෘතිය වෙනස් කිරීම නිසා ඒ මොහොතේම ලැබෙන දේ ගැන හොඳ අවබෝධයක් අපට තිබෙනවා. මේ දේශපාලන සංස්කෘතිය වෙනස් කිරීම නිසාම, ජනතාව ඒ තීරණය ගත්ත නිසාම, අතිවිශාල නාස්තියක් කරමින් ඉලක්කයක් නැතිව ගිය රට, ඉලක්කසහගත, සැලසුම් සහගත සංවිධානාත්මක තැනකට ගෙනෙන්න, නාස්තිය නැති කරන්න පුළුවන් දේශපාලන අධිකාරියකට අද බලය පැවරිලා තිබෙනවා. ගොඩක් අය අහනවා, "මේවා කරන්න සල්ලි කොහෙන්ද" කියලා. රටේ සල්ලි තිබෙනවා, හොයා ගන්න පුළුවන්. හැබැයි, නාස්තිය වළක්වන්න ඕනෑ. අපේ මන්ත්‍රීවරු ප්‍රකාශ කළා වාගේම, ඒ වෙනුවෙන් ආණ්ඩුව පැත්තෙන් කළ හැකි සියලු කැපකිරීම් කරන්න අපි සූදානම්. අපි එහෙම කරන්න

පුළුවන් දේශපාලන ව්‍යාපාරයක්. ඉතිහාසයේ පළමු වතාවට ආණ්ඩුවක් කැප කිරීම් කරමින් ජනතාව වෙනුවෙන් වැඩ කරන යුගයක් මේක. කවදද, එහෙම ආණ්ඩුවක් හදන්න පුළුවන් වෙලා තිබුණේ? කවදද එහෙම කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ? මහජනතාව සක්‍රියව මේ රට දියුණු කරන්න දායක කර ගන්න, ඒකට ආධ්‍යාත්මික වශයෙන් බද්ධ කරගන්න පුළුවන් වුණේ කොයි ආණ්ඩුවකටද? එහෙම බැරි වෙලා තිබෙනවා නේ, මෙච්චර කාලයකට. එහෙම තිබුණා නම්, මෙහෙම සාකච්ඡා කරන්න මේ ප්‍රශ්න එන්නේ නැහැ නේ.

අද අපට කථා කරන්න වෙලා තිබෙන්නේ මොනවාද? රැකියා ප්‍රශ්න ගැන අපට කථා කරන්න වෙලා තිබෙනවා. ප්‍රවාහන ප්‍රශ්න ගැන අපට කථා කරන්න වෙලා තිබෙනවා. සනීපාරක්ෂාව ගැන අපට කථා කරන්න වෙලා තිබෙනවා. කොටුව දුම්රිය ස්ථානයේ කාන්තාවන්ට යන්න පුළුවන් හොඳ වැසිකිලියක් -සනීපාරක්ෂක ස්ථානයක්- තිබුණේ නැහැ නේ. ඒකත් අපේ ආණ්ඩුව ඇවිල්ලානේ හැදුවේ. ඒවා පොඩි දේවල් තමයි. ඒ වුණාට ඒවා ගැන හිතලා තිබුණේ නැහැනේ. දැන් අපි කල්පනා කරලා තිබෙනවා නේ මේ රටේ සියලු ප්‍රධාන ස්ථානවල, මාර්ගවල -ප්‍රවාහනයට සම්බන්ධ තැන්වල- කාන්තාවන්ට හා දරුවන්ට හොඳ සනීපාරක්ෂක ස්ථාන හදා දෙන්න ඕනෑ කියලා. ඒවා ගැන මීට කලින් කල්පනා කරන්න බැරි වෙලා තිබෙනවා නේ. ඒවාට අපේ ආණ්ඩුව එනකන්ම ඉන්න ඕනෑ වුණා ද? ඒ නිසා ජනතාව දන්නවා මේ වෙන්නේ මොකක්ද කියලා.

එක පැත්තකින් ගත්තොත් අපි දේශපාලන සංස්කෘතිය වෙනස් කරලා තිබෙනවා. නාස්තිය නැති කරලා තිබෙනවා. ඒකේ ප්‍රතිලාභ රටටත්, ජනතාවටත් තමයි. අපි බලයට එන්න කලින් අපි ගැන භයක් ඇති කරමින් හිටියානේ. අපට ජාත්‍යන්තර සබඳතා නැති වෙයි, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අපිත් එක්ක වැඩ කරන්නේ නැති වෙයි, ඩොලර් එක රුපියල් 400න් එහාට යයි කියමින් එක එක භය හද හදා හිටියානේ. නමුත්, ජනතාව ඒවා ගණන් ගත්තේ නැහැ. ඒවා අත් හැරලා ජනතාව අපිත් එක්ක ඒකතු වුණා. දැන් නැවත වතාවක් මතයක් හදන්න යනවා, "මේ ආර්ථික මොඩල් එක අපි දන්නේ නැහැනේ. මොනවා වෙයිද දන්නේ නැහැ, NPP ආණ්ඩුව මේ විධියට වැඩ කරද්දී" කියමින්. හැබැයි, අපි නම් බිම් මට්ටමේ ඉන්න ජනතාවත් එක්ක වැඩ කරන අය.

අපි පාර්ලිමේන්තුවේත් වැඩ කරන ගමන්, නිරන්තරයෙන් ජනතාව එක්කත් වැඩ කරනවා. අපි ඡන්දයට කලින් විතරක් නොවෙයි, ඡන්දයක් තිබුණත් නැතත් කොහොමත් ජනතාවත් එක්ක වැඩ කරනවා. ජනතාවත් එක්ක වැඩ කරද්දී තවම නම්, කවුරුවත් අපෙන් අහලා නැහැ ඔයගොල්ලන්ගේ ආර්ථික මොඩලය මොකක්ද කියලා. මොකද, මේකේ ගති ලක්ෂණ දැක්කාම, ජනතාවාදී, ප්‍රගතිශීලී, ඒ වාගේම පුළුල් ආර්ථික පරිවර්තනයක් සහිත, ජනතාවට යහපත් ආර්ථිකයක් ළඟා කරවන වෙනසක් ගෙනෙන අය වැයක් සහ ක්‍රමවේදයක් තමයි අපි මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ කියන කාරණය ජනතාවට තේරුණා. ඒක නොදන්නවා නොවෙයි නේ, විපක්ෂය. ඒක දැනගෙන මෙතුමන්ලා අපි ගැන වෙන අදහසක් හදලා, ඒ අදහසට පහර දෙනවා. ඕක තමයි පසුගිය කාල සීමාවේම - මාස තුනේදීම - පාර්ලිමේන්තුවේ කළේ. අපි නොකියපු ඒවා, අපි ගැන ඒගොල්ලෝ කියලා තිබෙන ඒවා දිහා බැලුවොත්, විශේෂයෙන් විපක්ෂය මෙතැන අපි ගැන වෙනත් චිත්‍රයක් මවන්න උත්සාහ කරන බවක් තමයි පෙනෙන්නේ. අපේ මතවාද සම්බන්ධයෙන්, අපේ මූලධර්ම සම්බන්ධයෙන්, සංකල්ප සම්බන්ධයෙන්, අපි ආර්ථිකය හසුරුවන ආකාරය සම්බන්ධයෙන්,-

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි 2ක කාලයක් තිබෙනවා.

**ගරු තනුර දිසානායක මහතා**
(மாண்புமிகு தனுர திசாநாயக்க)
(The Hon. Thanura Dissanayake)

ඒ නිසා, එහෙම උත්සාහ කළාට අද රටේ ජනතාව සිටින්නේ කොතැනද කියලා අපි හැම දෙනාම දන්නවා. විශේෂයෙන් ලබා දිය හැකි සියලු ප්‍රතිලාභ, සහන අපි ජනතාවට දීලා තිබෙනවා. අපි ඒවා හිරකරගෙන, නතර කරගෙන හිටියේ නැහැ නේ, අය වැයට එල්ලන්න කියලා. අපි ගොවි ජනතාවගේ ප්‍රතිලාභ වැඩි කරලා දීලා, පොහොර සහනාධාරය වැඩි කළා. ඒ වාගේම පාසල් සිසු දරුවන්ට සහන සලසන්න අපි අය වැය එනතුරු හිටියේ නැහැ නේ. සහනය අවශ්‍ය දරුවන්ට පාසල් වාරය පටන් ගන්නකොටම ඒ ප්‍රතිලාභ ලබා දුන්නා, ලිපි ද්‍රව්‍ය ලබා ගන්න. ඉතින්, අපි එහෙම කටයුතු කරලා නැහැ.

ඒ වාගේම අපි විශ්‍රාමිකයන්ට රුපියල් 3,000ක් වැඩි කළේ, මේ අය වැය ඉදිරිපත් කරන්න කලිනුයි. එහෙම තමයි ජනතාවාදී ආණ්ඩු වැඩ කරන්නේ. ඒ නිසා මේ අය වැයෙනුත් ඉදිරිපත් කර තිබෙනවා වාගේම ඉදිරි කාල සීමාවේදී අපේ සියලු අමාත්‍යාංශවල වැඩකටයුතු සිදු වන්නේ ග්‍රාමීය දුප්පත්කම තුරන් කරන්න, ඒ වාගේම ආර්ථිකය වඩ වඩාත් ජනතාව අතරට ගෙනෙන්න, ඩිජිටල්කරණය හරහා, රජයේ සේවකයන්ට පැටවිලා තිබෙන බරත්, ඒ වාගේම ජනතාවගේ කාලයත් ඉතුරු කරන හොඳ තැනකට ගෙන යන්න, ඒ වාගේම Clean Sri Lanka ව්‍යාපෘතිය හරහා ජීවත් වෙන්න පුළුවන් සුපිරිසිදු වාගේම සුවපහසු පරිසරයක් සහිත රටක් ගොඩනහන්නයි. ඉතින් ඉලක්කම්වල, ප්‍රස්ථාරවල විතරක් නොවෙයි ජීවිතය තිබෙන්නේ. ඉලක්කම්වලින්, ප්‍රස්ථාරවලින් විතරක් මිනිස්සුන්ගේ ජීවිතය මනින්නේ කොහොමද? ඒක ආර්ථිකයේ එක පැත්තක්. හැබැයි, සමාජ ආරක්ෂාව, ප්‍රවාහන පහසුකම් යනාදිය වර්ධනය කරන්න තමයි අපි ඔක්කෝම සැලසුම් සකස් කරලා තිබෙන්නේ. පසුගිය දශක ගණනාවක් තිස්සේ විනාශ කරපු ප්‍රවාහන පද්ධතියක් තමයි තිබෙන්නේ. කිසිම ලෙසකින් ඒවා ගැන බලලා නැහැ. අපි රටේ කිසිම සම්පතක් විකුණන්නේ නැතුව නේ, මේවා කරන්නේ. හැබැයි, මාර ආර්ථික විශේෂඥයෝ ටිකක් තමයි පසුගිය ආණ්ඩුවල හිටියේ. රටේ සම්පත් ඔක්කෝම විකුණන්න දාලා නේ තිබුණේ. ඒවා විකුණලා නිෂ්පාදන ආර්ථිකයක් හදන්නේ කොහොමද? මිල්කෝ එක විකුණන්න හදපු එක නවත්වලා, රජය මැදිහත් වෙලා දැන් එය කරගෙන යනවා නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු තනුර දිසානායක මහතා**
(மாண்புமிகு தனுர திசாநாயக்க)
(The Hon. Thanura Dissanayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මා අවසන් කරනවා.

අපි නිෂ්පාදන ආර්ථිකයක් ඇති කරලා මේ රටේ ජනතාව අතට මුදලුත්, යහපත් රටකුත් ඇති කරනවා. සමාජය තව අදියරයකට ඔසවන ක්‍රියාදාමයක අපි නිරත වෙනවා. ඒ වෙනුවෙන් අපි සියලු දෙනා කැප වෙලා වැඩ කරනවාය කියන එක ප්‍රකාශ කරන්න කැමැතියි. ඔබ සියලු දෙනාටම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු නාමල් කරුණාරත්න ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.11]

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ජාතික ජන බලවේගය ආණ්ඩුවේ මංගල අය වැය පිළිබඳ විවාදයට සම්බන්ධ වෙද්දි මම මුලින්ම මතක් කරන්න ඕනෑ, ජනතාව අපේ ආණ්ඩුවට අවුරුදු 5කට තමයි බලය දීලා තිබෙන්නේ කියන එක. මේ, අපේ ආණ්ඩුවේ පළමුවැනි අය වැය. අපි ජනතාවට ඉදිරිපත් කරපු වැඩ පිළිවෙළක් තිබෙනවා. අපි ජනතාවට දුන් පොරොන්දු ප්‍රමාණයක් තිබෙනවා. ඒවා ඉෂ්ට සිද්ධ කරන්න කාලය තිබෙනවා. තව මේකෙන් පස්සේ අය වැය හතරක් එනවා. එම කාලපරාසය තුළ අපේ වැඩ පිළිවෙළ අපි නිසියාකාරව ඉෂ්ට කරනවාය කියන කාරණයත් මම මතක් කරනවා.

අද උදේ විපක්ෂ නායකතුමා කථා කරනකොට සඳහන් කළා, මේ අය වැය ජනතාවට පීඩනය එල්ල කරපු අය වැයක් කියලා. ඔව්, එක්තරා සුළු කණ්ඩායමක් පීඩනයට ලක් කරලා තිබෙනවා. මම විශේෂයෙන්ම කියන්න ඕනෑ, මේ අය වැය තුළින් මේ රටේ පොදු ජනතාව කිසිම පීඩනයකට ලක් කරලා නැති බව.

ඒ අනුව පොදු ජනතාවට අස්වැසුම ප්‍රතිලාභ වැඩි කරලා තිබෙනවා. අපේ පාසල් දරුවන් ඇවිත් ඉන්නවා මේ ගැලරියේ. අපේ පුංචි දරු පැටවුන්ට පොතපත ලබා ගැනීම සඳහා විශේෂ ආධාර වැඩසටහන් හඳුන්වා දීලා තිබෙනවා. මහපොළ ශිෂ්‍යාධාරය වැඩි කළා. ඒ වාගේම රාජ්‍ය අංශයේ සේවකයින්ට, පෞද්ගලික අංශයේ සේවකයින්ට ඉතිහාසයේ කවදාවත් නැති විධියට වැටුප් වැඩි කළා. රජයේ සේවකයින්ගේ මූලික වැටුප වැඩි කරලා තිබෙනවා. පෙර පාසල් පාලිකාවන්ට ආධාර වැඩසටහන් හඳුන්වා දීලා තිබෙනවා. ළමා නිවාසවල දරුවන්ට වෙනම ආධාර වැඩසටහන් වාගේම, අවුරුදු 18න් පසුව ඒ දරුවන් තවත් අනාථ කරන්නේ නැතුව ඒ දරුවන්ගේ වගකීම මේ අය වැය ඇතුළේ තහවුරු කරලා තිබෙනවා. ඒ වෙනුවෙන් මුදල් වෙන් කරලා තිබෙනවා.

ආබාධිත අය සඳහා විශේෂ ආධාර වැඩසටහන් පළමු වතාවට මේ අය වැය ඇතුළේ යෝජනා කරලා තිබෙනවා. ඒ වාගේම, ගොවි ජනතාවගේ පොහොර සහනාධාරය හෙක්ටෙයාර දෙකක් සඳහා රුපියල් 20,000කින් වැඩි කරලා තිබෙනවා. වැඩිහිටි ආධාර වැඩි කරලා තිබෙනවා. වකුගඩු රෝගීන්ට දෙන ආධාර වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම තමයි අද ඉන්ධන මිල අඩු වෙලා තිබෙනවා. අපි ආණ්ඩුව භාරගන්නකොට රුපියල් තුන්සිය හැට ගණන්වලට තිබුණු ඉන්ධන මිල මේ වෙනකොට රුපියල් දෙසිය අසූ ගණන් දක්වා අඩු කරලා තිබෙනවා. ඉතින්, විපක්ෂ නායකතුමා කියන ආකාරයට ඒ විධියට තමයි ජනතාවට පීඩනය එල්ල කරලා තිබෙන්නේ. විදුලි බිල සියයට 20කින් අඩු කර තිබෙනවා. කර්මාන්ත සඳහා සියයට 30කින් විදුලි බිල අඩු කරලා තිබෙනවා. ගර්භිණී මව්වරුන්ට විශේෂ ආධාර වැඩසටහන් යෝජනා කර තිබෙනවා. මේ අය වැයෙන් ඒ සඳහා මුදල් වෙන් කරලා තිබෙනවා. ත්‍රිපෝෂ ආයතනය විකුණන්න තමයි සැලසුම් කරලා තිබුණේ. නමුත්, ඒ ආයතනය නැවත ආරම්භ කරලා, ත්‍රිපෝෂ සඳහා රුපියල් බිලියන 5ක් වෙනම වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම 5 ශ්‍රේණිය ශිෂ්‍යත්වය සමත් වුණු දරුවන්ගේ ශිෂ්‍යාධාර මුදල දෙගුණයකින් වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම, දරුවන්ගේ ආහාර සලාකයත් වැඩි කරලා තිබෙනවා.

ඊළඟට, මේ රටේ වැව්, අමුණු ගොඩනැඟීම සඳහා; ප්‍රතිසංස්කරණය කිරීම සඳහා, ජලාශ ඉදිකිරීම සඳහා රුපියල් කෝටි 7,800ක් මාස 8ක් ඇතුළත වියදම් කරන්න මේ අය වැයෙන් මුදල් වෙන් කරලා තිබෙනවා. මේ ඔක්කොටම සම්බන්ධ වෙන්නේ සාමාන්‍ය ජනතාව, ග්‍රාමීය ජනතාව. අන්න ඒ විධියට තමයි මේ අය වැය ඇතුළේ සාමාන්‍ය ජනතාවට පීඩනය එල්ල කරලා තිබෙන්නේ. වෘත්තීය අධ්‍යාපනය ලබන ශිෂ්‍යයන්ට ලබාදෙන ආධාර මුදල් ද වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම සාමාන්‍ය ජනතාවට ප්‍රයෝජන ගැනීම සඳහා කොන්දේසි අඩුවෙන්, ඉතාම පහසු විධියට තමන්ගේ ව්‍යවසායක කටයුතු කර ගැනීම සඳහා, ණය ලබා ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසෙන සංවර්ධන බැංකුවක් පිහිටුවීමට මේ අය වැය තුළ යෝජනා කරලා තිබෙනවා. විශේෂයෙන්ම ග්‍රාමීය ආර්ථිකය නඟා සිටුවීමට අදාළව මේ වාගේ විශාල වැඩ කොටසක් මේ අය වැය ඇතුළේ යෝජනා කරලා තිබෙනවා. අපේ ආචාර්යතුමා; විෂය භාර ඇමතිතුමා මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. එම අමාත්‍යාංශය යටතේ තව විශාල වැඩ කොටසක් සිදු වෙනවා.

ඒ වාගේම අධ්‍යාපනය සහ සෞඛ්‍යයටත් විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. කෘෂි කර්මාන්තය ගත්තාම ඒ වෙනුවෙනුත් විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. ඒ සෑම ක්ෂේත්‍රයකටම මේ අය වැයෙන් විශේෂ අවධානය යොමු කරලා තිබෙනවා. ඔන්න ඔය විධියට තමයි මේ අය වැය ජනතාවට පීඩනය එල්ල කරන අය වැයක් බවට පත් වෙන්නේ. හැබැයි, ඉතිහාසයේ කවදාවත් නැති විධියට මේ රටේ සාමාන්‍ය ජනතාවට ආධාර ගොන්නක් ලබාදෙන, ඔවුන්ගේ ආර්ථිකය නඟාසිටුවීමට අදාළ සවිය, ශක්තිය නිර්මාණය කරන වැඩසටහන් විශාල ප්‍රමාණයක් සහ ඒ වෙනුවෙන් මුදල් විශාල ප්‍රමාණයක් වෙන් කරපු අය වැයක් බවට මේ අය වැය ඉතිහාසගත වෙලා අවසානයි. ඔව්, මේකෙන් පීඩනයක් එල්ල වෙලා තිබෙනවා. කාටද?

ඊළඟට, මේ අය වැය ගත්තාම මහින්ද රාජපක්ෂගේ, ගෝඨාභය රාජපක්ෂගේ අය වැයවලට සමානත්වයක් මේකේ තිබෙනවාය කියලා විපක්ෂ නායකතුමා කිව්වා. ඔව්, ඇත්තටම ඒ අය වැය කිහිපය ගත්තොත්, ඒවා පවුලට සල්ලි බෙදාගත් අය වැය බව අපට මතකයි. පවුලේ ඇමතිවරු ගොඩක් හිටියා, ඒ අය සඳහා සල්ලි විශාල ප්‍රමාණයක් වෙන් කර ගත් අය වැය තමයි ඒ කාලයේ ඉදිරිපත් වුණේ. ඒගොල්ලන් ඇති හැකි පරිදි බෙදා හදා ගත්තා. හැබැයි, මේ අය වැය ඇතුළේ එහෙම එකක් නැහැ.

මම විශේෂයෙන්ම මේ කාරණයත් මම මතක් කරන්න ඕනෑ. අපි ඡන්දයට එන්න කලිනුත්, ඡන්දය වෙලාවේත් රටට ප්‍රකාශ කළා, මේ රටේ පවතින දේශපාලන සංස්කෘතිය අපි වෙනස් කරනවාය කියලා.

එම දේශපාලන සංස්කෘතිය උඩු යටිකුරු කරනවා කියලා අපි කිව්වා. දැනුත් ඒක අපි කරලා තිබෙන්නේ. ඉදිරි කාලය තුළ මේ කටයුත්ත නීත්‍යානුකූලවම අපි කරනවා. එහෙම නම් දැන් කප්පාදුවට ලක් කරලා තිබෙන්නේ කවුද? කාගේ වරප්‍රසාද ද කප්පාදුවට ලක් කරලා තිබෙන්නේ? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අද වෙනකොට මහ පාරේ රථ පෙරහැරවල් දකින්න ලැබෙන්නේ නැහැ; ඇමතිවරු පිරිවරාගත් රථ පෙළපාළි දකින්න ලැබෙන්නේ නැහැ. ඒ වාගේම අපේ කිසිම ඇමතිවරයෙක් එතුමන්ලාට හිමි නිල බංගලා භාර ගත්තේ නැහැ. ඒ වාගේම වාහන පාවිච්චියේදී එතුමන්ලා පෙන්නුම් කරපු සදාචාරය බලන්න. අසීමිත ලෙස භුක්ති විඳපු අනෙකුත් වරප්‍රසාද සියල්ල අප විසින්ම කප්පාදු කරගෙන තිබෙනවා; අප විසින්ම අහෝසි කරගෙන තිබෙනවා. ජනාධිපතිවරයාගේ සිට මන්ත්‍රීවරයෙකු දක්වාම ඒ අසීමිත වරප්‍රසාද භුක්ති විඳීම කප්පාදුවට ලක් කරලා තිබෙනවා. විශේෂයෙන්ම ජනාධිපතිවරයෙකුට නීත්‍යානුකූලව භුක්ති විඳීමට ලැබෙන වරප්‍රසාද සියල්ල අද අසීමිතව කප්පාදුවට ලක් කරලා තිබෙනවා. ඒ වාගේම තමයි ඒවා

ඉවත් කිරීමට මේ වෙනකොට නීත්‍යානුකූලව කටයුතු කරගෙන එනවා. මෙන්න මේ පරිසරය තුළ ඉහළින් සිටි ජනාධිපතිවරු, අගමැතිවරු, මැති ඇමතිවරු පසුගිය අය වැයවලින් යහමින් සල්ලි වෙන්කර ගත්තා, ඒ අයගේ වැය ශීර්ෂ සඳහා. ඒ, රුපියල් කෝටි, ප්‍රකෝටි ගණනින්. අන්න ඒ සංස්කෘතිය මේ අය වැය ඇතුළේ වෙනස් කරලා තිබෙනවා. ඒවා කප්පාදු කරලා තිබෙනවා. මේ අය වැය ඇතුළේ යමෙකු පීඩනයට ලක් කළාය කියලා කියනවා නම්, එලෙස පීඩනයට ලක් කරලා තිබෙන්නේ අන්න ඒ අයයි. මොකද, අපි ඒ අයගේ වරප්‍රසාද කප්පාදු කරලා තිබෙනවා. පාලකයන්ගේ වරප්‍රසාද කප්පාදු කරලා, ඔවුන්ට වෙන් වන මුදල් කප්පාදු කරලා ඒ මුදල් බෙදලා තිබෙනවා, මේ ගැලරියේ ඉන්න පුංචි දරු පැටවුන්ගේ අනාගතය වෙනුවෙන්, මේ රටේ සාමාන්‍ය ජනතාව වෙනුවෙන්. තැළෙන, පොඩි වෙන, පෑගෙන මිනිස්සු වෙනුවෙන් අන්න ඒ මුදල් වෙන් කරලා තිබෙනවා; අත දිග හැරලා වෙන් කරලා තිබෙනවා. ඒ නිසා අපි පැහැදිලිව කියනවා, ඉතිහාසයේ පළමුවැනි වතාවට ජනතාවගේ පැත්ත බලාගෙන, ජනතාවට වරප්‍රසාද වැඩියෙන් ලැබෙන අය වැයක් තමයි මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ කියලා.

ඊළඟට මෙතැනදී කථා කළා, IMF එක ගැන. ඔව්, මීට කලින් අපි IMF එකට 16 වතාවක් ගිහින් තිබෙනවා. හැබැයි ගොඩ ගිහිල්ලා නම් නැහැ. අපි IMF එකට ගියා නොවෙයි, අපි ආණ්ඩුව ගන්නකොට IMF එක ඇතුළේ අපි හිර වෙලා හිටියේ. ඒ තත්ත්වය තුළ -මේ පරිසරය ඇතුළේ- තමයි අපට දැන් ඉදිරියට යන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඇයි, අපට IMF එකට යන්න වුණේ? ඇයි අපට එතැනට යන්න වුණේ? මේ ප්‍රශ්නයට අපි උත්තර හොයන්න ඕනෑ.

මට විශේෂයෙන්ම කියන්න ඕනෑකම තිබෙනවා, අද මේ අය වැයට තඩිබාන විපක්ෂයේ ඉන්න මන්ත්‍රීතුමන්ලාගේ පියතුමන්ලා, එතුමන්ලාගේ නායකයෝ තමයි මෙතෙක් මේ රට පාලනය කළේ කියන එක. පියාණෝ ගත්තොත්, 1977 සිට 1993 මැයි 01වැනි දා වෙනකම් ප්‍රධාන නායකයා, නියෝජ්‍ය නායකයා විධියට මේ රට පාලනය කරන්න සම්බන්ධ වුණා. ඒ කාලය තුළ අය වැය ගණනාවක් ඉදිරිපත් කෙරුණා. ඒ වාගේම තමයි, පුතාණෝත් ඇවිල්ලා පසුගිය ආණ්ඩුවක තුන්වැනියා විධියට වැඩකටයුතු කෙරුවා; ඒ ආණ්ඩුවේ වගකීම් දැරුවා. එහෙම නම්, මේ රට මෙතෙක් පාලනය කරපු අය තමයි රට ආර්ථික වශයෙන් බංකොලොත් කළේ.

2022 අප්‍රේල් 12වැනි දා ජාත්‍යන්තරයට නිවේදනය කරනවා, අපේ රට බංකොලොත් රටක් විධියට. අපේ රට බංකොලොත් රටක් විධියට නිවේදනය කරන තැනට රට පත් කළේ කවුද? අපිද? ඒ තත්ත්වය තුළ තමයි අද අපට මේ හැම දෙයකටම මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි. මේක ශ්‍රේෂ්ඨාධිකරණයේදීත් සාකච්ඡාවට භාජන වුණා. අපේ රටේ ආර්ථිකය බංකොලොත් කිරීමට අදාළව ශ්‍රේෂ්ඨාධිකරණයෙන් නිර්දේශයක් නිකුත් කළා. ඒ නිර්දේශය ඇතුළේ රාජපක්ෂවරුන් කිහිපදෙනෙකුගේම නම් කියැවෙනවා.

ඒකේ තව තව අයගේ නම් කියැවෙනවා. ඉතින්, මෙතෙක් රට පාලනය කරපු සියලුදෙනාම අඩු වැඩි වශයෙන් එකතුවෙලා තමයි අපේ රට බංකොලොත්භාවයට පත් කෙරුවේ. එහෙම නම්, ඒ බංකොලොත්භාවයට පත් කිරීමට අදාළව විපක්ෂයේ සිටින ඔබතුමන්ලා මීට පෙර ඉදිරිපත් කරපු අය වැය සියල්ලට කොච්චර දායක වුණා ද? ඔබතුමන්ලා ඉදිරිපත් කරපු අය වැය සියල්ලේ ප්‍රතිඵලයක් විධියට තමයි අපේ රට බංකොලොත් වුණේ. ඔබතුමන්ලා බංකොලොත් කරපු අන්න ඒ රට මීට මාස දෙකකට පෙරාතුව අපි ඒ බංකොලොත්භාවයෙන් නිදහස් කර ගත්තා. අලුත් ආණ්ඩුව යටතේ ඒක අපි ලබපු ලොකු ජයග්‍රහණයක්. ඔබ විනාශ කරපු රට, බංකොලොත්භාවයට පත් කරපු රට සුරක්ෂිත කරමින් ඉදිරියට අරගෙන යන්න අපි මේ පටන් ගත්තා විතරයි, මහත්වරුනි. අනේ, මේ ආණ්ඩුව හදලා තවම දවස් කිහිපයයි. ඒ නිසා මේ ආණ්ඩුවට අවුරුදු 5ක්, 6ක් ගියා වාගේ අදහසක ඉඳන් ඇඟිල්ල දිගු කරන්න එපා කියලා අපි මතක් කරනවා. මේ ඉදිරිපත් කරන්නේ අපේ පළමුවැනි අය වැය බවත් අපි මතක් කරනවා. මේ පළමුවැනි අය වැය ඉදිරිපත් කරනකොට මහා ළිං පතුලකට දාලා තිබුණු රට යාන්තම් ළිං ගැට්ටට ගත්තා විතරයි. හැබැයි, ඊළඟ අය වැය ඉදිරිපත් කරනකොට මේ තත්ත්වය මීට වඩා වෙනස් වෙයි.

ආණ්ඩුවක් විධියට අපි තව අය වැය 4ක් ඉදිරිපත් කරනවා. 4වැනි අය වැය ඉදිරිපත් කරනකොට ඔබ කාට කාටත් කටඋත්තර නැති වෙන විධියට, මේ රට කෙළින් හිටවපු, මේ රට නැඟිටවපු, ඉතාම සතුටුදායක පරිසරයක් ඇතුළේ ඒ අය වැය ඉදිරිපත් කරනවා. ඒ තැනට මේ රට අනිවාර්යයෙන්ම අපි ගේනවා. ඒ තැනට මේ රට ගේන්න අදාළ ශක්තිය අපට තිබෙනවා කියන කාරණයත් මතක් කරමින් මා නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු චානක සම්පත් මාදුගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.25]

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අද දවසේත් අපි එකතු වෙලා තිබෙන්නේ වත්මන් ආණ්ඩුවේ මංගල අය වැය ලේඛනය සම්බන්ධයෙන් විවාද කරන්නයි. අපි පළමුවෙන්ම විපක්ෂය විධියට ඒ අය වැය ලේඛනය ඉතාම සුබවාදීව දකිනවා. හැබැයි, අපි මේ අය වැය සුබවාදීව දකිනවා වාගේම අපි ඒ සම්බන්ධයෙන් එල්ල කරන විවේචනත්, විවේචන විධියටම දකින්න එපා කියන ඉල්ලීමත් කරනවා. ඒ විවේචන ඔබගේ අය වැය ලේඛනයේ ඉදිරි කටයුතු වෙනුවෙන්, ඉදිරි ප්‍රගමනය වෙනුවෙන් පාවිච්චි කරන්න උත්සාහ ගන්නවා නම් වටිනවා කියන කාරණයත් මේ මොහොතේ මා සිහිපත් කරනවා.

රාජ්‍ය සේවකයන්ගේ වැටුප පිළිබඳව අපි හැමෝම කථා කළා. පළමුවෙන්ම අපි ස්තුතිවන්ත වෙනවා, රාජ්‍ය සේවකයාගේ මූලික වැටුප වැඩි කිරීම සම්බන්ධයෙන්. ඒ පිළිබඳව අපේ යම් සතුටක් තිබෙනවා. හැබැයි ඔබ පසුගිය කාලයේ, ඔබ රජය භාර ගන්න පෙර ඔබේ වේදිකාවල රාජ්‍ය සේවකයන්ගේ වැටුප පිළිබඳව කථා කළේ කොහොමද කියන කාරණය පැහැදිලි කරන්න මම අමුතුවෙන් උත්සාහ ගන්නේ නැහැ. ඒ කාරණය පිළිබඳව රාජ්‍ය සේවක මහත්ම මහත්මීන් ඉන්නේ සතුටින් ද කියන කාරණය අපට ඔවුන්ගෙන්ම දැනගන්න ලැබෙයි, දකින්න ලැබෙයි, ඔවුන් අප්‍රේල් මාසයේ වැටුප ලබා ගන්නා දිනයේදී. එම නිසා මම ඒ පිළිබඳව මීට වඩා දීර්ඝව කථා කරන්නේ නැහැ.

අපි පෞද්ගලික අංශයේ සේවය කරන මහත්ම මහත්මීන් පිළිබඳවත් කථා කරන්න ඕනෑ. ඔවුන්ගේ මූලික වැටුප රුපියල් 27,000කට ගෙනාවා කියලා අය වැය ලේඛනය තුළින් ඉදිරිපත් කළා. හැබැයි අපි විශ්වාස කරනවා, මේ රටේ ගොඩක් පෞද්ගලික ආයතනවල දැනට සේවය කරන මහත්ම මහත්මීන්ගේ මූලික වැටුප රුපියල් 27,000ක සීමාවේ තිබෙනවා කියලා. ඔබතුමන්ලා සඳහන් කළා, එම මූලික වැටුප 2026 වසරේදී රුපියල් 30,000 දක්වා ගෙන එනවා කියලා. හැබැයි, රුපියල් 27,000ක් කියන

[ගරු චානක මාදුගොඩ මහතා]

මූලික වැටුප පෞද්ගලික අංශයේ සේවක මහත්ම මහත්මීන්ට ප්‍රමාණවත් ද කියන කාරණය පිළිබඳව අපි ඔබෙන් විමසනවා. ඒ වාගේම අපට මතකයි, පසුගිය ආණ්ඩුව වතු සේවක මහත්ම මහත්මීන්ගේ දෛනික වැටුප රුපියල් 2,700 දක්වා ගෙන එන්න එකඟතා හදාගෙන, කටයුතු කරමින් සිටි බව. නමුත්, මෙවර අය වැය ලේඛනයෙන් වතු සේවක මහත්ම මහත්මීන්ගේ දෛනික වැටුප රුපියල් 1,300 දක්වා පහළට රැගෙනවිත් තිබෙනවා. එම මුදල වතු සේවක මහත්ම මහත්මීන්ට ප්‍රමාණවත් ද කියන කාරණයත් මම මේ මොහොතේ මතක් කරනවා.

විශේෂයෙන්ම ඔබතුමන්ලාට මතක ඇති, උපාධිධාරීන් කියන්නේ ඔබේ ආණ්ඩුව බලයට ගේන්න වැඩියෙන්ම කැප වුණු පිරිසක් බව. අද ඔවුන්ගේ ඒ විශ්වාසය, ඔබ ඔවුන් කෙරෙහි තබපු පොරොන්දු මේ අය වැය ලේඛනයේ තිබෙනවාද කියන ප්‍රශ්නය තිබෙනවා. මොකද, රැකියා 30,000 පිළිබඳව අය වැය ලේඛනයේ ඔබ සඳහන් කර තිබෙන්නේ හඳුනා ගත් විවිධ ක්ෂේත්‍ර සඳහා බඳවා ගැනීම් සිදු කරනවා කියන කාරණය පමණයි. නමුත්, උපාධිධාරීන් 20,000ක් ගුරු වෘත්තියටත්, විශේෂයෙන්ම රේගුව, වරාය ඇතුළු විවිධ ක්ෂේත්‍රවලට 35,000කුත් බඳවා ගන්නවාය කියා පසුගිය ජනාධිපතිවරණයේදී ඔබ උපාධිධාරී සංගම්වලට පොරොන්දුවක් ලබා දී තිබෙනවා. ඒ නිසා මේ මොහොත වනවිට ඒක දැවැන්ත ප්‍රශ්නයක් බවට මේ සමාජය තුළ ගොඩනැඟෙමින් තිබෙනවා. ඒ පිළිබඳවත් මම මේ මොහොතේ ගරු සභාවට සිහිපත් කරනවා. ඒ කාරණා පිළිබඳව දීර්ඝව කථා කරන්න මම කාලය වැය කරන්නේ නැහැ.

ඔබට මතක ඇති, අපේ ආණ්ඩුව හම්බන්තොට සංවර්ධනය කරනකොට, අධිවේගී මාර්ග හදනකොට අද බලයේ ඉන්න ජනාධිපතිවරයා එදා විපක්ෂයේ කටයුතු කරමින් මොනවාද කිව්වේ කියලා. ඒ කාරණය පිළිබඳව මේ සමාජයට අමතක කරන්න බැහැ. එදා කිව්වා, රාජපක්ෂවරුන්ට ඇඹුල්තියල් ගෙනියන්න අධිවේගී මාර්ග හදනවා කියලා. අද අපි සතුටු වෙනවා, වත්මන් ජනාධිපතිවරයා තමන්ගේ ගම වන තඹුත්තේගමට යම් වැඩ කොටසක් කරන්න මේ අය වැය ලේඛනයෙන් මුදල් වෙන් කර තිබීම පිළිබඳව. ඒක වෙන්න ඕනෑ දෙයක්. රටේ ජනාධිපතිවරයා තමන් බලයට පත් කරපු, තමන් දේශපාලනයට ගෙනා ප්‍රදේශයේ ජනතාවට කෘතගුණ දැක්වීම වටිනා කාරණයක්. එතුමා විශේෂයෙන්ම තඹුත්තේගම දුම්රිය ස්ථානය සංවර්ධනය කිරීම වෙනුවෙන් ශක්‍යතා අධ්‍යයනයට රුපියල් මිලියන 100ක් වෙන් කර තිබෙනවා. අපි ඒවා අසුබවාදීව දකින්නේ නැහැ. ජනාධිපතිවරයෙක් විධියට රටට වග කියනවා වාගේම තමන්ගේ ප්‍රදේශයටත් යුතුකම් ඉටු කළ යුතුයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒ වාගේම අය වැය ලේඛනයේ අපි දැක්කා, වැවිලි ක්ෂේත්‍රය වෙනුවෙන් උතුරු පොල් ත්‍රිකෝණයේ වගාකරුවන්ට ඉහළ අස්වැන්නක් සහිත පොල් පැළ ලබා දීමට සහ ඉඩම් සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 500ක මුදලක් වෙන් කර තිබෙනවා. ඒක ඉතා හොඳ කාරණයක්. පසුගිය ආණ්ඩුව ආරම්භ කළ වැඩ පිළිවෙළක් තමයි, උතුරු පොල් ත්‍රිකෝණය. ඒක දිගුවක් විධියට ඉදිරියට ගෙනියන්න ඔබ සූදානම් වෙලා තිබෙනවා. ඒ සඳහා වෙන් කර ඇති රුපියල් මිලියන 500න් ඔබ බලාපොරොත්තු වන සංවර්ධනය කරන්න පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා. හැබැයි, ගැටලුව මේකයි. වැවිලි ක්ෂේත්‍රයේ අනෙකුත් අපනයන භෝග සඳහා වෙන් කර තිබෙන්නේ රුපියල් මිලියන 250යි. රුපියල් මිලියන 250ක මුදල ඒ සඳහා ප්‍රමාණවත් ද කියන කාරණය මේ අවස්ථාවේ කල්පනා කර බලන්න ඕනෑ.

මම නියෝජනය කරන ගාල්ල දිස්ත්‍රික්කයේ කුඩා තේ වතු හිමියන් 90,000ක් ඉන්නවා. විශේෂයෙන්ම ගාල්ල දිස්ත්‍රික්කය කුරුඳු වගාවට ප්‍රචලිතයි. කුරුඳු වගාවේ නියැළෙන වැඩි පිරිසක් ගාල්ල ප්‍රදේශයේ ඉන්නවා. ඔබගේ අය වැය ලේඛනයෙන් කුඩා තේ වතු හිමියන්ට -කුරුඳු වගාව ඇතුළු අනෙකුත් වගාවන්ට- වෙන් කර ඇති රුපියල් මිලියන 250ක මුදල ප්‍රමාණවත්ද කියන කාරණයත් මේ මොහොතේ මම සිහිපත් කරනවා.

මේ ආණ්ඩුව මෙවර අය වැය ලේඛනයෙන් -මීට පෙර කථා කළ ගරු ඇමතිතුමාත් ඒ පිළිබඳව සිහිපත් කළා- ළමුන්ට ලබා දුන් දීමනා පිළිබඳව අපි සතුටු වනවා. ඒ හැම දෙයක්ම දිනා ගත්තේ පසුගිය ආණ්ඩුවල අය වැය ලේඛනවලින් කියන කාරණය ඔබට අමතක කරන්න බැහැ. වකුගඩු රෝගීන්ට දෙන දීමනාව, ළමා නිවාසවල සිටින ළමුන්ට ලබා දෙන දීමනාව, ශිෂ්‍යත්වය සමත් දරුවන්ට ලබා දෙන දීමනාව, අස්වැසුම ප්‍රතිලාභය, වැඩිහිටි දීමනාව ඇතුළු මේ කියන හැම දීමනාවක්ම මේ රටට දායාද කර දුන්නේ, මේ රටට දිනා දුන්නේ පසුගිය ආණ්ඩුයි කියන කාරණය අමතක කරමින් අපට මේ අය වැය කථාව ඉදිරියට ගෙනයන්න බැහැ. ඔබ ඊට එකතුවක් කර තිබෙනවා. ඒ, පසුගිය ආණ්ඩු මේ රටට ගෙනාපු සුබසාධන කටයුතුවලට ඔබ තව මුදලක් එකතු කිරීම. ඒ පිළිබඳව අපි සතුටු වනවාය කියන කාරණයත් මේ මොහොතේ මම සිහිපත් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, විශේෂයෙන්ම මතු කළ යුතු තවත් කරුණක් තිබෙනවා. මේ අය වැය ලේඛනයෙන් "ශ්‍රී ලාංකික දිනය" වෙනුවෙන් රුපියල් මිලියන 300ක් වෙන් කර තිබෙනවා. මම ඒ පිළිබඳව දීර්ඝව කථා කරන්න උත්සාහ ගන්නේ නැහැ. රුපියල් මිලියන 300ක් "ශ්‍රී ලාංකික දිනය" වෙනුවෙන් අය වැය ලේඛනයෙන් වෙන් කරනකොට ඔබේම වැඩසටහනක් වන Clean Sri Lanka වැඩසටහන වෙනුවෙන් රුපියල් මිලියන 5,000ක් වෙන් කිරීම තුළ තිබෙනවා, ජාතීන් අතර සමගිය ඇති කිරීම වෙනුවෙන් සියලු ජන කොටස්වලට එක්ව සතුටු විය හැකි වැඩසටහනක් වෙනුවෙනුත් මුදල් වෙන් කරනවාය කියලා. මම විශ්වාස කරන විධියට මේ වැඩසටහන් දෙකම එකක්. ජාතීන් අතර සමගිය ගැන කථා කරන මේ වෙලාවේ නැවත මේ උත්සාහ කරන්නේ ජාතීන් අතර අසමගියක් තිබෙනවාය කියලා ඉස්මතු කරන්නද කියලා අපට හිතෙනවා.

මම විශ්වාස කරනවා, අපි අතර එවැනි අසමගියක් නැහැ කියලා. අපි ගාල්ලේ හින්දු කෝවිලට, මුස්ලිම් පල්ලියට යනවා. අපේ සංස්කෘතික බැඳීම්, ආගම් බැඳීම් ගාල්ල තුළ අපි ඉතා හොඳින් ක්‍රියාත්මක කරමින් ඉන්නවා. අපි අමතක කරන්න ඕනෑකම තිබෙන ආගම් අතර, ජාතීන් අතර ඇති වන කාරණයක් නැවත මේ රට තුළ ඉස්මතු කරන්න උත්සාහ කරමින්, "ශ්‍රී ලාංකික දිනයක්" එහෙම නැත්නම් ඔවුන්ගේ හිත් සුවපත් කිරීමේ දිනයක් වෙනුවෙන් අමතරව මුදල් වැය කරන්න මෙවර අය වැය තුළින් යෝජනා කර තිබෙනවා. එසේ කරනවාට වඩා ඔවුන්ගේ ඒ ගැටලු වෙනුවෙන් - භාෂාමය ගැටලු වෙනුවෙන් වෙන්න පුළුවන්; පරිපාලනමය ගැටලු වෙනුවෙන් වෙන්න පුළුවන් - මේ අය වැය ලේඛනයෙන් වෙන් කරන එම මුදල යොදවන්න පුළුවන් නම් එය ඉතා වටිනවාය කියන කාරණය මම මේ මොහොතේ විශේෂයෙන් සිහිපත් කරනවා.

විශේෂයෙන්ම අය වැය ලේඛනය ඉදිරිපත් කරනකොට ඔබතුමන්ලා ඩිජිටල්කරණය පිළිබඳවත් සිහිපත් කළා. එය ඉතාම වැදගත් කාරණයක්. මම මේ කාරණා සන්සන්දනය කරන්න උත්සාහ කළත්, අපි මේ සභාවට ඇවිල්ලා තිබෙන්නේ එකිනෙකාට චෝදනා කර ගන්න නොවෙයි කියන එකත් කියන්න ඕනෑ. නමුත්, හැමදාම එකිනෙකාට චෝදනා කර ගැනීම් තමයි අපි දකින්නේ. අපි එහෙම චෝදනා කර ගන්නේ නැතුව මේ අය වැය ලේඛනය ගැන කථා කරන්න උත්සාහ ගන්නවා. විශේෂයෙන්ම ඔබට මතක ඇති, ඩිජිටල්කරණය ගැන කියනකොට එදා විපක්ෂයේ හිටපු ඔබේ වත්මන් ජනාධිපතිවරයා ඉන්දියාවට දත්ත

ගෙනයන්න වැඩ කරනවාය කියූ බව. හැබැයි, එහෙම කියපු ජනාධිපතිවරයාම තමන්ගේ අය වැය ලේඛනයෙන් මෙවර ඩිජිටල්කරණයට මුදලක් වෙන් කර දීම පිළිබඳව අපි සතුටු වෙනවා. මේක රටේ අනාගතයට ඉතාම වැදගත් කාරණයක්.

ඒ වාගේම මම තවත් කාරණයක් මතක් කළ යුතුයි. උතුරට, නැගෙනහිරට මුදල් වෙන් කරනකොට අපි නම්වලින් "උතුර" නැත්නම් "නැගෙනහිර" කියන්න උත්සාහ ගත්තත්, මම විශේෂයෙන් ඉල්ලීමක් කරනවා, ඒක වෙනත් අර්ථයකට අරගෙන යන්න හදන්න එපා කියලා. උතුරද, දකුණද, නැගෙනහිරද කියන කාරණයට වඩා මෙය අපි රටක් විධියට ශ්‍රී ලංකාව ගැන කථා කරන මොහොතක්. හැබැයි, ගාල්ලට මේ අය වැය ලේඛනයෙන් මුදලක් වෙන් වුණේ නැහැයි කියන කාරණය ගාල්ල නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් විධියට මම සිහිපත් කරන්න ඕනෑ. විශේෂයෙන්ම ගාල්ලේ ජනතාවට දැවෙන ප්‍රශ්න තිබෙනවා. මහ ගාල්ල ජල යෝජනා ක්‍රමයේ දෙවන අදියර ක්‍රියාත්මක කරන්න වසර 15ක්, 20ක් තිස්සේ අපි උත්සාහ ගනිමින් ඉන්නවා. අද ගාල්ලට එන සංචාරකයන්ට වතුර නැහැ. ගාල්ලේ මිනිසුන්ට වතුර නැහැ. එම නිසා මේ අය වැය ලේඛනයෙන් ඒ සඳහාත් යම් මුදලක් වෙන් වුණා නම් හොඳයි කියන කාරණය ගාල්ල නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් විධියට මම සිහිපත් කරනවා. ඒ වාගේම ගාල්ල වරාය සංවර්ධනයට, ගාල්ල මධ්‍යයේ යෝජිත මිශ්‍ර ව්‍යාපෘතියට, එමෙන්ම අබලන් තත්ත්වයේ පවතින එවකට ලංකාවේ දිගම පාලම වුණු වක්වැල්ල පාලමට මුදලක් වෙන් කළා නම් ඉතාම වටිනවා. ගාල්ලට මේ අය වැය ලේඛනයෙන් විශේෂ මුදලක් වෙන් කරලා නැහැ කියන කාරණය මම සිහිපත් කරන්නේ ගාල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් විධියටයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මෙම අය වැය ලේඛනය පිළිබඳව කථා කළ යුතු කරුණු තව ගොඩක් තිබුණත්, වාහන ප්‍රශ්නය පිළිබඳව කථා කරන්න මම මේ මොහොත යොදා ගන්නවා. ඒ පිළිබඳව හැමදාම මේ සභාවේ කථා කරනවා. රදල පන්තියෙන්, එහෙම නැත්නම් රටේ සිටින ධනපති පන්තියෙන් සාමාන්‍ය ජනතාව අතරට, නැත්නම් මධ්‍යම පන්තියට බලය හුවමාරු වුණා කියලා අද කියනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, නමුත් සාමාන්‍ය ජනතාව අතට බලය හුවමාරු වෙලාද කියන කාරණය අපි මේ මොහොතේ විමසන්නට ඕනෑ. අද වාහනයක් නැති මන්ත්‍රීවරයෙකුට කොළඹට ඇවිල්ලා පාර්ලිමේන්තුවට එන්න වටපිටාවක් නැහැ. අපි මේවා කථා කරන්නේ මට වාහනයක් ලබා ගැනීම වෙනුවෙන් නොවෙයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, පහළ පන්තියේ සාමාජිකයෙක්, මධ්‍යම පාන්තිකයෙක්, එහෙම නැත්නම් ජීවන ශක්තියක් නැති, ව්‍යාපාරික ශක්තියක් නැති, එහෙමත් නැත්නම් ධනවත්කමක් නැති මන්ත්‍රීවරයෙක් අනාගතයේ කවදා හෝ මේ පාර්ලිමේන්තුවට පත් වුණොත්, එතුමා මේ පාර්ලිමේන්තුවට ඇවිත කටයුතු කරන්නේ කොහොමද කියන ප්‍රශ්නය මතුව තිබෙනවා. අද මේ රටේ ජනප්‍රිය මාතෘකාවක් විධියට අරගෙන තිබෙන වාහන ප්‍රශ්නය, අනාගතයේ කවදා හෝ දවසක මේ පාර්ලිමේන්තුව තුළ නැවත කථා කරාවි කියලා මම හිතනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, එම නිසා මම පෞද්ගලිකව මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරන්න කැමතියි. මට ගාල්ලේ ඉඳලා බස් එකෙන් ඇවිල්ලා බහින්න පුළුවන්. හැබැයි, ගාල්ලේ ඉඳලා බස් එකෙන් ඇවිල්ලා බැස්සාම, ඒ බැහැපු තැන ඉඳලා පාර්ලිමේන්තුවට එන්න ක්‍රමවේදයක් අපට මේ පාර්ලිමේන්තුව තුළින් ලබා දෙනවා නම් වටිනවා. ඒ වාගේම ඔබ බලාපොරොත්තු වුණු, බස් එකෙන් පාර්ලිමේන්තුවට එන මන්ත්‍රීවරු නිර්මාණය කරන තැනට මේ පාර්ලිමේන්තුව අපට ගෙනියන්න පුළුවන්ය කියන කාරණයත් සිහිපත් කරමින්, විශේෂයෙන්ම මෙම අය වැය ලේඛනයේ සාධනීය කාරණා සාර්ථක කර ගන්න හැකි වේවා කියාත් මම ප්‍රාර්ථනා කරනවා.

ඒ වාගේම ළිං ගැටිටේ ඉන්න කථාවක් ගරු ඇමතිතුමා කිව්වා. ළිං ගැටිටෙන් ළිදට වැටෙන්නේ නැතුව අපේ ගෞරවනීය ජනතාව මතට බරක් පැටවෙන්නේ නැතිව, මිනිස්සු සතුටු වන, මිනිස්සු සුවපත් වන, රටට හොඳක් වන දේවල් මේ අය වැය ලේඛනය තුළින් අනාගතයේ දකින්න ලැබේවා කියාත් ප්‍රාර්ථනා කරමින්, මට කථා කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමියටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු සුජීව දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.38]

**ගරු සුජීව දිසානායක මහතා**
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ජාතික ජන බලවේගයේ මංගල අය වැය දෙවැනි වර කියවීමේ විවාදයට සම්බන්ධ වීමට ඉඩ කඩ ලැබීම ඉතාම වටිනා අවස්ථාවක් ලෙස සලකනවා. 1931 රාජ්‍ය මන්ත්‍රණ සභාවේ ඉඳන් 2025 මේ පාර්ලිමේන්තුව දක්වා ලංකාවට අය වැය ලේඛන ගණනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. 1948 ඉඳන් 2025 දක්වා වූ කාලය; නිදහස ලබා ගෙවුණු අවුරුදු 77ක කාලය තුළ ඉදිරිපත් කළ අය වැය ලේඛන ගත්තොත්, වඩාත් හොඳ, ජනතාවගේ පැත්තෙන් හිතපු, පාලක පන්තියට කිසිදෙයක් නොලැබෙන ආකාරයේ, පුරවැසි අය වැයක් ඉදිරිපත් කරලා තිබෙන්නේ මෙවරයි කියලා මම විශ්වාස කරනවා. විශේෂයෙන්ම අපේ පාර්ලිමේන්තුවේ ප්‍රධාන වගකීම තමයි රටේ අනාගතයට වාර්ෂික අය වැය ලේඛනය සකස් කිරීම සහ අතිරේක වැය ලේඛන සකස් කිරීම.

මේ සභාවේ මහජන ගැලරියේ මේ මොහොතේ ඉන්නවා අපේ රටේ අනාගතය බාර ගන්න ඉන්න දරුවන්. ආදරණීය දරුවනේ, ඔබ මතක තියා ගන්න ඔබලාට මේ අය වැයෙන් වෙන් කරලා තිබෙනවා ලාංකීය ඉතිහාසයේ එතෙක් මෙතෙක් වෙන් කරන ලද විශාලම මුදල් ප්‍රමාණය; බිලියන 619ක්. බිලියන 619ක වැය ශීර්ෂයක් වෙන් කරලා තිබෙනවා මේ රටේ අධ්‍යාපනය වෙනුවෙන්; මේ රටේ අනාගතය බාර ගන්න ඉන්නා ආදරණීය දරුවන් වෙනුවෙන්.

1931 ඉඳන් මේ දක්වා අපේ රට පාලනය කළ පාලකයන් පාරවල් හදන්න, ඉස්කෝල හදන්න, රැකියා දෙන්න, විදුලිය දෙන්න, බෙහෙත් දෙන්න විවිධාකාරයේ ක්‍රියාමාර්ග තේරුවා. හැබැයි පසුගිය අවුරුදු දෙකකට පිටුපස්සට ගියොත්, අපේ රට ලෝකයේ බංකොලොත් රාජ්‍යයක් වුණා, අසාර්ථක රාජ්‍යයක් වුණා. එහෙම වෙන්න හේතුව මොකක්ද? අවුරුදු 77කට ආසන්න කාලයක් මේ රට පාලනය කළ පාලකයන් මේ රට ඉදිරියට ගෙනාවා නම් රට එතැනට යන්නේ කොහොමද? මතක තියා ගන්න, මේ රටේ අධ්‍යාපනය, මේ රටේ ඉගෙනීම, කියවීම විනාශ කරන්න යම් උත්සාහයන් ගත් පාලක පන්තියක් අපේ රටේ සිටි බව. 1981 මැයි මාසයේ 31- ජූනි මාසයේ 01වෙනි දා අතර කාලය තුළ කලබල ඇති කරලා දකුණු ආසියාවේ විශාලතම පුස්තකාලය; පොත් පිටපත් 97,000ක් තිබුණු පුස්තකාලයට ගිනි

[ගරු සුජීව දිසානායක මහතා]

තැබුවා. ගාමිණීලා තුන්දෙනෙක් දකුණෙන් උතුරට ගිහිල්ලා, සංවර්ධන සභා ඡන්දය ඉලක්ක කරගෙන, මේ රටේ තිබුණු විශාලතම පුස්තකාලය විනාශ කළා. පේරාදෙණිය පුස්තකාලය හැරුණුවිට ශ්‍රී ලංකාවේ වැඩිම පොත් පිටපත් සංඛ්‍යාවක් තිබුණේ යාපනය පුස්තකාලයේ.

පසුගිය පෙබරවාරි 17වැනි දා අපේ ජනාධිපතිතුමා ඉදිරිපත් කළ ඒ මංගල අය වැය මඟින් විශේෂයෙන් යාපනය පුස්තකාලය වැඩිදියුණු කිරීම වෙනුවෙන් සහ අපේ රටේ දරුවන් ඇතුළු පාඨක ජනතාව භාවිත කරන වෙනත් පුස්තකාල වෙනුවෙන් මුදල් ප්‍රමාණයක් වෙන් කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, 2025 අය වැය කථාවේ 20වන පිටුවේ මෙසේ සඳහන් වෙනවා:

> "යාපනය සහ අනෙකුත් ප්‍රාදේශීය පුස්තකාල වැඩිදියුණු කිරීම යාපනයේ සහ අවට දූපත්වල පාසල් සිසුන් ඇතුළු පාඨකයන් විශාල පිරිසක් යාපනය පුස්තකාලය භාවිත කරනවා. නමුත් මෙම පාඨකයන්ගේ ප්‍රයෝජනය සඳහා යටිතල පහසුකම් ප්‍රමාණවත් ලෙස සංවර්ධනය කර නැහැ. එම නිසා මෙම පුස්තකාලයට පරිගණක ඇතුළු අත්‍යවශ්‍ය පහසුකම් ලබාදීමට මෙවර අයවැයෙන් රුපියල් මිලියන 100ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා. ඊට අමතරව, අනෙකුත් ප්‍රාදේශීය පුස්තකාල සංවර්ධනය සඳහා මෙම අයවැය යටතේ තවත් රුපියල් මිලියන 200ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා."

අපි මේ රටේ අනාගතය ගොඩ නඟන ආණ්ඩුව. අවුරුදු 77ක් තිස්සේ පාලනය කළ පාලකයෝ අපේ රට අසාර්ථක රාජ්‍යයක්, බංකොලොත් රාජ්‍යයක් බවට පත් කරලා තිබුණා. ඒ බංකොලොත් වුණු රාජ්‍යය ඉස්සරහට ගෙනියන්න මේ රටේ ජනතාව අපට වගකීමක්, කාර්යභාරයක් පවරලා තිබෙනවා මේ රටේ ජනතාව. ඒ ජනතාවගේ දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන්, ඔවුන්ගේ කියැවීම වෙනුවෙන් අපි මැදිහත් වෙන්න ඕනෑ, ඒ වෙනුවෙන් වැඩ කරන්න ඕනෑ. ඒ නිසා තමයි අපේ අනුර දිසානායක ජනාධිපතිතුමා යාපනය පුස්තකාලය ඇතුළු වෙනත් පුස්තකාල වැඩිදියුණු කරන්න රුපියල් මිලියන 100ක් වෙන් කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපට මතකයි මෑත ඉතිහාසයේ අවුරුදු 27කට ආසන්න කාලයක් අපේ රටේ බෙදුම්වාදී යුද්ධයක් තිබුණු බව. යාපනය පුස්තකාලය ගිනි තිබ්බ දවසේ එක ද්‍රවිඩ සහෝදරයෙක් ගිහිල්ලා ලියනවා, "මෙතැනින් පටන් ගන්නේ අපේ රටක් වෙනුවෙන්, අපේ ජාතිය වෙනුවෙන් රාජ්‍යයක් නිර්මාණය කිරීමේ සටන" කියලා. අධ්‍යාපනය විනාශ කිරීම තුළින් වුණේ ඒක. ඒ නිසා මේ රටේ හිටපු පාලක පන්තියට අපි කියනවා අධ්‍යාපනය විනාශ කරන්න එපා කියලා. ලාංකීය ඉතිහාසයේ වැඩිම මුදල් ප්‍රමාණය වූ රුපියල් බිලියන 619කට ආසන්න ප්‍රමාණයක් අධ්‍යාපනය වෙනුවෙන් අපි මේ අය වැයෙන් වෙන් කරලා තිබෙනවා.

පසුගිය කාලයේ හිටපු රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා "Smart Youth" වෙනුවෙන් වෙන් කළා රුපියල් මිලියන 188ක්. ඡන්දය හෙට, අද වවුචර් 52ක් අත්සන් කරවනවා, සේවකයන් භය ගන්වලා, තර්ජනය කරලා, මාරු කරනවා කියලා. ඒ විධියට "Smart Youth" වැඩසටහනට වෙන් කරනවා, රුපියල් මිලියන 188ක්; හොරකම් කරනවා. ආදරණීය දරුවනේ, ඔබට වෙන් කරන්න තිබුණු රුපියල් 10, එහෙම හොරකම් කළා මේ පාලකයෝ.

ඊයේ-පෙරේදා දවසක COPE එකේදී හෙළිවෙනවා, ලක්ෂ 638ක් ප්‍රෞඪ ඉතිහාසයක් නඟා සිටුවන්න වෙන් කරගෙන කියලා. අපේ රටේ ජාතික අභිමානය නඟා සිටුවන්න ලූ, ඒ මුදල් වෙන් කළේ. ඒකට ලක්ෂ 638ක් වෙන් කර තිබෙනවා. හාඩ්වෙයාර් එකකින් ටී- ෂර්ට් ගහනවා. එහෙම පාලකයෝ, අධ්‍යාපනය ගැන කථා කරනවා. මේ රටේ ජනතාවගේ සල්ලි හොරකම් කළ, මේ රටේ දරුවන්ට වෙන් කරන්න තිබුණු මුදල් හොරකම් කළ, ඔවුන්ගේ ගෝලයන්ට, ඔවුන්ගේ හිතවතුන්ට හොරකම් කරන්න ඉඩ දුන්නු පාලනයක් තිබුණේ. ඒ පාලනය තමයි මේ රටේ ජනතාව අවසන් කළේ. මේ පාර්ලිමේන්තුවට අපේ පක්ෂයෙන් මහජන නියෝජිතයෝ 159දෙනෙක් එව්වේ ඒ වෙනුවෙන්. විශ්වවිද්‍යාල මහාචාර්යවරු, ආචාර්යවරු, ඉංජිනේරුවන්, පරිගණක ඉංජිනේරුවන්, ලක්ෂ 25, 30 වැටුප් ගත්ත මිනිස්සු මෙතැන ඉන්නවා. ඒ අය අද ශත පහක් ඉල්ලන්නේ නැහැ. එහෙම කැප කිරීම් කරලායි අපි ආවේ. එහෙම කැප කරලා ආපු මිනිස්සු විධියට තමයි මේ රටේ අධ්‍යාපනයට රුපියල් බිලියන 619ක් වෙන් කරන්නේ.

මට පෙර කථා කරපු ගරු මන්ත්‍රීතුමා "ශ්‍රී ලාංකික දිනය" ගැන කිව්වා. ඇත්තටම මම ලෑහැස්ති වෙලා ආවේ මේ රටේ "ශ්‍රී ලාංකික දිනය" පිළිබඳව අදහස් ඉදිරිපත් කරන්න, කාගෙන්වත් අදහසක් ඉදිරිපත් නොවෙයි කියලා හිතලා. අපේ අනුර දිසානායක ජනාධිපතිතුමා අය වැය කථාවේ 40වන පිටුවේ 33 ඡේදය යටතේ "ශ්‍රී ලාංකික දිනය" ගැන මෙසේ සඳහන් කරනවා:

> "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" යන රජයේ ප්‍රතිපත්ති රාමුව, ප්‍රජාවන් අතර පරතරයන් පියවීමට කැප වී, සංහිඳියාවෙන් යුත් ශ්‍රී ලංකාවක් සඳහා දැක්මක් ඉදිරිපත් කරයි. එබැවින්, "ශ්‍රී ලාංකික දිනය" ජාතික උත්සවය පැවැත්වීමට මා යෝජනා කරනවා. මෙම උත්සවය පෞද්ගලික අංශයේ ද සහභාගිත්වයෙන් සංවර්ධනය කෙරේ. මේ සඳහා රුපියල් මිලියන 300ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා."

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ශ්‍රී ලංකාව කියන්නේ ආගමෙන්, භාෂාවෙන්, ජාතියෙන් විවිධ මිනිස්සු ජීවත් වෙන සුන්දර රටක්. ඒකට තවත් වටිනාකමක් එකතු කර තිබෙනවා, අපේ රටේ ස්වාභාවික පරිසරය. කඳු වැටි, දිය ඇලි ඒ වාගේම පෞරාණික රාජධානි, මේ විවිධ දේවල් අපේ රටේ තිබෙනවා. ලෝකයේ කිසිම රටක් අපේ රට වාගේ නැහැ. මේ රටේ කාන්තාර නැහැ; ගිනිකඳු නැහැ; මහා පරිමාණ නාය යාම් නැහැ; දරුණු ස්වාභාවික විපත් අපේ රටේ වෙන්නේ නැහැ. අපේ රට සමකයට ආසන්නයි. එහෙත් සෞම්‍ය දේශගුණයක් තිබෙනවා. රට මැද්දේ කඳුකරයක්; හතර පැත්තට වැටෙන ගංගාධාර -ගංගාධාර 103ක්- තිබෙනවා. අපේ රටේ මිනිස්සු එදා ඉඳන් එකට එකතු වෙලා හිටියේ.

ලාංකීය ඉතිහාසයේ කියැවෙන විජය රජ්ජුරුවෝ උතුරු ඉන්දියාවේ අයෙක්. එතුමාට ආර්ය ප්‍රභවයක් තිබුණේ. විජයගේ බිරිඳ විජායි, දකුණු ඉන්දියාවේ තමිල්නාඩුවේ. එතැනින් පටන් ගත්තා සංහිඳියාව. අපේ රට පාලනය කරපු පාලකයෝ අවුරුදු 77ක් මොකක්ද කළේ? ඒ සංහිඳියාව එකින් එක, එකින් එක බින්දා. 1956දී සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කළා. දෙමළ මනුෂ්‍යයා ඉන්න, මුස්ලිම් මනුෂ්‍යයා ඉන්න රටේ ජාතිවාදය ඇවිස්සුවා, 1956 ඉඳන්. සුද්දා 1833 ඉඳන් ඇවිස්සුවා. ජාතීන් අනුව බෙදුවා. සිංහල, දෙමළ, බර්ගර් ජාතිකයන් විතරයි 1833 ව්‍යවස්ථාදායකය නියෝජනය කළේ. සුද්දා මුස්ලිම් ජනතාවට කිසිදු අවස්ථාවක් දුන්නේ නැහැ.

1956 ඉඳන් මේ රටේ ජාතිවාදය වැපිරුවා. ඒ ජාතිවාදයේ එක් අවස්ථාවක් තමයි, 1981 සංවර්ධන සභා ඡන්දයට ගිහිල්ලා මේ රටේ තිබුණු ලොකුම පුස්තකාලයට ගිනි තියපු එක. එතකොට අපේ රටේ සිංහල ජනතාව සියයට 75ක්, ශ්‍රී ලාංකික ද්‍රවිඩ ජනතාව

සියයට 12ක්, ඉන්දියානු ද්‍රවිඩ ජනතාව සියයට 4ක්, මුස්ලිම් ජාතිකයන් සියයට 9ක්, මැලේ, බර්ගර්, වැදි ආදී විවිධ ජන කොටස් ඉන්නවා. අපේ රට සුන්දර රටක්. ඔවුන්ටම ආවේණික වෙච්ච සංස්කෘතික උත්සව, හැමෝම එකට එකතු වෙලා සමරනවා. විශේෂයෙන් සිංහල - හින්දු අලුත් අවුරුද්ද සිංහල ජනතාව, හින්දු ජනතාව එකට සමරන උත්සවයක්. ඒක අපේ රටේ සංස්කෘතිය. විජයබාහු රජ්ජුරුවන්ගේ කාලයේ ඉඳන් සිංහල අවුරුද්ද සැමරුවා කියලා පෙන්වන්න සාක්ෂි තිබෙනවා, ඉතිහාසගත ලේඛනවල. ඒ වාගේම මහා ශිව රාත්‍රී දිනය, රාමසාන් දිනය, හජ් වන්දනාව, වෙසක්, පොසොන්, ඇසල ආගමික උත්සව පවත්වන රටක්, මේක. එහෙම රටකට මොකක්ද කළේ?

මේ රටේ කතෝලිකයන්ගේ ශුද්ධ දිනයක්, පාස්කු ඉරිදා දිනය. තමන්ගේ බලය වෙනුවෙන් ඒ ශුද්ධ වූ දිනය කේන්ද්‍ර කරගෙන මිනිස්සු 350කට වඩා මරලා බලයට ආවා සමහරු. එතැනින් බෙදීමක් ඇති වුණා. මතක ද ඔබතුමන්ලාට, මෙහි හිටපු ඇතැම් නායකයෝ ගර්භාෂ යුද්ධ ගැන කථා කෙරුවා? මම නියෝජනය කරන කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල මහ රෝහලේ හිටපු වෛද්‍යවරයෙක් කාන්තාවන්ගේ පැලෝපීය නාළය damage කරලා ඔවුන් වඳ කරන්න කටයුතු කළා කියලායි කිව්වේ. එතැනට හදපු ජාතිවාදය වෙනස් කරන්න ඕනෑ; ආගම්වාදය වෙනස් කරන්න ඕනෑ.

අපි ඔක්කෝම එකම රටේ මිනිස්සු. ලංකාව සුන්දර රටක්. ලෝකයේ විවිධ ජාතීන් මේ රට විවිධ ආකාරයෙන් හැඳින්වූවා. මේක, "රත්නදීපයක්". මේක, මැණික් රටක්. ඉතිහාසයේ චීන ජාතිකයන් මේ රට දැක්කේ එහෙමයි. හියුං සියැං හාමුදුරුවෝ, පාහියන් හාමුදුරුවෝ තමන් වහන්සේලාගේ පොත්වල අපේ රට හැඳින්වූයේ, "රත්නදීප" කියලා. අරාබි ජාතිකයන් ශ්‍රී ලංකාව හැඳින්වූයේ, "සෙරන්ඩිබ්" කියලා. මිහිබට සුරපුරය, ඕජදීප, වරදීප, මණ්ඩදීප, සිහලදීප, තැප්‍රොබේන්, තම්බපණ්ණි, සිලෝන්, සෙයිලාන් කියන නම්වලිනුයි අපේ රට හැඳින්වූයේ. අපේ රටට කියා තිබෙන නම් ටික ගත්තොත්, ලෝකයේ එහෙම හඳුන්වපු වෙනත් එක රටක්වත් නැහැ. එහෙම රටක තමයි ජාතිවාදය වැපිරුවේ; ආගම්වාදය වැපිරුවේ; මිනිසුන් බෙදා වෙන් කළේ. අන්න ඒ වෙන් වුණු, තැළිච්ච, තුවාල වෙච්ච හදවත් සුවපත් කරන්න තමයි, මේ අය වැයෙන් "ශ්‍රී ලාංකික දිනයක්" යෝජනා කර තිබෙන්නේ. අපි කියනවා, අපට ශ්‍රී ලාංකික දිනයක් ඕනෑ කියලා. ශ්‍රී ලංකාවට brand එකක් ඕනෑ. ඒක මතක තබා ගන්න. ජපානයේ තිබෙනවා, "ටොයොටා". ඉන්දියාවට තිබෙනවා, "බජාජ්". ඇයි අපට brand එකක් නැත්තේ? අපේ රටේ brand එක අනිවාර්යයෙන්, ලංකාවේ භූමියයි. මේ භූමියට අපි සංචාරකයන් ආකර්ෂණය කරවා ගන්න ඕනෑ. මේ භූමියේ සංහිඳියාව හදන්න ඕනෑ; ජාතීන් අතර සමගිය ඇති කරන්න ඕනෑ. ආගම් අතර සහජීවනය නිර්මාණය වෙන්න ඕනෑ. එහෙම වුණොත් ලෝකයේ විවිධ රටවල සංචාරකයන් මේ රටට එයි.

මේ රට පාලනය කරපු පාලකයෝ අපෙන් අහනවා, "කොහොමද අය වැය පරතරය පියවා ගන්නේ?" කියලා. මතක තබා ගන්න, ලංකාවට එන විදේශීය ජාතිකයෙකුගෙන් ඩොලර් 500ක්, 600ක් අපේ රටට ගන්න පුළුවන් නම්, අන්න එය ආදායම් උපයන මාර්ගයක්. අපේ ඉලක්කය, 2025දී සංචාරකයන් ලක්ෂ 30ක්. ඒ එක් මනුස්සයකුට ඩොලර් 500ක් අපේ රට තුළ වියදම් කරන්න පුළුවන් නම්, අන්න එය අපේ රට තුළ ආදායම් උපයන්න පුළුවන් මාර්ගයක්. එහෙමයි මේ ආර්ථිකය නිර්මාණය වෙන්නේ. වැය විතරක් නොවෙයි. එදා ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළේ අය වැය කථාවයි. අය වැය ඇස්තමේන්තුව මෙහි තිබෙනවා. වියදම් සහ ආදායම් තත්ත්වය එහි සඳහන් වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපි කඩා වැටුණු මේ රට හදන්න ඕනෑ. අපට බලය දුන්නේ ඒකට. 159ක බහුතර බලයක්, තුනෙන් දෙකකට එහා බලයක් ජනතාව අපට ලබා දුන්නා. එම නිසා අපි මේ රට නිර්මාණය කරනවා; අපි මේ රට හදනවා. ඒ හදන්නේ අපේ රටේ අනාගතය භාර ගන්න සිටින ආදරණීය දූ දරුවන් වෙනුවෙන් බව ප්‍රකාශ කරමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

මීළඟට, ලුතිනන් කමාන්ඩර් ප්‍රගීත් මධුරංග මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.50]

**ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා**
(மாண்புமிகு லெப்டினன் கமாண்டர் (ஓய்வுபெற்ற) பிரகீத் மதுரங்க)
(The Hon. Lieutenant Commander (Rtd.) Prageeth Madhuranga)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මම මුලින්ම ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමාට පිළිතුරක් දීලා මගේ කථාව පටන් ගන්න කැමැතියි. එතුමා ප්‍රකාශ කළා, අතිගරු ජනාධිපතිතුමා තමන්ගේ ගමේ, Thambuththegama Railway Station එක පාදක කරගෙන ශක්‍යතා අධ්‍යයනයක් කරන්න විශාල මුදලක් වෙන් කර තිබෙනවා කියලා. ඇත්තටම ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, Thambuththegama Railway Station එක කියන්නේ ආර්ථික මධ්‍යස්ථානයක් ළඟම තිබෙන දුම්රිය ස්ථානයක්. අය වැයෙන් එම වෙන් කිරීම කරලා තිබෙන්නේ, කෘෂිකාර්මික නිෂ්පාදන දුම්රිය ඔස්සේ ප්‍රවාහනය කිරීම පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයක් කරන්නයි. අපි දන්නවා, තඹුත්තේගම ප්‍රදේශයේ පිහිටි තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථානය කියන්නේ කෘෂිකාර්මික නිෂ්පාදන එන කේන්ද්‍රස්ථානයක් බව. කෘෂි කාර්මික නිෂ්පාදන මහාමාර්ග ඔස්සේ ප්‍රවාහනය කරද්දී විශාල වශයෙන් පසු අස්වනු හානියක් සිදු වෙනවා. නමුත්, ඒවා දුම්රිය මඟින් ප්‍රවාහනය කරද්දී පසු අස්වනු හානිය අවම කරන්න අපට පුළුවන්. ඒ කියන්නේ, අස්වනු අඩු වීම එමඟින් ද පාලනය කර ගන්න අපට පුළුවන්. කොළඹ, මාතර ඇතුළුව රට වටේටම දුම්රිය මාර්ග ඔස්සේ කෘෂිකාර්මික නිෂ්පාදන ප්‍රවාහනය කිරීමට ඇති හැකියාව තමයි සොයා බලන්නේ. එතකොට අපට එළවී භාණ්ඩවල මිල අඩු කර ගන්න, මාර්ග තදබදය අඩු කර ගන්න පුළුවන්. අය වැයෙන් එම මුදල් වෙන් කිරීම නිකම්ම කළ දෙයක් නොවෙයි. දුම්රියෙන් කෘෂිකාර්මික නිෂ්පාදන ප්‍රවාහනයේදී අපට ලැබෙන strengths මොනවා ද, එහි තිබෙන weaknesses මොනවා ද, එය කළාම අපට ලැබෙන opportunities මොනවා ද, අපට තිබෙන threats මොනවා ද කියලා SWOT analysis එකක් ආදිය කරලා ශක්‍යතා අධ්‍යයනයක් කරන්න තමයි එම මුදල් වෙන් කිරීම කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, පෙරේදා මහාධිකරණයේ වූ සිදුවීම ගැන කිහිප දෙනෙක් අදහස් දැක්වූවා; ජාතික ආරක්ෂාවට යම්කිසි බලපෑමක් වෙලා තිබෙන බව කිව්වා. හැබැයි මම අහන්න කැමතියි, මිලේනියම් සිටිවල ස්ථානගත කරලා සිටි බුද්ධි අංශ කිසිම සොයා බැලීමකින් තොරව සමාජයට විවරණය කරද්දී ජාතික ආරක්ෂාව ගැන හිතුවාද කියලා.

සමහර වෙලාවට ත්‍රිවිධ හමුදාවල ඉන්න පුද්ගලයන් කොළඹ ආදි ප්‍රදේශවලට සේවා ස්ථාන මාරුවක් අරගෙන එන්නේ පෞද්ගලික, අතිශය සානුකම්පික හේතුන් මත කර ගත යුතු වැඩ රාජකාරි කර ගන්නයි. පසුගිය කාලවල සිටි පාලකයන්ගේ සමහර

[ගරු ප්‍රගීත් මධුරංග මහතා]

පුත්‍ර කුමාරවරුන්ගේ rugger matches තිබුණේ සෙනසුරාදාට, ඉරිදාට. සෙනසුරාදා, ඉරිදා තිබෙන ඒ rugger matchesවලට කට්ටිය උද්‍යෝගීමත් කරන්න cheer කරන්න සිකුරාදා ඉඳන් තමයි cheering parties දාලා ලැහැස්ති වුණේ. එතකොට හමුදාවල හිටපු, පොලීසියේ හිටපු කට්ටියගේ මානසික ඒකාග්‍රතාව, තමන්ගේ රැකියාව පිළිබඳව තිබෙන අභිමානය බිඳුණේ නැද්ද? ඒ තුළින් ජාතික ආරක්ෂාවට හානියක් වුණේ නැද්ද? මට මතකයි, එක කාලයක canal party කියලා කානු ශුද්ධ කරන්න පමණක් යොදවපු පිරිසක් සිටි බව. එතකොට ජාතික ආරක්ෂාවට හානියක් වුණේ නැද්ද? මෙය ජාතික ආරක්ෂාව ඇතුළේ තිබෙන මහජන ආරක්ෂාව සම්බන්ධ සිදුවීමක්. නමුත් මේක අපි ලඝු කොට තකන්නේ නැහැ. මේ වෙද්දී ඒ සිද්ධියට සම්බන්ධ සැකකරුවන් අත්අඩංගුවට ගෙන තිබෙනවා. මේ වාගේ සිදුවීම් ලෝකයේ සමහර රටවලත් සිදු වෙලා තිබෙනවා. ලෝකයේ සමහර දියුණු රටවල, ජාතික ආරක්ෂාව හොඳින්ම තිබෙන රටවල පවා මානසික ආතතියෙන් පෙළෙන පුද්ගලයන් සමහර වෙලාවට ගුවන් තොටුපළවල, මහ පාරේ වාහන අනතුරු සිදු කරලා, එහෙම නැත්නම් මෙවැනි වෙඩි තැබීම් කරලා පුද්ගල ඝාතන විශාල වශයෙන් සිදු කරලා තිබෙනවා. මෙම සිදුවීම නිසා ජාතික ආරක්ෂාව බිඳ වැටීමක් කිසි ලෙසකින්වත් වෙන්නේ නැහැ. ජාතික ආරක්ෂාවට හානියක් වෙන්න ජාතික ජන බලවේගය රජය ඉඩ තියන්නෙත් නැහැ; ඉඩ තියලාත් නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

මේ අය වැය ගැන කථා කළොත්, මේ අය වැයෙන් ජාතික ආරක්ෂාව වෙනුවෙන් රුපියල් බිලියන 404ක් වෙන් කරලා තිබෙනවා. විපක්ෂයේ ඉන්න සමහර මන්ත්‍රීවරු කියනවා, ජාතික ආරක්ෂාවට වෙන් කරලා තිබෙන මුදල අඩුයි කියලා. ජාතික ආරක්ෂාව අඩු වෙන්නේ නැහැ, ඒ වෙන් කරපු මුදල අඩුයි කියලා කිව්වාට. PSD එකට, MSD එකට එක එක අයගේ මාළිගා ආරක්ෂා කරන්න, තනි පුද්ගලයන් ආරක්ෂා කරන්න, පොල් වතු රකින්න, පොල් කඩන්න, බල්ලෝ නාවන්න, බල්ලෝ බලා ගන්න වාගේ ඒවාට තමයි වෙනදා අය වැයෙන් විශාල මුදලක් වෙන් කරලා තිබුණේ. ඒ ටික අඩු කළාම තමයි වෙන් කරපු මුදල අඩු වෙලා වාගේ පෙනෙන්නේ. විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට මා කියන්න කැමතියි, ඒ රුපියල් බිලියන 404 මොනවාට ද වෙන් කරලා තිබෙන්නේ කියලා "අය වැය ඇස්තමේන්තුව 2025" කියන පොතේ සඳහන් කරලා තිබෙන බව. ලබන අවුරුද්ද තුළ Y-12 සැහැල්ලු ප්‍රවාහන ගුවන් යානා දෙකක් මිල දී ගැනීම, ඇමෙරිකාවේ නිෂ්පාදිත නෞකාවක් ගැනීම වාගේ ඉතාම සාධනීය කරුණුවලට ජාතික ආරක්ෂාව වෙනුවෙන් මේ අය වැයෙන් මුදල් වෙන් කරලා තිබෙනවා. කරුණාකර "අය වැය ඇස්තමේන්තුව 2025" කියවන්න. මෙම අය වැයෙන් ජාතික ආරක්ෂාවට කිසිම අඩුවක් වෙන්නේ නැහැ. පසුගිය රජයන් කරපු නාස්තිය, දූෂණය, අවභාවිතය නොකරන අපේ රජය ඒවා සිදු නොකර ඉතිරි කර ගත්තු මුදල් තමයි මෙහිදී අඩු වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, 2016 වසරේ මේ රටේ දරිද්‍රතාව සියයට 4ට තිබුණේ. නමුත් අර්බුදය තුළින් ඇති කළ දරිද්‍රතාව, එහෙම නැත්නම් crisis-driven poverty, 2023 වෙද්දී සියයට 25.9ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ස්වෛරීත්ව ණය පැහැර හැරීමට ලක් වූ රටවල් දරිද්‍රතාව සම්බන්ධව දිගු කාලයක් තිස්සේ ඉතාම දරුණු අත්දැකීම්වලට මුහුණ පානවා. නමුත් ජාතික ජන බලවේගය රජය තුළ නිසි මුදල් කළමනාකරණය, වගකීමෙන් යුතු ණය කළමනාකරණය, ශක්තිමත් සමාජ ආරක්ෂණ ජාල පද්ධති ඇති කිරීම, ව්‍යවසායකත්වය, නව ව්‍යාපාර ඇරඹීම සඳහා පහසුකම් සැලසීම, අප කරගෙන යන දූෂණ විරෝධී ක්‍රියාමාර්ග, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය මඟින් ලංකා ආර්ථිකයෙහි පරිවර්තනීය වෙනසක් ඇති කරන්න අපි බලාපොරොත්තු වෙනවා. රටක් දරිද්‍රතාවෙන් මිදීමට නම් ඒ රටට යම්කිසි ආර්ථික වර්ධන වේගයක් අවශ්‍ය වෙනවා. නමුත්, ඍණ මට්ටමක පැවැති ලංකාවේ ආර්ථික වර්ධන වේගය ධන ආර්ථික වර්ධන වේගයක් බවට පත් කරලා සියයට 5ක වර්ධන වේගයක් ලබා ගන්නට අපි මේ වර්ෂය තුළ බලාපොරොත්තු වෙනවා.

ඒත් එක්කම, මම මීට කලින් කියපු crisis-driven poverty හේතුවෙන්, එහෙම නැත්නම් මේ අර්බුදය තුළින් ඇති කරපු තත්ත්වය හේතුවෙන් දරිද්‍රතාවට පත් වුණු ජනතාවට ජීවත් වෙන්න අවස්ථාවක් අපි ලබා දෙන්නට ඕනෑ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. ඒ සඳහා 2025දී රුපියල් බිලියන 232.5ක මුදලක් සමාජ ආරක්ෂණය වෙනුවෙන් වෙන් කර තිබෙනවා. එහිදී දුප්පත් කියන සමාජ කාණ්ඩය වෙනුවෙන් අස්වැසුම ප්‍රතිලාභ වශයෙන් ලබා දුන් රුපියල් 8,500ක මුදල රුපියල් 10,000 දක්වා වැඩි කර තිබෙනවා. ඒ වාගේම අන්ත දුප්පත් කියන කාණ්ඩය වෙනුවෙන් වෙන් කර තිබුණු රුපියල් 15,000 දීමනාව රුපියල් 17,500 දක්වා වැඩි කර තිබෙනවා, 2025 ජනවාරි ඉඳලා. නමුත් මේ අස්වැසුම වැනි සමාජ ආරක්ෂණ දීමනා දිගින් දිගටම ලබා දෙනවාට වඩා, අපි තිරසාර වෙනසක් සඳහා සමාජ සවිබලගැන්වීමක් කරන්න අවශ්‍යයි. මොකද, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, සිදු කර තිබුණු ආර්ථික කඩා වැටීම තුළ සමහර වෙලාවට ජනතාව දුප්පත් වෙලා අස්වැසුම ගන්නා තත්ත්වයට පත් වෙලා ඉන්න පුළුවන්. කුකුළු ගොවිපොළක් කරපු කෙනෙක් මේ ආර්ථික කඩා වැටීම තුළ දුප්පත් වෙලා තිබෙන්න පුළුවන්. ඒ වාගේ කෙනෙකුට නැවත ඒ ව්‍යාපාරය ආරම්භ කරන්න අවශ්‍ය මූලික ප්‍රාග්ධනය ලබා දෙන්න අපට පුළුවන් නම්, ඔහු ඒ දුප්පත්කමින් මුදා ගන්න අපට පුළුවන්. අන්න ඒ සඳහා, ඒ කියන්නේ සමාජය සවිබලගැන්වීමේ වැඩසටහන සඳහා අපි රුපියල් මිලියන 500ක් වෙන් කර තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. 2025.03.31 දින වනවිට අස්වැසුම ගෙවීම් අවසන් කරන්නට තිබුණු අන්ත දුප්පත් තලයට නොවැටුණු නමුත් සංක්‍රාන්ති මට්ටමේ හිටපු දුප්පත් කණ්ඩායමට අදාළ ගෙවීම් කාල සීමාව 2025.04.30 දක්වා දීර්ඝ කරන්න යෝජනා කර තිබෙනවා. එමෙන්ම, අස්වැසුම වැඩ පිළිවෙළ සඳහා ඇතුළත්වීමට සුදුසුකම් ලබා තිබෙන අය සඳහා තවත් අවස්ථාවක් ලබා දීලා තිබෙනවා, එම සමාජ ආරක්ෂණ පද්ධතියට ඇතුළත් වෙන්න. අපි බලාපොරොත්තු වෙනවා, 2025 මැයි මාසයේදී ඒ අලුත් පිරිස එම වැඩසටහනට එකතු කරගන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, රටක ආර්ථික වර්ධනය සඳහා, රටක දියුණුව සඳහා, දරිද්‍රතාව අඩු කිරීම සඳහා අපට යහපත් මානසිකත්වයකින්, යහපත් සෞඛ්‍යයකින්, යහපත් කායික ශක්තියකින් හෙබි ශ්‍රම බලකායක් අවශ්‍යයි. දීර්ඝ කාලීනව එවැනි ශ්‍රම බලකායක් ඇති කිරීම සඳහා නිදහස් සෞඛ්‍ය සේවාව, නිදහස් අධ්‍යාපනය සඳහා මුදල් වෙන් කිරීම අවශ්‍ය වෙනවා. ඒ අනුව අපි සෞඛ්‍ය සේවාව සඳහා රුපියල් බිලියන 604ක්, 2025 අය වැය තුළින් වෙන් කර තිබෙනවා. එසේ කර තිබෙන්නේ මානසිකව, කායිකව ශක්තිමත්, දියුණු ශ්‍රම බලකායක් ඉදිරියේදී ශ්‍රී ලංකාව තුළ ඇති කරන්නයි. ඒ වාගේම අධ්‍යාපනය වෙනුවෙන් රුපියල් බිලියන 619ක් වෙන් කර තිබෙනවා, දැනුමෙන්, කුසලතාවෙන්, ආකල්පවලින් පිරිපුන් ශ්‍රම බලකායක් ඇති කරන්න. අධ්‍යාපනයට, සෞඛ්‍යයට වෙන් කරන මේ මුදල්වලින් අපට හෙට ප්‍රතිඵල නොලැබුණාට, ඒ තුළින් තව අවුරුදු 5ක්, 10ක් යද්දී අපේ ශ්‍රම බලකාය ඉතාම ශක්තිමත් ශ්‍රම බලකායක් බවට පත් කර ගැනීමට හැකියාව ලැබෙනවා.

ඒ වාගේම රටක දරිද්‍රතාව අඩු කරන්නට, රටට සෘජු විදෙස් ආයෝජන අවශ්‍ය වෙනවා. ආසියාතික රටක් විධියට පසුගිය කාලයේ ශ්‍රී ලංකාවට සෘජු විදෙස් ආයෝජන ලැබුණේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. වංචාව, දූෂණය පැවතීම, ආයෝජකයින් අපේ රටට එද්දී ඒ අයගෙන් කොමිස් ඉල්ලීම, එක එක පුද්ගලයන් ඒවායේ ලාභාංශ ඉල්ලීම වැනි දේවල් නිසා තමයි අපට සෘජු විදෙස් ආයෝජන නොලැබුණේ. නමුත් ආයෝජන සඳහා පෞද්ගලිකව කිසිම මැදිහත්වීමක් කරන්නේ නැතිව, රටේ අවශ්‍යතාව සඳහා, නිෂ්පාදන ආර්ථිකයක් සඳහා වැඩකටයුතු කරන බැවින් ජාතික ජන බලවේග රජයේ අපට සෘජු විදෙස් ආයෝජන ලංකාවට ලබා ගන්නට පුළුවන්.

මේ වෙද්දී ජාත්‍යන්තරය පවා පිළිගෙන තිබෙනවා, දූෂණය, වංචාව, නාස්තිය, අවභාවිතයෙන් තොර රජයක් තමයි මේ පත් වෙලා තිබෙන්නේ කියලා.

අවසන් වශයෙන්, අපි පොරොන්දු වෙච්ච ආකාරයට යහපත් රටක්, ලස්සන රටක්, පොහොසත් රටක් හදනවා. ඒ පොහොසත් රට තුළ ඉපදිලා, ඒ රටේ ප්‍රධාන පුරවැසියා බවට ඉඳලා ඒ රට අතහැර වෙනත් රටකට යන්නේ නැතුව ඒ රටේම ජීවත් වෙන්න අවස්ථාව සලසා දීලා ලස්සන ජීවිතයක් ගත කිරීමේ අවස්ථාව අපේ ශ්‍රී ලාංකික පුරවැසියාට නිර්මාණය කර දෙනවා. ඒ සඳහා 2025 වසර සඳහා ඉදිරිපත් කරන ලද මේ අය වැය ඉතාම සාධනීය අය වැයක් බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඔබතුමියට බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.04]

**ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சந்தருவன் மதரசிங்ஹ)
(The Hon. (Dr.) Sandaruwan Madarasinghe)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මෙච්චර කාලයක් මේ රට පාලනය කරපු පාලකයෝ රාජ්‍ය මුදල් පරිහරණය කළේ කොහොමද කියලා අපි දන්නවා. ඒගොල්ලන් රාජ්‍ය මුදල් පරිහරණය කළේ ඔවුන්ගේ පවුල්වල බූදලයක් විධියට. ඒ පාලකයන් වටා ඉන්න කණ්ඩායම්වලට සුඛ විහරණ ලබා දෙන්න අවශ්‍ය බූදලයක් විධියටයි මෙච්චර කාලයක් මේ රටේ මුදල් මේ පාලකයන් පාවිච්චි කළේ. එහි අන්තිම ප්‍රතිඵලය තමයි උපදින දරුවා පවා ලක්ෂ ගණනක ණයකරුවෙක් කරවන රාජ්‍යයක් බිහි කරපු එක. මේ මිනිස්සු කවුරුවත් ලයිට් බිල නොගෙවා ඉඳලා නැහැ. වතුර බිල නොගෙවා ඉඳලා නැහැ. හොරෙන් බස් එකේ ගිහිල්ලා නැහැ. හොරෙන් තෙල් ගහලා නැහැ. හැබැයි, ඒ අය ණයකරුවන් වෙලා තිබෙනවා. අපේ රට සම්පත් බහුල රටක්. අපේ රටේ විශාල ස්වාභාවික ආපදා නැහැ. එහෙත්, අපේ රටේ තනි තනි මිනිස්සුත් ණයකරුවන් වෙලා තිබෙනවා. අපේ රටේ සාමාන්‍ය මිනිස්සු ණයකරුවන් වුණාට, අපේ රට දුප්පත් වුණාට, මේ රටේ හිටපු දේශපාලනඥයන් පොහොසත්. දේශපාලනඥයන් තරු පහේ හතේ හෝටල්වලින් කද්දී ඡන්දදායකයන් මන්දපෝෂණයෙන් පෙළෙනවා. විශේෂයෙන්ම මාතෘ මන්දපෝෂණය, ළමා මන්ද පෝෂණය වේගයෙන් ඉහළ ගිය රටක්, මේක. දේශපාලනඥයන් ලංකාවේ තිබෙන හොඳම රෝහල්වලින් ඖෂධ ගනිද්දී, ලෝකයේ තිබෙන හොඳම රෝහල්වලට ඒ සඳහා යද්දී ඡන්දදායකයන් OPD එකේ පෝලිමේ ඉන්නවා. ඔවුන්ට ඖෂධ ගැන විශ්වාසයක් නැති වෙලා තිබෙනවා. දේශපාලනඥයන්ගේ පුත්තු ලංකාවේ තිබෙන හොඳම පාසල්වලට යද්දී, ලෝකයේ තිබෙන හොඳම විශ්වවිද්‍යාලවලට යද්දී අපේ රටේ නගරයේ පාසල් හා ගමේ පාසල් අතර විශාල විෂමතාවක් නිර්මාණය වෙලා තිබෙනවා. අවුරුදු හතරක, පහක කාලයක් තුළ දේශපාලනඥයන් තට්ටු පහේ හයේ ගෙවල් හදද්දී, ඡන්දදායකයන් ගෙයක් හදන්න පටන් ගත්තොත් මැරෙනකල්ම ඒ ගේ හදනවා. නමුත්, ඒ ගේ හදාගෙන ඉවර කරගන්න වෙන්නේ නැහැ. එහෙම නැත්නම් පරම්පරාවක්, දෙකක් ඒ ගේ හදනවා. දේශපාලනඥයන් ලෝකයේ තිබෙන සැපම වාහනවල යද්දී ඡන්දදායකයන්ට පදින්න වාහන ගෙන්වන්නෙත් නැහැ. අපේ දිස්ත්‍රික්කයේ ඉන්න මිනිස්සු නම් දන්නවා, යන වාහනවල ස්වරූපයෙන්, යන වාහනවල ප්‍රමාණයෙන් ඒ යන්නේ තාත්තාද, පුතාද, බාප්පාද, ලේලිද, නෝනලාද කියලා. දේශපාලනඥයන් හැසිරුණේ එහෙමයි. ඒගොල්ලන් වටේ හිටපු කණ්ඩායම් විශාල ව්‍යාපාරවල හිමිකරුවන් බවට පත් වුණා. හැබැයි, ඡන්දදායකයන් පාර ඉස්සරහ ආප්ප කඩයක් පටන් ගත්තොත්, ව්‍යාපාරයක් කළොත් ඒක කඩාගෙන වැටෙනවා. එහෙම තත්ත්වයක් තමයි උදා වෙලා තිබුණේ. සාමාන්‍ය මිනිස්සු වැටුප ගන්නකොටත් ණය වෙලා. පසුගිය දවස්වල අධිකරණය ඉස්සරහ හෙළි වුණා හිටපු ජනාධිපති පුත්තු අවුරුදු පහ, දහය තිස්සේ තමන්ගේ වැටුප අරගෙන නැහැ කියලා. හැබැයි, ඒගොල්ලන් ගෙවපු සැපවත් ජීවිත ගැන අපි හැමෝම දන්නවා. දේශපාලනඥයන්ගේ භාර්යාවන් රත්තරන්වලින් සිරුරු වහ ගනිද්දී අහිංසක ගොවීන්ගේ කන කර බඩු තිබුණේ බැංකුවල. ඒ නිසා මේ රට පාලනය කරපු දේශපාලනඥයන් හා ඒගොල්ලන්ට ඡන්ද දීපු ඡන්දදායකයන් අතර විශාල පරතරයක් නිර්මාණය වුණා. එහෙම වුණේ මෙච්චර කාලයක් මේ දේශපාලනඥයෝ රටේ බදු මුදල් ටික, රටේ ධනය තමන්ගේ සහ තමන් වටා ඉන්න කල්ලියකගේ සුඛ විහරණයට භාවිත කරපු නිසා. නමුත් මම හිතන විධියට ලංකා ඉතිහාසයේ පළමු වතාවට තමයි ලංකාවේ හැම ස්තරයක්ම නියෝජනය කරන, ලංකාවේ හැම ස්තරයකම අවශ්‍යතා ඉටු කරන මෙවැනි අය වැයක් යෝජනා වෙලා තිබෙන්නේ.

විශේෂයෙන්ම සෞඛ්‍ය ක්ෂේත්‍රය ගත්තොත්, එතෙක් මෙතෙක් සෞඛ්‍ය ක්ෂේත්‍රයට වෙන් කරපු වැඩිම මුදල වන රුපියල් බිලියන 604ක මුදලක් සෞඛ්‍ය ක්ෂේත්‍රය වෙනුවෙන් මෙවර වෙන් කරලා තිබෙනවා. මීට කලින් හිටපු පාලකයෝ කොවිඩ් වසංගතය කාලයේ ගංගාවලට මුට්ටි දාලා, පැණි වර්ග promote කරලා, ලංකාවේ සෞඛ්‍ය සේවාව හැල්ලු කළා. සෞඛ්‍ය වෘත්තිකයන්ගේ තත්ත්වයත්, ඒ වාගේම ලංකාවේ සෞඛ්‍ය සේවාවත් හැල්ලු වෙන්නේ ඒ වාගේ අමනෝඥ ක්‍රියාකාරකම් නිසා කියලා මම හිතනවා. ගුණාත්මක ඖෂධ හා වෛද්‍ය සැපයුම් වෙනුවෙන් රුපියල් බිලියන 185ක මුදලක් මේ අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. කලින් ආණ්ඩු ඖෂධ ගෙන්වූයේ කොහොමද කියලා අපි දැක්කා. සමහර මාධ්‍යවල සඳහන් වුණා, හෝටල්වල බිල් එක රැයට රුපියල් ලක්ෂ හතරයි, පහයි කියලා. කොම්පැනි එක්ක ඩීල් දාලා, බාල ඖෂධ ගෙනැල්ලා, රෝගීන්ගේ ඇස් අන්ධ කළා. පිළිකා රෝගීන්ට බාල ඖෂධ ගෙනාවා. පිළිකා රෝගියෙක් කියලා කියන්නේ, හෙට දවස ගැන මහා බලාපොරොත්තු තිබෙන මිනිහෙක් නොවෙයි. එහෙම රෝගීන්ටත් බාල ඖෂධ ගෙනැවිත් දුන්නා නම්, ඒ වාගේ ඇමතිවරු මිනිස්සු වෙන්න පුළුවන්ද? එහෙම සෞඛ්‍ය ඇමතිවරු තමයි හිටියේ. අය වැයෙන් ඖෂධ සඳහා වෙන් කළ මුදල් ඒ විධියට තමයි නාස්ති කළේ. ඒ නිසා මේ ආණ්ඩුව ගුණාත්මක ඖෂධ හා වෛද්‍ය සැපයුම් වෙනුවෙන් මේ අය වැයෙන් රුපියල් බිලියන 185ක මුදලක් වෙන් කරනවා.

ඒ වාගේම, මේ රටේ සෞඛ්‍ය සේවකයන් අපහසුතා රාශියක් මැද්දේ තමයි තමන්ගේ සේවාව ලබා දෙන්නේ කියලා අපි දන්නවා. විශේෂයෙන්ම සෞඛ්‍ය සේවයේ උග්‍ර සේවක හිඟයක්

[ගරු සඳරුවන් මදුරසිංහ මහතා]

තිබෙනවා. එම කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය වෙනුවෙන් මෙවර අය වැයෙන් රුපියල් බිලියන 22.4ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම පුහුණුව නිම කරපු විවිධ අංශවල - හෙද හෙදියන් වෙන්න පුළුවන්, MLTsලා වෙන්න පුළුවන්, අතුරු වෛද්‍යා වෙන්න පුළුවන් - 10,000ක පමණ ප්‍රමාණයක් සේවයට බඳවා ගන්න අපි ඉස්සරහට කටයුතු කරමින් ඉන්නවා. එහෙම තිබියදී තමයි මේ වැටුප් වැඩි කිරීමකුත් සෞඛ්‍ය සේවකයින්ට ලබා දෙන්නේ. 2025 අය වැය ඉදිරිපත් කරමින් ගරු ජනාධිපතිතුමා කළ කථාවේදී සෞඛ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කිරීම ගැන සඳහන් කරන්න විශේෂිත වූ කාලයක් වෙන් කර ගත් බව අපි දැක්කා. හැබැයි, මීට කලින් ඉදිරිපත් කරපු අය වැය යෝජනා පිළිබඳව ගත්තොත්, 2020 අය වැය කථාවේදී සෞඛ්‍ය සේවයේ වැටුප් වැඩි කිරීමක් හෝ ඒ අය වෙනුවෙන් කථා කරන්න විනාඩියක්වත් වෙන් වෙලා තිබිලා නැහැ. 2021දීත් විනාඩියක්වත් වෙන් වෙලා තිබිලා නැහැ. 2022දීත් විනාඩියක්වත් වෙන් වෙලා තිබිලා නැහැ. 2023දීත් සෞඛ්‍ය සේවකයන්ගේ පඩි වැඩි කිරීම වෙනුවෙන් කථා කරන්න විනාඩියක්වත් වෙන් වෙලා තිබිලා නැහැ. 2024 වර්ෂයේ දීත් නැහැ.

මේ අය වැය යෝජනා සම්බන්ධයෙන් අපි තේරුම් ගන්න ඕනෑ කාරණයක් තිබෙනවා. අපේ රට මුළු ලෝකයටම ණය වෙලා, ඒ ණය ගෙවා ගන්න බැරිව ලතැවෙන රටක්. ලෝකයේ තිබෙන පොහොසත් රාජ්‍යයක් නොවෙයි. අනෙක් පැත්තෙන් අපේ රටේ සෞඛ්‍ය සේවකයන් නිදහස් සෞඛ්‍ය සේවාවක් පවත්වා ගෙන යන්න අසීමාන්තික කැප කිරීමක් කරන බව අපි දන්නවා. ඔවුන්ගේ කැප කිරීම අපි අගය කරනවා. ඒ නිසා මේ වැටුප් වැඩි කිරීමේදී ඔවුන්ගේ මූලික වැටුප, ඒ වාගේම extra duty එක, ඒ වාගේම නිවාඩු දවස්වලට දෙන දීමනා කියන තුනම සංඛ්‍යාත්මකව වැඩි වෙලා තිබෙනවා. ඒ වැඩිවීම වෙනුවෙන් මාස 20ක කාලයකට රජය රුපියල් බිලියන 325ක මුදලක් වෙන් කරනවා. අපිට එක අවුරුද්දකට ඒක වෙන් කර ගන්න අමාරුයි. මොකද, මේ රටේ දුප්පත්භාවය නිසා. ඒ නිසා මේ වසරට රුපියල් බිලියන 110ක් වෙන් කරනවා.

ඒ වාගේම සෞඛ්‍ය සේවකයන් අතර යම් විවාදයක් ඇති වෙලා තිබෙනවා, මේ extra duty එක පිළිබඳව. ඒක ගලේ කෙටූ අකුරක් වාගේ එකක් නොවෙයි. අපිත් කැමැතියි, 1/80ක දීමනාවක් 1/60ක් කරනවා නම්. අපිත් කැමැතියි, 1/160ක දීමනාවක් 1/140 කරනවා නම්. අපිත් කැමැතියි, තව තව දීමනා සෞඛ්‍ය සේවකයන්ට ලබා දෙන්න, ඔවුන්ගේ කැපවීම අනුව. නමුත්, අපි ඔබෙන් ඉල්ලීමක් කරනවා. ඔබ තේරුම් ගන්න, මේ රට බංකොලොත් රටක් කියන එක. බංකොලොත් කරපු රටක්. ලෝකයේ දියුණු රටක් නොවෙයි. අපේ පළමුවැනි අය වැය තමයි මේ. අපේ ගරු නාමල් කරුණාරත්න ඇමතිතුමා සඳහන් කළා වාගේ, අපේ ආණ්ඩුවේ පළමුවැනි අය වැය. අපි ඉදිරි අය වැයවලදී සාකච්ඡාවක් කරමු, මේ 1/80 දීමනාව 1/60 කර ගන්නේ කොහොමද කියලා, මේ 1/140 දීමනාව 1/120 කර ගන්නේ කොහොමද කියලා. ඒ වෙනුවෙන් අපි ආණ්ඩුවක් විධියට ඔබත් එක්ක වැඩ කරන්න සූදානම්. ඒ නිසා සෞඛ්‍ය සේවා ඇතුළු අනෙක් සියලු වෘත්තිකයන් මේ ආණ්ඩුව පත් කරන්න මැදිහත් වුණා සේම ඉදිරියටත් මේ ආණ්ඩුව එක්ක එකතු වෙලා ඉඳියි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන්ම අධ්‍යාපන ක්ෂේත්‍රය ගත්තොත්, එතෙක් මෙතෙක් වෙන් කරලා තිබෙන වැඩිම මුදල - රුපියල් බිලියන 619ක් - අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කරලා තිබෙනවා. ලංකාවේ පාසල් 10,126ක් තිබෙනවා. මේ ප්‍රමාණයෙන් ළමයි 100කට අඩු පාසල් 3,000ක් තිබෙනවා. ග්‍රාමීය ප්‍රදේශවලට ගියාට පස්සේ, නගරයේ පාසලයි, ගමේ පාසලයි අතර විශාල විෂමතාවක් තිබෙනවා කියන එක අපි දන්නවා. ගමේ පාසල්වල ඉන්න ළමයින්ට ඒගොල්ලන්ගේ අනාගතය ගැන තිබෙන හීනය පටුයි. ඒගොල්ලන්ට තාක්ෂණික විෂයයන් එක්ක ඉස්සරහට යන්න ගුරුවරු නැහැ, පහසුකම් නැහැ. වෙස් ක්‍රීඩාව, ෆුට්බෝල් ක්‍රීඩාව දැකලාවත් නැහැ. දැක්කොත්, TV එකෙන් තමයි. මේ පාසල් අතර තිබෙන විෂමතාව අවම කර ගන්න ඕනෑ. බොහෝ ග්‍රාමීය පාසල්වල දරුවන්ගේ හීනය වෙලා තිබෙන්නේ එක්කෝ වෛද්‍යවරයෙක්, එක්කෝ ඉංජිනේරුවෙක්, එක්කෝ නීතිඥයෙක් වෙන එක. ඉන් එහාට හීනයක් මේ ළමයින්ට නැහැ. මේ අය වැයෙන් පාසල් පද්ධතිය සමාලෝචනය කර යළි ස්ථානගත කිරීමට අවශ්‍ය ජාතික වැඩ පිළිවෙළක් හදන්න රුපියල් මිලියන 500ක මුදලක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම 2019 ඉඳලා මේ පාසල්වල යටිතල පහසුකම් සංවර්ධනය කරලා නැහැ. ඒ වෙනුවට බොහෝ පාසල්වල දෙමව්පියන් මත අධ්‍යාපනය බරක් පටවමින් මුදල් එකතු කරමින් ඉන්නවා. ඒ මුදල් එකතු කිරීම සිදු කරන්නේ 1 වසරට දරුවා ඇතුළත් කරනකොට වෙන්න පුළුවන්. නැත්නම්, 6 වසරට දරුවා ඇතුළත් කරනකොට වෙන්න පුළුවන්. එහෙම නැත්නම් සංවර්ධන කටයුත්තකට වෙන්න පුළුවන්. දරුවන්ට උගන්වන එක දෙමව්පියන්ට මහා බරක් වෙලා තිබෙනවා. ඒක වළක්වන්න අපි පාසල්වල යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රුපියල් මිලියන 10,000ක මුදලක් මේ අය වැයෙන් වෙන් කරලා තිබෙනවා.

ඒ වාගේම විශ්වවිද්‍යාල අධ්‍යාපනය ගත්තත් එහෙම තමයි. විශ්වවිද්‍යාල තුළ ගුණාත්මක වර්ධනය කිරීම සඳහා රුපියල් බිලියන 135ක මුදලක් මේ අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම මහපොළ ශිෂ්‍යාධාරය රුපියල් 5,000 සිට රුපියල් 7,500 දක්වා වැඩි කරලා තිබෙනවා. අපි දන්නවා ශිෂ්‍ය ව්‍යාපාරය ගැන. අපි ශිෂ්‍යයන් විධියට සිටියදීත් විශාල වශයෙන් අරගළ කරලා තමයි මේ දීමනා රැක ගත්තේ. ඒ නිසා මේ රජය ශිෂ්‍යයන්ගේ පැත්තෙන් හිතන රජයක් විධියට මහපොළ ශිෂ්‍යාධාර දීමනාවත් වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම රාජ්‍ය අංශයේ අත්‍යවශ්‍ය පුරප්පාඩු සඳහා උපාධිධාරීන් 30,000ක් සඳහා රැකියා ලබා දෙන්න රුපියල් මිලියන 10,000ක් වෙන් කරලා තිබෙනවා. මීට කලින් උපාධිධාරීන්ට රැකියා ලබා දුන්නේ කොහොමද කියලා අපි දැක්කා. විශ්වවිද්‍යාලයට ගිහිල්ලා අමාරුවෙන් උපාධිය ගත්තාට රැකියාව මොකක්ද කියලා තීරණය කළේ ප්‍රදේශයේ සිටින දේශපාලනඥයන්. මම හිතන විධියට මෙන්න මේ පාර තමයි දේශපාලනඥයන්ගේ මැදිහත්වීමෙන් තොරව උපාධියට සරිලන රැකියාවක් ගන්න පුළුවන් විධියට අය වැයෙන් සල්ලි වෙන් වෙන්නේ.

අපි දන්නවා, අපේ ප්‍රදේශවල වුණත් මත්ද්‍රව්‍යයත් එක්ක බැඳුණු පාතාලය, මිනී මැරුම් එක්ක බද්ධ වෙලා තිබෙන බව. පසුගිය දවසක අපි නියෝජනය කරන මීද්දෙනියේ දී අරුණ විදානගමගේ කියලා කියන පුද්ගලයා හා ඔහුගේ දරුවන් දෙදෙනා අවාසනාවන්ත ලෙස මරා දැම්මා. මම උපුටා ගැනීමක් කරන්න කැමැතියි. ඒ අරුණ විදානගමගේ කියන පුද්ගලයා "ටෝක් විත් චමුදිත" කියන වැඩසටහනේ දී චමුදිත සමරවික්‍රම කියන මාධ්‍යවේදියාත් එක්ක මෙහෙම කියා තිබෙනවා; "රාජපක්ෂලාට විරුද්ධ පිලේ මම විතරයි මේ මරණ වරෙන්තුව අතේ තියා ගෙන ඉන්නේ. ඒ මිනිස්සු නිහඬව හිටියාට මට කරන්න දෙයක් නැහැ. ඒ අය ඇවිල්ලා කථා කරනවා, අනෙක් මිනිස්සු නිහඬව ඉන්නේ. තවත් මරණ වරෙන්තු තිබෙන කට්ටිය ඉන්නවා. මේ දැන් යනකොට මරා දැම්මොත් මගේ මරණයේ සම්පූර්ණ වගකීම මහින්ද රාජපක්ෂ, චමල් රාජපක්ෂ, ගෝඨාභය රාජපක්ෂ, නාමල් රාජපක්ෂ, ශෂීන්ද්‍ර රාජපක්ෂ, කපිල දිසානායක ගන්න ඕනෑ." ඔහු මාධ්‍යවේදියාත් එක්ක කිව්වේ එහෙමයි. ඔහු මෙහෙමත් කියා තිබෙනවා; "චමුදිත, රාජපක්ෂලා වටේ ඉන්නේ ලයිසන් මිනීමරුවෝ" කියලා. ඊට පස්සේ චමුදිත අහනවා, "මිනී මරුවෝ ද?" කියලා. ඊට පස්සේ ඔහු කියනවා, "ඔව්, මිනීමරුවෝ තමයි

ඔක්කෝම ඉන්නේ. ඒ කට්ටිය වැඩේ කරගෙන උන් අතුරුදන් කරනවා" කියලා. ඉතින් මේවා බරපතළ ප්‍රකාශ. අද උදෙත් මන්ත්‍රීවරයෙක් ඇහුවා, "කවුද, දේශපාලනඥයා?" කියලා. මේ, මිය ගිය පුද්ගලයාම අවුරුද්දකට කලින් මාධ්‍ය හමුවේ ප්‍රසිද්ධියේ කරපු ප්‍රකාශයක්. එහෙම තමයි ඒගොල්ලන්ගේ කල්ක්‍රියාව දිස්ත්‍රික්කය ඇතුළේ සිද්ධ වුණේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, කථාව අවසන් කරන්න කලින් මම මේ කාරණයත් කියන්න කැමතියි. අපේ රට දුප්පත් රටක්, මේ රට පොහොසත් කිරීමේ වගකීම තමයි අපේ කරපිට පැටවිලා තිබෙන්නේ. ඒ වෙනුවෙන් ආණ්ඩුවක් විධියට, ආණ්ඩුවේ මැති ඇමතිවරු විධියට, අපි සියලු කැපකිරීම් කරනවා. අපව පත් කරන්න තිබුණු උද්‍යෝගයෙන්ම, මේ රට සංවර්ධනය කරන්න අපි පත් කරපු හැමෝම අපිත් එක්ක එකට එකතු වෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. ඒ බලාපොරොත්තුවත් එක්ක මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සුරංග රත්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.18]

**ගරු සුරංග රත්නායක මහතා**
(மாண்புமிகு சுரங்க ரத்நாயக்க)
(The Hon. Suranga Rathnayaka)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අවුරුදු 77ක් පුරාවටම මෙරට ක්‍රියාත්මක වුණු ආර්ථික ක්‍රම සම්බන්ධව බරපතළ බාධා ඇති කරමින්, බරපතළ විවේචන ඇති කරමින්, එම ආර්ථික ක්‍රම ඉදිරියට ගෙන යෑමට, ආර්ථික ප්‍රතිසංස්කරණ ඉදිරියට පවත්වාගෙන යෑමට විශාල ලෙස බාධා කරපු ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර කුමාර දිසානායක ගරු ජනාධිපතිතුමා විසින් නිදහස් ශ්‍රී ලංකාවේ 79වෙනි අය වැය මේ සභාවට ඉදිරිපත් කළා.

විශේෂයෙන්ම මම මතක් කරන්න ඕනෑ, අවුරුදු 78කට පසු එතුමා විසින් මේ අය වැය මේ ගරු සභාවට ඉදිරිපත් කරන වෙලාවේදී, මේ ආර්ථික ක්‍රම ඉස්සරහට අරගෙන ගිහිල්ලා, මේ රටේ ජනතාවට දෙන්න ඕනෑ පහසුකම් ටික දෙන්න, හොඳ ආර්ථික තත්ත්වයක් ඇති කරන්නට, ඒවාට බාධා කරන්නේ නැතුව මේ ආර්ථික ක්‍රමයෙන් ඉස්සරහට යන්න පුළුවන් රටක් බවට මේ රට පත් කිරීම මේ රට ලබා ගත් විශාල ජයග්‍රහණයක් බව. මොකද, පසුගිය කාලයේ තිබුණු ඒ බාධා කිරීම් දැන් අවසානයි. දැන් අපි ඔක්කෝටම එකතු වෙලා මේ රට ඉස්සරහට අරගෙන යන්න පුළුවන්. මොකද, ඒ ආර්ථික ක්‍රමවලට එදා බාධා කළත්, දැන් ඒ ආර්ථික තත්ත්වයන් තුළින්ම ඉස්සරහට යන්න පුළුවන් කියන කාරණයත් මම මතක් කරනවා. ඒ ආර්ථික ප්‍රතිසංස්කරණ දැන් මේ මාලිමා ආණ්ඩුවට ඉස්සරහට කරගෙන යන්න පුළුවන්. ඒක මේ රටේ ජනතාව ලැබූ ජයග්‍රහණයක් කියලා විශේෂයෙන්ම මම මතක් කරන්න ඕනෑ.

අය වැය කථාව කරමින් ජනාධිපතිවරයා එහි පූර්විකාවේ මෙසේ ප්‍රකාශ කරනවා, "... අර්බුදයට බලපෑ කරුණු ඓතිහාසික මෙන්ම ව්‍යුහාත්මකයි. දූෂිත පාලනයන්, අසාර්ථක ආර්ථික ප්‍රතිපත්තීන් සහ වගකීම් විරහිත රාජ්‍ය මූල්‍ය කළමනාකාරිත්වය මෙම අර්බුදයේ මූලයයි ..." කියලා. එතුමා කියපු ඒ අසාර්ථක ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්නට එතුමන්ලාත් පසුගිය දශක දෙකක තුනක කාලය ඇතුළත දායකත්වය දුන්නා කියන කාරණයත් අපි මතක් කරන්න ඕනෑ. 1994 වර්ෂයේ සිට මේ රටේ හිටපු විධායක ජනාධිපතිවරුන් වන චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය, මහින්ද රාජපක්ෂ මැතිතුමා ඇතුළු ජනාධිපතිවරුන් මේ රටේ බිහි කරන්නටත්, ඒ ආණ්ඩුවල ඇමතිකම් දරමින් මේ රටේ අසාර්ථක මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්නටත් මේ ජනතා විමුක්ති පෙරමුණ ඇතුළු කණ්ඩායම ක්‍රියා කළා කියන කාරණයත් මේ වෙලාවේ මම මතක් කරන්න ඕනෑ.

විශේෂයෙන් එතුමා විශාල චෝදනාවක් කළා, වගකීම් විරහිත රාජ්‍ය මූල්‍ය කළමනාකාරිත්වය පිළිබඳව. අපි මතක් කරන්න ඕනෑ, එතුමා පසුගිය කාලයේ වගකීම් විරහිත රාජ්‍ය මූල්‍ය කළමනාකාරිත්වය කියලා ප්‍රකාශ කරපු මේ රටේ හිටපු ඒ රාජ්‍ය නිලධාරින්ම තමයි මේ අය වැයත් සකස් කරන්නේ කියන කාරණය. අපි අහන්න කැමැතියි, එතුමා මේ අසාර්ථක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කළා කියලා චෝදනා කරන්නේ පසුගිය කාලයේ මේ රටේ ආර්ථික ප්‍රතිපත්ති, මූල්‍ය ප්‍රතිපත්ති හදපු මහ බැංකු අධිපතිවරයාටද, නැත්නම් මුදල් අමාත්‍යාංශ ලේකම්වරයාටද කියා. හැබැයි, අද ඒ නිලධාරින්ම තමයි මාලිමා ආණ්ඩුවේ මේ අය වැය යෝජනා සකස් කරලා තිබෙන්නේ. ඒ නිසා වගකීමකින් තොරව කරන එවැනි ප්‍රකාශ පිළිබඳව අපි කනගාටුවට පත් වෙනවා.

ඒ වාගේම දිගින් දිගටම චෝදනා කළා, මීට කලින් අදහස් ඉදිරිපත් කරපු ඇමතිවරයෙකුත් කිව්වා, එතුමන්ලා භාර ගත්තේ බංකොලොත් රාජ්‍යයක් කියලා. ඒ බංකොලොත්භාවයේ තිබුණු රට භාර අරගෙන මාස දෙකෙන් ගොඩ දැම්මා කියලාත් ඒ අය කිව්වා. හැබැයි මම කියනවා, ඒ වාගේ වගකීම් විරහිත ප්‍රකාශ, ඒ වාගේ බොරු, තමන්ට ලකුණු දමා ගැනීම් තැන තැන කරන්න එපා කියලා. මොකද, මේ ජනාධිපතිවරයා විසින් මේ රටේ මුදල් ඇමතිවරයා විධියට "අයවැය, ආර්ථික සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව" ඉදිරිපත් කළා. ඒ වාර්තාවේ එතුමා පැහැදිලිවම ප්‍රකාශ කරනවා, "2023 වසරේ දෙවන භාගයේ සිට ආර්ථිකය ප්‍රකෘතිමත්වීමත් සමඟ 2024 වසරේ දී ශ්‍රී ලංකා ආර්ථිකය සාධනීය වර්ධනයක් පෙන්නුම් කරන ලදී. 2023 වසරේ තුන්වන කාර්තුව තුළ වාර්තා වූ සියයට 1.6ක වර්ධනයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ආර්ථිකය සියයට 5.5කින් වර්ධනය විය. 2024 වසරේ පළමු කාර්තු තුන තුළ ආර්ථික වර්ධනය සියයට 5.2ක් වූ අතර එය ආර්ථිකයේ සියලුම ප්‍රධාන අංශවල සිදු වන කැපී පෙනෙන වර්ධනයේ ප්‍රතිඵලයකි" කියලා.

ජනාධිපතිවරයා මුදල් ඇමතිවරයා විධියටයි මේ වාර්තාව නිකුත් කරන්නේ. එහෙම නම් ඔබතුමන්ලාට කිසිම වෙලාවක කියන්න බැහැ, අපි බංකොලොත් රාජ්‍යයක් භාර ගත්තා, ඒ බංකොලොත් රාජ්‍යය අපි තමයි ගොඩ දැම්මේ කියලා. මේ, ජනාධිපතිවරයා ඉදිරිපත් කරපු මූල්‍ය ප්‍රකාශනයක්. ඒ නිසා අපි විශේෂයෙන් ඉල්ලනවා, ඔබතුමන්ලා හොඳ වැඩ කරනවා නම්, මේ රට ඉස්සරයට අරගෙන යන්න ධනාත්මක දේවල් කරනවා නම්, ඒකේ ප්‍රතිඵලය ඔබතුමන්ලා ගන්න, හැබැයි ඔබතුමන්ලා කරපු නැති දේවල්වල ප්‍රතිඵලය ගන්න එපා කියලා. මුළු රටම ඒ පිළිබඳව දන්නවා කියන කාරණයත් අපි විශේෂයෙන් මතක් කරන්න ඕනෑ.

අපි දැන් මේ අය වැය ලේඛනය දිහා බලමු. මේ අය වැය ලේඛනයට අනුව රජයේ සමස්ත ආදායම රුපියල් බිලියන 4,960යි. හැබැයි, රජයේ පුනරාවර්තන වියදම -රජයේ එදිනෙදා වියදම- රුපියල් බිලියන 5,886ක් වෙනවා. මේ ප්‍රාථමික ගිණුමේම රුපියල් බිලියන 926ක් තිබෙනවා. එතකොට අපි අහනවා, විධිමත් මූල්‍ය කළමනාකරණයක් කරන්නට බලාපොරොත්තු වන ඔබතුමන්ලාගේ මේ අය වැයේ කොතැනද මේ ප්‍රාථමික ගිණුමේ ශේෂය හරියට තිබෙන්නේ කියලා. ඊළඟ අවුරුදු දෙක තුනේ මේ

[ගරු සුරංග රත්නායක මහතා]

ආර්ථිකය කළමනාකරණය කරන්න පුළුවන් සැලසුම් මොනවාද තිබෙන්නේ? මේ Budget එකේ ඒ සැලසුම් මොකුත්ම නැහැ.. හැබැයි, Budget Speech එකේ වෙන වෙන කථා නම් ගොඩක් කිව්වා; ඉතිහාසය ගැන, රජවරු ගැන, රටේ ලෝකයේ නැති දේවල් කිව්වා. හැබැයි, මේ අය වැයේ තිබෙන දුර්වලතා පිළිබඳව බොහෝදෙනා කථා කරන්නේ නැහැ කියන කාරණයත් අපි කියන්න ඕනෑ.

ඒ වාගේම රටේ සමස්ත ආදායම ගැන සැලකිලිමත් වෙද්දී අපට පෙනෙන්න තිබෙනවා, රටේ සමස්ත ආදායමෙන් සෘජු ආදායම් බදුවලින් ආණ්ඩුව මෙවර රුපියල් බිලියන 1,167ක් බලාපොරොත්තු වන බව. රුපියල් බිලියන 1,167ක් කියන්නේ 2024දී සෘජු ආදායම් බදුවලින් බලාපොරොත්තු වුණු ගණනට වඩා රුපියල් බිලියන 141ක වැඩිවීමක්. ඒක ගිය වසරට වඩා සියයට 14ක වැඩිවීමක්. ඒ සෘජු ආදායම් බදු නිසා අපට ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. හැබැයි, අපට ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, ආණ්ඩුව භාණ්ඩ හා සේවා මත පනවන ලද බදුවලින් බලාපොරොත්තු වෙනවා, රුපියල් බිලියන 2,772ක්. පසුගිය අය වැයේදී රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ආණ්ඩුව සමස්ත භාණ්ඩ හා සේවා මත බදු පනවා ලබා ගත් ආදායම රුපියල් බිලියන 2,201යි. භාණ්ඩ හා සේවා මත බදු පනවලා; එහෙම නැත්නම් වක්‍ර බදු පනවලා ඔබතුමන්ලා බලාපොරොත්තු වෙනවා, අමතර රුපියල් බිලියන 501ක්. මේ අමතර රුපියල් බිලියන 501ක් වක්‍ර බදු ගහලා ගන්නවා නම්, ඒක ගිය වර රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ අය වැයට වඩා සියයට 26ක වැඩිවීමක්. එහෙමනම්, සියයට 26ක් - තවත් රුපියල් බිලියන 501ක්- ගන්න ඕනෑ නම් වක්‍ර බදු ගහන්න වෙන්නේ මේ රටේ අහිංසක පුරවැසියාට; දුප්පත් ජනතාවට. උදේට තේ කහට කෝප්පය බීලා, කුලී වැඩ කරලා, හරියට කෑමක් නැතුව, එහෙම නැත්නම් වඩේ ටිකක් විකුණාගෙන, කැඳ කෝප්පයක් විකුණාගෙන, එදිනෙදා තුන්වේල හරියට කන්න බැරිව අදටත් ඉතාම දුක්ඛිත තත්ත්වයෙන් ජීවත් වන සාමාන්‍ය ජනතාවගෙන් තමයි ඔබතුමන්ලා රුපියල් බිලියන 501ක් ගන්න හදන්නේ. ඒ බදු ආදායමේ වැඩිවීම තිබෙනවා, රුපියල් බිලියන 747ක්. ඒක රුපියල් කෝටි 74,700ක්. ඒ අනුව රුපියල් කෝටි 74,000ක් මේ අය වැයෙන් අලුතින් බදු විධියට එකතු කර ගන්නට ඔබතුමන්ලා යෝජනා කරනවා. හැබැයි, ඔබතුමන්ලා රාජ්‍ය සේවකයින්ගේ වැටුප් වැඩිවීම දෙන්න රුපියල් බිලියන 110ක් වෙන් කර තිබෙනවා. මේ විධියට රුපියල් කෝටි 11,000ක් ලබා දෙද්දී, රුපියල් කෝටි 74,000ක් ආණ්ඩුව ආපසු එකතු කර ගන්නවා, දුප්පත් මිනිස්සුන්ගෙන්. හැබැයි, රුපියල් 5,975ක් රජයේ සේවකයන්ට මේ සාක්කුවෙන් දීලා රුපියල් 8,000ක්, 9,000ක් අනික් අතින් ඔබතුමන්ලා උදුරාගන්නවා. ඒ නිසා රුපියල් 5,975ක් දීලා තව කොච්චර ප්‍රමාණයක් රාජ්‍ය සේවකයාගෙන් බදු විධියට ගන්නවාද කියලා තව මාස 6ක් යද්දී ඔවුන්ට දැනේවි. බුදුරජාණන් වහන්සේ දේශනා කර තිබෙන පරිදි, "මල නොතළා රොන් ගන්නා බඹරෙකු සේ" බදු අය කරගත යුතුයි. හැබැයි ඔබතුමන්ලා මල පොඩි පට්ටම් කරලා, තළා, ඒකේ සාරය උරා බීලා, මේ රටේ ජනතාව බිමට සමතලා කරලායි මේ බදු අය කර ගන්නේ කියන කාරණය විශේෂයෙන් අපි මතක් කරනවා. ඉදිරියේදී මේ රටේ ජනතාවට ඒ පිළිබඳව වැටහීම ඇති වෙයි කියලා අපි හිතනවා.

මේ අය වැයේ තිබෙන, ආණ්ඩුව කරන හොඳ දේවල් ගැනත් අපි කියන්න ඕනෑ. මොකද, පසුගිය වසරට සාපේක්ෂව රාජ්‍ය වියදම් ඒ ආකාරයෙන්ම මේ ආණ්ඩුව පවත්වාගෙන ගිහිල්ලා තිබෙනවා. ඒක ගැන අපි ආණ්ඩුවට credit එක දෙන්න ඕනෑ. ඒක ප්‍රශ්නයක් නැහැ. මේ තත්ත්වයන් තුළ ඒ credit එක දෙනවා වාගේම විශේෂයෙන්ම අපි කියනවා, ණය ගැනීම ගැනත්. ණය ගෙවන්නට නැවත ණය ගන්න නම් ආණ්ඩු මොකටද කියලා ඔබතුමන්ලා පසුගිය කාලයේ ඇහුවා. හැබැයි ඔබතුමන්ලා රුපියල් බිලියන 4,000ක ණය අලුතින් ගන්නට බලාපොරොත්තු වෙනවා කියලා මේ අය වැයේ සඳහන් කරලා තිබෙනවා. කොහෙන්ද මේ රුපියල් බිලියන 4,000ක් ගන්නේ? ඒක මේ රටේ ජනතාවට බරක්, මේ රටේ ඊළඟ ආණ්ඩුවලට බරක්. කොහොමද මේක දරාගන්නේ? ඒක නිසා ඔබතුමන්ලා කියපු කාරණා නැවත නැවත ඔබතුමන්ලාට පාරා වළල්ලක් වෙනවා කියන කාරණයත් විශේෂයෙන් අපි මතක් කරන්න ඕනෑ.

පසුගිය වර්ෂයේ අවසාන කාර්තුවේදී මේ රටේ කෘෂි කර්මාන්තය සියයට 1.6කින් පහත වැටිලා තිබෙනවා. ඒකට හේතුව තමයි, කෘෂි කර්මාන්තයේ ඉන්න ගොවීන්ට හරි වෙලාවට පොහොර සහනාධාරය ලබා නොදීම. ඒ වාගේම අද ගොවි ජනතාව ගොවිතැනින් ඈත් වෙනවා. මොකද, අද වීවලට සාධාරණ මිලක් ලැබිලා නැහැ. එම නිසා ඒ පිළිබඳව ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ අවධානය යොමු කරන්න කියන කාරණය විශේෂයෙන් අපි මතක් කරනවා. "රුපියල් බිලියන 5ක් දීලා මොනවා කරන්නද, වී මිලදී ගන්න රුපියල් බිලියන 325ක් ඕනෑ, අපි බලමු කරන විධිය" කියලා ඊයේ දවසේ ඩඩ්ලි සිරිසේන ඔබතුමන්ලාට අභියෝග කළා. හැබැයි, ඔබතුමන්ලා රුපියල් බිලියන 5ක් දීලා වී මෙට්‍රික් ටොන් 40,000ක් අරගෙන මේ රටේ සහල් මාෆියාව විසඳන්න පුළුවන් කියලා කියනවා. ඒවා ඇත්ත නොදන්න ජනතාවට කියන්න පුළුවන් කාරණා. හැබැයි අපි කියනවා, ජනතාව එන්න එන්න දේශපාලන සාක්ෂරතාව සහ රාජ්‍ය ප්‍රතිපත්තිය පිළිබඳ අවබෝධයකට එනවා කියලා. ජනතාවට බොරු කියලා ටිකදෙනෙක් බොහෝ කාලයක් රවට්ටන්න පුළුවන්, බොහෝදෙනෙක් ටික කාලයක් රවට්ටන්න පුළුවන්, හැබැයි බොහෝදෙනෙක් බොහෝ කාලයක් රවට්ටන්න බැහැ කියන එකත් මේ වෙලාවේ මම මතක් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මන්ත්‍රීවරුන්ට වරප්‍රසාද දෙන්නේ නැහැ, පර්මිට් දෙන්නේ නැහැ කියලා ජනාධිපතිවරයා කියපු කාරණය මත වෙන්න ඇති, අද ඇමතිවරු ප්‍රවාහනය සඳහා බුරුවන්ව පාවිච්චි කරන්නේ කියන කාරණයත් ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ක්‍රිෂ්ණන් කලෛයිචෙල්වි මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු ක්‍රිෂාන්ත අබේසේන මහතා (විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு கிரிஷாந்த அபேசேன - விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அமைச்சர்)
(The Hon. Chrishantha Abeysena - Minister of Science and Technology)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, "ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.*

[பி.ப. 3.32]

**ගරු ක්‍රිෂ්ණන් කලෛචෙල්වි මෙනෙවිය**
(மாண்புமிகு (செல்வி) கிருஷ்ணன் கலைச்செல்வி)
(The Hon. (Ms.) Krishnan Kalaichelvi)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்தப் பத்தாவது பாராளுமன்றத்தில் நடைபெறும் இந்த ஆண்டுக்கான வரவு செலவுத்திட்ட விவாதத்தில், விசேடமாக நான் வாழும் மாவட்டமான நுவரெலியா மாவட்ட மக்கள் சார்பாகப் பேசுவதற்கு வாய்ப்பளித்ததையிட்டு நான் பெருமகிழ்ச்சியடைகின்றேன். இவ்வரவு செலவுத்திட்டம் உண்மையிலேயே இந்த நாட்டில் வாழுகின்ற மக்கள், விசேடமாக மலையகம் வாழ் தமிழ் மக்கள் சந்தோஷப்பட வேண்டிய உள்ளடக்கங்களைக் கொண்டிருப்பது மிக முக்கியமான ஒரு விடயமாகும். இதற்கு முன்பிருந்த 9 பாராளுமன்றத்திலும் இருந்த உறுப்பினர்களும் சரி, ஆட்சியாளர்களும் சரி, மலையகம் வாழ் தமிழ் மக்களுக்கு எதனைப் பெற்றுக்கொடுத்திருக்கிறார்கள்? என்பது பற்றிய கேள்விக்குறி எம்மத்தியில் இருக்கின்றது. அதனடிப்படையில் பார்க்கும்போது, சுதந்திரத்தின் பின்னரான 76 வருட கால ஆட்சியின் கீழ், எந்தவொரு பாராளுமன்றத்திலும் 202 வருட கால வரலாற்றைக் கொண்ட எமது மக்கள் தொடர்பாக தேசிய ரீதியான தீர்மானங்களை எடுக்காதபோது, தேசிய மக்கள் சக்தி அரசாங்கத்தின் இந்தப் பத்தாவது பாராளுமன்றத்தில் எமது ஜனாதிபதியும் நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சருமான மாண்புமிகு அநுர குமார திஸாநாயக்க அவர்களால் முன்வைக்கப்பட்ட வரவு செலவுத்திட்டத்தில் 'மலையகம்', 'மலையகம் வாழ் தமிழ் மக்கள்' என்ற வகையில் முதன்முறையாக எமக்கு ஓர் அங்கீகாரத்தைப் பெற்றுக்கொடுத்திருப்பது மிகவும் சந்தோஷப்படவேண்டிய விடயம்.

அதுமாத்திரமல்ல, எதிர்க்கட்சியிலுள்ள அநேகமான உறுப்பினர்கள் - மலையக மக்களுக்குத் தலைமைத்துவம் கொடுக்கும் உறுப்பினர்கள் - தலைமைத்துவம் கொடுப்பதாகக் கூறிக்கொண்டிருக்கும் தலைவர்கள், "இந்த வரவு செலவுத்திட்டத்தில் எமக்கு என்ன கிடைத்துள்ளது? எமது மக்கள் சார்பான தேவைகளை நிறைவேற்றக்கூடிய வகையில் இதில் எதுவும் குறிப்பிடப்படவில்லை" என்று கூக்குரலிட்டார்கள். மலையக மக்களின் சகல பிரச்சினைகளுக்கும் தோட்டக் கம்பனிகளுடன் இணைந்துதான் தீர்வு காணப்பட வேண்டும். அவ்வாறின்றி இந்நிறுவனங்களின்மீது பழிசுமத்தி இவர்கள் மேற்கொண்ட நடவடிக்கைகள் மலையக மக்களின் பலவிதமான உரிமைகள் இல்லாதொழியக் காரணமாகும். அதனடிப்படையில் பார்க்கும்போது, இந்த நாட்டில் உழைக்கும் மக்கள் என்ற அடிப்படையில் தேசிய ரீதியாக மலையக மக்களுக்குப் பலவிதமான சலுகைகளைப் பெற்றுக்கொடுப்பதற்கு இந்தப் பத்தாவது பாராளுமன்றம் தீர்மானித்துள்ளமை மிகவும் சந்தோஷப்பட வேண்டிய விஷயமாகும்.

எமது எதிர்க்கட்சி உறுப்பினர்கள் அநேகமானோர் கூறினார்கள், "மலையக மக்களுக்கு விசேடமாக வீட்டுப் பிரச்சினை இருக்கின்றது, சம்பளப் பிரச்சினை இருக்கின்றது, சுகாதாரம், கல்வி போன்ற சகல துறைகள் தொடர்பாகவும் பிரச்சினைகள் இருக்கின்றன; இந்தப் பிரச்சினைகளுக்கு கட்டாயம் தேசிய மக்கள் சக்தி அரசாங்கம் பொறுப்புக்கூற வேண்டும்" என்று. உண்மை! ஆனால், இந்த 76 வருட காலத்தில் மலையக மக்கள் சம்பந்தமாக இந்தப் பாராளுமன்றத்தில் என்னவிதமான தீர்மானங்கள் எடுக்கப்பட்டிருக்கின்றன? தோட்டத் தொழிலாளர்களின் சம்பளப் பிரச்சினை தொடர்பாக இந்தப் பாராளுமன்றத்தில் தீர்க்கமான முடிவு எடுக்கப்பட்டுள்ளதா? அவர்களின் வாழ்க்கைத் தரத்தை உயர்த்துவதற்கு ஏதாவது தீர்மானம் எடுக்கப்பட்டுள்ளதா? அவர்களது சுகாதாரப் பிரச்சினைகள் சம்பந்தமாக ஏதாவது தீர்மானம் எடுக்கப்பட்டுள்ளதா? அவர்களது உட்கட்டமைப்புப் பிரச்சினைகளுக்கு ஏதாவது தீர்மானம் எடுக்கப்பட்டுள்ளதா? எதுவுமே இல்லை! இவை அனைத்தையும் தெரிந்துகொண்டே இன்று எதிர்க்கட்சியிலிருந்து கூக்குரலிடும் உறுப்பினர்கள் தேசிய மக்கள் சக்தி அரசாங்கத்திற்கு எச்சரிக்கையாக இவற்றைக் கூறுகின்றார்கள். இவை அனைத்தையும் கண்டறிந்த ஓர் அரசாங்கம்தான் தேசிய மக்கள் சக்தி அரசாங்கம்!

இன்று நாங்கள் நுவரெலியா மாவட்டத்திலுள்ள டயகம, மஸ்கெலியா, பொகவந்தலாவை போன்ற பிரதேசங்களையும் அதுபோல், பதுளை மாவட்டத்தில் மலையக மக்கள் வாழும் பிரதேசங்களையும் எடுத்துக்கொண்டால், குறிப்பாக அங்குள்ள உட்கட்டமைப்பு வசதிகள் மிகவும் மோசமான நிலையில் இருப்பதையே பார்க்கக்கூடியதாக இருக்கிறது. அவர்கள் போக்குவரத்தை மேற்கொள்வதற்கு ஒழுங்கான வீதிகள் கிடையாது. அங்குள்ள வீதிகளில் லாடம் பூட்டிய குதிரைகளால்கூட போகமுடியாது. எந்தவிதத்திலும் அவர்களது உரிமைகள் பெற்றுக் கொடுக்கப்படவில்லை. இந்த 76 வருட காலத்தில் அவர்களது வாழ்க்கையை மேம்படுத்துவதற்கு ஏதுவாக அவர்களது சம்பளப் பிரச்சினையாவது சரியாகத் தீர்த்துக் கொடுக்கப்படவில்லை. அதுமாத்திரமல்ல, அங்கு தகுதிவாய்ந்த வைத்தியர்களைக்கொண்ட ஒரு hospital - வைத்தியசாலை கிடையாது. தரம்வாய்ந்த ஒரு வைத்தியர்கூட இல்லாத தோட்டப்புறங்கள்தான் நிறையவே இருக்கின்றன.

தோட்டப்புறங்களிலுள்ள பெண்கள் முகங்காடுக்கும் பிரச்சினைகள் அதையும்விட மேலானது. அவர்கள் தம் வேலைத்தலங்களுக்குச் செல்லும்போது தங்களது அடிப்படைத் தேவைகளைப் பூர்த்திசெய்வதற்கான வசதிகளைக்கூடப் பெற்றுக்கொடுக்க இன்று எதிர்க்கட்சியிலிருந்து கூக்குரலிடும் உறுப்பினர்களால் முடியாமற்போயுள்ளது. இன்று நீங்கள் என்ன கூக்குரலிட்டாலும், தேசிய மக்கள் சக்தி அரசாங்கம் - எமது உறுப்பினர்கள் தோட்டப்புறங்களுக்குச் சென்று அவர்களது உண்மையான பிரச்சினைகளைக் கண்டறிந்ததன் அதனடிப்படையில், இம்முறை வரவு செலவுத்திட்டத்தில் எமது சனாதிபதி அவர்கள் விசேடமாகக் குறிப்பிட்ட ஒன்றுதான் பெருந்தோட்ட மக்களுக்கிருக்கின்ற வீடில்லாப் பிரச்சினைக்குரிய தீர்வைக் குறுகிய காலத்திலும் நீண்ட காலத்திலுமாகப் பெற்றுக்கொடுப்பதென்ற விடயம். அதனடிப்படையில்தான் பெருந்தோட்ட மக்களின் வீடமைப்பு மற்றும் உட்கட்டமைப்பு அபிவிருத்திக்காக இம்முறை வரவு செலவுத்திட்டத்தில் 4,267 மில்லியன் ரூபாய் பணத்தை மாண்புமிகு சனாதிபதியவர்கள் ஒதுக்கியுள்ளார்.

அதுமாத்திரமல்ல, மலையகத்தில் வாழும் தமிழ் இளைஞர்கள் இன்று தொழிலற்று, தமது எதிர்கால வாழ்க்கை தொடர்பாக ஒரு நம்பிக்கையில்லாது வாழ்ந்துவருகின்ற நிலையில், அவர்களது தொழிற்பயிற்சி, வாழ்வாதாரம் மற்றும்

[ගරු ක්‍රිෂ්ණන් කලෛයිචෙල්වි මෙනෙවිය]

உட்கட்டமைப்பு அபிவிருத்தியை மேம்படுத்தி, அவர்களின் வாழ்க்கையை அழகானதாக்குவதற்காக 2,450 மில்லியன் ரூபாய் பணம் ஒதுக்கப்பட்டுள்ளது.

அதுமாத்திரமல்ல, நம் அனைவருக்கும் தெரியும், மலையகத்திலிருக்கும் பாடசாலைகள் குடிப்பதற்குத் தண்ணீர், மலசலகூட வசதிகள் போன்ற அடிப்படை வசதிகள் எதுவும் இல்லாத மிகமிக மோசமான நிலையில்தான் காணப்படுகின்றன என்பது. அதனைக் கண்டறிந்த எமது அரசாங்கம் இந்த வரவு செலவுத்திட்டத்திலே மலையகப் பாடசாலைகளில் 'ஸ்மார்ட்' வகுப்பறைகளை அமைப்பதற்கு ரூபாய் 866 மில்லியனை ஒதுக்கியுள்ளது.

அதுமாத்திரமன்றி, வரலாற்றில் முதன்முதலாகப் பெருந்தோட்டத் தொழிலாளர்களின் நாளாந்தச் சம்பளத்தை எந்த அளவுக்கு உயர்த்துவது என்பது பற்றிப் பாராளுமன்றத்தில் குறிப்பிடப்பட்டு, 1,700 ரூபாயைப் பெற்றுக் கொடுப்பதற்கான சகல வேலைத்திட்டங்களும் அரசாங்கத்தினால் நடைமுறைப்படுத்தப்பட்டுக் கொண்டிருக்கின்றது. பெருந்தோட்டத் தொழிலாளர்களின் சம்பளத்தை உயர்த்த வேண்டுமானால் கம்பனிகளோடு - பெருந்தோட்ட நிறுவனங்களோடு கதைத்து, இறுதியில் 100 ரூபாய் - 200 ரூபாய் அதிகரிப்பென்ற தீர்மானத்திற்கு வந்து அவர்களால் அந்த விடயம் முடித்து வைக்கப்படுவது எமக்குத் தெரியும். அந்த சிறிய தொகையைக்கூட எமது மக்கள் வீதியில் இறங்கி மாதக் கணக்காகப் போராடியே பெற்றுக் கொள்ள வேண்டும். ஆனால், இந்த மக்களின் வாழ்க்கையை மேம்படுத்துவதற்காக 1,700 ரூபாய் நாளாந்த சம்பளத்தைப் பெற்றுக்கொடுக்க அரசாங்கம் தீர்மானித்துள்ளது. அந்த அடிப்படையிலேயே தோட்டத் தொழிலாளர்களின் சம்பளத்தை உயர்த்துவதென்ற தீர்மானத்தை கௌரவ சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்கள் சென்ற 17ஆம் திகதி 2025ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தைச் சபையில் அறிக்கையிடும்பொழுது வெளியிட்டுள்ளார்.

நாங்கள் மிகவும் குறிப்பாக எதிர்க்கட்சியின் மலையக உறுப்பினர்களுக்குக் கூறுகின்றோம், மலையக மக்களின் 202 வருடகால வரலாற்றில் அந்த மக்களின் சார்பில் கிட்டத்தட்ட 77 வருட காலம் இந்தப் பாராளுமன்றத்தில் அண்ணன், தம்பி, தாத்தா, பாட்டன் என்று அனைவரும் பதவி வகித்தபோதும், இந்த வருடத்தைத் தவிர, ஒவ்வொரு 5 வருடத்திற்கு ஒருமுறை இந்த நாட்டில் ஆட்சிபீடம் ஏறும் ஒவ்வொரு கட்சியின் அரசாங்கத்திலும் அமைச்சுப் பதவிகளில் இருந்தபோதும், மலையக மக்களின் வாழ்க்கையை மேம்படுத்துவதற்கோ, குறைந்தபட்சம் மலையக மக்கள் என்ற அந்தஸ்தைக்கூடப் பெற்றுக்கொடுப்பதற்கோ உங்களால் முடியாமற்போய் விட்டது. இன்று மலையக மக்களின் பிரச்சினை தொடர்பாக மிகவும் அன்பாகவும் ஆரவாரமாகவும் ஆதரவாகவும் எதிர்கட்சி உறுப்பினர்கள் - விசேடமாக மலையகத்தைப் பிரதிநிதித்துவப்படுத்தும் உறுப்பினர்கள் - பேசுகிறார்கள். ஆனால், இவர்களால் அவர்களது உரிமை எந்தவிதத்திலும் பெற்றுக் கொடுக்கப்படவில்லை. அதற்கு இன்றுவரையும் ஆட்சியிலிருந்த மலையக உறுப்பினர்கள், ஆட்சியாளர்கள் கட்டாயம் பதில் சொல்ல வேண்டும்.

தேசிய மக்கள் சக்தி அரசாங்கமானது இந்த நாட்டில் உள்ள விவசாயிகள், அரச துறை மற்றும் தனியார் துறை ஊழியர்கள், இளைஞர்கள், பெண்கள், சிறுவர்கள் என அனைவரையும் தேசிய ரீதியாகக் கருத்தில் எடுப்பதுபோலவே மலையகத் தோட்ட வாழ் மக்களையும் தேசிய ரீதியாக இணைத்துக் கொண்டுள்ளது. அதன் அடிப்படையில்தான் இந்த வரவு செலவுத்திட்ட அறிக்கையில் மலையக மக்களுக்கும் தனித்துவமான ஓரிடம் கொடுக்கப்பட்டுள்ளது. இதுவரையும் இப்படியான ஒன்றை இவர்களால் செய்ய முடியாமற்போனது.

இங்குள்ள எதிர்க்கட்சி உறுப்பினர்கள் இந்த வரவு செலவுத்திட்டம் தொடர்பாகப் பாரிய விமர்சனங்களை வைத்துக் கொண்டிருக்கிறார்கள். இவர்கள் எந்த விமர்சனங்களை வைத்தாலும் கட்டாயமாக தேசிய மக்கள் சக்தி அரசாங்கத்தின் உறுப்பினர்களாகிய நாங்கள், எமது மலையக வாழ் மக்களின் உரிமைகளைப் படிப்படியாகப் பெற்றுக் கொடுப்பதோடு, அவர்களுடைய சகல பிரச்சினைகளுக்குமான தீர்வுகளையும் படிப்படியாகப் பெற்றுக் கொடுப்போம் என்று உறுதியாகக் கூறுகின்றோம். அதனால்தான் விசேடமாக உங்களையும் தேசிய ரீதியாக இணைத்துக்கொண்டுள்ள, உங்களது உரிமையைப் பெற்றுக்கொடுக்கக்கூடிய ஒரே அரசாங்கமான தேசிய மக்கள் சக்தி அரசாங்கத்துடன் இணைந்து செயற்படுமாறு மலையக மக்களுக்கு நாங்கள் அழைப்பு விடுக்கின்றோம்.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී මම විශේෂයෙන් මේ රටේ ජීවත් වන ලක්ෂ 20කට ආසන්න අපේ වතු කම්කරු ජනතාව ගැනත් වචන කිහිපයක් කථා කරන්න කැමැතියි. මොකද, වතු කම්කරු ජනතාව අවුරුදු 202ක පමණ ඉතිහාසය තුළ මේ රටේ විශාල දුකක් වින්දා. නිදහසින් පසු ගතවූ අවුරුදු 76ක කාලය තුළ වතු කම්කරු ජනතාව මේ පාර්ලිමේන්තුවේ "අපේ" යැයි කියා ගත් මන්ත්‍රීවරු විශාල පිරිසක් සිටියා. හැබැයි, ඒ මන්ත්‍රීවරු අපේ වතු කම්කරු ජනතාව වෙනුවෙන් ලබා දීලා තිබෙන අයිතිවාසිකම් මොනවාද? අදටත් මේ ජනතාව පාවිච්චි කරන්නේ ඡන්ද මැෂිමක් විධියට විතරයි. සමහර අය දැන් නම් බොහොම ආදරයෙන් වතු කම්කරු ජනතාවගේ අයිතිවාසිකම් පිළිබඳව කථා කරනවා. හැබැයි ජාතික ජන බලවේගයේ ආණ්ඩුව වතුකරයේ ජනතාව; කඳුකරයේ ජනතාව, "මලයගම්" ජනතාව කියන එක පිළිගෙන තිබෙන එක පවා වතුකරයේ ජනතාවට ලොකු දෙයක්. අපට ඒක කරගන්න පුළුවන් වුණේ ජාතික ජන බලවේගයේ ආණ්ඩුවෙන්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියට නියමිත කාලය දැන් අවසානයි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමියට තවත් විනාඩි 3ක් ආණ්ඩු පක්ෂයේ කාලයෙන් ලබා දෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි, ගරු මන්ත්‍රීතුමිය කථාව කරගෙන යන්න.

**ගරු ක්‍රිෂ්ණන් කලෛයිචෙල්වි මෙනෙවිය**
(மாண்புமிகு (செல்வி) கிருஷ்ணன் கலைச்செல்வி)
(The Hon. (Ms.) Krishnan Kalaichelvi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වතුකරයේ ජනතාව අවුරුදු 76ක් තිස්සේ නොවෙයි, අවුරුදු 202ක් තිස්සේ ඉතාම දුක්ඛිත ජීවිත ගත කරන්නේ. ඒක හොඳටම දැනගත්ත ආණ්ඩුව තමයි ජාතික ජන බලවේගයේ ආණ්ඩුව. ඒ නිසාම තමයි වතුකරයේ

ජනතාවගේ ජීවිතය නඟා සිටුවන්න, අධ්‍යාපනය නඟා සිටුවන්න, සංස්කෘතිය, සදාචාරය, සෞඛ්‍ය නඟා සිටුවන්න, මේ සියලු දේවල් හොයා බලමින් ජාතික ජන බලවේගයේ ආණ්ඩුව අද කටයුතු කරමින් ඉන්නේ.

අපේ වතුකරයේ ජනතාව නියෝජනය කරමින් මේ පාර්ලිමේන්තුවේ තාත්තලා, පුතාලා, සීයලා සියලු දෙනාම හිටියත්, මෙතුවක් කල් වතුකරයේ, කඳුකරයේ ජීවත් වන ජනතාව identify කර තිබුණේ නැහැ; හඳුනා ගැනීමක් තිබුණේ නැහැ. ඒක කරගන්න පුළුවන් වුණේත් ජාතික ජන බලවේගයේ ආණ්ඩුවෙන්. ඒ තමයි, 'மலையகத் தமிழ் மக்கள்'; මලයගම් දෙමළ ජනතාව විධියට.

ඒ විතරක් නොවෙයි. මේගොල්ලන් කියන ආකාරයට වතුකරයේ පාරවල් සම්බන්ධ ප්‍රශ්න තිබෙනවා; නිවාස සම්බන්ධ ප්‍රශ්න තිබෙනවා; වැටුප් සම්බන්ධ ප්‍රශ්න තිබෙනවා. මේ සියල්ල විසඳන්න ඕනෑ ජාතික ජන බලවේගයේ ආණ්ඩුව. ඇත්ත, අපි අනිවාර්යයෙන්ම ඒ ප්‍රශ්න විසඳනවා. ඒකේ දෙකක් නැහැ. අනිවාර්යයෙන්ම ජාතික ජන බලවේගය ආණ්ඩුව වතුකරයේ ජනතාවගේ ප්‍රශ්න විසඳනවා. මූලික අදියර විධියට මේ අය වැයේදී අපේ ජනතාවගේ නිවාස ප්‍රශ්න විසඳන්න, යටිතල පහසුකම් පිළිබඳ ප්‍රශ්න විසඳන්න රුපියල් මිලියන 4,267ක් වෙන් කර තිබෙනවා. එවැනි දෙයක් මේ පාර්ලිමේන්තුවේ මීට කලින් සිදු වුණේ නැහැ. ජාතික වශයෙන් වතු කම්කරුවන්ගේ ප්‍රශ්න කථා කළේ නැහැ. ප්‍රශ්නවලට උත්තර දුන්නේත් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වතුකරයේ ඉන්න, කඳුකරයේ ඉන්න දෙමළ තරුණ තරුණියෝ; අපේ සහෝදර සහෝදරියන් අදටත් ජීවිතය ගෙවන්නේ අපේක්ෂා භංගත්වයෙන්. මොකද, ඔවුන්ට රැකියාවක් නැහැ; යන්න තැනක් නැහැ. පෞද්ගලික ආයතනයකට ගියත් නිසි වැටුපක් නැහැ. ඒ නිසාම වතුකරයේ ඉන්න තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණුව ලබාදීම සඳහා මේ ආණ්ඩුව රුපියල් මිලියන 2,450ක් මේ අය වැයෙන් වෙන් කර තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. වතුකරයේ තිබෙන පාසල් ඉතාම පහළ මට්ටමක තිබෙන්නේ. අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය ඇමතිතුමාත් නියෝජනය කරන්නේ අපේ දිස්ත්‍රික්කය. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, වතුවල තිබෙන පාසල්වල කිසිම පහසුකමක් නැහැ.

ඒ නිසා තමයි "මලයගම්" දෙමළ ප්‍රජාවේ පාසල් සඳහා සුහුරු පන්ති කාමර හදන්න රුපියල් මිලියන 866ක් වෙන් කර තිබෙන්නේ. හැබැයි, මේ කිසිවක් මීට කලින් හිටපු මන්ත්‍රීවරු, මේ පාලකයෝ මේ පාර්ලිමේන්තුවේදී අපට වෙන් කර දුන්නේ නැහැ. "මලයගම්" දෙමළ ජනතාවගේ ජීවිත නඟා සිටුවන්න තිබෙන එකම ආණ්ඩුව මේකයි. ඒ මිනිසුන්ගේ ජීවිත සම්බන්ධව හොඳම තීන්දුව ගත්තු පාර්ලිමේන්තුව දසවැනි පාර්ලිමේන්තුව හෙවත් ජාතික ජන බලවේගය ආණ්ඩුව සහිත පාර්ලිමේන්තුවයි කියන එකත් ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සාගරිකා අතාවුද මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.50]

**ගරු නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சாகரிகா அதாவுத)
(The Hon. (Mrs.) Sagarika Athauda, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2024 සැප්තැම්බර් 21වන දා මේ රටේ ජනතාව ඉතිහාසයේ ප්‍රථම වතාවට ඓතිහාසික තීන්දුවක් ගත්තා, සියලු ජනතාව නියෝජනය කරමින් එකම රටක් යටතේ එක ජනාධිපතිවරයකුගේ පාලනයට මේ රට ලක් කර ගන්නට. විශේෂයෙන් උතුර, නැඟෙනහිර ඇතුළු සියලු ජනතාවගේ අපේක්ෂාව වුණේ නව වැඩ පිළිවෙළක් එක්ක ඉදිරියට යන රජයක්. ඒක රටක් විධියට ගනු ලැබූ ඓතිහාසික තීරණයක්.

අපි ඉදිරිපත් කළා, මේ රට හදන වැඩ පිළිවෙළ; ජාතික ජන බලවේගයේ පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් ගොඩ නඟන වැඩ පිළිවෙළ. මේ වැඩ පිළිවෙළ ඇතුළේ පුරවැසි ක්‍රියාකාරිත්වය, සාමූහික මැදිහත්වීම්, සමාජ සාධාරණත්වය, යහපාලන මූලධර්ම භාවිත කරන නව යුගයක් ආරම්භ කිරීම අපේක්ෂා කරනවා. මේ සියලු මූලධර්ම පදනම් කරගත් නව රජයේ මංගල අය වැය පිළිබඳවයි අද මේ ගරු පාර්ලිමේන්තුව ඇතුළේ සාකච්ඡා වෙමින් පවතින්නේ. විශේෂයෙන් මේ රටේ සියලු පුරවැසියන්ට රටේ ආර්ථික ක්‍රියාවලියට සක්‍රියව දායක විය හැකි පරිදි අවස්ථා වැඩි දියුණු කිරීමත්, ඒ අවස්ථා තුළින් ලැබෙන ආර්ථිකමය ප්‍රතිඵල සමාජයේ සෑම ස්තරයකටම සාධාරණ ලෙස ලබා ගත හැකි පරිදි ආර්ථිකය වර්ධනය කිරීමත් මේ අය වැයේ මූලික අපේක්ෂාවයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා, පසුගිය කාල සීමාව පුරාවටම මේ රටේ ආර්ථික ක්‍රියාවලිය කොහොමද හැසිරුණේ කියලා. ආර්ථිකයේ වැඩි පංගුවක් හැම වෙලේම අත්පත් කර ගත්තේ සීමිත පිරිසක්, එහෙමත් නැත්නම් අතළොස්සක්. අපේ අරමුණ වන්නේ රටක් වශයෙන් ඉදිරියට යෑම නම්, ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය, එහෙමත් නැත්නම් මේ රටේ ආර්ථික ප්‍රතිලාභ සාමාන්‍ය ජනතාව අතරට වාගේම මේ රටේ සෑම පුරවැසියෙකු අතරටම බෙදී යෑම අත්‍යවශ්‍යයි. මේක රටේ ඉදිරි දැක්මට සෘජුව බලපාන ක්‍රියාවලියක්. ඒ සියලු අරමුණු හොඳින් තහවුරු කර ගනිමින් රටේ පවත්නා ගැටලුවලට තාර්කික විසඳුම් ලබා දෙන අය වැයක් මෙවර ජාතික ජන බලවේගය රජය සිය මංගල අය වැය විධියට, එහෙමත් නැත්නම් අපේ පළමු අය වැය විධියට ඉදිරිපත් කර තිබෙනවා. විශේෂයෙන් මෙම තත්ත්වය හොඳින් වටහා ගත හැකිව තිබුණත්, විපක්ෂය දිගින් දිගටම අසත්‍ය කරුණු මත පදනම් වෙලා, සාධාරණත්වය මත, ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය මත අප ගොඩ නඟන්න උත්සාහ කරන මේ වැඩ පිළිවෙළ ගැන විවේචනය කරමින්, සමාජය තුළ අසත්‍ය පතුරුවමින් අසත්‍ය කරුණු සමාජගත කරන්න උත්සාහ කරනවා. මේක හරියට දිය කොරහෙත් කිඹුල්ලු දකිනවා වාගෙයි. විශේෂයෙන් මේ අය වැයේ අන්තර්ගතය සම්බන්ධයෙන් සැබෑ දැක්මක් තිබුණත්, සැබෑ අවබෝධයක් තිබුණත්, මෙය දෝෂ දර්ශනයට ලක් කරමින් ඒ හරහා අසත්‍ය කරුණු සමාජගත කිරීම විපක්ෂය දිගින් දිගටම සිදු කරනවා. මේ අය වැය විශේෂයෙන් ජනහිතකාමී අය වැයක්. මේ අය වැය රටේ ජනතාව වෙනුවෙන් සකස් කරන ලද අය වැයක්.

මට පෙර විපක්ෂයෙන් කථා කළ මන්ත්‍රීවරයකු දිගින් දිගටම පැහැදිලි කරන්න උත්සාහ කළා, මේ අය වැය හරහා අය කරන බදු ක්‍රියාවලිය ඇතුළේ පෙරට වඩා ජනතාව පීඩාවට පත් වෙනවා කියලා. ගරු මන්ත්‍රීතුමනි, අපි අපේක්ෂා කරන්නේ ප්‍රසාරණය වුණු ආර්ථිකයක් ඇතුළේ බදු අය කිරීමේ ක්‍රියාවලියක්. මා එය උදාහරණයකින් කියන්නම්. අප පාන් රාත්තලකින් එක පාන් පෙත්තක් ගත්තත්, පාන් රාත්තල් දෙකකින් පාන් පෙති දෙකක් ගත්තත් කාරණා දෙකම එකයි.

[ගරු සාගරිකා අතාවුද මහත්මිය]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ප්‍රතිපත්ති ප්‍රකාශය ඇතුළේ අපි ඉදිරිපත් කළ රටේ ජනතාවගේ, විශේෂයෙන් ළමා පරපුරේ ආරක්ෂාව, රැකවරණය මේ අය වැය තුළ සහතික කර තිබෙනවා.

අප හඳුන්වන ඒ වැඩ පිළිවෙළ ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ විස්තර කරනවා, "සුරක්ෂිත ළමා ලෝකයක්, නිර්මාණශීලී අනාගත පරපුරක්" කියන මාතෘකාව යටතේ. මේ කාරණය සනාථ කරමින් එහි මූලධර්ම වශයෙන් දක්වන කාරණයත් මම උපුටා දක්වන්නම්.

> "පෝෂ්‍යදායී ආහාර සැපයීම ඇතුළු සමස්ත ළමා සෞඛ්‍ය වැඩිදියුණු කිරීම අරමුණු කර ගනිමින් ජාත්‍යන්තර සහ දේශීය ආයතනවල සහාය ඇතිව ප්‍රජාව, පවුල සහ පාසල් පදනම් කර ගත් සහයෝගිතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම."

මේ අරමුණ සංතෘප්ත වන ආකාරයට මෙවර අය වැයෙන් දරුවන්ගේ පෝෂණ අවශ්‍යතා වෙනුවෙන් රජය වැඩි සැලකිල්ලක් දක්වා තිබෙනවා. මේ අය වැය තුළින් පෝෂණ ඌනතාව ඇති දරුවන්ට සහ ගැබිනි මව්වරුන්ට ත්‍රිපෝෂ ලබා දීමේ වැඩසටහන සඳහා පමණක් රුපියල් මිලියන 5,000ක් වෙන් කර තිබීම විශේෂත්වයක්. ඒ වාගේම ගර්භිණී මව්වරුන්ට ලබා දෙන පෝෂණ ආහාර මල්ල සඳහා රුපියල් මිලියන 7,500ක් වෙන් කිරීම, පෙර පාසල් දරුවන්ගේ ආහාර වේලක් වෙනුවෙන් මෙතෙක් වියදම් කළ රුපියල් 60ක මුදල වෙනුවට රුපියල් 100ක මුදලක් වෙන් කිරීම ආදිය තුළින් නව රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය අපේක්ෂා කළ අරමුණට මෙහෙයවීමක් දකින්න ලැබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ළමයින් ගැන කථා කරන කොට අපට පූර්ව ළමාවිය සංවර්ධනය අමතක කරන්න බැහැ. විශේෂයෙන් පූර්ව ළමාවිය සංවර්ධනය සඳහා වැඩි දායකත්වයක් ලබා දීම තුළින් අප අපේක්ෂා කරන්නේ වර්තමානයේ ලැබෙන ප්‍රතිලාභ නොවෙයි. ඒ තුළින් අප අපේක්ෂා කරන්නේ අනාගත ආයෝජනයක්. තව වසර ගණනාවකින් මේ රටේ නීරෝගිමත්, බුද්ධිමත්, දක්ෂ දරු පරපුරක් බිහි කිරීම අපේ අපේක්ෂාවයි. ඒ සඳහා අඩිතාලම දමමින්ම පෙර පාසල් ගුරුවරුන් සඳහා මෙතෙක් ලබා දුන් දීමනාවට රුපියල් 1,000ක අමතර දීමනාවක් අපි වෙන් කර තිබෙනවා. සමස්ත අය වැයේම තිබෙන විශේෂත්වය වන්නේ, මේ අය වැය තුළින් සමාජයේ සෑම කොට්ඨාසයක්ම ආවරණය කිරීමට රජය කටයුතු කර තිබීමයි.

කාන්තාවන් විධියට අපි දන්නවා, ගෙදරක දරුවෙකු අසනීප තත්ත්වයෙන් පසු වුණොත් අපට අපේ කාර්යභාරයන් සිදු කර ගන්න කෙතරම් අපහසුද කියලා. ඔටිසම් වැනි ස්නායු ආශ්‍රිත ආබාධ තිබෙන දරුවන් ඇති මව්වරුන්ට තමන්ගේ ජීවිත කාලයම ඒ දරුවන් වෙනුවෙන් කැප කරන්න සිද්ධ වෙලා තිබෙනවා. මේ රජය එවැනි සියුම් තත්ත්වයන් ගැන පවා අය වැය තුළින් අවධානය යොමු කරලා, විශේෂයෙන් ඔටිසම් වැනි ස්නායු ආබාධ සහිත දරුවන්ට අවශ්‍ය රැකවරණය ලබා දීම ගැන වාගේම, ඔවුන්ට විශේෂ පහසුකම් සැලසීම ගැනත් කථා කරන්නේ ඉතිහාසයේ පළමුවැනි වතාවටයි. මේ කාරණය නිසාම මේ රටේ සමස්ත ජනගහනයෙන් අඩකටත් වඩා සිටින කාන්තාවන්ට තමන්ගේ ගෙදර දොර වැඩ කටයුතු වාගේම, ඇතැම් විට සක්‍රිය ලෙස ජාතික ආර්ථිකයට දායක වෙන්න තිබෙන අවස්ථාවත් අහිමි වෙලා තිබෙනවා. ඉතින්, මෙවැනි සියුම් තැන් නිරීක්ෂණය කරමින් ඊට අවශ්‍ය වැඩ පිළිවෙළ සකස් කිරීම මේ අය වැය තුළ අපට දකින්න ලැබෙනවා. ඒ අනුව මෙවර අය වැයෙන් ඔටිසම් වැනි ස්නායු ආබාධ සහිත දරුවන්ගේ සෞඛ්‍ය තත්ත්වය නඟා සිටුවීමටත්, ඒ වෙනුවෙන් අවශ්‍ය සෞඛ්‍යය, අධ්‍යාපනය ඇතුළු අනෙකුත් සේවාවන් සඳහා අවශ්‍ය ජාතික වැඩසටහනක් සම්පාදනය කිරීමටත් මුදල් වෙන් කර තිබෙනවා. රුපියල් මිලියන 200ක් ඒ වෙනුවෙන් වෙන් කර තිබෙනවා. ඒ වාගේම, ඉදිරි වසර 5 තුළ දිස්ත්‍රික්ක 25ම ආවරණය කරන්න අපි මේ තුළින් අපේක්ෂා කරනවා. එවැනි දරුවන් වෙනුවෙන් පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක්, ඒ වාගේම පහසුකම් සහිත දිවා සුරැකුම් මධ්‍යස්ථාන සකස් කිරීමේ වැඩ පිළිවෙළ පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ඡා කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තුළින් නව රජයේ මානුෂීය ගුණාංග වඩාත් පැහැදිලි වෙනවා.

කාන්තාවන් කියන්නේ, ඕනෑම තත්ත්වයකදී සමාජයේ අභියෝගාත්මක අවස්ථාවලට දීර්ඝ ලෙස පෙනී සිටින්න හැකි පිරිසක් වුවත්, හිංසනයට ලක් වන, ඒ සියල්ල නිහඬව දරාගෙන සිටින කාන්තාවන් බහුතරයක් අපේ රටේ ඉන්නවා. මෙවැනි තැන් පවා ස්පර්ශ කරමින් මෙම අය වැය සකස් කර තිබෙනවා. "කාන්තා හිංසනය" කියන්නේ, ආර්ථික ක්‍රියාවලිය තුළ, නිවස තුළ, සමාජය තුළ ඇතැම් අවස්ථාවල පොදුවේ අපට දකින්නට ලැබෙන මාතෘකාවක්.

එවැනි කාන්තාවන් සමාජයත් එක්ක ගනුදෙනු කරන්නේ හරිම පරිස්සමින්. ඒ නිසාම ඔවුන් ආර්ථික ක්‍රියාවලියට සම්බන්ධ කර ගන්න තිබෙන ඉඩ කඩ ඇහිරී යන අවස්ථා තිබෙනවා. නව රජය ස්ත්‍රියකගේ ආරක්ෂාව, ඇයට එරෙහිව සිදු වන හිංසනය වැළැක්වීම වෙනුවෙන් මෙවර අය වැයෙන් වෙන් කර ඇති මුදල් රුපියල මිලියන 120ක්. විශේෂයෙන් වේගවත් පිම්මක් ගන්නට සූදානම් වන රජය විශ්වාස කරනවා, සවිබලගැන්වුණු කාන්තාව ජාතික ආර්ථිකයට දායක කර ගැනීම අත්‍යවශ්‍ය කාරණයක් විධියට.

නිෂ්පාදන ආර්ථිකයත් එක්ක පුනරුදය ප්‍රධාන අභිලාෂය කර ගත් රජයක ව්‍යවසායකයන් යනු සම්පතක්. ඒ ව්‍යවසායකයන් ගොඩ නැඟීම රටකට අත්‍යවශ්‍යයි. නව ව්‍යවසායකයන් ගොඩ නැඟීම ඇතුළේ පමණයි රටක ආර්ථික ක්‍රියාවලිය වේගවත්ව ඉදිරියට අරගෙන යන්න පුළුවන් වෙන්නේ. ශ්‍රී ලංකාවේ සමස්ත ජනගහනයෙන් සියයට 38ක් තරුණ ප්‍රජාව. තාරුණ්‍යය නිදහසෙන් පසු දැඩි අසීරු, අතෘප්තිමත් කාලයක් ගත කරනු දකින්න ලැබුණා. ඒ සඳහා ඕනෑ තරම් උදාහරණ අපට ඉතිහාසයේ දකින්න ලැබෙනවා. විශේෂයෙන් තරුණයන්ට අධ්‍යාපනයේ අවස්ථා අඩුකම, ආර්ථිකයට සක්‍රිය ලෙස දායක වීමට අවස්ථා අඩුකම, තාක්ෂණික හා සන්නිවේදන දියුණුවේ කොටස්කරුවන් වීමට අවස්ථා නොමැතිකම, කොටින්ම කිව්වොත් ගෞරවනීය විධියට ජීවත්වීමට නොහැකිවීම අපේ රටේ තාරුණ්‍යය පසුගිය කාල සීමාව තුළ මුහුණ දුන් අමිහිරි සිදුවීම්. මේ රට තවදුරටත් අනාගත සංවර්ධනය කරා යන ගමනේදී තාරුණ්‍යයේ දායකත්වය අත්‍යවශ්‍යයි. විශේෂයෙන් දියුණු, බලසම්පන්න බලවේගයක් වන තරුණ ප්‍රජාව තවදුරටත් අවවරප්‍රසාදිත කොටසක් බවට අත්හැර දාන්න බැහැ, ඔවුන් මේ රටේ ජාතික ආර්ථිකයට දායක කර ගන්න ඕනෑ.

සමුපකාර ක්‍රමය හරහා විකල්ප නිෂ්පාදන ප්‍රවේශයක් අනුගමනය කරමින් තරුණ ව්‍යවසායකයන් ගොඩනැඟීම වෙනුවෙන් මේ වසරට පමණක් මිලියන 100ක් වෙන් කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක මේ රට අනාගත පුනරුදයක් කරා යන ගමනේ දීර්ඝ කාලීන ආයෝජනයක්. මේ අය වැය තුළ තරුණයන් ඇතුළු සමාජයේ සෑම කොටසක් ගැනම සෘජුව කථා කරන අතර, අමතක වුණු තවත් කොටසක් ඉන්නවා. ඒ තමයි රැකවරණ නිවාසවල සිටින දරුවන්. ඔවුන්ද මේ සමාජයේ අනෙක් දරුවන් හා සමානවම කොටස්කරුවන්. ඔවුන්ද ඉදිරි කාල සීමාවේ මේ රට බාර ගන්න ඉන්න පුරවැසියන්. ඔවුන් පිළිබඳවත් මේ රජයේ වැඩ පිළිවෙළ තුළ සාකච්ඡා කරනවා. විශේෂයෙන්

අපේ රජයේ ප්‍රතිපත්තියක් තිබෙනවා සෑම පුරවැසියෙකුටම ගෞරවාන්විත හා සුරක්ෂිත ජීවිතයක් ගත කිරීමට ඇති අවස්ථාව තහවුරු කිරීමේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය කියන්නේ මේ රටේ අස්සක් මුල්ලක් නැර සෑම ජන කොටසක් ගැනම සාකච්ඡා කරන, ඒ වාගේම මේ රටේ සෑම ජන කොටසකගේම අවශ්‍යතා මනා ලෙස විශ්ලේෂණය කරලා ඔවුන්ගේ අවශ්‍යතා වෙනුවෙන් සකස් කරන ලද අය වැයක්. අන්තර්ගතය ගැන වැටහීමක් ඇතිව බැලුවොත් අපට පැහැදිලි වෙනවා කුඩා දරුවාගේ ඉඳලා සෑම පුරවැසි කොට්ඨාසයක් වෙනුවෙන්ම කුමන හෝ වැඩ පිළිවෙළක් මේ අය වැය තුළ අන්තර්ගත වෙලා තිබෙනවා කියලා. අපි හැම දාම මේ රටේ දැක්කේ ඒකාකාරී විධියට ගමන් කළ අය වැය ලේඛන. අපි පසුගිය කාලයේ දිගින් දිගටම දැක්කා හිතවතුන්ට, ගජමිතුරන්ට සහන දෙන්න මුදල් වෙන් කර ගත්ත අය වැය ලේඛන.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය හරහා ජාතික ජන බලවේගය මූල්‍ය විනයක්, ආර්ථික දැක්මක් සහ මග පෙන්වීමක් ඇතිව අය වැයක් ඉදිරිපත් කරන්නේ කොහොමද කියලා පෙන්වලා තිබෙනවා. මේ රටේ ජනතාව තවදුරටත් අප ගැන විශ්වාස කරමින්, මේ අය වැය හරහා ලබා දෙන සහන ඔස්සේ අපි බලාපොරොත්තු වෙන පොහොසත් රට ගොඩනහනකම් බලාගෙන ඉන්න බව විශ්වාසයි.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ෆස්මින් ෂරීෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 4.03]

**ගරු ෆස්මින් ෂරීෆ් මහතා**
(மாண்புமிகு பஸ்மின் ஷரீப்)
(The Hon. Fasmin Sharif)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இலங்கையின் வரலாற்றில் முதற் தடவையாக சனாதிபதியும் நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சருமான மாண்புமிகு அநுர குமார திஸாநாயக்க அவர்களால் முன்வைக்கப்பட்டுள்ள வரவு செலவுத்திட்டமானது எல்லா மக்களுக்கும் பொருந்தக்கூடியதாக இருக்கின்றது. 2025ஆம் ஆண்டுக்கான Budgetமூலம் எங்களுடைய நாடு பெரும் முன்னேற்றம் அடையுமென நாம் எதிர்பார்க்கின்றோம். இந்த Budgetஆனது, நாட்டின் வளர்ச்சிக்கும் மக்களின் வாழ்வாதாரத்தை மேம்படுத்துவதற்கும் மிக முக்கிய பங்கு வகிக்கும்.

கம்பளையிலிருந்து நுவரெலியாவுக்கு 50 கிலோமீற்றர் தூரம் இருக்கின்றது. அதிகளவு tourists வரக்கூடிய நகரமாக கம்பளை நகரம் காணப்பட்டாலும், அங்கு இதுவரை dry toilet ஒன்றுகூட இல்லாத நிலைமை காணப்படுகின்றது. இந்த நிலைமையை முன்பிருந்த அரசாங்கங்களே ஏற்படுத்தியுள்ளன. கம்பளையிலுள்ள அம்புலுவாவ பிரதேசம் அதிகளவு tourists வரக்கூடிய ஓர் இடமாக இருக்கின்றது. எனினும், கம்பளை நகரில் எந்தவித அபிவிருத்தியும் ஏற்படவில்லை. அதேநேரம், கம்பளை பிரதேசம் குடிநீர் தட்டுப்பாடுள்ள ஒரு பிரதேசமாகவும் இருக்கின்றது. இந்த நாட்டின் பிரதம மந்திரியாக இருந்த ஒருவர் வாழ்ந்த தொலுவ பிரதேசத்திலும் இந்த நிலைமை காணப்படுகின்றது. இந்த முறை வரவு செலவுத்திட்டத்தில் மாண்புமிகு சனாதிபதி அவர்கள் குடிநீர் வசதிக்குக் கூடுதலான நிதியை ஒதுக்கியுள்ளார்.

இம்முறை ஆளும் கட்சிப் பாராளுமன்ற உறுப்பினர்கள் தங்களுக்கான சிறப்புரிமைகளைக் குறைத்து, நாட்டின் நலன்காக்க முன்வந்துள்ளனர். குறிப்பாக, மாண்புமிகு சனாதிபதி, கௌரவ பிரதமர் மற்றும் பாராளுமன்ற உறுப்பினர்கள் தூய்மையான இலங்கையை - Clean Sri Lanka - அமைக்கும் முயற்சியில் ஈடுபட்டுள்ளனர். இவர்கள் சுற்றுச்சூழல் பாதுகாப்பு, தூய்மை, பராமரிப்பு விடயங்களில் முன்மாதிரியாகச் செயற்படுகின்றார்கள். இது எங்களது நாட்டிலுள்ள சமுதாயத்தை முற்றிலும் மாற்றியமைக்க உதவும் என்பதை நான் இங்கு உறுதியாகத் தெரிவித்துக் கொள்கின்றேன்.

அண்மையில் அக்குறணையில் வெள்ளம் ஏற்பட்டபோது, நாங்கள் கௌரவ றியாஸ் பாரூக் அவர்களுடனும் இன்னும் சில உறுப்பினர்களுடனும் அதனைப் பார்வையிடச் சென்றோம். அப்போது, மணல் போடக்கூடிய சிறியதோர் இடத்தை அரச உத்தியோகத்தர்கள் தெரிவு செய்திருந்ததை நாங்கள் கண்டோம். அது பற்றி நாங்கள் வினவியபோது, அவ்விடத்துக்கு ஒவ்வொரு மாதமும் 172,000 ரூபாய் கொடுப்பதாகச் சொன்னார்கள். அப்போது நான் அங்கிருந்த அதிகாரியிடம், "இந்த இடத்தில் எவ்வளவு தொகைக்கு மணல் இருக்கின்றது" என்று கேட்டேன். அதற்கு அவர், "150,000 ரூபாய் பெறுமதியுள்ள மணல் குவித்து வைக்கப்பட்டுள்ளது" என்று கூறினார். அப்போது நான், அந்த இடத்திலுள்ள மணலை இலவசமாகக் கொடுத்துவிட்டு, அந்த இடத்துக்குரிய கூலியை இரத்துச் செய்தால்கூட, அரசாங்கத்துக்குப் பாரியதொரு தொகைப் பணம் மீதமாகுமெனக் கூறியபோது, அந்த அதிகாரி மௌனமாக இருந்தார். இவ்வாறு சில இடங்களில் முன்பிருந்த அரச அதிகாரிகள் இதுபோன்ற தவறான செயலுக்கு உடந்தையாக இருந்திருக்கிறார்கள். அதனால்தான் அக்குறணை பிரதேசத்தில் ஏற்படும் வெள்ளம் மக்களுக்கு அதிக சேதத்தை ஏற்படுத்தக்கூடிய வகையில் இருக்கின்றது. இதனால் வருடாந்தம் சுமார் 30 கோடி ரூபாய் நட்டம் ஏற்படுகின்றது. எனவே, இது சம்பந்தமாகக் கவனம் செலுத்தி, உரிய நடவடிக்கை எடுக்குமாறு நான் கௌரவ அமைச்சர் அவர்களை கேட்டுக்கொள்கின்றேன்.

மேலும், தேவையுடையோரை அடையாளம் காண்டு 'அஸ்வெசும' கொடுப்பனவைக் கொடுப்பதற்கும், சிரேஷ்ட பிரஜைகளுக்கான வட்டி மானியத்துக்கும் இம்முறை வரவு செலவுத்திட்டத்தில் நிதி ஒதுக்கீடு செய்யப்பட்டுள்ளது. எமது அரசாங்கம், தேவையுடைய மக்களின் நலனுக்காகப் பல்வேறு திட்டங்களை வகுத்துள்ளமை மனதுக்கு சந்தோஷத்தை தருகின்றது. அத்தோடு, சிறிய மற்றும் நடுத்தர தொழிற்றுறையை ஊக்குவித்தல், பொதுப் போக்குவரத்து, கிராமப்புற அபிவிருத்தி, விவசாயப் புத்தெழுச்சி, உள்ளூர் தொழில்முனைவு, ஆராய்ச்சியை வணிகமயமாக்குதல் மற்றும் தடையற்ற உள்நாட்டு, வெளிநாட்டு ஏற்றுமதி சார்ந்த உற்பத்தி ஆகியவற்றுக்கு வளங்களை ஒதுக்கியுள்ளதன்மூலம் நாடு பெரும் அபிவிருத்தியை அடையுமென நாம் எதிர்பார்க்கின்றோம். அரச ஊழியர்களின் ஆகக் குறைந்த மாதாந்த அடிப்படைச் சம்பளம் 24,250 ரூபாயிலிருந்து 40,000 ரூபாய் வரை, 15,750 ரூபாயால் அதிகரிக்கப்பட்டுள்ளது. நாட்டின் பொருளாதார நிலை கருதி அதனைக் கட்டங்கட்டமாக வழங்குவதற்கு நடவடிக்கை எடுக்கப்பட்டுள்ளது.

[ගරු ෆස්මින් ෂරීෆ් මහතා]

மலையக மக்களின் வாழ்வாதாரத்தை மேம்படுத்துவதற்காக 7,583 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளது. மலையக மக்களின் வீடமைப்பு வசதிக்காக 4,267 மில்லியன் ரூபாயும், மலையக தமிழ் இளைஞர்களின் தொழிற்பயிற்சிக்காக 2,450 மில்லியன் ரூபாயும் ஒதுக்கப்பட்டுள்ள அதேநேரம், தோட்டத் தொழிலாளர்களின் நாட்சம்பளத்தை 1,700 ரூபாயாக அதிகரிப்பதற்கும் அரசாங்கம் முன்வந்துள்ளது. மேலும், கண்டி 'குட்செட்' பஸ் தரிப்பிடத்தின் அபிவிருத்திக்காக 7.7 பில்லியன் ரூபாயும், பஸ் கொள்வனவுக்காக 3,000 மில்லியன் ரூபாயும் ஒதுக்கப்பட்டுள்ளது. மேலும், விவசாயத்துக்கு 54,000 மில்லியன் ரூபாயும், கல்விக்கு 12,000 மில்லியன் ரூபாயும் ஒதுக்கப்பட்டுள்ளது. விவசாயிகளின் நலன்கருதி தம்புத்தேகமவில் களஞ்சிய வசதிகள் அமைப்பதற்காக 100 மில்லியன் ரூபாயும் ஒதுக்கப்பட்டுள்ளது.

இந்த வரவு செலவுத்திட்டத்தில் மூலதனச் செலவுக்காக மொத்த உள்நாட்டு உற்பத்தியில் 4 சதவீதம் ஒதுக்கப்பட்டுள்ளது. இது பொருளாதார வளர்ச்சியை முன்னகர்த்துவதற்கான அரசாங்கத்தின் முக்கிய பங்களிப்பாகும். இந்த ஆண்டில் பொருட்கள் மற்றும் சேவைகளின் ஏற்றுமதிமூலம் கிட்டத்தட்ட 19 பில்லியன் டொலருக்கு அண்மித்த வருமானத்தை - முன்னொருபோதும் இல்லாத உயர்வை - அடையலாமென நாங்கள் எதிர்பார்க்கின்றோம். மக்களின் அடிப்படைத் தேவைகளான பாதை, மின்சாரம், குடிநீர் போன்ற வசதிகளைக்கூட, சென்ற அரசாங்கங்களால் மக்களுக்குப் போதியளவு பெற்றுக்கொடுக்க முடியவில்லை. கெரவலப்பிட்டி சுங்க கண்காணிப்பு நிலையம் மற்றும் புளூமெண்டல் சரக்கு போக்குவரத்துப் பூங்கா காணி கையகப்படுத்தல் செயல்முறை மற்றும் ஆரம்ப ஆயத்தப் பணிகளுக்காக 500 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளது. இந்தச் சந்தர்ப்பத்தில் இன்னொரு விடயத்தை ஞாபகப்படுத்த விரும்புகின்றேன். அதாவது, NLDBக்குச் சொந்தமான தோட்டங்கள், Ridiyagama Farm போன்றவற்றை ஹரி ஜயவர்த்தனா அவர்கள் விற்பதற்கு முடிவு செய்திருந்தார். இன்று எமது அரசாங்கம் ஆட்சியில் இல்லாது இருந்திருந்தால், அவர் அவற்றை விற்றிருப்பார் என்பதை நான் இங்கு கூறிக்கொள்ள விரும்புகின்றேன்.

கம்பளை நகரமானது, வெளிநாட்டு சுற்றுலாப் பயணிகள் வந்துசெல்லக்கூடிய ஒரு முக்கிய இடமாக இருக்கின்றது. எதிர்காலத்தில் நாங்கள் கம்பளை நகரத்தில் tourist hotels, spice gardens மற்றும் தேவையான அனைத்து வேலைத்திட்டங்களையும் மேற்கொள்வதற்கு இந்த அரசாங்கத்தின்மூலம் பாரிய முயற்சிகளை எடுக்கவுள்ளோம். இனிவரும் காலங்களில் எங்களுடைய மாண்புமிகு சனாதிபதி அவர்கள் கம்பளைக்கு கூடுதலான நிதியை ஒதுக்கி, அங்கு அபிவிருத்தி வேலைகளைச் செய்து தருவாரென நாங்கள் எதிர்பார்க்கின்றோம்.

மேலும், அத்தியாவசிய அரசாங்கத்துறைப் பதவிகளுக்கு 30,000 பேரை ஆட்சேர்ப்புச் செய்யவும் எமது அரசாங்கம் தீர்மானித்துள்ளது. அரச உத்தியோகத்தர்களின் வாழ்வாதாரத்தை மேம்படுத்தும் நோக்கில், அவர்களுடைய சம்பளத்தை உயர்த்திக்கொடுத்து, அவர்களின் வாழ்க்கையில் சுபிட்சம் ஏற்பட வழிசெய்துள்ளது. கொழும்பு - கண்டி அதிவேகப் பாதை நிர்மாணப் பணியின் ரம்புக்கனை வரையான பாதை நிர்மாணிப்புக்கு நிதி ஒதுக்கியுள்ளமை கண்டி வாழ் மக்களின் பொருளாதாரத்தில் பெரும் எழுச்சியை ஏற்படுத்தும் என்பதில் ஐயமில்லை என்பதை நான் கண்டி மாவட்ட மக்கள் பிரதிநிதி என்ற வகையில் கூறுகின்றேன். இந்த வரவு செலவுத்திட்டத்தில் நகர அபிவிருத்திக்காகப் பெருமளவு நிதி ஒதுக்கப்பட்டுள்ளமை முக்கியமானதொரு விடயமாக உள்ளது.

ඒ වාගේම මම මේ කාරණයත් කියන්න කැමැතියි. ගම්පොළ නගරය කියන්නේ විශේෂ නගරයක්. සංචාරකයන් විශාල ප්‍රමාණයක් එන ප්‍රදේශයක් වන ගම්පොළ නගරයේ ටොයිලට් එකක් නැති තත්ත්වයක් තමයි තිබුණේ. අපි ඉදිරියේ දී එහි spice gardens, ඒ වාගේම tourist hotels හදන්න බලාපොරොත්තු වෙනවා. අම්බුළුවාව කියන්නේ ලංකාවේ සුවිශේෂ ස්ථානයක්. අපි ඉදිරි කාලයේදී ඒ තැන්වල සියලු සංවර්ධන වැඩකටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. ගම්පොළ ඉඳලා නුවරඑළියට කිලෝ මීටර් 50ක දුරක් තිබෙනවා. ගම්පොළ නගරයේ ඉඳලා පුස්සැල්ලාව නගරයට යනකල් අපේ සහෝදර දෙමළ ජනතාව ජීවත් වෙනවා. ඒ ලස්සන ප්‍රදේශය ඉදිරි කාලයේදී සියලු පහසුකම් සහිත ප්‍රදේශයක් බවට පත් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒකට අපේ ඇමතිවරුන්ගෙනුත්, මේ රජයෙනුත් අපි උදවු උපකාර බලාපොරොත්තු වෙනවා. ඔබතුමන්ලා දන්නවා, ගම්පොළ නගරය කියන්නේ අගමැති කෙනෙක් හිටපු නගරයක් බව. අගමැති කෙනෙක් හිටපු නගරයක් වුණත් දොළුව ප්‍රදේශයේ ගෙවල්වලට තවම වතුර නැතුව ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. අපි ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ගම්පොළ ප්‍රදේශයට ලොකු වතුර ව්‍යාපෘතියක් ලබා දෙන ලෙස. ඒ වාගේම ඉඩම් ප්‍රශ්න තිබෙනවා. ලැයිම්වල ජීවත්වන ජනතාව බලන්න මම හුඟක් තැන්වලට ගිහිල්ලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු ෆස්මින් ෂරීෆ් මහතා**
(மாண்புமிகு பஸ்மின் ஷரீப்)
(The Hon. Fasmin Sharif)
වතුවල ටොයිලට් සම්බන්ධව ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. ඒ වාගේම බඹරු ගහලා ගම්පොළ ප්‍රදේශයේ පුස්සැල්ලාවේ මෑතකදී එක් අයෙකුගේ ජීවිතය නැති වුණා. ඊට කලින්, වයස අවුරුදු අටක ළමයකුගේ ජීවිතය නැති වුණා. ඒ ගැටලු විසඳා ගැනීමටත් මේ රජයෙන් අපට උදවු කරන්න කියලා ඉල්ලමින්, මට මේ අවස්ථාව ලබා දීපු මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට බොහොම ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි විසිදෙකක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.16]

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවුරුදු කිහිපයකට පස්සේ තමයි මට පාර්ලිමේන්තුවේදී නැවත කථා කරන්න අවස්ථාව ලැබෙන්නේ. මේ, ජනතා විමුක්ති පෙරමුණේ සහ මාලිමාවේ මංගල අය වැය. මා ප්‍රථමයෙන්ම ජනාධිපතිවරයාට සුබ පතනවා. ඒ වාගේම අපේ පරණ මිත්‍රයන් වන බිමල් රත්නායක මැතිතුමා, හඳුන්නෙත්ති මැතිතුමා, විජිත හේරත් මැතිතුමා අද ඇමතිවරු

බවට පත් වෙලා ඉන්නවා. ඒ ගැන සන්තෝෂයි. ඒ වාගේම අනෙකුත් ඇමතිවරු ඉන්නවා. මන්ත්‍රීවරුන් 159ක තුනෙන් දෙකක බලයක් ලබා ගැනීමට ඔබතුමන්ලාට හැකියාව ලැබුණා. පාර්ලිමේන්තුවට පැමිණි ඒ සියලු මන්ත්‍රීවරුන්ට මා සුබ පතනවා. අපේ රටට හොඳ අනාගතයක් උරුම කරන්නට වාසනාව ලැබෙන්න කියලා ඒ ගොල්ලන්ට සුබ ප්‍රාර්ථනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය ගැන කථා කරන කොට මම මුලින්ම මේ කාරණය කියන්න ඕනෑ. මම පාර්ලිමේන්තුවේ මීට කලින් සිටි කාලයේ -මා ඇමතිවරයකු වශයෙන් කටයුතු කළ කාලයේ- ජනතා විමුක්ති පෙරමුණත් එක්ක ඉතා ළඟින් කටයුතු කළා. මම ඇමතිවරයකු වශයෙන් කටයුතු කරන කොට කවදාවත් මගේ අමාත්‍යාංශ සම්බන්ධයෙන්, මගේ කල්ක්‍රියාව සම්බන්ධයෙන් කිසිම වෙලාවක ඒ මන්ත්‍රීවරු විවේචනයක් ඉදිරිපත් කළේ නැහැ. මම අභියෝග කරනවා, එහෙම කරලා තිබෙනවා නම් හැන්සාඩ් වාර්තාවෙන් ඒක පෙන්වන්න කියලා. විරුද්ධ පක්ෂයේ ඕනෑම මන්ත්‍රීවරයෙක් ආණ්ඩුවේ ඇමතිවරුන්ට චෝදනා ඉදිරිපත් කරනවා. හැබැයි, මට විරුද්ධව කිසිම චෝදනාවක් ඒ අවුරුදු ගණන තුළ ඒ මන්ත්‍රීවරු ඉදිරිපත් කළේ නැහැ. ඒකේ ප්‍රශංසාව මා එතුමන්ලාට දෙනවා. ඒ වාගේම මේ පාර්ලිමේන්තුව තුළදී අවශ්‍ය තැන්වල පමණක් ඒ ආකාරයෙන්ම සාධනීය ලෙස එතුමන්ලා විවේචනය කරන්නත්, හොඳ දෙයක් වෙනවා නම් ඒ හොඳ කියන්නත් මම බලාපෙරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඡන්දය කාලයේ ඡන්ද බිමේ හැසිරෙන්නේ කොහොමද කියන එක ගැන මට හොඳට තේරෙනවා. පසුගිය අගෝස්තු මාසයේ ඉඳලා ජනතා විමුක්ති පෙරමුණ ටිකින් ටික ජනතාවට ළං වෙන්න පටන් ගත්තා. විශේෂයෙන් අනුර දිසානායක මැතිතුමා ඒ ඡන්ද ව්‍යාපාරයේදී ජනතාව අතරට ආවා. ඒ මන්ත්‍රීවරු ගොඩක් කථා කළා, දූෂණය ගැන. විශේෂයෙන්ම රාජපක්ෂ යුගයේ දූෂණ ගැන විශාල ලෙස කථා කරපු පුද්ගලයෙක් තමයි, මම. ඔවුන්ගේ කාලයේ දූෂණය ඉහවහා ගිහිල්ලා තිබුණා. රට බංකොලොත් වෙන තරමට ඒ පාලනය මේ රටේ අනාගතය විනාශ කරලා දැම්මා. ජනතා විමුක්ති පෙරමුණේ නායකතුමා -අනුර දිසානායක මැතිතුමා- ඒ තත්ත්වය හොඳට පාවිච්චි කළා.

මම ඒක දැක්කා. සාමාන්‍යයෙන් ජනතා විමුක්ති පෙරමුණේ සහෝදරයෝ දේශපාලන වශයෙන් මට පහර ගහනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි එතුමන්ලා පරාජය කරන්න මම උත්සාහ කළේ, ඒ අයගේ පවුල්, ඒ අයගේ පෞද්ගලික ජීවිතය, එහෙම නැත්නම් 88-89 කාලය ගැනවත් කියලා නොවෙයි, ඒ අයගේ නොහැකියාව සම්බන්ධව කියලායි. ආණ්ඩුවක් භාර ගත්තොත් ඒ ආණ්ඩුවට රට දියුණු කරන්න අවශ්‍ය ශක්තිය, දක්ෂතාව සහ පළපුරුද්ද අවශ්‍ය බව සහ ඔවුන්ට එය නැති වීම පිළිබඳවයි මම කථා කළේ. මම මේ මාස ගණනම නිහඬව හිටියා. මොකද මම එතුමන්ලාට සාධාරණ අවස්ථාවක් ලබා දුන්නා, රටේ දියුණුවක් පෙන්වන්න.

නමුත්, කියන්න කනගාටුයි. මේ අය වැය දැක්කා නම් රෝහණ විජේවීර මැතිතුමා අඬයිද, නැත්නම් හිනාවෙයිද කියන ප්‍රශ්නය අපට තිබෙනවා. සෝමවංශ අමරසිංහ මැතිතුමාගේ කථා අසා තිබෙන නිසා මම දන්නවා, මේ අය වැය දැක්කා නම්, එතුමා අනිවාර්යයෙන්ම මේ ගැන කනගාටු වන බව. මොකද, ජනතා විමුක්ති පෙරමුණ -මාලිමා ආණ්ඩුව- කෙළින්ම ලොකු විපර්යාසයක් ඔවුන්ගේ දේශපාලන දර්ශනයේ ඇති කරගෙන තිබෙනවා. ඒක U-turn එකකට වැඩිය V-turn එකක් වාගේ ලොකු විපර්යාසයක්. ඒ ගැන මම සන්තෝෂ වෙනවා. මොකද, අපේ සමහර ගරු මන්ත්‍රීවරු කිව්වා වාගේම එය සාධනීය තත්ත්වයක්. ඉදිරියේදී මේ රට දියුණු කරන්න පුළුවන් වපසරිය මේකෙන් හැදෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. මොකද, ඉතිහාසය තුළම මේ රටේ සංවර්ධනයට ජනතා විමුක්ති පෙරමුණ බාධා කළා. විශේෂයෙන්ම පෞද්ගලීකරණය, විවෘත ආර්ථිකය, ලිබරල්වාදය යනාදියට විශාල ලෙස පහර ගැහුවේ ජනතා විමුක්ති පෙරමුණේ නායකයා. අපි විජේවීර සහෝදරයාගේ කථා අසා තිබෙනවා. එකවරක් එතුමා එක හෙළාම කිව්වා, ඔවුන් අනුගමනය කළ සමාජවාදී, මාක්ස්වාදී දර්ශනය අත හැරියොත් ඒක පාවාදීමක් කියලා. එම පාවාදීම පක්ෂයට හොඳ නොවුණත්, මම හිතන හැටියට එම වෙනස් වීම අපේ රටට නම් ඉතාම සාධනීය තත්ත්වයක්. එතුමන්ලා විපක්ෂයට ගිය දවසක වුණත්, දූෂණයෙන් තොරව, හරියට ආණ්ඩුවක් කරන දක්ෂ කණ්ඩායමකට නැවත මේ රට හදන්න පුළුවන් වපසරිය මේ වෙනකොට ඇති වෙලා තිබෙනවා.

මම දැක්කා මේ මන්ත්‍රීවරු ගොඩක් වෙලාවට කියන්න හදනවා, මේ තත්ත්වයට වග කියන්න ඕනෑ පසුගිය රජයන්, පසුගිය පාලකයන් කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි එතුමන්ලාට අමතක වනවා, ඒ සියලු පාලකයන්ට ජනතා විමුක්ති පෙරමුණ එක හෙළා සහයෝගය ලබා දුන් බව. චන්ද්‍රිකා කුමාරතුංගට අපි සහයෝගය දුන්නේ නැහැ. මහින්ද රාජපක්ෂ යම් විනාශයක් කළා නම්, හොරකම් කළා නම්, දූෂණ කළා නම්, එතුමාගේ පවුලේ උදවිය සහ සගයන් යම් විනාශයක් කළා නම්, ඒකට කෙළින්ම මේ මන්ත්‍රීවරුත් වගකියන්න ඕනෑ. මේ වෙලාවේ ගරු බිමල් රත්නායක සහෝදර ඇමතිතුමා හිටියා නම් මම සන්තෝෂ වනවා. Facebook එක බලනකොට මම දැක්කා, එතුමා ඉතා තරුණ කාලයේ මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ගුණ, ඒ ආණ්ඩුවේ ගුණ වර්ණනා කර තිබෙනවා. එහෙම නම් එතුමන්ලාට බැහැ, අපට අත දික් කරන්න හෝ ඇඟිල්ල දික් කරන්න. චන්ද්‍රිකා කුමාරතුංග, මහින්ද රාජපක්ෂ, මෛත්‍රීපාල සිරිසේන හිටපු ජනාධිපතිවරුන්ගේ කාලවල තිබුණු සියලු ආණ්ඩුවලටත්, ෆොන්සේකාටත් ජනතා විමුක්ති පෙරමුණ කෙළින්ම සහයෝගය දීලා තිබෙනවා. නමුත් අපි ඒ ආණ්ඩුවල හිටියේ නැහැ. අවුරුදු 20ක ඒ පාලන කාලයේ රටේ ව්‍යසනයක් වුණා නම්, ඒ ආණ්ඩුවල අපි හිටියේ නැහැ.

ජේ.ආර්. ජයවර්ධන, ඩී.එස්. සේනානායක, ඩඩ්ලි සේනානායක, ජෝන් කොතලාවල, ගාමිණී දිසානායක කියන අපේ නායකයෝ සියලුදෙනා ගැන අපි ඉතා ආඩම්බර වනවා. ඒ කාලයේ කරපු සංවර්ධන කටයුතු තමයි අදටත් පවතින්නේ. මේ ආණ්ඩුව යම් සංවර්ධනයක් කරන්න බලාපොරොත්තු වනවා නම්, ඇඟලුම් කර්මාන්තයට ඒ සහන ලබා දෙන්න කියා මම කියනවා. පසුගිය වසරේ ඇඟලුම් කාර්මාන්තයෙන් ලැබුණු ආදායම ඩොලර් බිලියන 4යි. මෙතුමන්ලාට මෙවැනි අය වැයක් ඉදිරිපත් කරන්නවත් පුළුවන් වුණේත්, අපේ නායකයෝ කරපු දේවල් නිසායි. අතීතයට බැණ බැණ, මේ අය වැය ඉදිරිපත් කළත් ඔබතුමන්ලාට අය වැය ඉදිරිපත් කරන්න ඩොලර් බිලියන 4ක් ලබා ලැබෙන්නේ අපේ නායකයෝ කරපු සංවර්ධනය නිසායි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මහවැලි ව්‍යාපාරය ගන්න. අපේ නායකයෝ 80 දශකයේ තමයි එම කාර්යභාරය කළේ. මෙච්චර කල් ගිහිල්ලාත් ලංකාවට අවශ්‍ය විදුලි බලයෙන් තවමත් සියයට 50කට වැඩිය උත්පාදනය කරන්නේ මහවැලියෙන්. එහි වටිනාකම ගණනය කළොත් ඩොලර් බිලියන 10කට ආසන්න වෙයි. ඒ නිසා මම හිතන හැටියට ජනතා විමුක්ති පෙරමුණේ නායකයා වන ජනාධිපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුන් තුළ ඒ කුහකත්වය නැති වෙන්න ඕනෑ. අන්න, ඒ මිනිසුන් හොඳ දෙයක් කළා කියලා කියන්න පුළුවන් වෙන්න ඕනෑ. ජනතා විමුක්ති පෙරමුණ දූෂණයට විරුද්ධව සටන් කිරීම ගැන අපි සන්තෝෂයි. දූෂණය පැත්තෙන් ගත්තොත් ඔවුන්ට

[ගරු අර්ජුන සුජීව සේනසිංහ මහතා]

කාලයක් තිබුණේ නැහැ, දූෂණ කරන්න සහ යම් දෙයකට දායක වෙන්න. හැබැයි මේ මාස 5 තුළ නම් අපට දකින්න පුළුවන් වුණා, විශේෂයෙන්ම කන්ටේනර් තුන්සිය ගණනක් මුදා හැරීම, Technical Evaluation Committee එකෙන් reject කරපු සමාගමකට මෙගාවොට් 50ක් ලබා ගත හැකි සූර්‍ය විදුලි බලාගාර ව්‍යාපෘතියකට අවසර දෙන එක. ඒවා ගැන අපි ඉදිරියේදී කථා කරමු. මම මේ කථා කරන්න පටන් ගත්තා විතරයි. ඒ අවස්ථාව අපි ලබා දෙනවා ජනතාව විමුක්ති පෙරමුණට; මාලිමා ආණ්ඩුවට. දූෂණ සම්බන්ධයෙන් එතුමන්ලාගේ කල් ක්‍රියාව යම් ආකාරයකින් අපි පැසසුමට ලක් කරනවා. අපි කුහක වෙන්නේ නැහැ, හොඳ දෙයට හොඳයි කියන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනතා විමුක්ති පෙරමුණ මේ කාලය තුළ වෙනස් වෙලා කියලා හඳුන්නෙත්ති මැතිතුමා කියනවා මම දැක්කා. ඔබතුමන්ලා අගය කරන ලිබරල්වාදය අපි වැලඳගෙන ඉන්නවා, ඒ අනුව තමයි අපි මේ අය වැය ඉදිරිපත් කරන්නේ කියලා එතුමා කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි මම එක කරුණක් කියන්න ඕනෑ. එතුමාගේ ඒ පිළිගැනීම සම්බන්ධයෙන් අපි සන්තෝෂ වෙනවා. හැබැයි, එකක් තිබෙනවා. එතුමා අහනවා, හර්ෂ, සුජීව ඇතුළු ඔබතුමන්ලා ඇයි මේ අය වයට විරුද්ධ වෙන්නේ, එහෙම නම් මේ අය වැයට සහයෝගය දෙන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ කාරණය හිතේ තියාගන්න ඕනෑ. සාමාන්‍යයෙන් සුද්දෝ සූට් අඳිනවා. සුද්දා තමයි සූට් අඳින්න පටන් ගත්තේ. ඔවුන්ගේ බෙල්ල දිගයි. මම හිතන විධියට shoulder එකත් අඟල් 40ක් විතර තිබෙනවා, ඉණ සාමාන්‍යයෙන් අඟල් 28ක් විතර තිබෙනවා. සුද්දන්ට සූට් එක ඇන්දාම ලස්සනයි. සුද්දෝ ඇන්දාට පස්සේ තමයි අපිත් සූට් එක අඳින්න පටන් ගත්තේ. හැබැයි, අපට මේ සූට් එක එච්චරම ලස්සන නැහැ. මොකද, අපේ ඉණ අඟල් 40ක් විතර වෙනවා, shoulder එක අඟල් 25ක් විතර වෙනවා. ඒ නිසා අපට ඒ සූට් එක ගැළපෙන්නේ නැහැ. හැබැයි, අපි ඒ සූට් එක ඇඳගෙන ඉන්නවා.

ඒ වාගේම තමයි මේ විවෘත ආර්ථිකයත්, ලිබරල් ආර්ථිකයත්. මෙතුමන්ලා ඒක ඇඳ ගත්තාට මෙතමන්ලාට ඒක ලස්සන නැහැ. ඒක අපේ ඇඳුම. ජේ.ආර්. ජයවර්ධන මහත්මයලා ඒක ගෙනාවේ. ඊට පස්සේ චන්ද්‍රිකාලා ඒකට මඩ ගැහුවා. රාජපක්ෂලා ඒකට මඩ ගැහුවා. හැබැයි, අද ලෝකයම ලිබරල් ආර්ථිකය පිළිගෙන තිබෙනවා. මම දැක්කා ලාල් කාන්ත ඇමතිතුමා කියනවා, මේක මාක්ස්වාදය නොවෙයි, මේක ලිබරල්වාදය නොවෙයි, අපි ආණ්ඩුවේ සහයෝගය ඇතිව සාධනීය ලෙස මේ විවෘත ආර්ථිකය සම්බන්ධයෙන් කටයුතු කරනවා කියලා. චන්ද්‍රිකාත් ආවේ ඔහොමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ ලෝකයේ ඔක්කෝම රටවල ක්‍රියාත්මක වෙන්නේ මේ විවෘත ආර්ථිකය. ඉන්දියාව, චීනය, රුසියාව යන සියලු රටවල් ක්‍රියාත්මක කරන්නේ, මඩේ දදා හෝද හෝදා ක්‍රියාත්මක කරන්නේ විවෘත ආර්ථිකය. හැම රටකම ඒ සඳහා රජයේ මැදිහත්වීමක් තිබෙනවා. අපි ඉතිහාසය දිහා බැලුවොත්, චන්ද්‍රිකා කුමාරතුංග, මහින්ද රාජපක්ෂ, ගෝඨාභය රාජපක්ෂ කියන ඔය හැමෝම මේ ක්‍රමය වෙනස් කළේ නැහැ.

හැබැයි, අපි කරපු දේ කරන්න බැරි වුණා. අපි ඉතා සුළු කාලයක් තුළ මහවැලිය, ඇඟලුම් කර්මාන්තය දියුණු කළා. ඒ, යුද්ධ දෙකක් රටේ තිබියදී. විශේෂයෙන්ම ජනතා විමුක්ති පෙරමුණ ඒ කාලය තුළ කරපු විනාශය බලන්න. මම ඉතිහාසය කථා කරන්න කැමැති නැහැ. හැබැයි, ආර්ථිකය ගැන කථා කරපු නිසායි මම මේක කියන්නේ. ඒ විනාශය ඩොලර් බිලියන 150කට වැඩියි. එදා private medical collages නැවැත්වුවා. පෞද්ගලික විශ්වවිද්‍යාල නැවැත්වුවා. පෞද්ගලික රෝහල් නැවැත්වුවා. සියලු සංවර්ධන ව්‍යාපෘතිවලට, විදේශ රටවල් සමඟ කරපු ආයෝජනවලට විරුද්ධ වුණා. ඒ වාගේම විශාල ව්‍යසනයක් ඇති වුණා; ජන ජීවිත නැති වුණා; දේපළ විනාශ වුණා. ඒ විනාශය විතරක් ගණන් හැදුවොත් කොපමණද? LTTE සංවිධානය කළ විනාශය ඩොලර් බිලියන 250කට ආසන්නයි කියලා ගණන් හදලා තිබෙනවා. ඒ වාගේම ජනතා විමුක්ති පෙරමුණේ විනාශයත් ඩොලර් බිලියන 150කට ආසන්නයි කියලා ගණන් හදලා තිබෙනවා. එතකොට අපි සාධාරණ වෙන්න ඕනෑ. අපි මේ දේවල් විවේචනය කළාට අපි අතිනුත් වැරැදි වෙලා තිබෙන්න පුළුවන්.

ජේ.ආර්. ජයවර්ධන මහත්මයා පිළිබඳ මට විවේචනයක් තිබෙනවා. එතුමා සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ප්‍රජා අයිතිය අහෝසි කළ එකට මම විරුද්ධයි. එතුමාගේ කළගෙඩි-ලාම්පු සෙල්ලමටත් -ජන මත විචාරණයට- අපි විරුද්ධයි. හැබැයි, එතුමා කරලා තිබෙන කාර්යභාරය කොතරම්ද? එතුමාට "ජේ.ආර්.ගේ ආර්ථිකය" කිය කියා බණිනවා. ජේ.ආර්. තමයි මේ විවෘත ආර්ථික ක්‍රමය ආරම්භ කළේ. චීනය, සිංගප්පූරුව වැනි රටවල් ජේ.ආර්. දිහා බලලා තමයි ඒ විවෘත ආර්ථිකය ගැන ඉගෙන ගත්තේ. ඒ මහත්වරු නියම මහත්වරු, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. තමුන්ගේ දේපළ -වෝඩ් පෙදෙසේ තිබුණු පර්චස් 80ක් වාගේ ප්‍රමාණයක්- පවා ජනතාවට පරිත්‍යාග කරලායි අපේ නායකයෝ ගියේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රනිල් වික්‍රමසිංහ මහත්මයා සම්බන්ධව අපට වෙනම සිද්ධියක් තිබෙනවා. අපට සැහෙන විනාශයක් වුණා, අවුරුදු 35ක් තුළ. ඒක ගැන අපි කනගාටු වෙනවා. නමුත් එතුමා හොඳ දේවල් කරලා තිබෙනවා. මේ ආර්ථිකය තුළ ඔබතුමන්ලාට මේ අය වැය ඉදිරිපත් කරගන්න පවා එතුමා යම් කාර්යභාරයක් කරලා තිබෙනවා. බංකොලොත්භාවයෙන් එළියට ආපු රටවල් අතරින් අපි ලෝකයේ ප්‍රධාන රටක්. ඒ ගෞරවය එතුමාට යන්න ඕනෑ. හැබැයි, හොරකම් සම්බන්ධයෙන් සහ අනෙක් දූෂණ සම්බන්ධයෙන් එතුමාට ගොඩක් විවේචන පටබැඳිලා තිබෙනවා, රාජපක්ෂවරු එක්ක එකතු වීම තුළින්. අපි කෙළින් කථා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සජිත් ප්‍රේමදාස මහත්මයා කියන්නේ හොරෙක් නොවෙයි. සජිත් ප්‍රේමදාස මහත්මයා දක්ෂයෙක්; තරුණයෙක්. එතුමාගේ කණ්ඩායම බැලුවොත්, ඉතා දක්ෂ කණ්ඩායමක්. ඔබතුමන්ලා හැම වෙලාවෙම ඇඟිල්ල දිගු කරන්නේ විපක්ෂය කියලායි. රාජපක්ෂවරුන්ගේ යුගය ගැන අපට ඇඟිල්ල දිගු කරන්න එපා. ඒවාට විරුද්ධව ජනතා විමුක්ති පෙරමුණේ නායකයන් එක්ක එකතුව සටන් කළේ අපි. අජිත්ලා, අපි, මේ මන්ත්‍රීවරු -අපි ඔක්කෝම-ඒ කාලයේ සටන් කළා. ඒ හින්දා ඔබතුමන්ලා කථා කරද්දි ඔක්කෝම එකට දමන්නේ නැතිව සාධාරණ ලෙස ඒ දේවල් කියන්න ඕනෑ. යම් චෝදනාවක් තිබෙනවා නම්, අපි උත්තර දෙන්න සූදානම්. හැබැයි ඒ දූෂණවලට සම්බන්ධ පුද්ගලයන් කවුද කියලා ඔබතුමන්ලා අවබෝධ කර ගන්න. අපේ පක්ෂය වන සමගි ජන බලවේගය අපි හදලා තිබෙන්නේ, පිරිසිදු, වැඩක් කරන්න පුළුවන්, දක්ෂතා තිබෙන, පළපුරුද්ද තිබෙන කණ්ඩායමක් විධියට.

මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා රාජ්‍ය සේවක වැටුප ගැන සඳහන් කළා. මම කෙළින්ම කියන්නම්, අය වැයේ තිබෙන රාජ්‍ය සේවක වැටුප ගැන. මම ඒ වැටුප් වැඩි වීම ගණනය කළා. නියෝජ්‍ය ඇමතිතුමනි, මට ලැබිලා තිබෙන දත්ත අනුව Primary Level-unskilled සඳහා වැඩි වෙන්නේ රුපියල් 5,900යි. 2025 වර්ෂය ඉවර වෙනකොට Management Assistant MN-1 ශ්‍රේණියට වැඩි වෙන්නේ රුපියල් 6,777යි.

Associate officerලාට වැඩි වෙන්නේ රුපියල් 7,700යි. ඒ වාගේම nursesලාට වැඩි වෙන්නේ රුපියල් 7,900යි. මේ ආකාරයෙන් රුපියල් 5,000, 6,000, 7,000 ගණන්වලින් වැටුප් වැඩි වෙනවා. අවුරුදු 3ක් යනකොට - 2028ට විතර ළඟා වෙනකොට - තව රුපියල් 8,000ක් විතර වැඩි වෙන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි, අපි භාණ්ඩවල මිල ගණන් අරගෙන බලමු. මේ ආණ්ඩුව බලාපොරොත්තු වෙනවා, සියයට 5ක උද්ධමනයක්. හැබැයි, සියයට 5 උද්ධමනය සියයට 15කට, 20කට වැඩි වෙනවා, අවුරුදු 3කින්. මේ භාණ්ඩ මිල ගණන් දිහා බැලුවාම ඔබතුමන්ලාට ඒක පෙනේවි. මේ රටේ දුප්පත් ජනතාව වෙනුවෙන් තමයි ජනතා විමුක්ති පෙරමුණ කථා කළේ. හැබැයි, දුප්පත් ජනතාවත් එක්ක අපේ තමයි ඒ සහෝදරත්වය තිබෙන්නේ. මම දැක්කා, නියෝජ්‍ය ඇමතිවරයෙක් ඩ්‍රයිවර් මහත්තයාට බුරුවා කියලා කථා කරනවා. ඇවිල්ලා බලන්න, අපිත් එක්ක වැඩ කරන අපේ සගයන් ගැන. ඒගොල්ලන් කෑවාට පසුව තමයි අපි කන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා ඔය කථා කරන මිනිස්සු දුප්පත් ජනතාව වෙනුවෙන් කඳුළු හෙළුවාට ඒක ඒ අයගේ බොක්කේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මේ අය වැය හදනකොටත් අනුර කුමාර ජනාධිපතිතුමා ලොකු යූ ටර්න් එකක් ගසා තිබෙනවා. එතුමාටත් අමතක වෙලා තිබෙනවා, මේ දුප්පත් ජනතාව. මේ දුප්පත් ජනතාව කන්නේ, බොන්නේ කොහොමද කියලා පොඩ්ඩක් හිතා බලන්න. එතුමන්ලා කියපු බොරු තොගය මම පෙන්වන්නම්. ඔබතුමාට පෙන්වන්නම්, රටට දුන් පොරොන්දු ප්‍රමාණය. 2019දී පරිප්පු කිලෝවක මිල රුපියල් 147යි; දැන් රුපියල් 349යි; 2025 අග වෙනකොට සියයට 5 උද්ධමනයත් එක්ක පරිප්පු කිලෝවක මිල රුපියල් 366ට ඉහළ යනවා. පාන් පිටි කිලෝවක මිල 2019දී රුපියල් 91යි; දැන් රුපියල් 183යි; සියයට 5 උද්ධමනයත් එක්ක 2025දී රුපියල් 192ට ඉහළ යනවා; 2028 වෙනකොට රුපියල් 230ක් වෙනවා. සීනි කිලෝවක් 2019දී රුපියල් 105යි; දැන් රුපියල් 289යි; ඊළඟ අවුරුද්දේ රුපියල් 303ක් වෙනවා; 2028දී රුපියල් 355ක් වෙනවා. සම්බා සහල් කිලෝවක් රුපියල් 100යි, ඒ කාලයේ; අද රුපියල් 265යි; එන අවුරුද්දේ රුපියල් 278යි; අවුරුදු 3කින් රුපියල් 330යි. මම මේ වාගේ භාණ්ඩ වර්ග 10ක විතර මිල ගණන් බැලුවා. මෙම ලේඛනය මම සභාගත කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ කාලයේ මේ භාණ්ඩ ඔක්කෝම මිලදී ගන්න වැය වුණේ රුපියල් 2,900යි. නමුත් මේ අවුරුද්දේ ඒ සඳහා වැය වෙනවා, රුපියල් 6,719ක්. 2028 වෙනකොට වැය වෙනවා, රුපියල් 7,918ක්. ඒ කියන්නේ මේ අවුරුද්දට වඩා 2028 වෙනකොට රුපියල් 2,000කට ආසන්න මුදලක් වැය වෙනවා, මේ භාණ්ඩ ප්‍රමාණයට විතරක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එතකොට පඩි වැඩි කළත් ඒ උද්ධමනයත් එක්ක බැලුවාම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ජනතාවට ජීවත් වෙන්න බැරි තත්ත්වයක් ඇති වෙනවා. මම හිතන විධියට ජනාධිපතිතුමා ඒක හොඳින් අවබෝධ කර ගත්තා.

එතුමා කියනවා, "ආර්ථික අතින් ඉතා අධික ලෙස පහතට වැටීම නිසා රටේ ජනතාව දිළිඳුකමට පත්වී තිබෙනවා, ඒක නවත්වා ගන්නයි අපි උත්සාහ කරන්නේ." කියලා. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වැටී ඉන්න තැනින් ඒ අය උඩට ගන්න දෙයක් ගැන එතුමන්ලා විශ්ලේෂණය කරන්නේ නැහැ. මොකද, ඒක කරගන්න බැහැ; ඒ හැකියාව නැහැ. විශේෂයෙන්ම සංවර්ධනය පිළිබඳව කථා කළොත් සංවර්ධනය නිෂ්පාදන ක්‍රියාවලියට ඇතුළත් වෙන්න කිසිම දෙයක්,-

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමාවෙලා කියන්න, මට තව විනාඩි කීයක් තිබෙනවාද කියා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි පහයි තිබෙන්නේ.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

තව ගොඩක් කාරණා ගැන කියන්න තිබුණත් මට ඒවා කියන්න අවස්ථාව ලැබෙන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මේ අවුරුද්ද අවසන් වෙනකොට ඩොලර් බිලියන 5කට ආසන්න ප්‍රමාණයක් ණය ගෙවන්න සිදු වෙනවා. එතකොට මේ අය වැය අතිරික්තයෙන් ඩොලර් බිලියන 7 ½ක් වාගේ ප්‍රමාණයක්,- ඩොලර් බිලියන 12 ½ක් ඔබතුමන්ලා හොයන්නේ කොහොමද? කිසිම තැනක සඳහන් කරලා නැහැ, කර්මාන්ත පටන් ගන්නේ කොහේද කියලා. මම ඔබතුමාට සැලැස්මක් පෙන්වන්නම්. ගරු අජිත් පී. පෙරේරා මැතිතුමාත් මේ ගරු සභාවේ ඉන්නවා. අපි එකතු වෙලා ඔබතුමන්ලාට උදවු කරන්නම්. අපි කුහක වෙන්නේ නැහැ.

මමත්, අජිත් පී. පෙරේරා මහත්මයාත් එකතු වෙලා තමයි මිල්ලනිය ප්‍රදේශයේ industrial zone එකක් පටන් ගැනීමට කටයුතු ආරම්භ කළේ. මේ සඳහා ඩොලර් මිලියන 500ක් ආයෝජනය කළා, රෝජනා සමාගම. මලික් සමරවික්‍රම මහත්මයායි, රනිල් වික්‍රමසිංහ මහත්මයායි අපට ඒක කරන්න ඉඩ දුන්නේ නැහැ. හැබැයි, අපි ගේට්ටුවටම හඳලා ඉවරයි. කර්මාන්ත 200කට අවශ්‍ය ඉඩමත් වෙන් කරලා. ඒ වෙනුවෙන් මම ගරු ගයන්ත කරුණාතිලක මහත්මයාට ස්තුතිවන්ත වෙනවා. මොකද, මාසයකින් මට ඒ ඉඩම වෙන් කර දුන්නා. මට කිව්වා, ඉඩම වෙන් කරගන්න - divest කරගන්න - අවුරුදු 2ක් යනවා කියලා ධම්මික පෙරේරාගෙනුයි, දම්රෝ ආයතනයෙනුයි. නමුත් ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා මට "දැන් එන්න මල්ලී" කියලා ඒ කටයුත්ත කරලා දුන්නා. ඒ අනුව මාසයක් ඇතුළත අපි ඒ ඉඩම වෙන් කර ගත්තා. අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා ගිහිල්ලා ගමේ කට්ටියට කථා කරලා ඒ පැත්ත ෂේප් කර ගත්තා. එතැනට JVP එකෙන් ගිහින් උද්ඝෝෂණයක් පටන් ගත්තා, මම හිතන විධියට ගෙවල් එකසිය ගණනක පිරිස එක්ක. අපි ගිහිල්ලා ඒකත් ෂේප් කර ගත්තා. දැනටත් ඒ කටයුතු පිළියෙල කරලා ඉවරයි. ඒක කරන්න අපි ඔබතුමන්ලාට සහයෝගය දෙන්නම්. ඔබතුමන්ලාට මේ වාගේ සැලැස්මක් නැහැ.

මගේ අතේ මේ තිබෙන්නේ National Export Strategy of Sri Lanka කියන සැලැස්ම. මම රාජ්‍ය ඇමතිවරයා වශයෙන් සිටි කාලයේ මේ සඳහා යූරෝ මිලියන 5ක් ආධාර ලැබුණා. මේවා ණය නොවෙයි, තෑගි. ඔබතුමන්ලා දැන් plans හදන්න පටන් ගත්තොත්, ආදායමක් උපයන්න පටන් ගන්නකොට තව අවුරුදු 4ක්, 5ක් යයි. නමුත් මේ අවුරුද්ද අවසන් වෙනකොට ඩොලර් බිලියන 12ක් වැඩියෙන් හොයන්න ඕනෑ. ඊළඟ අවුරුද්ද වෙනකොට ඩොලර් බිලියන 15ක් හොයන්න ඕනෑ. 2028 වෙනකොට ඇඩුස් නැති වෙනවා, plan එකක් තිබුණේ නැත්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සියලු අමාත්‍යාංශවලට අදාළව මෙය සැලසුම් කර තිබෙනවා. මේක ක්‍රියාත්මක කිරීමට අපි උදවු කරන්නම්. අපිට කිසිම ගෙවීමක් අවශ්‍ය නැහැ. අපි ස්වේච්ඡාවෙන් ඔබතුමන්ලාට උදවු කරන්නම්, මේ රට ගොඩ දමන්න. නැත්නම් අපි ඔක්කෝම ඉවරයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොරු පොරොන්දු දීලා මේ විධියට ගියොත් මොකක්ද වෙන්නේ? ඩොලර් බිලියන 19ක් බලාපොරොත්තු වෙනවා, අපනයනවලින්. කොහොමද, එහෙම ආදායමක් ගෙනෙන්නේ? කොහෙන්ද, මේ අපනයන ආදායම එන්නේ? අවුරුදු 4ක්, 5ක් එක දිගටම ඩොලර් බිලියන 11 ½ ක් තිබෙන්නේ.

[ගරු අර්ජුන සුජීව සේනසිංහ මහතා]

ඒ, අපේ දක්ෂතාවෙන් නොවෙයි, මේ රටේ වැඩ කරන, මහන්සි වෙන ව්‍යාපාරිකයන්ගේ දක්ෂතාවෙන්. මේ ආණ්ඩුවට විශේෂ සැලසුමක් නැහැ, මේ රට දියුණු කරන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි normal විධියට කරපුවාම ව්‍යාපාරිකයෝ ඒවා දියුණු කරගෙන යනවා. ඒ සංවර්ධනය තමයි ඔය සියයට 3.4, සියයට 5 කියලා පෙන්වන්නේ. හැබැයි, අපි එකතු වෙලා මේවා සංවර්ධනය කරන්න පුළුවන් මඟකට යොමු කළොත්, මේ National Export Strategy of Sri Lanka ක්‍රියාත්මක කළොත් ප්‍රතිඵල ලබා ගන්න පුළුවන්. ඒක ක්‍රියාත්මක කරලාත් අවුරුද්දක් ගත වෙනවා, ප්‍රතිඵල ලැබෙන්න. මේ තිබෙන්නේ, හදපු සැලැස්ම. මේක හදන්නත් අවුරුදු 2ක් ගත වුණා. National Export Strategy of Sri Lanka සඳහා හාවර්ඩ් විශ්වවිද්‍යාලයෙන්, McKinsey and Company එකෙන් වාගේම European Economic Community එකෙන් විවිධ උපකාර ලැබෙනවා. European Economic Community එකෙන් තමයි අපට මේ යූරෝ මිලියන 5ක ආධාරය ලැබුණේ. ඊළඟට තිබෙනවා, Trade Information and Promotion Strategy එක. මේක පොඩ්ඩක් අලුත් කරගන්න ඕනෑ. මේක, 2022 වර්ෂයේ එක. ඊළඟට, Electrical and Electronic Components Strategy. සියලු අමාත්‍යාංශවලින් කරන්න ඕනෑ කාර්යභාරය මේකේ සඳහන් වෙනවා. හැම අමාත්‍යාංශයක්ම එකින් එකට සම්බන්ධ වෙලා, ඒ ආයතන කොහොමද වැඩ කරන්නේ, කොහොමද දියුණු කරන්නේ කියලා මේකේ සඳහන් වෙනවා.

ඊළඟට තිබෙනවා, Logistics Strategy. මේ, ඔබතුමන්ලා බලාපොරොත්තු වන සංවර්ධන ව්‍යාපෘති: Wellness Tourism Strategy, Boat Building Strategy, Information Technology Strategy. විශේෂ අධ්‍යයනයක් කරලා තමයි අපි මේ ටික ඉවර කළේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විපක්ෂයේ මන්ත්‍රීවරයකු වශයෙන් මම සජිත් ප්‍රේමදාස මහත්මයාගෙන් අවසර ඉල්ලාගෙන තමයි මේ ටික ඉදිරිපත් කළේ. එතුමා කිව්වා, "මල්ලි, මේ ටික ඔයා දෙන්න" කියලා. හැබැයි, සමහර මන්ත්‍රීවරු කිව්වා, "දෙන්න එපා. මේ අපි කරපු වැඩේ. මේක තියා ගන්න" කියලා. එතකොට අපේ නායකතුමා කිව්වා, "මේක දෙන්න. පෙන්වන්න, අපි මේ ආණ්ඩුවට සහයෝගය ලබා දෙන්න කැමැතියි, රට දියුණු කරන්න කැමැතියි" කියලා. ඒ නිසා අපි එහෙම කුහක වෙන්නේ නැහැ. හොඳ දෙයට හොඳයි කියනවා. නරක දෙයට නරකයි කියනවා.

මගේ නඩු ගැන මම මේ සභාවේදී කථා කරන්නේ නැහැ. උසාවියේදී ඒ ගැන බලා ගනිමු. හැබැයි, මට මඩ ගැහුවොත් ඉතුරු කරන්නේත් නැහැ. මම අනිවාර්යයෙන් උසාවි යනවා. මම ඕනෑම කෙනෙකුට අභියෝග කරනවා, පුළුවන් නම් මට විරුද්ධව - මම දැක්කා, එහෙන් මෙහෙන් මට විරුද්ධව පොඩි පොඩි ෂොට් ගහනවා - පුළුවන් නම්, එළියට ඇවිල්ලා මට චෝදනා කරන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කවුරු මොනවා කිව්වත් අපි පැකිළෙන්නේ නැහැ; ඇඹරෙන්නේ නැහැ. මොකද, අපි බය නම් සොහොනේ ගෙවල් හදන්නේත් නැහැ. අපි හොඳයි කියන ඕනෑම දෙයකට සහයෝගය දෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අර මිනී මරපු පුද්ගලයා අල්ලාගෙන ඉන්න අවස්ථාව love scene එකක් වාගේයි. හැබැයි, CID එකෙන් අපේ ගෙවල්වලට 10ක්, 15ක් එන්නේ යක්කු වාගේ. අපේ ගෙවල්වලට එන්නේ එහෙමයි. මගේ වාහනයේ ලයිසන් එක check කරන්න CID එකෙන් ආවා. ඒ, අවුරුදු 10කට කලින් මම transfer කරපු signature එක හරිද කියලා බලන්න. දේශපාලන වශයෙන් ඔබතුමන්ලා පළිගන්න එන්න එපා. අපේ වරදක් තිබෙනවා නම් ඒ වරද මොකක්ද කියලා ඔබතුමන්ලා කරුණු ඉදිරිපත් කරන්න. මේ වනකොට මම නඩු 4කට වඩා දාලා තිබෙනවා. Damages claim කරලා තිබෙනවා, Rs. 100 million against the Acting IGP.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඔබතුමන්ලා කරන වැඩකටයුතුවලට සහයෝගය දෙන්නම්. අපි කථා නොකර හිටියේ බයට නොවෙයි. අපි කථා නොකර හිටියේ ගරු කිරීමක් වශයෙන්. මේ ආණ්ඩුවට අපි සහයෝගය දෙන්න ඕනෑ. සහෝදරයෝ හොඳයි; හිටපු මන්ත්‍රීවරු හොඳයි. හොරකම් කරලා නැති ගොඩක් කට්ටිය මේ ආණ්ඩුවේ ඉන්නවා. ඒ අතරේ හොරකම් කරන්න පුළුවන්, ඒ look එක තිබෙන දෙදෙනෙක්, තුන්දෙනෙකුත් එහෙන් මෙහෙන් ඉන්නවා. ඒ වුණත්, ඔක්කොම ගැන හිතුවාම ඒ කට්ටියට සහයෝගයක් දෙන්න පුළුවන් හැකියාව තිබෙනවා. ඒ හින්දා කුහක වෙන්න එපා. අධ්‍යයනය කරපු මේ සියලු පොත් ටික මම දෙන්නම්. මගේ නම දාන්නත් එපා. ඔබතුමන්ලාට සහයෝගය දෙන්න අපි සූදානම්.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව වෙලාව ඕනෑද?

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
මට තව විනාඩි 2ක් දෙන්න, ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයේ කාලයෙන් තව විනාඩි 2ක් එතුමාට ලබා දෙනවා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ඔබතුමන්ලා විපක්ෂයේ කාර්යභාරය දිගටම කරන්න එපා කියායි අපි විශේෂයෙන් කියන්නේ. හිටපු ආණ්ඩු මම දැක්කා,- විශේෂයෙන්ම පොලිසිය භාර ඇමතිතුමාට කිසිම ගණනක් නැහැ. කොහේද කියලා නම් මම දන්නේ නැහැ, අදත් වෙරළක් අයිනේ වෙඩි තියලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ජාඇල.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
පොලිසිය භාර ඇමතිතුමා කියනවා, ජාතික ආරක්ෂාවට තර්ජනයක් නැහැ ලු. ජාතික ආරක්ෂාව කියන්නේ, LTTE එකෙන් ඇවිල්ලා ගහන එකට නොවෙයි. මෙහෙම දේවල් වෙන්න පුළුවන්. මොන ආණ්ඩුව තිබුණත් මෙහෙම දේවල් වෙන්න පුළුවන්. නමුත් නලින්ද ජයතිස්ස ඇමතිතුමා හරියට තේරුම් ගත්තා, මේක භයානක තත්ත්වයක් කියලා. හැබැයි, පොලිසිය භාර ඇමතිවරයා පොලිසියේ හිටපු කෙනෙකු වෙලාත් කියනවා, මේක ජාතික ආරක්ෂාවට ප්‍රශ්නයක් නොවෙයි කියලා. එහෙම කියන්නේ, STF එකේ 15ක් විතර guard කරද්දීත් කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණය ඇතුළට දවල් ඇවිල්ලා වෙඩි තියලා තිබියදී. මේක විශාල තර්ජනයක්. මන්ත්‍රීවරුන්ට මොන guard එකක්වත් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි මේ කථා කරන දේවල්වලට උරණ වන පුද්ගලයන් කොච්චර ප්‍රමාණයක් එළියේ ඉන්නවාද? ඒ නිසා අපි කථානායකතුමාට මේ

කාරණය කියනවා. මට නම් එහෙම ප්‍රශ්නයක් නැහැ. Guard එක තිබුණත් මම අරගෙන යන්නේ නැහැ. හැබැයි, guard එක අවශ්‍ය මන්ත්‍රීවරු ඉන්නවා. ඒ හින්දා විශේෂයෙන්ම අපි මේ මන්ත්‍රීවරුන්ට මතක් කර සිටිනවා, පසුගිය දේවල්. අපි දන්නවා, කාලයක් රාජපක්ෂ පාලනය තුළ විශාල වශයෙන් දූෂණ සිද්ධ වුණු බව. ඔබතුමන්ලා, අපි ඔක්කොම එකතු වෙලා ඒවාට සම්බන්ධ අයට දඬුවම් කරන්න විශාල උත්සාහයක් දැරුවා. ඒවාට විරුද්ධව තමයි අපි සටන් කළේ. හැබැයි, ඒ ගැන කියමින් මේ රට පල්ලෙහාට, අගාධයට දාලා හරි යන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මම විශේෂයෙන්ම මේ කාරණයත් සඳහන් කරනවා. සජිත් ප්‍රේමදාස මහත්තයා කියන්නේ, පිරිසිදු නායකයෙක්; වැඩක් කරන්න පුළුවන් නායකයෙක්. ඒ වාගේම එතුමා බොරු කියන්නේ නැහැ. තමුන්නාන්සේලා කියපු බොරු ලැයිස්තුව මට කියන්න බැරි වුණා, වෙලාව නැති නිසා. කියපු බොරු ටික ගත්තොත්, ජනාධිපතිතුමා ඇතුළු කණ්ඩායම කිව්වේම පව. හැම දෙයක්ම සම්බන්ධයෙන් කිව්වේ පව. ජනතාවට බොරු පොරොන්දු දුන්නා. ඒ පොරොන්දුවලට අදාළ උත්තර ඉදිරි අනාගතයේදී ජනතාවගෙන් හම්බ වෙයි.

හැබැයි, අපි කියන්න කැමැතියි වගකිව යුතු විපක්ෂයක් ලෙස අපට දක්ෂ කණ්ඩායමක් ඉන්නවා කියන එක. හොර බොරු නැහැ, කෙළින් වැඩ කරන, නිර්මාණාත්මකභාවය, දක්ෂතාව, අවබෝධය, වැඩ කරන්න පුළුවන්කම -මේ සියල්ල- තිබෙන විශාල කණ්ඩායමක් අපට ඉන්නවා; දක්ෂ කණ්ඩායමක් ඉන්නවා. අපට ඒ වෙලාවේ වෛරය, ක්‍රෝධය අවුස්සලා ඡන්දය ලබා ගන්න අවස්ථාව උදා වුණා. නමුත් අපි එහෙම කළේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉදිරි අනාගතයේදී අපි බලාපොරොත්තු වෙනවා, ජනතාවට මේවා ගැන හරියට දැනුවත් කරලා කටයුතු කරන්න. ඒ වාගේම ඉදිරි අනාගතයේදී ඔබතුමන්ලා හොඳ දෙයක් කරනවා නම්, ඒකටත් සහයෝගය දීලා, මේ රටේ මේ දේශපාලන පසුබිම ඉදිරියේදී වෙනස් කරන්න ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා ඇතුළු අපේ කණ්ඩායම කැප වෙනවා කියන එක කියමින්, මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔව්, ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා වැටුප් ගැන සඳහන් කළා. මම එදා මගේ කථාවේදී දීර්ඝ ලෙස මේ ගැන එකින් එක පැහැදිලි කළා. ඒ නිසා මේ ගරු සභාවට, රටට බොරු කියන්න එපා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
මම මේක පර්යේෂණ අංශයෙන් ගත්තේ.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මම දන්නේ නැහැ. *[බාධා කිරීමක්]* මම පොඩ්ඩක් කියන්නම්. එතකොට ඒක වැරැදි නම්, ඔබතුමා ඔය කියන පර්යේෂණ අංශයෙන් දීපු එකත් එක්ක බලන්න.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මට මේ ලේඛනය පර්යේෂණ අංශයෙන් ලැබුණු එකක්. එතුමා මේක වැරැදියි කියනවා නම්, මම පිළිගන්නවා. මම මේක ඔබතුමාට ඉදිරිපත් කරන්නම්. මේකේ වැරැද්දක් තිබෙනවා නම්, ඔබතුමා හරි දේ සම්බන්ධයෙන්,-

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ඔබතුමා කියපු සීමා කිහිපයක් තිබුණා නේ.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ඔව්, මම මේ list එක ඔබතුමාට දෙන්නම්. මේක පාර්ලිමේන්තුවෙන් ගත්තේ. මේක වැරැදි නම් මම,-

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ගරු මන්ත්‍රීතුමනි, මොකද දන්නවාද? ඔබතුමන්ලා පළමුවැනි දවසේ කියපු ඒවා එක්ක රටේ වැඩ කරන ජනතාව සැහෙන්න කලබල වුණා. හැබැයි, අපි ඒක නිවැරැදි කළා. පළමුවැනි දවසේ බොරු කියලා වැඩ කරන ජනතාව අවුස්සන්න සැහෙන්න උත්සාහ කළා. නමුත්, ඒක වුණේ නැහැ. ඊටපස්සේ අපි නිවැරැදි ලෙස සංඛ්‍යාලේඛන කිව්වාට පස්සේ, මොකක්ද වෙලා තිබෙන්නේ කියලා තේරුම් අරගෙන තිබෙනවා. හරි පැහැදිලියි, හැම වෙලාවේම වැරැදි මතයක් යවන්න උත්සාහ කරනවා, මේ වැඩි කරනවා කියපු එක නැහැ කියලා. නමුත්, කාර්යාල කාර්ය සහායකයෙකුගේ වැටුප අපි ඉතා පැහැදිලිව කිව්වා. අපේ ජනාධිපතිතුමා කිව්වා, රුපියල් 8,250කින් මාස 20ක් ඇතුළත - 2027 ජනවාරි- වැටුප වැඩි වෙනවා කියන එක. ඊට පස්සේ *[බාධා කිරීමක්]* හරි, හරි. නමුත්, ඔබතුමා ඔය කියපු සංඛ්‍යාලේඛන වැරැදියි.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
මේක පාර්ලිමේන්තුවෙන් ගත්තේ. වැරැදි නම්-*[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අපට තිබෙන කාලය සීමිතයි.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා Research Unit එකෙන් ගත්ත ලේඛනය මට දෙන්න. මම ඊට පස්සේ ප්‍රකාශයක් කරනවා,- *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ අපැහැදිලිකම එන්නේ නැහැ, හරියටම අවුරුද්දෙන් අවුරුද්දට වැඩි වෙන ගණන කීයද කියලා කිව්වා නම්. මේක සංකීර්ණයි නේ. සොයා ගන්න බැහැ. මිනිස්සු මඤ්ඤං වෙලා ඉන්නේ. ගොඩක් අය මේ සම්බන්ධයෙන් ලොකු ප්‍රහේලිකාවක ඉන්නේ. මම මේ staff එකෙන් ඇහුවා. "අපි දන්නේ නැහැ සර්, සොයා ගන්නත් බැහැ, හිතා ගන්නත් බැහැ" කියලා පාර්ලිමේන්තු staff එකත් කියනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, අපෙට තිබෙන කාලය සීමාසහිතයි.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
හරි, මේක මම භාර දෙන්නම්. *[බාධා කිරීමක්]*

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ගරු මන්ත්‍රීතුමනි, ඉතා පැහැදිලිව මේ අය වැයේ Annexure V වල ඒ ඒ වැටුප් කාණ්ඩවල වැටුප තිබෙනවා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
මේ කාර්ය මණ්ඩලයේ අයට කියන්න-

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
එතුමන්ලාටත් මම ගණන් හදලා කියන්නම්. හරි, කාලය මදි නිසා මම වැඩිය තර්ක කරන්න යන්නේ නැහැ. නමුත්, Research Unit එකෙන් දීපු ලේඛනය දෙන්න. මම ඉදිරියේදී ඒක හරියට අධ්‍යයනය කරලා නිවැරදි කිරීමක් කරන්නම්.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අසෝක සපුමල් රන්වල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.43]

**ගරු අසෝක සපුමල් රන්වල මහතා**
(மாண்புமிகு அசோக சபுமல் ரன்வல)
(The Hon. Asoka Sapumal Ranwala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගෙවෙමින් පවතින මොහොත, දින, මාස, ඇතුළු 2025 වර්ෂය, ලෝකයේ දේශපාලනය පැත්තෙන් ගත්තොත් ශීඝ්‍ර වෙනස්වීමකට භාජන වෙන කාලයක්. මෙවැනි මොහොතක අපේ රටේ ජනාධිපතිතුමා, මුදල් ඇමතිවරයා විධියට ඒ වෙනස් වෙන ලෝකයට ගැළපෙන ආකාරයට අපේ රටේ ජනතාව, අපේ රටේ පුරවැසියන් සූදානම් කිරීම වෙනුවෙන් මේ අය වැය ඉදිරිපත් කරලා තිබෙනවා. අපි විශ්වාස කරනවා, ජනතාවාදී අය වැයකට එහා ගිහිල්ලා පුරවැසි අය වැයක් විධියට මේ අය වැය ඉදිරිපත් කරන්නේ එවැනි ලෝක වාතාවරණයකට අපේ රටේ ජනතාවත්, අපේ රටේ සමාජයත්, අපේ රටේ ආර්ථිකයත් මෙහෙයවීමේ උසස් පරමාර්ථයෙන් කියලා.

එවැනි අය වැයක් තුළදී ඒ පුරවැසියාගේ ප්‍රධානතම, ප්‍රමුඛතම කැටපත බවට පත් වෙලා තිබෙන රාජ්‍ය සේවය, රාජ්‍ය සේවකයා, නිලධාරීන්, වෘත්තිකයන්, පෞද්ගලික අංශයේ සේවකයා, පෞද්ගලික අංශයේ වෘත්තිකයන් යන සියල්ලෝම අවුරුදු 20ක කාලපරිච්ඡේදයක් තුළම තමන්ගේ වැටුප සම්බන්ධව අවිනිශ්චිත තත්ත්වයකින් තමයි පසු වුණේ. වෘත්තීය සමිති ක්‍රියාකාරකයන්, වෘත්තීය සමිති නායකයන් ඒ වැටුප වැඩි කර ගන්න සෑම අවුරුද්දකම අය වැයට පෙර බරපතළ පරිශ්‍රමයක් දරා තිබෙනවා. අය වැයට පෙර භාණ්ඩාගාරය එක්ක, අදාළ ප්‍රධානීන් එක්ක සාකච්ඡා කරලා එවැනි පරිශ්‍රමයක් දැරුවත් ඔවුන්ට ඒ සාකච්ඡාවල ප්‍රතිඵලයක් විධියට අය වැය තුළ ඒ වැටුප වැඩි කර ගන්න බැරි වුණා. මූලික වැටුප මත තමයි ඒ සියලු සේවකයන්ගේ, සියලු වැඩ කරන ජනතාවගේ, සියලු වෘත්තිකයන්ගේ අභිමානය සාඩම්බරය රඳා පැවතිලා තිබෙන්නේ. රාජ්‍ය අංශයට සේවකයකු බඳවා ගනිද්දී, වෘත්තිකයෙකු රාජ්‍ය අංශයට බඳවා ගනිද්දී, පෞද්ගලික අංශයේ සේවකයෙකු සේවයට බඳවා ගනිද්දී, ඔහුගේ මූලික වැටුප, වසරක කාල පරිච්ඡේදයෙන් පසු වාර්ෂික වැටුප් වැඩිවීම ආදිය පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා. මේක තමයි ඒ වෘත්තිකයාගේ, ඒ සේවකයාගේ ඒ සියලුදෙනාගේම ගෞරවය රැකෙන ආකාරය. ඒකට අපි කියනවා, dignity of labour කියලා. ඒ සාඩම්බරය, ඒ වෘත්තිකයාගේ සාඩම්බරය, රාජ්‍ය නිලධාරියාගේ සාඩම්බරය, ශ්‍රමිකයාගේ සාඩම්බරය රඳා පවතින්නේ නිකම්ම නිකම් පුරාජේරුවලින් නොවෙයි.

ලෝකයේ ඕනෑම රටක ඒ ඒ වෘත්තියට අදාළ වැටුපක් නියම කර තිබෙනවා. ඒ වැටුප අනුව තමයි ඒ වෘත්තියට බැඳෙන්නේ. හැබැයි, අද වෙනකොට රාජ්‍ය සේවකයාට, වෘත්තිකයන්ට එහෙම වැටුපක් පෙන්වන්න බැරි මට්ටමට තමයි පසුවුණු අවුරුදු 20ක කාලපරිච්ඡේදය තුළ ඇද වට්ටලා තිබුණේ. ඒක තමයි අපේ රටේ වැටුප් ඉතිහාසය. මොකද, මූලික වැටුප වැඩි කරන්නේ නැහැ. අපි වෘත්තීය සමිති විධියට මහා භාණ්ඩාගාරයේ ප්‍රධානීන් එක්ක සාකච්ඡා සඳහා ගියාම අපි දකින කාරණය තමයි පැය ගණන් සාකච්ඡා කළාම, වැටුපට ඕනෑ නම් රුපියල් 300ක් එල්ලන්නම් කියනවා. ඒත් මූලික වැටුපට නොවෙයි. එහෙම නැත්නම් රුපියල් 1,000ක් එල්ලන්නම් කියනවා. කථා කරලා, කථා කරලා අවසානයේදී එකඟතාවට එන්නේ කොහොමද? Overtime කරන්න ඉඩ දෙන්නම්; එහෙම නැත්නම් overtime වල ratio එක වෙනස් කරලා දෙන්නම් කියලායි. අන්න ඒ කාරණය හරහා අපේ රටේ රාජ්‍ය සේවකයාට, පෞද්ගලික අංශයේ සේවකයාට ගෙවල්වලට වෙලා ඉන්න තිබෙන කාලපරිච්ඡේදය වැඩපළ ඇතුළේ, නැත්නම් කාර්යාලය ඇතුළේ ඉන්න වෙන මට්ටමට තමයි ඇද වැට්ටුවේ. ඒ සියලු සේවකයන්ට බල කළා, වෘත්තිකයන්ට බල කළා, ඔවුන්ගේ මූලික වැටුප් වැඩි කරන්නේ නැතුව වැඩපළ ඇතුළේ වැඩි පැය ගණනක් ඉඳලා තමන්ට ඕනෑ මුදල් ප්‍රමාණය එකතු කර ගන්නට. එහෙම තත්ත්වයක් තමයි පසුවුණු අවුරුදු 20 තුළම තිබුණේ.

අද මෙතැන කථා කරනවා, සේවකයාට බදු ගහලා ඔවුන්ගේ වැටුපත් අභිමි වෙනවා කියලා. ඒ වාගේම සොච්චම් වැටුප් වැඩි කිරීමක් කරලා තිබෙන්නේ කියලා කථා කරනවා. මම අහනවා, මේ මෑත ඉතිහාසයේදී -පසුවුණු අවුරුදු 20 තුළදී- මූලික වැටුප වැඩි කරන්න මෙවැනි ආකාරයට කටයුතු කර තිබෙනවාද කියලා. එහෙම ඉතිහාසයක් මෑතක දකින්න ලැබෙන්නේ නැහැ. වෘත්තිකයන්ගේ මූලික වැටුප තව කෙනෙකුට කියන්න ලජ්ජාවෙන් හිටියේ. මන්ත්‍රීවරුන්ගේ වැටුප ශීඝ්‍ර ලෙස වැඩි කර ගත්තත්, මේ රටේ වෘත්තිකයන්ගේ මූලික වැටුප් වැඩි කර ගන්න බැරි වුණා. වැටුපට දීමනා ලෙස එල්ලලා තමයි තිබෙන්නේ. ඉතින් මේ වැටුප මදි නිසා, ගෙදර ලයිට් බිල ගෙවා ගන්න අපහසු නිසා, වාහනයට ඉන්ධන ගහ ගන්න බැරි නිසා ඔහුට වැඩි කාලයක් අතිකාල සේවයේ යෙදෙමින් සේවා ස්ථානයේ රැඳී

සිටින්නත් සිද්ධ වුණා. මේ නිසා ඔවුන්ගේ පවුල් ජීවිත තුළ නොයෙකුත් ආරාවුල් ඇති වෙන්න පටන් ගත්තා. මේක තමයි වෘත්තිකයා ඇද වට්ටලා තිබුණු තැන. මේක තමයි රජයේ සේවකයා ඇද වට්ටලා තිබුණු ඇත්ත තැන. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවැනි තත්ත්වයක් තුළ තමයි අපේ රට ඒ අයට ජාත්‍යන්තරයට යන්න බල කරලා තිබුණු තත්ත්වය ඇති වුණේ. අපට යන්න පුළුවන්ද?

ලෝකයේ ඕනෑම වෘත්තියකට, ඕනෑම විදේශ රටකට යන්න බලාපොරොත්තු වෙනවා නම්, ඒ වෘත්තිය සම්බන්ධව තිබෙන මූලික වැටුප මොකක්ද, එය අවුරුද්දක් ගාණේ වැඩි වෙන්නේ කොහොමද කියලා ප්‍රබල නිර්ණායක තිබෙනවා.

ඒ නිර්ණායක එකක්වත් පසුගිය අවුරුදු 20 තුළ සලකා බැලුවේ නැහැ. ඒ විතරක් නොවෙයි, වැටුපට අදාළ වන අතිකාල දීමනා ගැන සලකා, ඒ අතිකාල දීමනාව ගන්න ටිකක් කල් වැඩ කරගෙන යද්දී ඔන්න ආයතනවලට චක්‍රලේඛනයක් එනවා, අතිකාල කප්පාදු කරලා කියා. අතිකාල සේවාව පැය 20කට වඩා කරන්න බැහැ, පැය 80කට වඩා කරන්න බැහැ, පැය 120කට වඩා කරන්න බැහැ කියලා චක්‍රලේඛ එනවා. නැවත වරක් ඒ වෘත්තිකයන්ට, ඒ සේවකයන්ට අරගළ කරන්න සිදු වෙනවා, "අපිට කොහොම හරි අතිකාල ලබා දෙන්න" කියලා. මේවා තමයි සටන් බවට පරිවර්තනය වෙලා තිබුණේ. හැබැයි, අද වන විට මේ වෘත්තිකයන්ගේ මූලික වැටුපම වැඩි කර තිබෙනවා, අපට හිතා ගන්න බැරි ආකාරයට. ඒක තමයි අවුලට පත් වෙලා සිටියේ, අපේ සුජීව සේනසිංහ මහත්මයා. එතුමාට තේරුම් ගන්න බැරි වුණා ඒ වැඩි වීම වුණේ කොහොමද, ඒ වැඩි කිරීම කළේ කොහොමද, ඒ හරහා වෘත්තිකයාට තමන්ගේ ආයතන තුළ ලැබෙන ගෞරවය මොකක්ද කියලා. හැබැයි, පහුගිය කාල සීමාව තුළම ඒ වෘත්තිකයන්ට, ඒ සේවකයන්ට අමතක වෙලා තිබුණා, තමන්ගේ මූලික වැටුප වැඩි වීම තමයි තමන්ගේ අභිමානය කියන එක. ඔවුන් ඇද වට්ටලා තිබුණා, වැටුපේ ප්‍රතිශතයක් විධියට පැයකට ගන්නා අතිකාල මුදල කොපමණද කියා හිතන තැනට. මේක තමයි ඇත්ත දේ.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ගරු මන්ත්‍රීතුමා, අපි 2015දී සියයට 107කින් මූලික වැටුප වැඩි කළා.

**ගරු අසෝක සපුමල් රන්වල මහතා**
(மாண்புமிகு அசோக சபுமல் ரன்வல)
(The Hon. Asoka Sapumal Ranwala)
අපි ඒක පස්සේ කථා කරමු. ඒ වැඩි කරපු එක ගැන, මොනවාද වැඩි කළේ කියන එක ගැන අපි හොඳට දන්නවා. ඒ ගැන කථා කරන්න ගියොත් හුඟක් දේවල් කථා කරන්න පුළුවන්. එදා සේවකයන්ගේ දීමනා කැපුවා නොවෙයි, අහිමි කළා. ඒවා අහිමි කරපු ඉතිහාසයක් තමයි පසුගිය අවුරුදු 20 පුරාවට දිව යන්නේ. *[බාධා කිරීමක්]* එහි ඇත්ත තත්ත්වය මේක තමයි, ගරු මන්ත්‍රීතුමනි. මේ විධියට අපේ රටේ රාජ්‍ය සේවකයාට තිබුණු අභිමානය, සාඩම්බර බව නැති කරලා අපේ රටේ රාජ්‍ය සේවකයා අත් හැර දමලා විදේශ රටවලට යන තත්ත්වයට එම සේවය ඇද වට්ටලා තිබුණා. ඒක තමයි ඇත්ත ඉතිහාසය. මීට පෙර රාජ්‍ය සේවකයන්ට, වෘත්තිකයන්ට හොඳම ආකාරයට වැටුප් වැඩි කළා නම් ඒ අයගේ වැටුප මන්ත්‍රීවරයෙකුගේ වැටුපට වඩා වැඩි වෙන්න ඕනෑ. හැබැයි, එහෙම කරන්න කලින් පැවැති ආණ්ඩු අසමත් වුණා.

කෙසේ වෙතත්, රාජ්‍ය සේවකයාට -වෘත්තිකයාට- හිතා ගන්න බැරි තැනකට අද ඔහුගේ මූලික වැටුප ගෙනැවිත් තිබෙනවා. මොකද, මූලික වැටුප විශ්‍රාම වැටුපට අදාළ වෙනවා; මූලික වැටුප අතිකාල දීමනාවට අදාළ වෙනවා; මූලික වැටුප නිසා වැන්දඹු හා අනත්දරු අරමුදලට යන ගණන වැඩි වෙනවා. එහෙම නම්, මූලික වැටුප වැඩි කිරීම තමයි ඇත්ත අර්ථයෙන් වැටුප් වැඩි කිරීම කියන්නේ. ඒ නිසා අද මේ රටේ වෘත්තිකයන්ට, මේ රටේ රාජ්‍ය සේවකයන්ට නව පුනරුදයක් ඇති වෙලා තිබෙනවා. ඔවුන්ට අභිමානවත් මූලික වැටුපකට උරුමකම් කියන්න පුළුවන් හැකියාව අත් පත් වෙලා තිබෙනවා. ඒ නිසා තමයි මෙය පුරවැසි අය වැයක් බවට පත් වෙන්නේ. පුරවැසියා නිර්මාණය වන්නේ මෙහෙමයි. පුරවැසියා සතු අයිතිවාසිකම් සුරක්ෂිත වන්නේ මෙහෙමයි. අප Members' Dining Restaurant එකට ගියාම එතැන ඉන්න සේවකයන් අපත් එක්ක කථා කරලා කියන්නේ මොකක්ද? "අපිට හරි සතුටුයි. ඉතිහාසයේ කවදාවත් නැති ආකාරයට අපේ මූලික වැටුප වැඩි වෙලා තිබෙනවා. ඉතිහාසය තුළ අපිට එහෙම දෙයක් අහන්න ලැබුණේ නැහැ" කියලායි ඒ අය අපිත් එක්ක ප්‍රකාශ කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙන්න මේ විධියට මේ අය වැය ජනතාවාදී අය වැයකට වඩා එහාට ගිහින් පුරවැසි අය වැයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම විවිධ තැන්වල දී කථා කළා මේ අය වැය තුළ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට මොනවාද හම්බ වෙලා තිබෙන්නේ කියලා. ඇයි එහෙම කියන්නේ? මීට පෙර සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට අය වැයෙන් ලබා දීලා තිබුණු සහනය තමයි, ණය මුදලක් අරගෙන දෙන එක. බැංකුවල ණයකරුවන් බවට පත් වෙලා අවුරුදු දෙකක්, තුනක් යන කොට ඒ ව්‍යාපාරය බැංකුවට සින්න වන මට්ටමට ඇද වැටිලා තිබුණා. හැබැයි, ඒ ව්‍යාපාරිකයා රැක බලා ගන්නා වැඩ පිළිවෙළක් ඒ කිසිම අය වැයක තිබුණේ නැහැ. සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ගැන වෙන වෙනම කථා කරන්නේ නැතිව, අලුතින් බිහි වන කර්මාන්තකරුවන් සුරක්ෂිත කරන්න, ඔවුන්ගේ වාණිජ ව්‍යාපාර නවෝත්පාදන විධියට ඉස්සරහට ගෙන යන්න වැඩ පිළිවෙළක් මේ අය වැය තුළ නිර්මාණය කර තිබෙනවා. විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ තිබෙන National Science Foundation - NSF - එකට අදාළව ප්‍රතිපාදන තුන් ගුණයකින් වැඩි කරලා තිබෙනවා. වෙන වෙනම බැංකුවලට ණය දීලා, මන්ත්‍රීවරයාගේ අභිමතය පරිදි ණය අරගෙන දීලා ණයකරුවෙකු බවට පත් කරලා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයා සුළු කාලයකින් ඇද වට්ටන එක ද, එහෙම නැත්නම් ඒ ව්‍යාපාරිකයා වාණිජ කර්මාන්තයක් විධියට දීර්ඝ කාලීනව අරගෙන යන සාර්ථක ව්‍යාපාරයක සාඩම්බරකරුවෙකු බවට පත් කරන එක ද වඩා හොඳ? දෙවැන්න තමයි වඩා හොඳ. එයයි සැබෑ අය වැයක පරමාර්ථය. ඒ පරමාර්ථය තුළ තමයි විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ විවිධ අංශවලට තුන්ගුණයකින් ප්‍රතිපාදන වැඩි කරලා තිබෙන්නේ. ඒ වාගේම, අපේ රටේ වාරි පද්ධතිය පිළිබඳවත් මෙවර අය වැයෙන් විශේෂ අවධානයක් යොමු කර තිබෙනවා.

මේ සභාවේ ගරු මන්ත්‍රීවරු කලින් ප්‍රකාශ කරපු විධියට, ඉතිහාසය තුළ දීර්ඝ කාලීනව සොයා බලා දැවැන්ත ව්‍යාපෘති මේ රටේ ක්‍රියාත්මක කර තිබෙනවා. ඇත්ත තමයි. ඒවා හොඳයි.

[ගරු අසෝක සපුමල් රන්වල මහතා]

හැබැයි, මෑත ඉතිහාසය තුළ එවැනි දීර්ඝ කාලීන සැලසුම් සහිතව මේ රටේ වාරි පද්ධතියට හෝ වෙනත් ව්‍යාපෘතිවලට හෝ මුදල් වෙන් කරලා තිබුණේ නැහැ. ප්‍රාග්ධන වියදම් විධියට, එහෙම නැත්නම් කාරක ප්‍රාග්ධන වියදම් විධියට වරින් වර මුදල් ප්‍රමාණයක් වෙන් කරලා වාරි පද්ධතිය යම් පමණකට නඩත්තු කළා විතරයි. හැබැයි, ඒ නඩත්තු වියදම් ඒ ආකාරයෙන්ම තබාගෙන වාරි පද්ධතිය වෙන වෙනම නොගෙන කටයුතු කිරීම නිසා ඒවා අද පත් වෙලා තිබෙන ශෝචනීය ඉරණමෙන් ගලවා ගන්න, මෙම අය වැයෙන් ඒවාට වෙන වෙනම මුදල් වෙන් කර තිබෙනවා. උදාහරණයක් විධියට ගල්ඔය, රාජාංගනය, මින්නේරිය සහ හුරුළු වැව යෝජනා ක්‍රමවල පහළ සංවර්ධන කටයුතු ප්‍රතිසංස්කරණය කිරීම, ඒවා නවීකරණය කරලා ගැමි ජනතාවට වඩාත් හොඳින් තමන්ගේ කෘෂිකාර්මික අවශ්‍යතා සපුරා ගැනීම කියන අරමුණ මේ යෝජනා ක්‍රමය තුළ බලාත්මක කර තිබෙනවා. ඒ බව මෙම අය වැයෙන් තහවුරු වෙනවා. අන්න, එතැනදී තමයි අපේ රටේ පුරවැසියන් විධියට ගොවි ජනතාව තුළ ගෞරවය ඇති වන්නේ.

පසුගිය කාල පරිච්ඡේදය පුරාවට අපේ රටේ ජනතාව ආපදාවට පත් වුණාට පසුව තමයි ඒ ආණ්ඩු ඒවාට පිළියම් සෙව්වේ. මම කැලණි ගඟ අසබඩ ජීවත් වන්නේ. කැලණියේ ගං වතුර ගැලුවාට පසුව තමයි අපට මතක් වෙන්නේ, මේ ගංවතුරෙන් බේරෙන්නේ කොහොමද කියලා සොයා බලන්න. ඒ වෙලාවට තමයි රජයට මතක් වෙන්නේ, ගංවතුරෙන් යට වෙච්ච මිනිසුන් ආපදාවෙන් මුදා ගන්න මැදිහත් වෙන්නේ කොහොමද කියලා සොයා බලන්න. ඒ තත්ත්වය වෙනස් කරන්න මෙවර අය වැය තුළ කටයුතු කර තිබෙනවා. නම් වශයෙන්ම ගංගා නම් කරලා එම ආපදා වළක්වා කැලණි ගං නිම්නයේ ජනතාව සුරක්ෂිත කරන්නේ කොහොමද කියන කාරණා ටිකක් පළමු වතාවට මෙවර අය වැයට ඇතුළත් කර තිබෙනවා. අන්න, ඒ නිසා තමයි මේක පුරවැසි අය වැයක් බවට පත් වන්නේ. ඒ පුරවැසියන්ගේ සාඩම්බරකම රකින්න, ගංවතුරක් වෙලාවට අසරණ වන පුරවැසියන් මුදා ගන්න අවශ්‍ය කාරණා දුර දක්නා නුවණින්, කල් වේලා ඇතිව මෙවර අය වැයට ඇතුළත් කර තිබෙනවා. මා හිතන්නේ ඒ කාරණා වෙනම සඳහන් කළොත් හොඳයි කියලායි.

නමුත් අය වැය කථාවකින් එහාට ගිහිල්ලා එවැනි කාරණාත් මෙවර අය වැයේ අන්තර්ගත වෙලා තිබෙනවා. දේශගුණයට ඔරොත්තු දීමේ බහු අදියර වැඩසටහන් ප්‍රවේශ ව්‍යාපෘතිය යටතේ කැළණි ගංගා නිම්නයේ ගංවතුර කළමනාකරණය, කාලගුණ විද්‍යා පද්ධතිය නවීකරණය, ආපදා සඳහා පූර්ව සූදානම සහ ක්‍රියාකාරී සූදානම, ගංවතුර පුරෝකථනය වැඩිදියුණු කිරීම සහ නාය යෑමේ පුරෝකථනය වැඩිදියුණු කිරීම සඳහා රුපියල් බිලියන 9ක් වෙන් කර තිබෙනවා. මෙය කැලණි ගඟ ආශ්‍රිතව ජීවත් වන ජනතාවට මහත් අස්වැසිල්ලක්, ඔවුන්ගේ ජීවිත අවදානමින් බේරා ගන්න මහත් අස්වැසිල්ලක්, ඔවුන්ගේ දේපළ බේරා ගන්න මහත් අස්වැසිල්ලක් බවට පත් වෙලා තිබෙනවා. මේ සියලු අර්ථයෙන් ගත් කල මේ අය වැය පුරවැසි අය වැයක් බවට පත් වෙලා තිබෙනවා; මේ අය වැය ජනතාවාදී අය වැයක් බවට පත් වෙලා තිබෙනවා. එවැනි අය වැයක් ගෙන ඒම සම්බන්ධයෙන් ස්තුති කරමින් මා නතර වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.57]

**ගරු උපුල් කිත්සිරි මහතා**
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනාධිපතිවරයා මුදල් අමාත්‍යවරයා ලෙස ඉදිරි මාස 9කට අදාළව 2025 අය වැය පසුගිය දිනෙක මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. අප මේ අය වැය ඉදිරිපත් කළාට පසුව, පසුගිය දිනවල විපක්ෂයේ මන්ත්‍රීවරුන් කළ කතා අහද්දී අපට දැනුණේ, ජාතික ජන බලවේගය ආණ්ඩුව අවුරුදු 5ක් ආණ්ඩු කරලා ගෙනාපු අවසාන අය වැය වාගේ සලකා එතුමන්ලා මේ අය වැය ගැන කථා කළ බවක්. හැබැයි, අපි මේ අය වැය ගෙනෙන්නේ මේ ආණ්ඩුව පත් වෙලා මාස 3කින්. අපි පාර්ලිමේන්තුවට ඇවිල්ලා අදට හරියටම මාස 3යි. මේ රටේ ඉදිරි සංවර්ධන සැලැස්ම ඉදිරිපත් කරන අය වැයක් හැටියට තමයි අපි මේ අය වැය ගෙනැල්ලා තිබෙන්නේ. නමුත්, අපේ ආණ්ඩුව අවුරුදු 5ක් කරගෙන ගිහිල්ලාත් ඒ අවුරුදු 5ට මොකවත් කළේ නැහැ, ආණ්ඩුවට වැඩ පිළිවෙළක් නැහැ කියලා හිතාගෙන තමයි විපක්ෂය නිතරම කථා කළේ.

ගරු විපක්ෂ නායකතුමා අද උදේ විනාඩි 45ක වාගේ කාලයක් මේ අය වැය පිළිබඳව කථා කරමින් විවිධ කාරණා මතු කළා. එතුමා ඒ කථාව ඇතුළේ නිතරම මතක් කරන්න ගිය දේ තමයි, පරණ කතන්දර නොවෙයි, අලුත් වැඩ පිළිවෙළ ගැන කථා කරන්න කියන එක. ඉදිරි වැඩ පිළිවෙළ, මේ රට ගෙනියන්නේ මොන දිසාවකටද කියන එක මේ පළමුවැනි අය වැය තුළින් අපි පෙන්වලා තිබෙනවා. පරණ දේවල් කථා කරන්න එපා කිව්වාට විපක්ෂ නායකතුමාට අපි මේ කාරණය කියන්න ඕනෑ. අපි ගම්වල විවිධ ව්‍යාපෘති කරන්න ගියාම අපේ කාර්යාලවලට අදටත් එනවා, ව්‍යාපාරිකයන්. මීට අවුරුදු 10කට, 15කට පෙර කරපු කර්මාන්තවලට තවම මුදල් ගෙවන්න තිබෙනවා. මීට අවුරුදු 12කට, 13කට උඩදී නිවාස සංවර්ධන අධිකාරියේ මඟ නතර වෙච්ච නිවාස ව්‍යාපෘතිවල, ඒ කාලයේ බිලියන ගණන් සල්ලි ගෙවලා නැති ව්‍යාපෘතිවල බිල් අද අපට ගෙවන්න වෙලා තිබෙනවා. ඒ නිසා පසුගිය දේවල් කථා කරන්න එපා කිව්වත්, මම හිතන හැටියට ඒ වාගේ ඒවා අපි එතුමාට මතක් කරලා දෙන්න ඕනෑ. ඒ වාගේම තමයි, එතුමා නිතරම කියන්න ගියේ වැටුප් පිළිබඳ ව්‍යාකූලතාවක් රටේ නිර්මාණය වෙලා තිබෙනවා කියලා. ආණ්ඩුවක් හැටියට අපි සන්තෝෂ වෙනවා, අය වැය ඉදිරිපත් කළ දවසේ ඉඳලාම රාජ්‍ය සේවකයා වැටුප පිළිබඳ කථා කරන්න වෙනදාට වඩා උනන්දු වෙන එක ගැන.

රජයේ සේවකයෝ හැටියට හිටපු අපිත් මේ වැටුප් වැඩිවීම් පිළිබඳව විවිධ අවස්ථාවලදී මහා මාර්ගවල අනන්තවත් අරගළ කරලා තිබෙනවා. ඉතිහාසයේ පළමුවැනි වතාවට තමයි වැටුප් වර්ධකය දෙගුණයකට ආසන්නවත්, ඒ වාගේම මූලික වැටුප ඉතා විශාල අගයකින් වැඩිවෙන්නේ. ඒ වැටුප් වැඩිවීම කියන්නේ එසේ මෙසේ වැඩිවීමක් නොවෙයි. විශ්‍රාම යද්දී මොනතරම් ප්‍රමාණයකින් ඒ මුදල් අපට නැවත දායක මුදලක් හැටියට ලබාගන්න පුළුවන්ද කියන එක ඒ වැටුප හරහා අපි දකිනවා. මම හිතන්නේ එතුමාට ප්‍රශ්නයක් ඇති, මේ වැටුප කොහොමද හැදෙන්නේ කියලා. මේ Phoneවලත් ඊට අදාළ apps දාලා තිබෙනවා. ඒ appsවලින් ඉතා ලේසියෙන් හොයාගන්න පුළුවන් තමන්ගේ වැටුප කොච්චර වැඩි වෙනවාද, 2025දී කොච්චර වැඩි වෙනවාද, 2026දී කොච්චර වැඩි වෙනවාද, 2027දී කොච්චර වැඩි වෙනවාද කියලා. මම හිතන්නේ විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන්ට හොයාගන්න බැරුව ඇති තමන්ගේ වැටුප කීයක් වැඩි වෙනවාද කියලා. විපක්ෂ නායකතුමාටත් පුළුවන් ඕනෑ නම් ඒ app එක දාගෙන තමන්ගේ වැටුප කීයද කියලා හොයාගන්න.

එතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට දෙන විමධ්‍යගත ප්‍රතිපාදන මුදල වන රුපියල් මිලියන 10 පිළිබඳව කථා කළා. ඒ රුපියල් මිලියන 10 ගැන කථා කරද්දී එතුමා නිරන්තරයෙන් කියන්න උත්සාහ කළේ ඒක අපට තනියෙන් වියදම් කරන්න දෙන්නේ නැහැ කියලා. අපි ඒ ඉතිහාසය හොඳට දන්නවා. ඒවා රජයේ මුදල්. ඉතිහාසයේ වුණේ ඒකයි. මන්ත්‍රීවරයාට සංවර්ධන යෝජනාවක් ඉදිරිපත් කරන්න පුළුවන්. ප්‍රාදේශීය ලේකම් කාර්යාල, දිසාපති කාර්යාල හරහා තමයි ඒ මුදල් වියදම් කරන්නේ. අපට ඒ මුදල්වලට සංවර්ධන යෝජනා ඉදිරිපත් කරන්න පුළුවන්. ඒ නිසා එතුමන්ලාට දෙන සල්ලිවලට, එතුමන්ලාට දෙන ප්‍රතිපාදනවලට එතුමන්ලාට යෝජනා ඉදිරිපත් කරන්න පුළුවන්. ඒවායේ වෙනසක් නැහැ. ඒක එහෙම තමයි. නමුත් කාටවත් පෞද්ගලිකව මේ මුදල් වියදම් කරන්න බැහැ. පෞද්ගලිව ඒ මුදල් වියදම් කළ ඉතිහාසය අපි දන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ගත්තොත් මේ අය වැය ඇතුළේ විදේශ ආයෝජන නැහැ, කොහොමද ඩොලර් හොයන්නේ, 2028 වෙනකොට කොහොමද ඩොලර් හොයන්නේ, අපේ රටේ ණය ගෙවන්නේ කොහොමද යන කරුණු පිළිබඳව කථා කරනවා. පසුගිය කාලය තුළ අපේ ජනාධිපතිතුමා කළ ඉන්දීය සංචාරයේදී, චීන සංචාරයේදී මේ රටට ඩොලර් බිලියන ගණන් විදේශ ආයෝජන ආපු ආකාරය අපි දැක්කා. ඒ නිසා කලබල වෙන්න එපා. තව කාලයක් තිබෙනවා. ලෝකයේ නායකයන්, ලෝකයේ අනෙකුත් රටවල් අප පිළිබඳව පූර්ණ විශ්වාසය තියලා තිබෙනවා. ඒ නිසා ඉතා කෙටි කාලයක් ඇතුළත මේ රටට විදේශ ආයෝජකයෝ විශාල වශයෙන් එනවා කියන විශ්වාසය අපට තිබෙනවා.

ඒ වාගේම, මේ අය වැය පිළිබඳව ඔබතුමන්ලා නොයෙක් දේවල් කථා කළා. නමුත් ඉතිහාසයේ පළමුවැනි වතාවට මේ අය වැය තුළින් කථා කරපු කාරණා කිහිපයක් තිබෙනවා. අපි නොදැකපු පැති ගණනාවක් අපි මේ අය වැය ඇතුළේ දැක්කා. විශේෂයෙන්ම ආබාධිත පුද්ගලයන් සඳහා මේ අය වැයෙන් රුපියල් මිලියන 100ක් වෙන් වෙනවා. ඉතිහාසයේ පළමුවැනි වතාවට තමයි අය වැයකට එවැනි ආකාරයේ යෝජනාවක් ඉදිරිපත් වන්නේ. නමුත් ඔබතුමන්ලා මේවා ගැන කථා කරන්නේ නැහැ. ඔබතුමන්ලාට මේවා පෙනුණේ නැහැ. ඒ නිසා මේවා ගැන කියන්න බැහැ.

ඒ වාගේම, රැඳවුම් නිවාසවල සිටින සෑම දරුවෙකුටම මාසිකව රුපියල් 5,000ක් වෙන් කරන්නත්, ඒ රුපියල් 5,000න්, රුපියල් 2,000ක් බැංකු ගිණුමට යන්නත්, ඉතිරි රුපියල් 3,000 ඔවුන්ගේ මාසික වියදම් සඳහා වෙන් කරන්නත් ආණ්ඩුව කටයුතු කළා. ඒ විතරක් නොවෙයි, එවැනි දරුවෙක් අවුරුදු 18 සම්පූර්ණ වුණාම ඒ රැඳවුම් නිවාසවලින් එළියට යන්න ඕනෑ. නමුත්, ඔවුන් සමාජගත වෙනකම් තවදුරටත් ඔවුන්ගේ ආරක්ෂාව සඳහා ඒ රැඳවුම් නිවාසවලම ඉන්න අවස්ථාව ලබා දෙනවා. එපමණක් නොවෙයි, ඒ දරුවන් සමාජගත වෙද්දී ඔවුන්ට කියලා නිවසක් හදා ගන්නවා නම්, ඒ වෙනුවෙන් රුපියල් දසලක්ෂයක මූලාධාරයක් කරන්නත් ආණ්ඩුව මේ අය වැයෙන් යෝජනා කරලා, ඒ වෙනුවෙන් මුදල් ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. ඒ නිසා අපි විපක්ෂයේ හැමෝටම කියනවා, මේවා දකින්න කියලා. ඉතිහාසයේ පළමුවැනි වතාවට මෙවැනි කාරණා අපේ රටේ අය වැයක් තුළින් දකින්න.

අපේ රටේ ගෙවී ගිය සෑම අවුරුද්දකම සියදිවි හානිකර ගැනීම් 3,000කට වඩා වැඩි ප්‍රමාණයක් සිදුවෙලා තිබෙනවා. සියදිවි හානිකර ගැනීමට උත්සාහ කරපු අවස්ථා අවුරුද්දකට 5,000කට වඩා වැඩි ප්‍රමාණයක් වාර්තා වෙනවා. අපේ ආණ්ඩුව රුපියල් මිලියන 250ක් වෙන් කළා, මානසික තැවුලට පත්වන ඒ අය මුදා ගැනීම සඳහා, ඒ වෙනුවෙන් වැඩසටහන් සකස් කිරීම සඳහා. විපක්ෂයේ සිටින ඔබතුමන්ලාට ඒවා පෙනුණේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතෙක් කාලයක් එතුමන්ලා අපේ රට පාලනය කළා කිව්වාට, ග්‍රාමීය ප්‍රදේශවල සිටින ජනතාවගෙන්, ඒ පවුල්වලින් සියයට 60කට, 70කට වඩා වැඩි ප්‍රමාණයකට පිරිසිදු පානීය ජලය ලබා ගන්න බැහැ. අපි මේ අය වැය ඇතුළේ ප්‍රාග්ධන වියදම් හැටියට රුපියල් බිලියන 107.9ක් වෙන් කර තිබෙනවා, ග්‍රාමීය ජල පහසුකම් ලබාදීම සඳහා. ඒ වාගේම, අපේ රටේ ග්‍රාමීය මාර්ග විශාල ප්‍රමාණයක් තවමත් හදන්න තිබෙනවා. විශේෂයෙන්ම කෘෂිකාර්මික ප්‍රදේශවල තිබෙන මාර්ග ඉතාම අබලන් තත්ත්වයේ තිබෙන්නේ. ඒ නිසා විශේෂයෙන්ම ග්‍රාමීය මාර්ග සංවර්ධනයට පමණක් රුපියල් මිලියන 4,000ක පමණ මුදල් ප්‍රමාණයක් වෙන් කර තිබෙනවා. එම මුදල ග්‍රාමීය මාර්ග හදන්න විතරයි. එය සැලකිය යුතු මුදලක් කියන එක අපි මේ සභාවට පෙන්වා දෙනවා.

අපේ රටේ කෘෂි කර්මාන්තය ගත්තොත්, අපට අපනයන කෘෂි කර්මාන්තය දක්වා යන්න පුළුවන්. උදාහරණයක් හැටියට ගත්තොත්, අපේ රටේ අවශ්‍යතාවට වඩා වැඩියෙන් අපි කෙසෙල් නිෂ්පාදනය කරනවා. අපි අතිරික්ත කෙසෙල් නිෂ්පාදනයක් කළොත්, අපට ලෝක වෙළෙඳ පොළේ ඉල්ලුමට අවශ්‍ය කෙසෙල් ප්‍රමාණයක් ලබා දෙන්න පුළුවන්. අපි ඒ බව දන්නවා. නමුත්, අවශ්‍යතාව තිබුණාට, ලෝක වෙළෙඳ පොළේ ඉල්ලුමට අපි කෙසෙල් නිෂ්පාදනය කරන්නේ නැහැ. ඒ නිසා ඉදිරි කාලය තුළ අපි බලාපොරොත්තු වෙනවා, ඒ අපනයන කෘෂි කර්මාන්තය පදනම් කරගෙන දැවැන්ත ව්‍යාපෘති ආරම්භ කරන්න. මම උදාහරණයක් හැටියට කෙසෙල් කර්මාන්තය ගැන කිව්වේ ඒකයි. ඒ වෙනුවෙන් අපි විශාල මුදලක් විශේෂයෙන්ම වෙන් කරන්න බලාපොරොත්තු වෙනවා.

රත්නපුර දිස්ත්‍රික්කයේ මැණික් තිබෙනවා. ඊට අමතරව, කුරුඳු, තේ, ගම්මිරිස් වැනි භෝග තිබෙනවා. නමුත් අපේ ඛනිජ සම්පත්වලට තවම නිසි මිලක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා අපි මේ අය වැය තුළිනුත් ප්‍රධාන වශයෙන් මුදල් වෙන් කරලා, ඒ අපනයන තත්ත්වය පිළිබඳව හොඳට හිතා බලා, අපේ රටට ඩොලර් ගේන්න අවශ්‍ය ඒ ක්‍රියා මාර්ග ගනිමින් ඉන්නවා. ඒ නිසා අපි ආණ්ඩුවක් හැටියට ඉදිරිපත් කළ පළමුවැනි අය වැය ගැන අපි විශේෂයෙන්ම සතුටු වෙනවා. ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම සඳහා අපි ගත්ත ඒ උත්සාහයට අපි විශේෂයෙන්ම සතුටු වෙනවා.

මීට පෙර ගරු රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා කථා කළා. එතුමා කියා සිටියා, එතුමා මේ පාර්ලිමේන්තුව ඇතුළට එනකොට පාර්ලිමේන්තුවේ සේවය කරන නිලධාරි මහත්වරුන්ගෙන් වැඩි වෙච්ච වැටුප ගැන ඇහුවාම, ඔවුන් වැටුප් වැඩි වුණු ආකාරය දන්නේ නැහැ කිව්වා, පාර්ලිමේන්තුව ඇතුළේ ඉන්න පොලිස් නිලධාරින්ගෙන් වැඩි වෙච්ච වැටුප ගැන ඇහුවාම, ඔවුනුත් වැටුප් වැඩි වුණු ආකාරය දන්නේ නැහැ කිව්වා කියලා.

අපි එතුමාට කියන්න කැමැතියි, මේ නිලධාරින් වැටුප් වැඩිවීම ගැන දන්නා බව. හැබැයි, එතුමාට ඒ පඩිය කීයද කියලා කියන්න භය වුණාද කියලා අපට සැකයි. ඒ කියන්නේ, එතුමාගේ ඉතිහාසය ඒ වාගේ නිසා මේ නිලධාරින් එතුමාට ඒක කියන්න භය වුණාද කියලා අපට සැකයි. එළියේ ඉන්න ගොඩක් අය පඩිය ගැන දන්නවා. නමුත්, එතුමාට කියන්න භය වෙන්න ඇති කියලා අපට හිතෙනවා. අවුරුදු 25ක් පාර්ලිමේන්තුවේ හිටපු මන්ත්‍රීවරයෙක් කියලා එතුමා අපට අවවාද, අනුශාසනා සැහෙන

[ගරු උපුල් කිත්සිරි මහතා]

ප්‍රමාණයක් දෙනවා අපි දැක්කා. මේ සියලු තත්ත්වය, බිම් මට්ටම හොඳින් හඳුනාගෙන ආපු කණ්ඩායමක් තමයි ජාතික ජන බලවේග ආණ්ඩුව කියන එක අපි පැහැදිලිව කියනවා.

ගාල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීතුමෙක් කථා කළා. එතුමා කිව්වා, ගාල්ල දිස්ත්‍රික්කය වෙනුවෙන් මොකුත් කරලා නැහැ කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත වේලාව අවසානයි.

**ගරු උපුල් කිත්සිරි මහතා**
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)
ඔබතුමා අය වැය ලේඛනයේ ඇතුළ බලන්න. ගාල්ල දිස්ත්‍රික්කය වෙනුවෙන් සංවර්ධන යෝජනා ගණනාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ පිළිබඳවත් හොයලා බලන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කාරණයත් කියලා මගේ කථාව අවසන් කරන්නම්. පසුගිය දවස්වල බොහෝදෙනෙක් කිව්වා, අපට දිනන්න බැහැ කියලා. දිනන්න බැහැ කියපු අයට දිනලා පෙන්නපු අපි, හදන්න බැහැ කියන රට හදලා පෙන්වනවාය කියන එකත් සහතික කර කියමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔව්, ගරු මන්ත්‍රීතුමා. මොකක්ද point of Order එක?

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
එතුමා මා ගැන සඳහන් කළා. ගාලු දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයකු විධියට මම විතරයි මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ නම සඳහන් කළේ නැහැ නේ.

**ගරු උපුල් කිත්සිරි මහතා**
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)
ගාල්ලේ මන්ත්‍රීවරු ගොඩක් ඉන්නවා.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
ගාල්ල දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු මොනවාද කියලා කියන්න පුළුවන් නම් වටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුසන්ත කුමාර නවරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.00]

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2025 වර්ෂයට අදාළව ඉදිරිපත් කළ අය වැය ලේඛනය ගැන මේ සභා ගර්භයේ බොහෝ මන්ත්‍රීවරු අදහස් ප්‍රකාශ කළා. ඒ වාගේම විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුත් බොහෝ අදහස් ප්‍රකාශ කළා. විශේෂයෙන්ම වසර ගණනාවක් ආපස්සට ගිහින් තිබෙන අපේ රටේ ආර්ථිකය, බිඳ වැටුණු ආර්ථිකය නැවත ස්ථාවර කර ගන්නේ කොහොමද, නැවත ශක්තිමත් කර ගන්නේ කොහොමද කියන අදහස ඇතිව ඉතාම කල්පනාකාරීව මේ අය වැය ඉදිරිපත් කරලා තිබෙනවා. අය වැය ඉදිරිපත් කරන මොහොතේ විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු සමහර ක්ෂේත්‍ර වෙනුවෙන් මුදල් වෙන් කරනකොට නැඟිටලා ආචාර කළ ආකාරය අපි දැක්කා. අපි දන්නවා, පසුගිය ඉතිහාසය පුරාවට අපේ රටේ අය වැයක් ඉදිරිපත් කරනකොට උතුර අමතක කර තිබුණු බව. ඒ නිසා උතුරු පළාත ගැන විශේෂ අවධානය යොමු කරපු එකත් මේ අය වැයේ විශේෂ කාරණයක් ලෙස මතු කරන්න පුළුවන්.

විපක්ෂයේ බොහෝ මන්ත්‍රීවරුන් ජන දුක ගැන කථා කරනවා. ඒ ගැන මාර වේදනාවකට පත් වෙලා, දැන් විවිධ අදහස් ප්‍රකාශ කරමින් ඉන්නවා. අපි දැක්කා, පසුගිය කාලයේ මොළ හතක් තිබෙනවා යයි කියපු ආර්ථික විශේෂඥයෝ ප්‍රකාශ කළා, වට්ටක්කා ඇටයක් වීසි කරලා, කම්මැලිකමින් හිටියොත් ගොවි ජනතාවට අස්වැන්නක් ගන්න බැහැ කියලා. එහෙම කියපු අතීතයක් තිබුණා. ගොවි ජනතාවට අවමන් කළා. ඒ නිසා ගොවි ජනතාව කනස්සල්ලට පත් වුණා. හැබැයි, අනුර කුමාර දිසානායක අපේ ජනාධිපති සහෝදරයා මේ ඉදිරිපත් කරපු අය වැය ඇතුළේ බිඳ වැටුණු කෘෂි කර්මාන්තය නැවත ගොඩ ගන්නේ කොහොමද කියන එක පෙන්වා දීලා, ඒ සඳහා වැඩිපුර ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා.

විශේෂයෙන් ගත්තොත්, අපේ රටේ කෘෂි කර්මාන්තය සඳහා රුපියල් ලක්ෂ 56,000ක් වෙන් කරලා තිබෙනවා. මෙහි තිබෙන විශේෂ කාරණා කිහිපයක් මතු කරලා පෙන්වන්න පුළුවන්. එකක් තමයි, අපේ රටේ කෘෂි කර්මාන්තය ඉදිරියට ගෙනයන්න, නවීකරණය කරන්න, තාක්ෂණය එකතු කරන්න ආණ්ඩුවක් විධියට අපි බලාපොරොත්තු වෙනවා. තාක්ෂණයෙන් දශක දෙකක් විතර ආපස්ස ගිහිල්ලා තිබෙන අපේ රට, තාක්ෂණයෙන් පිම් ගණනාවක් ඉදිරියට ගෙන යෑම වෙනුවෙන් අවධානය යොමු කරලා තිබෙනවා. ඒ සඳහා රුපියල් මිලියන 1,250ක් වෙන් කරලා තිබෙනවා. එය විශේෂ කාරණයක් ලෙස පෙන්වා දෙන්න පුළුවන්. අපි දන්නවා, අපේ ගම්වල ගොවි ජනතාව තවමත් දණිස දක්වා එරි -එරී කුඹුරට තෙල් ගහනවා. තවමත් ඉතාම ප්‍රාථමික විධියටයි කෘෂි කර්මාන්තයේ නියැළෙන්නේ. එම නිසා ඉදිරියේදී අපේ රටේ ගොවි ජනතාවට අලුත් තාක්ෂණය වැඩි වැඩියෙන් හඳුන්වා දෙන්නට ඕනෑය කියන අදහස සහිතව ඒ මැදිහත් වීම කරන්න අපි සූදානම්.

ඒ වාගේම කුඩා පරිමාණ කෘෂි ව්‍යවසායකයන්වත් ශක්තිමත් කරන්න ඕනෑ. අලුත් ව්‍යවසායකයන් හඳුන්වා දෙන්න ඕනෑකම තිබෙනවා. අපි අපටම ආහාර නිෂ්පාදනය කර ගන්නවා වෙනුවට

භාණ්ඩාගාරයේ ඩොලර් සංචිතය තව තවත් තර කර ගැනීම වෙනුවෙන් අනාගතයේදී අපේ රටේ ගොවි ජනතාව නිෂ්පාදනය කරන අස්වැන්න අපනයනය කරලා, මහා භාණ්ඩාගාරයට තව තවත් වැඩියෙන් ඩොලර් එකතු කරන්න පුළුවන් මට්ටමට අපි අපේ රටේ කෘෂි කර්මාන්තය දියුණු කරන්න ඕනෑකම තිබෙනවා. ඒ වෙනුවෙන් රුපියල් මිලියන 3,470ක් වෙන් කරලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ වාගේම කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර නඟා සිටුවීමේ වැඩසටහන යටතේ අපි තවත් රුපියල් මිලියන 5,947ක් වෙන් කර තිබෙනවා.

ඒ වාගේම අපට තිබෙන ප්‍රධාන ප්‍රශ්නයක් තමයි, අපේ රටේ අතිරේක බෝග වගාව විශාල ලෙස කඩාගෙන වැටීම. ඒ නිසා අපේ රටේ කෘෂි කර්මාන්තයේ තුන්වැනි කන්නයක් ගැන, එහෙම නැත්නම් අතරමැදි කන්නයක් ගැන ආණ්ඩුවක් විධියට අපි කල්පනා කරනවා. එම අතරමැදි කන්නය ගැන අපි අතීතයේ ඕනෑ තරම් අහලා තිබෙනවා. හැබැයි, දැන් අතරමැදි කන්නයක් ගැන කථා ඉවත් වෙලා තිබෙනවා. එහෙමත් තැනක තමයි මැදි කන්නය, අතරමැදි කන්නය වගා කරන්නේ. අතරමැදි කන්නයේ තමයි අපේ රටේ අතිරේක බෝග වැඩි වශයෙන් වගා කර ගන්න ඉඩ කඩ තිබෙන්නේ. එම නිසා අතිරේක බෝග වගා වැඩසටහනට රුපියල් මිලියන 150ක් වෙන් කර තිබෙනවා. අපි මේ වර්ෂය ඇතුළේ අතිරේක බෝග වැඩිපුර වගා කරලා, පිට රටින් අපේ රට ඇතුළට ගෙනෙන අතිරේක ආහාර ටික අඩු කර ගන්න ඕනෑය කියා අපි කල්පනා කරනවා.

අනෙක් පැත්තෙන් ගත්තාම ප්‍රධාන කාරණයක් ලෙස ජාතික බීජ නිෂ්පාදන සහ මිලදී ගැනීමේ වැඩසටහන පෙන්වා දෙන්න පුළුවන්. අපි කවුරුත් දන්නවා, කෘෂි කර්මාන්තයේ යෙදෙන අපේ රටේ ගොවි ජනතාවට අධික වැය බරක් දරලා බීජ ටික මිලදී ගන්න සිදු වෙලා තිබෙන බව. ඒ නිසා අනාගතයේදී අපේ රටේ ගොවි ජනතාවට ඕනෑ කරන බීජ ටික අපේ රට ඇතුළේම නිෂ්පාදනය කරලා සහන මිලට ලබා දෙන්න ආණ්ඩුවක් විධියට අපි කල්පනා කරනවා. අපේ රටේ බීජ පර්යේෂණායතන තිබෙනවා. ඒවාට ඕනෑ කරන පහසුකම් ටික දෙන්න ඕනෑකම තිබෙනවා. බීජ පර්යේෂකයෝ ඉන්නවා. ඒ පර්යේෂකයන්ට ඕනෑ කරන පහසුකම් ටික දෙන්න ඕනෑකම තිබෙනවා. ඒ වාගේම බීජ ගොවිපොළවල් තිබෙනවා. ඒ බීජ ගොවිපොළවල්වලට දෙන්න ඕනෑ පහසුකම් ටික දෙන්න ඕනෑකම තිබෙනවා. ඒ වෙනුවෙන් රුපියල් මිලියන 1,250ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම කඩිනම් බීජ ගොවිපොළ සංවර්ධන වැඩසටහනත් ඒකටම අදාළයි. දැනට තිබෙන බීජ ගොවිපොළවල්වලින් විතරක් අපේ බීජ අවශ්‍යතාව සපුරාගන්න බැහැ කියලා අපි දන්නවා. රට පුරා ගොවි ජනතාව විශාල පිරිසක් මෙම බීජ නිෂ්පාදනය වෙනුවෙන් එකතුවෙලා ඉන්නවා. ඒ නිසා, අපට වැඩි අස්වැන්නක් ගන්නට නම් ඒ සඳහා කුඩා කණ්ඩායම් දායක කර ගන්නවා වාගේම, ගොවි ජනතාව තවත් වැඩි වශයෙන් බීජ නිෂ්පාදන කටයුතු වෙනුවෙන් දායක කරගෙන අපට අවශ්‍ය බීජ නිෂ්පාදනය වේගවත් කරන්න ඕනෑය කියලා අපි ආණ්ඩුවක් විධියට කල්පනා කරලා තිබෙනවා. ඒ වෙනුවෙන් අපි රුපියල් මිලියන 600ක් වෙන් කරලා තිබෙනවා. ඒ විධියට අපේ රටේ බිඳ වැටී තිබෙන කෘෂි කර්මාන්තය නැවත නඟා සිටුවීම වෙනුවෙන් අපි වැඩි වැඩියෙන් මුදල් වෙන් කර තිබෙනවා.

අනෙක් පැත්තෙන් අපේ රටේ තිබෙන ප්‍රධාන අංශයක් තමයි පශු සම්පත් ක්ෂේත්‍රය. අපේ රටේ බිඳ වැටී තිබෙන පශු සම්පත් ක්ෂේත්‍රය නැවත ගොඩනඟලා ඉදිරියට ගෙන යෑම වෙනුවෙන් සැලසුම් හදලා ඒ සඳහා 2025 වර්ෂයට රුපියල් ලක්ෂ 26,000ක් වෙන් කරලා තිබෙනවා. අපේ රටේ කිරි අවශ්‍යතාවෙන් සියයට 45යි අපේ රට තුළ නිෂ්පාදනය කරන්නේ. ඉතිරි සියයට 55 ගෙනෙන්නේ පිට රටින්. අපට අවශ්‍ය කිරි පිටි ටික අපි පිට රටින් ගෙනැල්ලා ඩොලර් වැය කරනවා වෙනුවට, ඒ ඩොලර් ටික භාණ්ඩාගාරයේ ඉතිරි කර ගන්න ඕනෑ නම්, අපේ රට ඇතුළේ කිරි නිෂ්පාදනයට දායක වන ගොවි ජනතාවට අවශ්‍ය පහසුකම් ටික සපයන්න ඕනෑකම තිබෙනවා.

ඒ වාගේම ඔවුන්ට අවශ්‍ය තාක්ෂණය සපයන්නත් ඕනෑකම තිබෙනවා. මේ ආදී ගොවි ජනතාවගේ ප්‍රශ්න විසඳීමේ ඕනෑකම අපට තිබෙනවා. අපි දැක්කා, පෙර වරුවේ කථා කළ සමහර මන්ත්‍රීවරු සත්ව පාලනයේ යෙදිලා ඉන්න ජනතාවගේ ප්‍රශ්න ගැන කථා කරනවා. ආණ්ඩුවක් විධියට අපි රටේ පශු සම්පත් ක්ෂේත්‍රය ගොඩනැඟීම පිළිබඳව අවධානයෙන් යුතුව ඒ වෙනුවෙන් මැදිහත්වෙමින් ඉන්නවා. වැඩිපුර මුදල් වෙන් කරලා, අලුත් තාක්ෂණය ගමට ගෙනිහිල්ලා, මේ කර්මාන්තයේ යෙදෙමින් තැන තැන විසිරිලා ඉන්න ගොවි ජනතාව එකතු කරලා ඔවුන්ට විශ්වාසවන්තව ඒ කටයුත්ත කරගෙන යෑමට අවශ්‍ය මැදිහත්වීම අපි කරනවා.

එදා හිටපු සමහර මන්ත්‍රීවරු, ඇමතිවරු ඇහුවා, "ඔක්සිජන් කන්නද" කියලා. දැන් අපේ රටේ බොහෝදෙනෙක් භාගෙට හුස්ම අරගෙන ඉන්නේ කියලා අපි දන්නවා. මොකද, දැන් පිරිසිදු වාතාශ්‍රය ලබා ගන්න බැරි මට්ටමට අපේ රටේ වනාන්තර විනාශ වෙලා තිබෙනවා. ඒ කියන්නේ අද අපට අවශ්‍ය ප්‍රමාණයට වනාන්තර නැහැ. ඒ නිසා අපි ආණ්ඩුවක් විධියට කල්පනා කරලා තිබෙනවා, අපේ රටේ පරිසර පද්ධතිය සුපෝෂණය කරන්න ඕනෑ, වනාන්තර පද්ධතිය ආරක්ෂා කර ගන්න ඕනෑ කියලා. අපි ඒ වෙනුවෙනුත් වැඩි අවධානයක් යොමු කරමින් මුදල් වෙන් කරලා තිබෙනවා.

අපි දන්නවා, පසුගිය කාලයේ හිටපු ජනාධිපතිවරුන්ගේ පුත්තු රොකට් යැව්වා කියලා. ජනතාවට සිහින පෙන්වලා, ජනතාවගේ සිහින විනාශ කරලා රොකට් යවපු ඉතිහාසයක් අපට තිබෙනවා. හැබැයි, අපි අලුත් බලාපොරොත්තු සහිතව ගම්වල ජීවත් වන නව නිර්මාණකරුවන්ට, පාසල්වල ඉගෙන ගන්නා නව නිර්මාණකරුවන්ට, පර්යේෂකයන්ට වැඩි ඉඩ කඩ දීලා තිබෙනවා, වැඩි අවස්ථා දීලා තිබෙනවා. ඒ අනුව තාක්ෂණයේ පිම්ගණනාවක් ඉදිරියට යන්න කල්පනා කරන මේ මොහොතේ තරුණ පරම්පරාවට, දූවා දරුවන්ට, ජනතාවට රටේ අනාගතය ගැන බලාපොරොත්තු සහිතව ජීවත් වෙන්න පුළුවන් අය වැයක් අපි ඉදිරිපත් කරලා තිබෙනවා.

මේ රටේ ජනතාවට කියන්න තවත් කාරණයක් තිබෙනවා. දැන් විපක්ෂයේ බොහෝ මන්ත්‍රීවරු විවිධ කථා, විවිධ අදෝනා ගම්වල ඉන්න ජනතාවට ප්‍රකාශ කරමින් ඉන්නවා, මාධ්‍ය තුළ විවිධ අදහස් ප්‍රකාශ කරමින් ඉන්නවා. ඒ වාගේම ඔවුන් අද රාජ්‍ය සේවකයන්ගේ වැටුප ගැන විවිධ මත හදන්න උත්සාහ කරමින් ඉන්නවා. සමහර මන්ත්‍රීවරු කියනවා, රනිල් වික්‍රමසිංහ මහත්තයා ගිය වැල් පාලමේම අපිත් යන්න හදනවා කියලා. සීයා ගිය පාරේ ජාතික ජන බලවේගයේ ආණ්ඩුව කොහොමත් යන්න සූදානම් නැහැ. අපි ආවේ system change එකකට, සමාජ පරිවර්තනයක් වෙනුවෙන්, මේ රටේ ජීවත් වන ජනතාවට අලුත් බලාපොරොත්තු සහිතව සතුටින් ජීවත් වෙන්න පුළුවන් රටක් නිර්මාණය කිරීම වෙනුවෙන්. ඒ මියැදුණු වැල් පාලමේ යන්න, ජනතාව ප්‍රතික්ෂේප කළ වැල් පාලමේ යන්න ජාතික ජන බලවේගයේ ආණ්ඩුවේ අපි සූදානම් නැහැ. අපි අපේ රටේ නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කරන්න, අලුත් තාක්ෂණය එකතු කරලා නව කර්මාන්තකරුවන්ට ඒ සඳහා අවස්ථාව හදලා දෙනවා. ඒ වාගේම ජනතාවට නීරෝගීව ජීවත් වෙන්න පුළුවන් රටක් අපි නිර්මාණය කරනවා.

[ගරු සුසන්ත කුමාර නවරත්න මහතා]

අපේ රටේ අධ්‍යාපනය බිඳ වැටිලා තිබෙන බව ඈත ගම්මානවලට යනකොට අපට පෙනෙනවා. මැදවච්චිය, පදවිය, කැබිතිගොල්ලෑව, රඹෑව වාගේ ඈත ගම්මානවල ඉන්න දූවා දරුවන්ට අධ්‍යාපනය සම්බන්ධ බරපතළ ප්‍රශ්න තිබෙනවා. වසර ගණනාවක් තිස්සේ අධ්‍යාපනයේ විසමතා නිර්මාණය කළ පාලකයෝ දැන් කියනවා, මේ අය වැයෙන් ඒ දරුවන්ගේ ප්‍රශ්න ගැන, අධ්‍යාපනය ගැන අවධානයක් යොමු කරලා නැහැ, ගම්වල ඉන්න ජනතාවගේ ප්‍රශ්න ගැන අවධානයක් යොමු කරලා නැහැ කියලා. නමුත් අපි අධ්‍යාපනයට වැඩි වැඩියෙන් මුදල් වෙන් කරලා අධ්‍යාපන ක්ෂේත්‍රය තවත් විධිමත් කරන්න අවධානය යොමු කරලා තිබෙනවා. සෑම ක්ෂේත්‍රයක් ඇතුළේම, තරුණයා වෙන්න පුළුවන්, ධීවර ජනතාව වෙන්න පුළුවන්, කාන්තාව වෙන්න පුළුවන්, මේ හැම කෙනාගේම ප්‍රශ්න ගැන අපි අවධානය යොමු කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුව ඇතුළේ මන්ත්‍රීවරු 159ක් නියෝජනය කරමින් අපි ගෙන යන මේ සටන මේ රටේ ජනතාවට සුබිත මුදිත ජීවිතයක් අත්පත් කර දීමකින් තොරව අත්හරින්නේ නැහැ කියන ප්‍රකාශය කරමින් මම නවතිනවා. මේ අවස්ථාව ලබා දීම වෙනුවෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 16ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.24]

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවර අය වැය පිළිබඳව වචන කිහිපයක් ප්‍රකාශ කරන්නට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මේ අය වැය ගැන ලොකු ලොකු කථා ඇහෙනවා. මේ අය වැය ගැන කථා කරනකොට, අය වැය කොහොමද කියලා නොවෙයි, අය වැය කථාව කොහොමද කියලා ඇහුවොත් අපට දෙන්න පුළුවන් ලකුණු 100න් 100ම.

ඒක පාර්ලිමේන්තු ඉතිහාසයේ හොඳම ඉදිරිපත් කිරීම. ඒක ගැන විවාදයක් නැහැ. අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා වේදිකාවේදී රටේ ජනතාව ඇන්දුවා වාගේම පාර්ලිමේන්තුවේදීත් ඒ කටයුත්ත ලස්සනට හොඳට හැඩදාලා, වැඩදාලා ඉදිරිපත් කළා. ඒකට අපට දෙන්න පුළුවන් උපරිම ලකුණු ප්‍රමාණය ලබා දෙන්න අපි සූදානම්. ඒකේ විවාදයක් නැහැ. හැබැයි, අය වැය කොහොමද කියලා ඇහුවොත් මේකට අපේ ගමේ භාෂාවෙන් කියන්න තිබෙන්නේ, "තක්කඩි අය වැයක්" කියලායි. මේක ඉතිහාසයේ වාගේම ජනතාවට සිහින පෙන්නපු අය වැයක්. සුරංගනා කථා ගොඩක් එල්ලපු අය වැයක්. සියල්ලම තීරණය කරන සාධකය මුදල් වනකොට, ඒ ඔක්කෝටම රුපියල් මිලියන 100යි, රුපියල් මිලියන 50යි වාගේ බොහොම සොච්චම් ගණන්. නමුත්, අවසානයේ ලොකු කතන්දර ගොඩක් මවලා තිබෙනවා.

දැන් මේ අය වැය ගැන ලොකුවට කථා කරනවා. මේ අය වැයේ ලොකුම කතිකාව බවට පත් වුණේ රාජ්‍ය සේවක වැටුප් වැඩිවීමයි. ඉතිහාසයේ ලොකුම වැටුප් වැඩි කිරීම, කිසිම රජයක් රාජ්‍ය සේවකයෝ දිහා බැලුවේ නැති වුණාම අපට තමයි රාජ්‍ය සේවකයන් ගැන කැක්කුම ඇති වුණේ කිව්වා. ඒක අනිවාර්යයෙන්ම වෙන්න ඕනෑ. සියයට 80ක් රාජ්‍ය සේවකයෝ කටකපලා ඡන්දය දුන්නා. Canvassing කරලා ගමම එකතු කරලා දුන්නා. ඒ නිසා රාජ්‍ය සේවකයන්ට හොඳට සලකන්න ඕනෑ. මේ අයට නොසලකා ඉන්න බැහැ. හැබැයි, සැලකුවේ කොහොමද? ඒකත් තල්ලු කරලා දැම්මේ, අනාගත ආණ්ඩුවකට. මූලික වැටුපට එකතු කරලා, එකතු කරලා මෙන්න කියලා පෙන්නුවා. හැබැයි, රාජ්‍ය සේවකයාට සොච්චම් වැටුපක් ලබා දෙන්න තමයි කටයුතු කරලා තිබෙන්නේ. තව කාලයකින් මේ ආණ්ඩුව ඉවර වෙනවා කියලා දන්නවා. මේ පව් ටික අනාගත ආණ්ඩුවකට භාර දීලා මේ අය මෙතැන පම්පෝරි ගහනවා. රාජ්‍ය සේවකයන්ට පෙන්වනවා, වැටුප් වැඩි කරලා දෙනවා කියලා. හැබැයි, එල්ලලා තිබුණු මුදල මූලික වැටුපට දාලා තිබෙනවා. මූලික වැටුපට දැම්මාම, විවිධ දේවල්වලට කැපෙනකොට අතට එන මුදල කොච්චරද?

හැබැයි, මේ රටේ රාජ්‍ය සේවකයන්ට වැඩ කළේ නැහැ කියලා කියන යහ පාලන රජය කොහොමද වැටුප් වැඩි කළේ? මේ අයත් යහ පාලන රජයේ අයිතිකාරයෝ. ඒක නැහැයි කියන්න බැහැ. යහ පාලන රජය ගෙනෙන්න වේදිකා ගණනේ ආවා. රනිල් වික්‍රමසිංහගෙන් දින 52ක් ආණ්ඩුව හොරකම් කර ගත්තාම, ඔළුවේ අත ගහගෙන වටේ දුවලා අනුර කුමාර දිසානායක තමයි ඒ ආණ්ඩුව නැවත ගෙනෙන්න කටයුතු කළේ. ඒ යහ පාලන රජයේ කොටස්කාරයෝ විධියට එතුමන්ලා ඉන්නකොට සියයට 107කින් වැටුප් වැඩි වීමක් දීලා ඒක මූලික වැටුපටත් එකතු කරලා දුන් නිසා තමයි ලංකාවේ වාහනවලට බදු ගහන එක වැඩි කරන්න අපට සිදු වුණේ. ගෙදර නෝනයි, මහත්තයායි රාජ්‍ය සේවයේ ඉන්නවා නම් ඔවුන් වාහනයක් ගත්තා, ඒ වැඩි වෙච්ච වැටුපට හරියන විධියට ලීසිං එකක් දාගෙන ගෙවන්න. ඇල්ටෝ, මරුටි වාහන විශාල ප්‍රමාණයක් එක වර අපේ රටට ඇතුළු වුණේ කොයි කාලයේද කියලා ඔබතුමන්ලා හොයලා බලන්න.

අපි ඒ කාලයේ සලකපු හැටි රාජ්‍ය සේවයේ මහත්වරුන්ට ටික කාලයක් යනකොට අමතක වුණා. ඊට වැඩිය අපි දෙන්නම් කියලා කථා ගොඩක් මවලා ආපු ආණ්ඩුව මේ විධියට සොච්චමක් දීලා රාජ්‍ය සේවකයෝ කුට්ටුවට දාපු එක ගැන රාජ්‍ය සේවක මහත්වරු අප්‍රේල් මාසයේ වැටුප ලැබුණාම ආණ්ඩුව ගැන කතිකාව ඇති කර ගනීවි. දැන් මේ කියන කතන්දර ඔක්කෝම අපි අහගෙන ඉන්නවා. මට කලින් කථා කරපු මන්ත්‍රීතුමෙකුත් ඒ ගැන විග්‍රහ කළා. එතුමාටත් චෝදනාවක් තිබෙනවා, මැතිවරණයට ඉදිරිපත් වෙද්දි තඹුත්තේගම කාර්යාලයකින් මාසික වැටුපත් ගත්තා කියලා. ඒ පිළිබඳව විමසන්න අපි බලාපොරොත්තුවෙන් ඉන්නවා. මේ අය වැය ගැන විවිධ කතන්දර ඇති කර ගන්න පුළුවන්. මේ අය වැයේ තිබෙන දේවල් ඉදිරි කාලය තුළ ක්‍රියාත්මක කරයි කියලා දෙන්න පුළුවන් විශ්වාසය මොකක්ද? ඒවා මේ රටේ යථාර්ථයක් බවට පත් වෙනවා කියන එකට දෙන්න පුළුවන් සහතිකය මොකක්ද?

ඔබතුමන්ලා ආවේ ජාතික ආරක්ෂාව පිළිබඳව අපට lectures දෙන්න. ඒක අහගන්න බංකු අරගෙන ඇවිල්ලා වාඩිවෙන්න කිව්වා. ජාතික ආරක්ෂාව සුරක්ෂිත කරලා දෙන්නම් කියලායි කථා කළේ. දැන් ජාතික ආරක්ෂාව ඉගෙන ගන්න වෙලා තිබෙන්නේ අපට නොවෙයි. ජාතික ආරක්ෂාව සහතික කරන්න ආපු අයගේ බංකු අස්සේ රිංගලා අපේ ආරක්ෂාව තහවුරු කරගන්නයි දැන් වෙලා තිබෙන්නේ. රටේ ආරක්ෂාව දැන් ඒ තැනට පත්ව තිබෙනවා.

දැන් පම්පෝරි ගහනවා, ඒ වෙඩි තියපු පුද්ගලයා අපි අල්ලගත්තා කියලා. වෙඩි තියපු පුද්ගලයා අල්ලගන්න අවශ්‍ය තොරතුරු මේ රටේ බුද්ධි අංශ තහවුරු කළා, මීට සති ගණනකට පෙර මෙවැනි කාරණයකට අධිකරණය තුළ ලැස්ති වෙනවා

කියලා. මේක සහරාන්ගේ ප්‍රහාරය වාගේ තවත් එකක් විතරයි. සියලු බුද්ධි තොරතුරු ලැබිලා තිබෙද්දී ඒ පිළිබඳව ක්‍රියාත්මක වෙන්නේ නැතුව සහරාන්ලාට ගහන්න ඉඩහැරියා -පාස්කු ඉරුදින ප්‍රහාරය සිදු වෙන්න ඉඩ හැරියා- වාගේ එකක දෙවැනි අදියර තමයි මේක. ඒකේ දෙවැනි පිටපත තමයි මේක. මේ සම්බන්ධ සියලු තොරතුරු ලබා දීලා තිබුණා. ඒ කාන්තාවගේ නමත් ලබා දීලා තිබුණා. පින්පුර දේවගේ ඉෂාරා සෙව්වන්දි කියන මේ කාන්තාව කාලයක් තිස්සේ මේ කටයුත්තට සූදානම් වෙනවා කියලා බුද්ධි අංශ තහවුරු කර දීලා තිබෙද්දී තමයි මේ සිද්ධිය වුණේ. ඔවුන් අධිකරණය ඇතුළට ඇවිල්ලා වෙඩි තියලා යනකල් ආරක්ෂාවේ කප්පිත්තෝ කියපු අයට ඔවුන්ගේ එක මයිලක්වත් හොයා ගන්න පුළුවන් වුණාද? ඒ කාන්තාව එතැනට ඇවිල්ලා පිස්තෝලයත් ගෙනැල්ලා දීලා පිට වෙලා ගියා. අද වෙනකොට ඉන්න තැනක් දන්නේත් නැහැ.

මුදල්වලට තිබෙන පෙරේතකමට, පොරොන්දු වෙච්ච මුදල දෙන්න තිබෙන කැදරකමට ඩුබායිවල ඉන්න ඒ පාතාලයේ මිනිස්සුම මේ අය ගැන ඔත්තුව දුන්නා. වාහනේ නොම්මරයත් එක්ක දුන්නාම STF එක සිවිල් පිට ගිහිල්ලා එතැන නතර වෙලා ඉන්නවා. නතර වෙලා ඉඳගෙන ඒ පුද්ගලයාත් එක්ක සතුටු සාමීචියේ යෙදෙනවා. ඒ, ඇයි? Uniform නැතුව අත්අඩංගුවට ගන්න බැහැ. සැකකරු අල්ලා ගත්තාට පස්සේ uniform ඇඳගත් කණ්ඩායමක් එනකල් සතුටු සාමීචියේ යෙදෙනවා.

වෙන කෙනෙක්ව අල්ලා ගත්තා නම් කොහොමද? ගහලා, මුහුණු වහගෙන අරගෙන යන්නේ. හැබැයි, ඒ කට්ටිය කැමරාත් අරගෙන ගිහිල්ලා. මේ අපවාදයෙන් බේරෙන්න STF එක කැමරාත් අරගෙන ගිහිල්ලා තමයි ඔහුව අත්අඩංගුවට ගන්නේ. ඔහු ප්‍රධාන චූදිතයෙක්; ප්‍රධාන වරදකාරයෙක්. ඔහුව ඉදිරිපත් කරන්න ඕනෑ, හඳුනා ගැනීමේ පෙරෙට්ටුවකට. දැන් ආපසු මොකටද ඔහු හඳුනා ගැනීමේ පෙරෙට්ටුවකට ඉදිරිපත් කරන්නේ? සියල්ලම විවර වෙලා ඉවරයි. මේ සියල්ලටම හේතුව ආණ්ඩුවේ නොහැකියාව.

ඒ වාගේම මේ රටේ සමස්ත ක්‍රිස්තියානි ජනතාව මත මෙතුමන්ලා විශාල විශ්වාසයක් ගොඩනැඟුවා, "අපි පාස්කු ප්‍රහාරයේ මහ මොළකරුවෝ අල්ලනවා, අල්ලනවා, අල්ලනවාමයි" කියලා. හැබැයි, අපි ඒ අය අල්ලලා දෙනවා කියලා මෙතුමන්ලා ඒක යටපත් කළා. පාස්කු ප්‍රහාරයේ මහ මොළකරුවෝ කවුද මහත්තයෝ, අධිආරක්ෂිත කලාපය ඇතුළට රිංගලා, STF එකත් සිටිද්දී වෙඩි තබා මරා දමා ගිය මිනිහාව අල්ලා ගන්න බැරිව. එම අපරාධයේ සැබෑ මහ මොළකරු අතුරුදහන්. ඔත්තුව දුන්නාම ඒ shooter විතරක් අල්ලා ගත්තා. හැබැයි, ඒ අපරාධයට සම්බන්ධ කාන්තාව අද වනතෙක් ආගිය අතක් නැහැ. ඔබතුමන්ලාගේ බුද්ධි අංශවලට, ඔබතුමන්ලාගේ ආරක්ෂක අංශවලට වැඩිය පාතාලයේ ඒ කාන්තාව ශක්තිමත්. ඇය දන්නවා, මිය ගිය ඒ පාතාලකරුවා එදින අංක 09 අධිකරණ ශාලාවේ පැවති නඩුවකට ගෙනෙනවා කියලා. එම නඩුවේ කට උත්තරය Zoom හරහා ගන්න පුළුවන්කම තිබෙද්දී, එසේ නොකර භෞතිකව පෙනී සිටින්න කියලා අංක 09 අධිකරණ ශාලාවෙන් නියෝගයක් දීලා තිබෙනවා. අපරාධකරුව අංක 09 අධිකරණ ශාලාවට ගෙනෙනකොට එදිනම අංක 05 අධිකරණ ශාලාවේ තවත් නඩුවක් තිබෙනවා. ඒ නිසා අංක 09 අධිකරණ ශාලාවේදී ඔහුව ඝාතනය කරන්න බැහැ. හැබැයි, ඔහුව ඝාතනය කරන්න පුළුවන් අංක 05 අධිකරණ ශාලාවේදී කියන එක ඔබතුමන්ලාට වැඩිය හොඳට මේ රටේ පාතාලය අතරට ගිහිල්ලා තිබෙනවා. පාතාලය එතැන ඉඳලා සැලසුම් කරලා එම ඝාතනය කරවලා තිබෙනවා. එහෙම තිබෙද්දී ජාතික ආරක්ෂාව තහවුරු කරන්න එනවා.

අද පාර්ලිමේන්තුවට, ගොඩනැඟිලිවලට ආරක්ෂාව දීලා. මන්ත්‍රීවරුන්ට ආරක්ෂාව දෙන්න බැහැ. බංකුවේ ඉඳගෙන lectures අහන්න ආපු කට්ටිය බංකුව අස්සේ. හැබැයි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට නොවෙයි නේ ආරක්ෂාව ඕනෑ. දැන් පාර්ලිමේන්තුව වටේ ඉන්න STF එක වැඩි කරලා තිබෙනවා. පාර්ලිමේන්තුව වටේ ඉන්න පොලීසිය වැඩි කරලා තිබෙනවා. අපේ මාදිවෙල නිවාස සංකීර්ණයට STF එකේ නිලධාරින් දමා තිබෙනවා. ඒ, ගොඩනැඟිලි රකින්නද? එම නිලධාරින් දාලා තිබෙන්නේ ගොඩනැඟිලි ආරක්ෂා කරන්නද? ඔබතුමන්ලා ලජ්ජා වෙන්න ඕනෑ. හෙට මහ පාරේ මේ රටේ මන්ත්‍රීවරයෙකුත් මරා යන කල්ද බලාගෙන ඉන්නේ? ආරක්ෂාව තුට්ටු දෙකට දමලා, තමන්ගේ දේශපාලන වෛරය නඩත්තු කරන්න උත්සාහ කරනවා. හෙට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් ඝාතනයට ලක් වුණොත් එහි සම්පූර්ණ වගකීම මේ ආණ්ඩුව භාර ගත යුතු වෙනවා; ඒ සියල්ලම ආණ්ඩුවට භාර ගන්න වෙනවා. වැඩි කාලයක් නොගිහින් ආරක්ෂාව ඕනෑ වෙන්නේ ඔබතුමන්ලාටමයි.

මතක තබා ගන්න, අපට ප්‍රශ්නයක් නැහැ. අපට අදටත් ප්‍රශ්නයක් නැහැ. ඉදිරියටත් අපට ගැටලුවක් නැහැ. මොකද, අපි ජනතාව වෙනුවෙන් පෙනී සිටින්නේ. මම මේ කථා කරන්නේ රෝහණ බණ්ඩාරගේ ප්‍රශ්න නොවෙයි. මේ රටේ ජනතාවගේ ප්‍රශ්න. රටේ ජනතාවගේ ප්‍රශ්න ගැන කථා කරනකොට අපට පාතාලයට විරුද්ධව කථා කරන්න සිද්ධ වෙනවා. කුඩු ජාවාරම්කාරයන්ට විරුද්ධව කථා කරන්න වෙනවා. ඒ වාගේම සමහර ජාවාරම්කාරයන්ගේ හිත සුව පිණිස නොවන දේවල් අපි මෙතැන කථා කරනවා. එහෙම කථා කරන නිසා රෝහණ බණ්ඩාරට නම් පෞද්ගලිකව ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නයක් නැහැ. හැබැයි, ලක්ෂ 225ක් නියෝජනය කරන්න සිටින ගරු මන්ත්‍රීවරු 225දෙනා මේ රටේ ජනතාවගේ ආරක්ෂාව වෙනුවෙන්, ජනතාවගේ අනාගත උන්නතිය වෙනුවෙන් තීන්දු තීරණ ගන්න කථා කරනකොට එය මේ රටේ ජාවාරම්කාරයන්ට තර්ජනයක් වෙනවා. අන්න ඒ නිසායි උත්තරීතර පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීවරුන්ට ආරක්ෂාව දෙන්න කියන්නේ. එහෙම නැතුව මේ ඉන්න මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලිකත්වයට නොවෙයි, ආරක්ෂාව දෙන්න කියන්නේ. මේ රටේ උත්තරීතරභාවය පිළිබඳව තීන්දු තීරණ ගන්න, මේ රටේ වංචල සහ නිශ්චල දේපළ පිළිබඳව තීන්දු තීරණ ගන්න පිරිසටයි ආරක්ෂාව දෙන්න කියන්නේ. ඒ නිසා මන්ත්‍රීවරුන්ගේ උත්තරීතරභාවය ආරක්ෂා කරන්න. ඒක කෙලෙසලා ඔබතුමන්ලා බලයට ගත්ත එක හරි. හැබැයි, එහෙම කරලා ඔබතුමන්ලා මේ මොනවාද කරගෙන යන්නේ? වගකීමෙන් යුතුව ජනතාවට කථා කරනවාද? අද ජාතික ආරක්ෂාව සම්පූර්ණයෙන්ම ගිලිහී ගිහිල්ලා.

පෞද්ගලික අංශයේ වැටුප් වැඩි කරනවා කියන එක රජයට බරක්ද? එය රජයට තව වාසියක්. ETF හා EPF හරහා එන සල්ලි ටිකෙන් තවත් ණය ගන්න පුළුවන්. පෞද්ගලික අංශයේ සේවකයන්ගේ අවම මාසික වැටුප රුපියල් 21,000ට, රුපියල් 30,000ට තිබුණේ මේ මෑතක. ඔය වැටුපටද මේ රටේ පෞද්ගලික අංශයේ සේවකයෙක් වැඩ කරන්නේ? රුපියල් 30,000ට වැඩ කරන සේවකයෝ ඉන්නවා නම් අපට ගෙනැල්ලා දෙන්න. රුපියල් 30,000ට වැඩ කරන සේවකයෝ කොහේද ඉන්නේ? මේ කථා පම්පෝරි ගහන්න හොඳයි. මේවා මහ පොළොවේ යථාර්ථය නොවෙයි. මාසික අවම වැටුප රුපියල් 30,000ට වැඩි කළාම වෙන්නේ ETF සහ EPF වෙනුවෙන් ගෙවන මුදල වැඩි වන එකයි. මාසික වැටුපෙන් හදාගෙන හිටපු වියදම් රාමුව වෙනස් වීම විතරයි වෙන්නේ. ETF සහ EPF ලබන සමහර කට්ටිය අපි ළඟත් වැඩ කරනවා. ඔවුන් කියන්නේ, අනේ මහත්තයෝ මගේ වැටුපෙන් නම් ETF සහ EPF අය කරන්න එපා කියායි. කම්කරු දෙපාර්තමේන්තුවෙන් ප්‍රශ්න ඇති වන නිසා අපි සේවකයන්ව ලියාපදිංචි කරලා ETF සහ EPF වෙනුවෙන් වැටුපෙන් කපනවා.

[ගරු රෝහණ බණ්ඩාර මහතා]

අනේ, ETF සහ EPF වැටුපෙන් කපන්න එපා කියලා අඬන කම්කරු මහත්වරු ඉන්නේ. එම නිසා අවම වැටුප වැඩි කළා කියලා ඔබතුමන්ලා පම්පෝරි ගහන්න එපා. මෙම යෝජනාව තුළ ඔබතුමන්ලා කරපු විශේෂ කාර්යභාරයක් නැහැ.

ප්‍රවාහනය පිළිබඳ කාරණයේදී අනුරාධපුරය ගැන කථා කිරීම සම්බන්ධයෙන් සතුටුයි. ජනාධිපතිතුමාගේ ගෙදර ලිපිනය ගැන, තඹුත්තේගම සිග්නල් කණු ගැන කථා වන නිසා මම කියන්න කැමතියි, තඹුත්තේගම දුම්රිය ස්ථානය සංවර්ධනය කරන්න නොවෙයි, එහි මූලික කර්තව්‍යය සඳහා සහාය දැක්වීමට ශක්‍යතා අධ්‍යයනයක් කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 100ක් මෙවර අය වැයෙන් වෙන් කරලා තිබෙන බව. ඒකට හේතුව වශයෙන් මොකක්ද පෙන්වන්නේ? ආර්ථික මධ්‍යස්ථානයක් ළඟම තිබෙන දුම්රිය ස්ථානය වීම. අපේ රටේ දුම්රිය ප්‍රවාහනය ගැන ඔබතුමන්ලාට ආපසු අමුතුවෙන් මම කියන්න ඕනෑ නැහැ. තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථානයට ගිහින් එළවලු ටික අරගෙන තඹුත්තේගම ස්ටේෂන් එකට ගෙනෙන්න වාහනයක් ඕනෑ. ඊට පසුව දුම්රියෙන් ඒවා කොටුව ස්ටේෂන් එකට ගේන්න ඕනෑ. එතැනින් පැලියගොඩ මැනිං මාර්කට් එකට එළවලු ටික ගෙනියන්න තව වාහනයක් ඕනෑ. කෘෂිකර්ම ඇමතිතුමනි, එළවලු හත් අටපොළකින් මාරු කරනකොට ඒවායේ තත්ත්වය මොකක්ද? අපේ දුම්රියවල තිබෙන යකඩ මැදිරිවල දොර වහලා තිබ්බාම එළවලුවල තත්ත්වය මොකක්ද? තඹුත්තේගමට, අනුරාධපුරයට කරන්න කෝටියක් දේවල් තිබෙනවා. ඔබතුමාත් ඒ ගැන දන්නවා නේ, අපේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අනුරාධපුර දිස්ත්‍රික්කය තමයි ලංකාවේ ලොකුම දිස්ත්‍රික්කය. නමුත්, අනුරාධපුර දිස්ත්‍රික්කය කාලයක් තිස්සේ කුඩම්මාගේ සැලකිලිත් එක්ක අභාවයට ගිහින් තිබෙන්නේ. දැන් අපේ ජනාධිපතිවරයෙක් පත් වෙලා ඉන්නේ. අපට ඒ ගැන සතුටුයි. හැබැයි, නිවැරදි තැනට වියදම් කරන්න. තමන්ගේ ගෙදර ඇඩ්‍රස් එකේ තඹුත්තේගම කියන නම සඳහන්ව තිබෙන නිසා මේ දුම්රිය ස්ථානය තෝරාගෙන සංවර්ධනය කරලා වැඩක් නැහැ. කෝච්චි පීලි පනිනවා, කෙළවරක් නැහැ. කෝච්චිය වෙලාවට එනවාද කියලා ෂුවර් එකක් නැහැ. අලි හැපිලා කෝච්චි නතර වෙනවා. තඹුත්තේගමින් එළවලු ටික පටවලා බස් එකක ඇවිල්ලා පැය ගණනක් ඔවුන් ඉන්න ඕනෑ, කෝච්චිය එනකම්. අන්තිමට බලනකොට කෝච්චිය පීලි පැනලා. කෝච්චියේ අලියෙක් වැදිලා අද එන්නේ නැහැ කියනවා. එතකොට එළවලු ටික අලින්ට කන්න දමන්නද? ඒ නිසා ප්‍රායෝගික වැඩ පිළිවෙළවලට යන්න. ජනාධිපතිතුමා ඉගෙන ගත්ත තඹුත්තේගම ඉස්කෝලය ගොඩනඟන්න. ඒකෙන් දැයේ දූ දරුවන් බිහි කරන්න. තඹුත්තේගමින් අධ්‍යාපනය ලබලා විශ්වවිද්‍යාලවලට ඇතුළත් කරන ශිෂ්‍ය ප්‍රමාණය තව වැඩි කරන්න. අපේ දරුවන්ට ගෞරවනීය විධියට ක්‍රීඩාවලට යන්න අවශ්‍ය ශක්තිය ලබා දීම කෙරෙහි අවධානය යොමු කරන්න. තමන්ගේ ලිපිනයේ දුම්රිය ස්ථානය පිහිටි ප්‍රදේශයේ නම සටහන් වුණා කියලා අනුරාධපුරයට යමක් කළා, මගේ ගමට යමක් කළා කියලා සතුටු වෙනවාට වැඩිය ගමට කරන්න බොහෝ දේවල් තිබෙනවා. අපි ඒවා සාකච්ඡා කරලා කරමු. අපි ඒ ගැන කියන්නම්. අපි ඒ වෙනුවෙන් දෙන්න පුළුවන් සහයෝගය ලබා දෙන්නම්. ඇමතිතුමන්ලා ගිහින් වැව් සුද්ද කළා නේ. එහෙම අවස්ථාවක් දුන්නොත් තමයි අපටත් ඒ වැඩකටයුතු කරන්න පුළුවන් වෙන්නේ. එතකොට අපිත් ඇවිත් ශ්‍රමදානයට දායක වෙන්නම්. කරන්න මෙච්චර වැඩ තිබියදී ෂෝ නේ දමන්නේ. ඒ වාගේ ෂෝ දාලා වැඩක් නැහැ. ඒ නිසා අපි ඉල්ලනවා, ඔබතුමන්ලා වෙන් කරන මුදල් ප්‍රායෝගිකව වැඩක් ඇති දෙයකට යොදවන්න කියලා.

ඒ වාගේම ඉඩම් සම්බන්ධව කථා කළා. "උරුමය" වැඩසටහන යටතේ ඔප්පු ලබා දෙන එක දැන් නතර කරලා තිබෙන්නේ. ඔබතුමන්ලා දන්නවා, තමන්ට කියා ඉඩමක අයිතිය ලබා ගන්න එක මේ රටේ හැම කෙනෙකුගේම සිහිනයක් බව. තමන්ගේ ද්‍රවශීලතාව වැඩිකර ගන්න තිබෙන එක වත්කමක් තමයි ඉඩම. ස්වර්ණ භූමි, ජය භූමි ඔප්පුවක් පවරන්න ගියාම ගොවි පන්තියේ වෙන්න ඕනෑ; ඒකට හොර සහතිකය හදන්න වෙනම සොච්චමක් දෙන්න ඕනෑ; ගතමන්ට් එකක් දෙන්න ඕනෑ; ඒක අරගෙන වටයක් ගහලා යන්න ඕනෑ. එතකොට ඒ ඉඩමේ තිබෙන වටිනාකම බාල්දු වෙනවා. ඉඩම්වල ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නය හින්දා ලු, මේවා නතර කළේ. කවුරු හරි ඉඩම කර තියාගෙන ඉන්නවාද? අපට කියන්නකෝ, සුද්දෙක් ලංකාවේ ඉඩමක් හොරකම් කරගෙන ගිය අවස්ථාවක් ගැන. සුද්දෝ ඇවිත් වසර ගණනාවක් තිස්සේ මේ රටේ දේපළ හොරකම් කරගෙන ගියා තමයි. පෘතුගීසින්, ලන්දේසින්, ඉංග්‍රීසින් එක බිම් අඟලක් හොරකම් කරගෙන ගිහින් තිබෙනවාද? බොරු කරලා, දූෂිතයින්ට තවත් ඉදිරියට දූෂණ කරගෙන යන්න තමන්ගේ බිම් ලබා ගන්න තිබුණු අයිතිය නතර කරන්න එපා. ඒ පිළිබඳව ඔබතුමන්ලාගේ අවධානය යොමු කරන්න. ඒකට ඔබතුමන්ලාගේ ලස්සන නමක් දමා ගන්න. ජාතික ජන බලවේගයට සම්බන්ධ එකක් හරි, අනුර කුමාර සහෝදරතුමාගේ නමට සම්බන්ධ වෙන විධියට හරි නමක් දාලා නම වෙනස් කරන්න. හැබැයි, මේ ඉඩම්වල සින්නක්කර අයිතිය දෙන්න පුළුවන් වැඩ පිළිවෙළක් සකස් කරන්න කියන කාරණය මම ඔබතුමන්ලාට මතක් කරන්න කැමතියි.

අධ්‍යාපනය සම්බන්ධව කථා කළ යුතු කරුණු ගොඩක් තිබෙනවා. නමුත් මට තව විනාඩි දෙකයි නේ තිබෙන්නේ. ඒ නිසා මම කෘෂිකර්මය ගැන කියන්න කැමතියි. අපේ කෘෂිකර්ම නියෝජ්‍ය ඇමතිතුමා කථා කරනවා මම අහගෙන හිටියා. මම හිතුවේ එතුමා ගොවියාගේ අනාගතය ගැන කියයි කියලා. එතුමාට දැන් රුපියල් 10,000 කියලා කියන්නත් ලජ්ජයි. පොහොර සහනාධාරය වෙනුවෙන් හෙක්ටෙයාර දෙකකට රුපියල් 20,000ක් දෙනවා ලු. හෙක්ටෙයාර දෙකේ කථාව කොහේද තිබුණේ? අපේ මහවැලියේම ඉඩම් දීලා තිබෙන්නේ හෙක්ටෙයාර එක ගණනේ. ඒ අනුව හෙක්ටෙයාර එකේ කුඹුරු තමයි තිබෙන්නේ. මෙතුමා ගණන් ලොකු කරලා පෙන්වන්න කියනවා, හෙක්ටෙයාර දෙකකට රුපියල් 20,000ක පොහොර සහනාධාරයක් අපි ලබා දෙනවා කියලා. ඒ හැර එතුමා ගොවියා ගැන මොනවාද කථා කළේ? ඉස්සර අබරං මාමලාත් එක්ක කුඹුරු ගණනේ ගිහින් කථා කළා. ඔබතුමන්ලා දැන් වී මෙට්‍රික්ටොන් කොච්චර ප්‍රමාණයක් අරගෙන තිබෙනවාද? මම කට කැඩෙනකම් ඒවා ගැන කිව්වා. හාල් ප්‍රශ්නය ගැන කථා කරනකොට අනෙක් පැත්තට කථා කළේ වී ප්‍රශ්නය ගැන. වී මිලදී ගැනීමට ඔබතුමන්ලාට තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද, ඔබතුමන්ලා දෙන සාධාරණ මුදල කීයද කියලා මම ඇහුවා. අපි ඒක විද්‍යාත්මකව පෙන්වන්නම් කිව්වා. දුන්නු මිලට දැන් වී ලැබෙනවාද? යහ පාලනයට බැන්නා නේ. හැබැයි, යහ පාලන රජය පැවති වෙලාවේ දීපු මිලත් එක්ක වී ගබඩා කරන්න ගබඩා මදි වුණා. මත්තල වී ගබඩා කරන්න තරම් ගොවියෝ වී දුන්නා. ඒ මොකද? හොඳ මිලක්, සාධාරණ මිලක් දුන්නු හින්දා. හැබැයි, ඔබතුමන්ලා විද්‍යාත්මක පදනම මත එදා රුපියල් 157ට තිබුණු වී කිලෝවක මිල අද රුපියල් 120ට අඩු කරලා මිල නියම කළා.

වී කිලෝ 670 ගණනක් එනකොට යනවා පිළිගන්න. අර ඉස්සර තෙල් නැව් එනකොට කට්ටිය මල් මාලා දමා පිළිගන්න ගියා වාගේ, වී අලෙවි මණ්ඩලයට වී කිලෝ 675ක් එනකොට, කට්ටියක් ගියා පිළිගන්න. මෙන්න, ලංකාවේ ප්‍රධාන ප්‍රවෘත්තිය. ඇමතිවරු ගණනාවක් ගිහිල්ලා වී කිලෝ හයසිය ගණනේ මුට්ට කර ගහන්න. අයියෝ! ලංකාවේ ප්‍රවෘත්තිවලට ගිය කල. මාලිමාව 70 වසරක සාපය නිමා කරන්න ආවේ. ගොවීන්ට හම්බ වුණු

සහනය මොකක්ද? බඩඉරිඟු ගොවීන්ට මිලක් දුන්නාද, උඳු ගොවීන්ට සහනයක් හම්බ වුණාද? උඳු ටික විකුණා ගන්න බැරුව ඉන්නවා. මොනවාටද, ඔබතුමන්ලා මැදිහත් වුණේ?

අද බඩඉරිඟු මිල ගැන කථා කරනවාද? ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඉස්සර නම් ඔබතුමා කුඹුරෙන් එළියට ගන්න හම්බ වුණේ නැහැ, හේනෙන් එළියට ගන්න හම්බ වුණේ නැහැ. ගිහිල්ලා ඒ මිනිස්සුන්ගේ බුලත් විටටත් කෙළලා, බත් මුලටත් කෙළලා ආවා මිසක් මේ අය වැයෙන් ශත පහක සහනයක් ගොවීන්ගේ පැත්තට ඉෂ්ට කරලා නැහැ කියන එකයි අපට කියන්න තිබෙන්නේ. ඔහොම කරන්න එපා, ගරු නියෝජ්‍ය ඇමතිතුමා. ඒ, ඔබතුමන්ලා වෙනුවෙන් පෙනී හිටපු, ඔබතුමන්ලා බලයට ගෙනෙන්න වැඩි ශක්තියක් දුන් කඳවුරු. රාජ්‍ය සේවකයා වාගේම ගොවියා ඔබතුමන්ලා බලයට ගෙනෙන්න කටයුතු කළා.

මේ රටේ කෘෂිකර්මාන්තය ගැන කියද්දී අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා කියනවා, "අපට වී දෙන්න ඕනෑ අනිවාර්යයෙන්. අපි රජය විධියට මෙච්චර මුදලක් මේකට වියදම් කරනවා" කියලා. ඔබතුමන්ලා ලංකාවේ කෘෂිකර්මාන්තයට වියදම් කරපු පළමුවෙනි රජය කියලාද, හිතා ගෙන ඉන්නේ? "ඇළ වේලි හදන්න, වාරි මාර්ගය වෙනුවෙන් අපි බිලියන මෙච්චරක් වෙන් කරලා වියදම් කරනවා" ලු. මහවැලිය හැදුවේ කවුද? මහවැලි ව්‍යාපාරය යටතේ මහා ජලාශ හැදුවේ කවුද? මේ ඔක්කෝම හැදුවේ ඔබතුමන්ලාද? එහෙම නැත්නම් ඒවා ඉබේ පහළ වෙලාද; ස්වයංජාත වෙලාද? සුද්දාත් මේ රටේ කෘෂිකර්මාන්තය වෙනුවෙන් කටයුතු කළා. සුද්දා කාලයකදී ඒවා විනාශ කරලා දැම්මා තමයි. හැබැයි, නිදහස ලබපු තැන ඉඳලා; ඩී.එස්. සේනානායක මැතිතුමාගේ කාලයේ ඉඳලා මේ වෙනකම් හැම කෙනෙකුම මේ රට කෘෂිකර්මාන්තයෙන් ස්වයංපෝෂිත කරන්න වියදම් කරලා තිබෙනවා. එහෙම කරන්නේ මේ රටේ සහල් පරිභෝජනය වැඩි නිසා; අපේ ප්‍රධාන ආහාරය බත් නිසා. එම කටයුතු සිදු කිරීම රජයක වගකීමක්. ඒක ඉෂ්ට කළ යුතුයි. ඒ නිසා ඒ කටයුතු වෙනුවෙන් ඔබතුමන්ලාගේ අවධානය යොමු කරන්න කියන කාරණය මතක් කරමින් වේලාව ලබා දීම පිළිබඳව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිය පුද කරමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ක්‍රිෂාන්ත අබේසේන අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 19ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.41]

**ගරු ක්‍රිෂාන්ත අබේසේන මහතා (විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு கிரிஷாந்த அபேசேன - விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அமைச்சர்)
(The Hon. Chrishantha Abeysena - Minister of Science and Technology)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළමුවෙන්ම මම කාරණයක් කියන්න කැමැතියි. දැන් කථා කළ ගරු මන්ත්‍රීතුමා කිව්වා, අපේ ජනාධිපතිතුමා බොහොම හොඳ අය වැය කථාවක් ඉදිරිපත් කළාය කියලා. මම කියනවා, ඒ කථාව වාගේ සිය ගුණයකින් අපි වැඩ පෙන්වනවා කියලා. මොකද, මේක අපේ පළමුවෙනි අය වැය. මේකෙන් පසුව තමයි අපි වැඩ පටන් ගන්නේ.

ඒ වාගේම එතුමා පාස්කු ප්‍රහාරය ගැනත් සඳහන් කළා. පාස්කු ප්‍රහාරය එල්ල වුණේ යහ පාලනය කාලයේදී. ඉතින් ඒ කාලයේ ඒගොල්ලන්ට තිබුණා නේ, ඒ සම්බන්ධව කටයුතු කරන්න. එහෙම කරන්නේ නැතුව පාස්කු ප්‍රහාරය වුණේ අපේ කාලයේ වාගේයි දැන් ඒ අය කථා කරන්නේ. ඒ වාගේම යහ පාලන කාලයේ තමයි ලංකාවේ බුද්ධි අංශ පතුලටම වැටුණාය කියන්නේ; එහෙම යුගයක් තිබුණේ. ඉතින් ඒ වාගේ තමයි එතුමන්ලාගේ හැම තර්කයක්ම.

අපේ රට 2022 වෙනකොට ආර්ථිකමය වශයෙන් කඩා වැටුණා. මේ ආර්ථික කඩා වැටීම ගෝඨාභය රාජපක්ෂ මහත්මයාගේ කාලයේ වුණාට ඒකේ මුල් දිවෙනවා, අවුරුදු ගණනකට. අපි අවුරුදු 76ක් ගැන කථා කළාට, අපිට වඩාත් හොඳින් කථා කරන්න පුළුවන්, පසුගිය අවුරුදු 30-40ක කාලය ගැන.

දැන් එක මන්ත්‍රීතුමෙක් අපට මතක් කළා, 1980ගණන්වල ආර්ථිකය ගැන. 1980ගණන්වල ජේ.ආර්. ජයවර්ධන පාලන කාලයේ ආර්ථිකය පොඩ්ඩක් උඩට ආවා. ඒක පවත්වා ගෙන ගියේ නැහැ. ඒක එහෙමම අනෙක් පැත්තට ගියා. එදා ඉඳලා අපේ රටේ තිබුණේ එක තැන පල් වෙන ආර්ථිකයක්. ඔය කාලය ගැන කථා කරද්දී, "ජේ.ආර්.- ප්‍රේමදාස - රනිල් වික්‍රමසිංහ යුගය" කියන්නේ, භීෂණ යුගය; ප්‍රධාන කොටම රාජ්‍ය ත්‍රස්තවාදය ඇති කරපු යුගය; ප්‍රජාතන්ත්‍රවාදය නැති කරපු යුගය. එදා -1980 ගණන්වල- ඉඳලා තමයි අපේ රට තවදුරටත් බංකොලොත්භාවයට පත් කළේ.

පසුගිය කාලය වෙනකොට උද්ධමනය සියයට 70ට වැඩි වුණා. රාජ්‍ය සේවකයාගේ මූර්ත වැටුප අඩු වුණා. ඒ වාගේම දිළිඳුකම, දරිද්‍රතාවේ අනුපාතය සියයට 25.9 දක්වා වැඩි වුණා. මිනිස්සු දුප්පත්, රටත් දුප්පත්. අපි හැමෝම හිඟා කන තත්ත්වයට පත් කළා.

ඒ වාගේම අපේ රටේ වෘත්තියවේදීන් රට හැර දමා ගියා. ඇයි ඒ? දේශපාලන නායකත්වයක් නැහැ; රටට අනාගතයක් නැහැ. තමන්ගේ දුවලා පුතාලට මේ රටේ ජීවත් වෙලා කළ හැකි දෙයක් තිබෙනවාද කියලා අවිශ්වාසයක් තිබුණා. ඒ නිසා ඔවුන් රට දාලා ගියා. ඒ වාගේම වෘත්තිකයන්ට සැලකුවේ නැහැ. වෘත්තිකයන්ගේ වැටුප - salary එක - ජීවන වියදමත් එක්ක බැලුවාම කිසිසේත් ප්‍රමාණවත් නැහැ. ඒ නිසායි වෘත්තියවේදීන් රට දාලා ගියේ.

අපි කථා කළා පසුගිය අවුරුදු 30, 40 ගැන. WHO survey එකක කියනවා, වර්ෂ 2000දී අපේ රටේ සෞඛ්‍ය පද්ධතිය සම්බන්ධයෙන් rank එක තිබුණේ 80 කියලා. හොඳ තත්ත්වයක නොවෙයි, අපි 2000 වර්ෂයේ හිටියේත්. ඒ කියන්නේ, මීට අවුරුදු 24කට ඉස්සෙල්ලා. අද ඒ තත්ත්වය තවත් පහළ වැටී තිබෙනවා. 100ට විතර ගිහිල්ලා තිබෙනවා, rank එක. රටවල් 100ක් විතර අපට වඩා උඩින් ඉන්නවා. නීති පද්ධතිය ගත්තත් එහෙමයි. නීති පද්ධතිය සම්බන්ධයෙන් ගත්තොත් rank එක 70 වාගේයි තිබෙන්නේ. ඉස්සෙල්ලා තිබුණෙත් එහෙමයි. ආර්ථිකය එක තැන පල් වුණා වාගේ නීතියත් එහෙමයි, සෞඛ්‍යයත් එහෙමයි. හැම අංශයක්ම එහෙමයි. රාජ්‍ය පරිපාලනයත් එහෙමයි. විනිවිදභාවයක් තිබුණේ නැහැ. කඩා වැටිච්ච රාජ්‍ය පාලනයක් තිබුණේ. එහෙම ඉතිහාසයක් තිබෙන්නේ.

ඒ වාගේම පක්ෂ ගත්තොත්, යූඑන්පී - සජබයේ බලවේගයත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය - පොහොට්ටුව බලවේගයත් මාරුවෙන් මාරුවට ආවා. ඒගොල්ලන්ව පත් කළා ජනතාව. ඒ ජනතාවම තමයි අපිටත් මෙවර ඡන්දය දුන්නේ. ජනතාව දැන් අපෙන් අහනවා, නොයෙක් නොයෙක් ප්‍රශ්න. ඒ ගැනත් අපි කියන්න ඕනෑ.

අපේ ප්‍රධාන අරමුණක් තමයි අපේ රටේ ආර්ථිකය ස්ථායීකරණය කිරීම; කර්මාන්ත, කෘෂි කර්මාන්ත අංශවල නිෂ්පාදනය වැඩි කිරීම. ඒ සඳහා අපට දිගු කාලීන වැඩ පිළිවෙළක්

[ගරු ක්‍රිෂාන්ත අබේසේන මහතා]

තිබෙනවා. විශේෂයෙන් කර්මාන්ත, කෘෂිකාර්මික අංශවල නිෂ්පාදනයේ ඵලදායිතාව ඉහළ නංවන්න, exports වැඩි කර ගන්න අපි විද්‍යාව හා තාක්ෂණය යොදා ගැනීම පිළිබඳව විශේෂ සැලකිල්ලක් දක්වා තිබෙනවා. ඒ අනුව රුපියල් බිලියන 20.9ක් විද්‍යාව හා තාක්ෂණය වෙනුවෙන් මේ අය වැයෙන් වෙන් කර තිබෙනවා. ඒ අතර අපේ අමාත්‍යාංශයට බිලියන 5ක් වෙන් කර තිබෙනවා. වෙනත් අමාත්‍යාංශවලටත් යම් යම් මුදල් ප්‍රමාණයන් වෙන් කර තිබෙනවා.

උදාහරණයක් හැටියට සෞඛ්‍ය සම්බන්ධ පරීක්ෂණ සඳහා රුපියල් බිලියන 0.9ක්, වැවිලි කර්මාන්තයට බිලියන 0.5ක්, රබර් කර්මාන්තයට බිලියන 0.5ක්, තේ කර්මාන්තයට බිලියන 0.7ක්, පොල් කර්මාන්තයට බිලියන 0.45ක්, ජලජ සම්පත් වෙනුවෙන් බිලියන 0.8ක්, ගොවි කටයුතු වෙනුවෙන් බිලියන 0.2ක්, උක් වගාව වෙනුවෙන් බිලියන 0.39ක්, විශ්වවිද්‍යාල වෙනුවෙන් බිලියන 0.1ක් වෙන් කර තිබෙනවා. ඒවාට වඩා ලොකු ප්‍රමාණයක් විද්‍යාව හා තාක්ෂණයට වෙන් කරලා තිබෙනවා. ඇයි ඒ? අපි විශ්වාස කරනවා, විද්‍යාව හා තාක්ෂණය මාර්ගයෙන් අපේ නිෂ්පාදනයේ ඵලදායිතාව වැඩි කරන්න පුළුවන් කියලා.

විපක්ෂ නායකතුමා කිව්වා, වැටුප් ගැන පැහැදිලි නැහැ කියලා. එතුමාට පැහැදිලිව නැතුව ඇති. මම හිතන විධියට එතුමාට කිසිම දෙයක් පැහැදිලි නැහැ. දේශපාලනය ගැනත් එහෙමයි. අටවලායි කිව්වා තිබෙන්නේ. අපි නොවෙයි ඇටෙව්වේ. පසුගිය ආණ්ඩුවලින් තමයි අටවා අටවා වැටුප් වැඩි කළේ. මූලික වැටුප වැඩි කළේ නැහැ. එක එක කෑලි ඇමුණුවා. වැටුප් විෂමතා ඇති කළා. සමහර අය විශේෂයෙන් නීති අංශවලින්, ඒ වාගේම පරිපාලන සේවාවලින් -මම දන්නේ නැහැ, සමහර අය කියන විධියට- අනිසි විධියට වැටුප් වැඩි කරගන්නවා. ඒගොල්ලන් නේ මේවා තීරණය කරන්නේ. එහෙම වෙනවා. එහෙම කොටස් ඉන්නවා. තවත් සමහරු වැටුප් වැඩි කරගන්නවා, වෘත්තීය අරගළවලින්. සමහර අයට තිබෙන්න ඕනෑ බලවත් වෘත්තීය සමිති. ඒවා තිබෙනවා නම් ඒගොල්ලන් වැටුප් වැඩි කරගන්නවා. එහෙම නැත්නම්, ඒ අයට මොකුත් නැහැ. එහෙම තමයි ලංකාවේ සමහර වෘත්තීයවේදීන් වැටුප් වැඩි කරගෙන තිබෙන්නේ.

වැටුප් ගැන කථා කරපු නිසාත්, හිටපු වෘත්තිකයෙකු වන නිසාත් මම යම් දෙයක් කියන්න ඕනෑ. MBBS උපාධිය තිබෙන වෛද්‍යවරයෙකු ගත්තොත්, වෛද්‍ය උපාධිය ගන්න අවුරුදු 6ක් වියදම් කරන්න ඕනෑ කියලා අපි දන්නවා. අවුරුදු 5යි, internship අවුරුදු 1යි, අවුරුදු 6යි. එහෙම නැත්නම් practise කරන්න බැහැ. ඒ වාගේම, ඒ අවුරුදු 5 තුළ අවුරුද්දකට credit values 30යි තිබෙන්න ඕනෑ. නමුත්, අනෙක් courses එක්ක compare කරලා නිවැරැදි විධියට calculate කළොත්, අවුරුද්දකට 30ක් නොවෙයි ඊට වඩා ලොකු ගණනක් වෙනවා. මා හිතන විධියට ඒ කාලය තුළ වෛද්‍ය සිසුන් පැය 5ක්වත් නිදා ගන්නේ නැහැ. ඒ අය ඒ විධියට වැඩ කරනවා; ඒ අයට ඒ විධියට වැඩ කරන්න සිදු වෙලා තිබෙනවා.

ඒ වාගේම, MD - Doctor of Medicine - උපාධිය කරන්න අඩුම ගණනේ අවුරුදු 5ක් හෝ 7ක් යනවා. ඒකත් පූර්ණ කාලීනව කටයුතු කළ යුතු කාලයක්. ඒ කාලය තුළ ඒ අයට private practise කරන්නත් බැහැ. ඒ අයට පැය 24ම වාට්ටුවල වැඩ කරන්න වෙලා තිබෙනවා. Part-time කරන්න පුළුවන් master's degrees තිබෙනවා. ඒ වාගේම doctorate degrees තිබෙනවා, part -time three years කරන්න පුළුවන්. අපේ පශ්චාත් උපාධි ආයතනවල එවැනි අවස්ථා තිබෙනවා. මේක එහෙම එකක් නොවෙයි කියන එක මතක් කර දෙන්නයි මම මෙය කිව්වේ.

Salaries ගැන කථා කරද්දී සමහරු කියනවා, වැඩි කළ salary එක අපි අවුරුදු 3ක් තිස්සේයි දෙන්නේ කියලා. ඒක වැරැදියි. අප්‍රේල් මාසයේ සිට ගත්තාම මේ අවුරුද්දට තවත් මාස 9යි තිබෙන්නේ. මාස 9කින් ඊළඟ වැටුප් වැඩි වීම සිදු වෙනවා. මේ, 2025 අවුරුද්ද. 2026 අවුරුද්දට තිබෙන්නේ තවත් මාස 9යි. ඊට පස්සේ, 2027 අවුරුද්ද. එහෙම නම්, අවුරුද්දකුත් මාස 9යි යන්නේ. අවුරුදු 3ක් නොවෙයි, අවුරුද්දකුත් මාස 9ක් ඇතුළත තමයි මේ සම්පූර්ණ වැටුප් වැඩි වීම සිදු වන්නේ. අපි වැටුප් වැඩි කළා මිසක මේ අය වැය තුළින් කාගේවත් බදු වැඩි කළා ද? අපි කිසිම බද්දක් වැඩි කරලා නැහැ. බදු අඩු කරලා තිබෙනවා. PAYE Tax එක අඩු කළා. ගෙවල්වලට පනවපු බද්ද -ගෙවල් කුලී බද්ද- නැති කළා. අපි කාටවත් බදු වැඩි කරලා නැහැ. මේ අය වැයෙන් සහන විතරයි දීලා තිබෙන්නේ.

වැටුප ගැන කථා කරද්දී මම මේ කාරණයත් කියන්න ඕනෑ. අපි දන්නවා රාජ්‍ය සේවයේ අවම මූලික වැටුප රුපියල් 24,250 සිට රුපියල් 40,000 දක්වා වැඩි කළා කියලා. ඒ කියන්නේ, අඩුම grade එකේ ඉන්න සේවකයාගේ වැටුප රුපියල් 15,750කින් වැඩි කළා. ඒ වාගේම, සෑම රජයේ සේවකයෙකුගේම වාර්ෂික වැටුප් වර්ධකයේ වටිනාකම සියයට 80කින් වැඩි කළා. ඒ කියන්නේ වාර්ෂික අඩුම වැටුප් වර්ධකය රුපියල් 250ක් නම්, ඒක රුපියල් 450ක් දක්වා වැඩි වෙනවා. ඒ වාගේම, ආපදා ණය සීමාව රුපියල් 250,000 සිට රුපියල් 400,000 දක්වා වැඩි කළා. අපි දන්නවා, වෛද්‍ය වෘත්තිකයන් අතරත්, විශ්වවිද්‍යාල ආචාර්යවරුන් අතරත් වැටුප් පිළිබඳව ලොකු ලොකු විවාද පැවැත්වෙන බව. පළමුවෙන්ම ඒගොල්ලෝ කිව්වා, අපි වැටුප් වැඩි කරලා නැහැ, වැටුප් අඩු කරලා නේ කියලා. අපි කාගේද වැටුප් අඩු කරලා තිබෙන්නේ? කවුද දන්නේ නැහැ, මේ වාගේ ප්‍රචාර ගෙන යන්නේ. මම උදාහරණයක් කියන්නම්. මමත් Senior Professor කෙනෙකු විධියට හිටියා. Senior professor කෙනෙකුගේ මූලික වැටුප රුපියල් 98,000කින් වැඩි වෙනවා. ඒ කියන්නේ, 2027 ජනවාරි වෙද්දී මූලික වැටුප අද තිබෙන වැටුපට වඩා රුපියල් 98,000කින් වැඩි වෙනවා. සියයට 35ක්ව තිබුණු research allowance එක සියයට 20ට අඩු කළා. ඒ වාගේම, percentage එකක් විධියට 209ක්ව තිබුණු academic allowance එක 112ට අඩු කළා. හැබැයි, ඒවා අඩු කරන්නේ අද තිබෙන මූලික වැටුපෙන් නොවෙයි. ඒවා ගණනය කරන්නේ අද තිබෙන මූලික වැටුපට නොවෙයි. ඒවා ගණනය කරන්නේ, 2027 අවුරුද්දේ වැඩි වන මූලික වැටුපට.

ඒ නිසා ඒ සියයට ගණන 35 ඉඳන් 20ට අඩු වුණා කියලා කිසිම කෙනෙකුගේ වැටුප අඩු වීමක් වෙන්නේ නැහැ; වැටුපට එකතු වන ගණන අඩු වෙන්නේ නැහැ. මොකද, අපි ගණන් බලන්නේ 2027 වැටුපෙන්. එතකොට තමන්ට අද ලැබෙන ගණනට වඩා වැඩිපුර ගණනක් හම්බ වෙනවා. එහෙම ගත්තාම senior professor කෙනෙකුට රුපියල් 60,000කින් salary වැඩි වෙනවා. Net salary increase එක ගත්තොත්, රුපියල් 80,000ක්, 90,000ක් විතර මාසයකට වැඩි වෙනවා. ඒ කියන්නේ, senior professor කෙනෙකුට රුපියල් 80,000ක්, 90,000ක් විතර මාසයකට වැඩි වෙනවා. ඊට අමතරව, අපි PAYE Tax එක අඩු කළා. PAYE Tax එක අඩු කිරීමෙන් ලැබෙන ආදායම රුපියල් 20,500ක් වනවා. මේක එක් උදාහරණයක් විතරයි. එහෙම නම්, මේ වැටුප් වැඩි කිරීම ලොකු වැඩි කිරීමක්; රාජ්‍ය සේවයට ලොකු වැඩි කිරීමක්.

ඒ වාගේම මම කියන්න කැමතියි, තවත් උදාහරණයක්. Senior Lecturer - Grade II, ගත්තොත්, ඒ තැනැත්තාගේ වැටුප වැඩි වෙනවා රුපියල් 55,000කින් විතර. මම මේ කියන්නේ දළ වශයෙන්. ඒ වාගේම gross salary එක වැඩි වෙනවා රුපියල් 30,000කින් විතර. Net salary එක වැඩි වෙනවා, රුපියල්

49,000ක, 50,000ක විතර ගණනකින්. එතකොට PAYE Tax එක නිසා ඇති වන ඉතිරිය රුපියල් 16,000ක් විතර වනවා. Senior lecturer කෙනෙකුගේ වැටුපට සමාන්තරව තිබෙනවා consultant කෙනෙකුගේ වැටුප. Consultant කෙනෙකුගේ මූලික වැටුප අද වන විට රුපියල් 156,000යි. ඒක රුපියල් 214,000 ගණනක් වනකල් වැඩි වෙනවා. ඉතිරිය රුපියල් 54,000 ගණනකින් විතර වැඩි වෙනවා. ඒ වාගේම PAYE Tax එක තවත් අඩු වෙනවා. එමඟිනුත් ඉතිරියක් ඇති වෙනවා. ඒ විතරක් නොවෙයි, මූලික වැටුප වැඩි කළාම ඒකෙන් තමයි pension එකට අදාළව ගණන් හදන්නේ. එතකොට මේ හැම රාජ්‍ය සේවකයෙකුගේම pension එක වැඩි වෙනවා. ඒවාත් ඉතිරියි.

Nurse කෙනෙකුගේ වැටුප ගත්තොත්, මාසයකට රුපියල් 45,000ක් විතර වැඩි වීමක් වෙනවා, 2027 අවුරුද්ද වෙද්දී. Paramedic කෙනෙකු ගත්තත්, වැටුප මාසයකට රුපියල් 45,000ක් විතර වැඩි වෙනවා. MO කෙනෙකු ගත්තොත්, මාසයේ වැටුප රුපියල් 90,000ක් විතර වැඩි වෙනවා, 2027 අවුරුද්දට අදාළ ගණනය කිරීම ගත්තාම. අපි දන්නවා, ඒ වැඩි කිරීම දෙන්නේ බෙදලා බව. ඒ බෙදිල්ල - මා ඉස්සෙල්ලාත් කිව්වා වාගේ - අවුරුද්දකුත් මාස 9යි තිබෙන්නේ.

මම තවත් විශේෂ දෙයක් ගැන කියන්න කැමතියි. ඒ තමයි, MOsලාගේ extra duties ගැන. MOsලාගේ extra duties ගත්තාම, අමතර රාජකාරි දීමනාව සඳහා පැයක ගාස්තුව මාසික මූලික වැටුපෙන් 1/80 සිට මාසික මූලික වැටුපෙන් 1/120 දක්වා සංශෝධනය වුණා. ඒ වාගේම nursesලාගේ අමතර රාජකාරි දීමනාව මූලික වැටුපෙන් 1/160 සිට මාසික මූලික වැටුපෙන් 1/200 වනකල් සංශෝධනය වුණා. හැබැයි, මේවා ගණනය කරන්නේත් 2027 අලුත් salary structure එකටයි. එහෙම ගත්තාම අර කියන විධියේ අඩු වීමක් නැහැ. හැබැයි, අපි holiday allowance එක ගැනත් කියන්න ඕනෑ. මාසික මූලික වැටුපෙන් 1/20ක දෛනික වැටුප් දීමනාව මාසික මූලික වැටුපෙන් 1/30ක් ලෙස සංශෝධනය වුණා. එහෙම වුණත් ඒවා calculate කරන්නේත් 2027 ගණනට. ඒ නිසා වැටුප්වල කිසිම අඩු වීමක් වෙලා නැහැ.

පෞද්ගලික අංශය ගත්තත්, අපි ඒ අයගේ වැටුප වැඩි කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, මෙවර අය වැය තුළින් හැම ක්ෂේත්‍රයකටම, හැම ක්ෂේත්‍රයක කෙනෙකුටම සහන දීලා තිබෙනවා. අපි හදලා තිබෙනවා ප්‍රාථමික වෛද්‍ය ප්‍රතිකාර ඒකක 1,000ක්, අපේ ගම්වල සෞඛ්‍ය තත්ත්වය - health - වැඩි දියුණු කරන්න. ඒ වාගේම ඔටිසම් තත්ත්වයේ පසුවන ළමුන් වෙනුවෙන් ආදර්ශ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් සඳහා රුපියල් මිලියන 250ක් වෙන් කර තිබෙනවා. වකුගඩු ආබාධවලින් පෙළෙන්නන්ගේ මාසික දීමනාව රුපියල් 7,500 සිට රුපියල් 10,000 වන කල් වැඩි කළා. වැඩිහිටි දීමනාව රුපියල් 3,000 සිට රුපියල් 5,000 දක්වා වැඩි කළා. අස්වැසුම ප්‍රතිලාභීන් මිලියන 1.2ක් ඉන්නවා. 'අස්වැසුම', කියන්නේ අපේ ප්‍රතිපත්තියක් නොවෙයි. ඒක තාවකාලික දෙයක්. අපි ඒගොල්ලන් සවිබලගන්වන්න ඕනෑ. ඒගොල්ලන් සවිබලගැන්වීම වෙනුවෙන් අපි රුපියල් මිලියන 500ක් වෙන් කර තිබෙනවා. විශේෂයෙන් උතුරු, නැගෙනහිර අවතැන් වූවන් සඳහා නිවාස වැඩසටහන වේගවත් කිරීම ඇතුළු කාරණා වෙනුවෙන් රුපියල් මිලියන 1,500ක් අය වැයෙන් වෙන් කර තිබෙනවා.

එදා යාපනය පුස්තකාලයට ගිනි තිබ්බා, අර ත්‍රස්තවාදී ආණ්ඩුව. ජේආර්-ප්‍රේමදාස-රනිල් ආණ්ඩුව එම පුස්තකාලයට ගිනි තිබ්බා. එම පුස්තකාලයට අත්‍යවශ්‍ය පහසුකම් ලබා දෙන්න රුපියල් මිලියන 100ක් වෙන් කළා. "මලයගම්" දෙමළ ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීමේ වැඩසටහනට රුපියල් මිලියන 7,583ක් වෙන් කළා. ළමයින්ගේ සුරැකුම් මධ්‍යස්ථානවල ධාරිතාව වැඩි දියුණු කිරීම සඳහා රුපියල් මිලියන 500ක් වෙන් කළා. වූදිත ළමයින් අධිකරණයට සහ එහි සිට විධිමත්ව ප්‍රවාහනය කිරීමේ පහසුකම් සැලසීමට රුපියල් මිලියන 250ක් වෙන් කළා.

රැඳවුම් නිවාසවල සිටින අනාථ දරුවෙකුට රුපියල් 5,000ක මාසික දීමනාවක් දෙන්න මුදල් වෙන් කරලා තිබෙනවා. මේ අය වැයේ මේ වාගේ ගොඩක් ප්‍රතිලාභ තිබෙනවා. ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳ පුළුල් දත්ත සමුදායක් ස්ථාපිත කිරීම සඳහා රුපියල් මිලියන 100ක්, ආපදා නිසා ජීවිත අහිමි වන, පූර්ණ ආබාධිත තත්ත්වයට පත් වන පුද්ගලයන් සඳහා වන්දිය රුපියල් ලක්ෂ 10 දක්වා වැඩි කළා. ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ තැන්පතු සඳහා පොලී අනුපාතය සියයට 3කින් වැඩි කළා. සිරකරුවන්ට වෘත්තීය පුහුණුව ලබාදීමට රුපියල් මිලියන 100ක් වෙන් කළා. ඉතින් මේ ඔක්කෝම සුබසාධනත් නොවෙයි, වරප්‍රසාදත් නොවෙයි. මේවා අයිතිවාසිකම්. මේවා සිරකරුවන්ගේ අයිතිවාසිකම්; දරුවන්ගේ අයිතිවාසිකම්. මේ විධියට තමයි අපි හැම ක්ෂේත්‍රයක්ම මේ අය වැය මඟින් ආවරණය කරලා තිබෙන්නේ. ඉතින් මේක තමයි සමාජ සාධාරණත්වය දීලා තිබෙන අය වැය. මේක තමයි සමාජ සාධාරණත්වය ස්ථිර කරපු අය වැය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මගේ කථාව මෙතැනින් අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

***එකල්හි වේලාව අ. භා. 6.00 වූයෙන්, කටයුතු අත්හිටුවා විවාදය කල් තබන ලදී.***

***එතැන් සිට විවාදය 2025 පෙබරවාරි 22 වන සෙනසුරාදා පවත්වනු ලැබේ.***

*அப்போது பி. ப. 6.00 மணியாகிவிடவே, அலுவல்கள் இடைநிறுத்தப்பட்டு, விவாதம் ஒத்திவைக்கப்பட்டது.*

*விவாதம் 2025 பெப்ருவரி 22, சனிக்கிழமை மீளத் தொடங்கும்.*

*It being 6.00 p.m., Business was interrupted, and the Debate stood adjourned.*

*Debate to be resumed on Saturday, 22nd February, 2025.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු සුසන්ත කුමාර නවරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

## දුම්රියේ ගැටීමෙන් සිදුවන වනඅලි මරණ වැළැක්වීම
## புகையிரதம் மோதி யானைகள் இறப்பதைத் தடுத்தல்
## PREVENTION OF ELEPHANT DEATHS DUE TO COLLISION WITH TRAINS

[අ.භා. 6.00]

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "වන අලි දුම්රියේ ගැටීම් හේතුවෙන් වසරකට වන අලි මරණ විශාල ප්‍රමාණයක් වාර්තා වන අතර, එම තත්ත්වයට නිසි පියවර නොගැනීම හේතුවෙන් එම ප්‍රශ්නය දිනෙන් දින උග්‍රවෙමින් පවතී.
>
> විශේෂයෙන්ම උතුරු මැද, මධ්‍යම සහ නැගෙනහිර පළාත්වල පවතින දුම්රිය මාර්ගවල ඇතිවන අනතුරු වාර්තා වන අතර සියලු වගකිවයුතු අංශයන් හි අවධානය ඒ කෙරෙහි යොමු විය යුතුය.
>
> මේ සඳහා විවිධ හේතු බලපා ඇති අතර එම තත්ත්වයන් ද සැලකිල්ලට ගනිමින් වගකිව යුතු සියලු අංශ සම්බන්ධ කර ගනිමින් කඩිනම් විසඳුම් කෙරෙහි යොමුවිය යුතු යැයි මෙම ගරු සභාවට යෝජනා කරමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මේ වෙලාවේ මේ යෝජනාව ඉදිරිපත් කරන්න අදහස් කළේ ඊයේ පෙරේදා අපට අහන්න ලැබිච්ච වේදනාත්මක සිදුවීමක් නිසා. ඊයේ උදෑසන වෙනකොට අපට වාර්තා වුණා, වන අලි මරණ 5ක් පිළිබඳව. මේ වන අලි මරණ 5 සිදු වෙන්නේ මහව - මඩකලපුව දුම්රිය මාර්ගයේ ගල්ඔය කියන ප්‍රදේශයේදී සිදුවෙච්ච මේ අනතුර පෙරේදා විතරක් සිදු වෙච්ච අනතුරක් නොවෙයි; පළමු අවස්ථාවත් නොවෙයි. මෙය වසර ගණනාවක් තිස්සේ දිගින් දිගටම සිදුවෙන අනතුරක්.

පසුගිය වසර හතරක් පහක් ආපස්සට බලනකොට දුම්රියේ ගැටීම නිසා වන අලි විශාල ප්‍රමාණයක් විනාශ වෙලා තිබෙනවා. 2018 වර්ෂයේ වන අලි 9දෙනෙක්, 2019 වර්ෂයේ 4ක්, 2020 වර්ෂයේ වන අලි 3දෙනෙක්, 2021 වර්ෂයේ වන අලි 7දෙනෙක්, 2022 වර්ෂයේ වන අලි 10දෙනෙක්, 2023 වර්ෂයේ 12දෙනෙක්, 2024 වර්ෂයේ 7 දෙනෙක්, ඒ වාගේම 2025 වර්ෂයේ ආරම්භක මාස දෙක තුන වෙනකොට පෙරේදා අපට අහන්න ලැබෙනවා වන අලි 5 දෙනෙක් මරණයට පත් වුණු බව. මීට පෙරත් ජනවාරි මාසයේ වන අලියෙක් මරණයට පත් වුණා.

විශේෂයෙන්ම මේ සඳහා දුම්රිය දෙපාර්තමේන්තුවේ අවධානය යොමු කිරීම වෙනුවෙන් පසුගිය කාලයේ ප්‍රවාහන ඇමතිතුමාත් අවධානය යොමු කරලා තිබෙනවා. හැබැයි, ඒත් අවධානය යොමු වෙලා නැහැ. අපේ රටේ අලි - මිනිස් ගැටුමකුත් තිබෙන අතරේ, තවත් ප්‍රධාන ප්‍රශ්නයක් බවට මේකත් පත් වෙලා තිබෙනවා. අපේ රටේ ආරක්ෂා කර ගන්න ඕනෑ සතුන් අතරින් විශේෂිත සත්වයෙකු ලෙස අපේ රටේ අලියා අපි හඳුනාගෙන තිබෙනවා.

එය එක පැත්තකින් අපට සංචාරක ව්‍යාපාරයට විශේෂ වශයෙන් දායක වෙනවා. ඒ වාගේම, අපේ පරිසරයේ සමතුලිතතාව ආරක්ෂා කරගන්න දායක වෙනවා. මේ සියලු හේතු කාරණා නිසා අපි අපේ රටේ වනජීවීන් ආරක්ෂා කරගන්න ඕනෑ. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව පැත්තෙනුත් පසුගිය කාලය පුරාවට වනජීවී කළමනාකරණය සම්බන්ධයෙන් අවධානය යොමු වෙලා නැහැ. විශේෂයෙන්ම, මේ ගල් ඔය කියන ප්‍රදේශය පිළිබඳව අධ්‍යයනය කරලා බලනකොට තිබෙන ප්‍රධාන හේතුවක් තමයි මේ දුම්රිය මාර්ගයේ දෙපස, දුම්රිය මාර්ගය ආසන්නයට වෙනකල් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත්ව තිබෙන කැලෑ ප්‍රදේශය. ඒක සුද්ද කරගන්න ඕනෑකම තිබෙනවා. හැබැයි, දිගින් දිගටම යෝජනා කළත් ඒ සඳහා අවධානය යොමු වෙලා නැහැ. ඒ නිසා දුම්රිය දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව කියන ආයතන මැදිහත් වෙලා, දවසින් දවස ඉහළයන වසරක් පාසා දුම්රියේ ගැටීම නිසා සිදුවන වන අලි මරණ ප්‍රමාණය නැවැත්වීම වෙනුවෙන් විශේෂිත පියවර ගන්න ඕනෑ.

අද ලෝකයේ තාක්ෂණය වේගයෙන් දියුණු වෙමින් තිබෙනවා. මේක නවත්වාගන්න ඒ තාක්ෂණය භාවිත කරන්න පුළුවන්. නමුත්, අවාසනාවක මහත! ඒ තාක්ෂණය ගැන ඉතිහාසයේ බොහෝ දේවල් කථා කරලා තිබුණාට, වර්තමානය වෙනකොට ඒ තාක්ෂණය පාවිච්චි කිරීම වෙනුවෙන් සමහර බලධාරීන් මැදිහත් වෙලා නැහැ. ඒ නිසා ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න ඕනෑකම තිබෙනවා. දියුණු ගණයේ තාක්ෂණික උපකරණ අපේ රටේත් දැන් තිබෙනවා. ලෝකයේ බොහෝ රටවල් ඒවා පාවිච්චි කරනවා. නමුත්, අපේ රටේ ඒ සඳහා අවධානය යොමු කරලා, මුදල් වෙන් කරලා ඒ මැදිහත් වීම කරලා නැහැ. ඒ නිසාම දවසින් දවස වන අලි දුම්රියේ ගැටීමෙන් සිදුවන මරණ සංඛ්‍යාව වැඩිවෙමින් තිබෙනවා. පසුගිය වසර 5ක කාලය තුළ 50ත්, 60ත් අතර ප්‍රමාණයක් වන අලි මරණ සිද්ධ වෙනකොට දුම්රිය දෙපාර්තමේන්තුවේ සමහර ඉහළම නිලධාරීන් ඒකට අවධානය යොමු කරන්නේ නැති තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

අපි මේ අවස්ථාවේදී මේ යෝජනාව කරනු ලබන්නේ ඉතාම කාලෝචිත විධියට. මේ මොහොතේ අපට මතුවෙච්ච ප්‍රධාන කාරණාවක් විධියට මෙයට පාර්ලිමේන්තුවේ අවධානය යොමු කරලා, දවසින් දවස සිදුවන වන අලි මරණ ප්‍රමාණය නවත්වා ගැනීම වෙනුවෙන්, අපි මේ ආයතන සියල්ල සම්බන්ධීකරණය කරගෙන විධිමත් මැදිහත්වීමක් කර ගැනීම වෙනුවෙන් මේ මොහොතේ මේ පාර්ලිමේන්තුවේ අවධානය යොමු කරමින් මෙම යෝජනාව මා ඉදිරිපත් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම සඳහා ගරු සුදත් බලගල්ල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 6.07]

**ගරු සුදත් බලගල්ල මහතා**
(மாண்புமிகு சுதத் பலகல்ல)
(The Hon. Sudath Balagalla)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද උදෑසන සිටම විපක්ෂය සැහෙන සද්දයක් දැම්මත්, දැන් ඒ මන්ත්‍රීවරු 66දෙනාගෙන් එක් කෙනෙත් විතරයි මෙතැන ඉන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉදිරිපත් කළ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව අනුව අලි ප්‍රශ්නයක් තිබෙනවා. අවුරුදු 76ක් තිස්සේ මේ අලි ඇවිල්ලා. විපක්ෂයේ ඉන්න මේ මහත්වරුන්ගෙන් එදා සමෘද්ධිය ඉල්ලුවේ නැහැ, අස්වැසුම ඉල්ලුවේ නැහැ, ගෙවල් හදාගන්න ඉල්ලුවේ නැහැ, අලියාගේ පැටවා ඉස්කෝලෙට දාලා දෙන්න කියලා ඉල්ලුවේ නැහැ. ඒ සතුන්ට තිබෙන්නේ වුවමනා තුනයි. අවුරුදු 76ක් ඒ වුවමනා තුන සපුරන්න බැරි වුණු විපක්ෂය අද කිඹුල් කඳුළු වෙනුවට අලින්ගේ කඳුළු හලන්න පටන් අරගෙන තිබෙනවා. සතුන්ට වුවමනා වුණේ නිදහසේ ජීවත් වෙන්න පුළුවන් වාසස්ථානයක්. ඔවුන්ට ඇත්තටම දෙන්න තිබුණා උරුමයක්. අර හොර උරුමය ඔප්පුව නොවෙයි, සතුන්ට අවශ්‍ය උරුමය ඒ සතුන්ට දෙන්න තිබුණා.

ඒක දුන්නේ නැහැ අවුරුදු 76ක්. සතුන් ඉල්ලුවේ ජීවිතය පවත්වාගෙන යන්න ජලය. සතුන් ඉල්ලුවේ ජීවිතය පවත්වාගෙන යන්න ආහාර. ආහාර, ජලය සහ වර්ගයා බෝ කරගැනීම සඳහා අවශ්‍ය නිවහල් පරිසරයක් විතරයි සතුන් ඉල්ලුවේ. ඒ කාරණා තුන ලබා දෙන්න බැරි වුණු විපක්ෂය දැන් අපට චෝදනා කරනවා මේ සතුන්ගේ මරණයේ වගකීම භාරගන්න කියලා. ඔව්, අපි භාරගන්නවා. බල්ලාගේ, පූසාගේ, හරකාගේ වගකීම මේ රටේ මහජනතාව භාර ගන්නවා වාගේම, වනයේ ඉන්න සතාගේ වගකීම රජයක් විධියට අපි භාර ගන්නවා. ඒක විපක්ෂය අත් හැරලා තිබුණා අවුරුදු 76ක්. අලි හයදෙනෙක්, හත්දෙනෙක් එතැන මැරෙනකොට - අද මේ මොහොතේ මගේ ගමේ අලි ගහලා මැරුණු දෙදෙනෙකුගේ සිරුරු භූමදානය වෙනවා. විපක්ෂය අවුරුදු 76ක් මිනිස්සුන්ගේ ජීවත් වීමේ අයිතිය වාගේම සතුන්ගේ ජීවත් වීමේ අයිතියත් විනාශ කරලා තිබුණේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හැබැයි, අපි අනිවාර්යයෙන්ම ඉදිරි කාලය තුළ ඒ සතාට අවශ්‍ය භූමිය සුපෝෂිත කරන්න සූදානම්.

ඒ වනයේ වැව් ටික හදලා, ආහාර ටික සම්පාදනය කරන ජාතික ආණ්ඩුවක් තමයි මේ හදලා තිබෙන්නේ. සතාගේ අයිතිය විනාශ කරපු විපක්ෂය වෙනුවට සතාගේ අයිතිය සනාථ කරන ආණ්ඩුවක් තමයි මේ හදලා තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා වසර 76ක් තිස්සේ මෙතුමන්ලා නොකරපු වැඩ ටික කරන්න තමයි ජාතික ජන බලවේග ආණ්ඩුවේ අපි බලය ගත්තේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එක මහත්තයෙක් දැන්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කෑ ගහලා ගියා නේ. එතුමා කිව්වා, මේ ආණ්ඩුවේ වී මිල සම්බන්ධයෙනුත්. හැබැයි වී ඇටයක් මිලදී නොගත්ත ඒ මහත්තුරු දැන් අපේ ආණ්ඩුවේ වී මිල ගැන ප්‍රශ්න කරනවා. දැන් දෙකොන පත්තු වෙලා තිබෙන්නේ. හිතාගන්න බැහැ, මොකක්ද මේ කරන්නේ කියලා. අය වැය ආවාට පස්සේ ඇත්තටම රිදුණේ ජනතාවට නොවෙයි, විපක්ෂයට. හරියට මතවාදීව, තර්කානුකූලව ආණ්ඩුවට එරෙහිව මතයක් ගොඩනහන්න බැරි තත්ත්වයට විපක්ෂය අද පත් වෙලා ඉවරයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. මේ සත්ව ප්‍රශ්නයේදී -අලින් මිය යාම සම්බන්ධයෙන්- විද්‍යාත්මක උත්තරයක් අපි ළඟ තිබෙනවා. ඔව්, අපි අවුරුදු 50ක් විතර සතා සිවුපාවා වෙනුවෙන් වාගේම මිනිස්සු වෙනුවෙන් මහ පාරේ අරගළයක් කළා. ඒ අරගළය ඇතුළේ අත්දැකීමෙන් අපි මේකට උත්තර හොයගත්තා. ඒ උත්තර මේ අවුරුදු 5 ඇතුළත මේ සමාජයේ අපි සමාජගත කරනවා. අපි අලියාට අවශ්‍ය කැළේ; සතා සිවුපාවාට අවශ්‍ය කැළේ අනිවාර්යයෙන්ම හදනවා. අලිමංකඩවල් 12ක් තිබිලා ඒ අලිමංකඩවල් 12න් 8ක් මේ වෙනකොට වැහිලා ඉවරයි. ඒවා ගැසට් කළේ නැහැ. අලියා යන එන පාරේ නිල් පාට, කොළ පාට මහත්තුරු මාරුවෙන් මාරුවට ඉඩකඩම් දීලා අලිමංකඩවල් වැහුවා. අද අලියාට යනඑන මං නැහැ, සතා සිවුපාවාට යන එන මං නැහැ. මිනිහාට එතැන ඉන්න විධියකුත් නැහැ. මිනිස් ජීවිත විනාශ කළා වාගේම සත්ව ජීවිතත් විනාශ කරපු

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ගාණටම මේ විපක්ෂය වැටිලා තිබුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වචනය පාවිච්චි කරන එක හොඳ නැති වෙන්න පුළුවන්. හැබැයි ඊට වඩා සත්තු හොඳයි. සමහර සත්තු මිනිස්සුන්ගේ ජීවිත විනාශ නොකර යනවා. හැබැයි අවුරුදු 76ක් තිස්සේ සතා සිවුපාවා වාගේම අපේ මිනිස්සුන්ගේ ජීවිතත් විනාශ කරපු මේ විපක්ෂයට අපි උත්තර දෙන්න සූදානම්. අපි මිනිස්සුන්ට වාගේම සතා සිවුපාවාටත් ජීවත් වෙන්න පුළුවන් යහපත් රටක්, යහපත් සමාජයක් හදනවා කියමින්, මේ යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.12]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම කනගාටුදායක සිදුවීමකින් පස්සේ ගරු සුසන්ත කුමාර නවරත්න මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරපු මේ කාලීන යෝජනාව පිළිබඳව කථා කිරීමට අවස්ථාව ලැබීම සතුටක්.

මට කලින් මේ යෝජනාව ස්ථිර කරමින් කථා කළ ගරු සුදත් බලගල්ල මන්ත්‍රීතුමා බොහොම හැඟීම්බරව අය වැය ගැනත් සඳහන් කරලා මේ අලි-මිනිස් ගැටුම විසඳීමට ගන්නා වූ විද්‍යාත්මක පියවර ගැනත් සඳහන් කළා. මා ළඟ තිබෙනවා, 2025 අය වැය කථාව. ඒකේ 38වැනි පිටුවේ 29වැනි අයිතමයේ තිබෙනවා, "අලි-මිනිස් ගැටුම අවම කිරීම සහ වන සංරක්ෂණය" ගැන. අපි කවුරුත් දන්නවා, සංවර්ධන ක්‍රියාදාමයන් එක්ක වනය එළි කරලා ගොවිතැනට ජලාශ හැදුවා, ගොවිබිම් හැදුවා, ගොඩමඩ දෙක වගා කළා, මෙරට සහලින් ස්වයංපෝෂිත කළා කියලා. හැබැයි අලියාට තැනක් නැති වුණා. අලි-මිනිස් ගැටුම ඉතා බරපතළ දෙයක්. ඊයේ අපේ පක්ෂයේ ආසන සංවිධායකවරයෙකුත් අලියා ගහලා මැරුණා. ඒ නිසා ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ කථාවක් නැහැ, අලියාට. ආසන සංවිධායකව මැරුවේ. ගමේ සාමාන්‍ය අහිංසක ගොවියෙක් මැරෙන එක අපි දැකලා තිබෙනවා. ඊයේ අපේ පක්ෂයේ ආසන සංවිධායකව මැරුවා. අලින්ට තේරුමක් නැහැ; පක්ෂයක්, පාටක් නැහැ. 76 අවුරුද්දක් මේ රටට මොකුත් කළේ නැහැ කියලා තමයි කථා කරන්නේ. ඩී.එස්. සේනානායක මහත්මයා ගල්ඔය යෝජනා ක්‍රමය හැදුවේ නැත්නම් ඔය පළාත් අලින්ට නොවෙයි, කොටින්ට ගිහිල්ලා. ඩී.එස්. සේනානායක මහත්මයා, ඩඩ්ලි සේනානායක මහත්මයා, ජේ.ආර්. ජයවර්ධන මහත්මයා, ඒ පරම්පරාවේ මිනිස්සු මේ රට - උතුරු මැද පළාතේ පොළොන්නරුව, අනුරාධපුරය - අස්වැද්දුවේ නැත්නම් බඩගින්නේ මැරෙන්න තමයි වෙන්නේ. අඩුපාඩු තිබෙනවා. සියල්ල සම්පූර්ණ නැහැ. ඒ නිසා අලි-මිනිස් ගැටුමට අපි හැමෝම වග කියන්න ඕනෑ. ඒ වාගේම අලින්ට සාධාරණයක් ඉෂ්ට වෙන්න ඕනෑ. එක පැත්තකින් අලින්ගේ පැත්තෙන් හිතලා අනෙක් පැත්තෙන් රටේ ආර්ථිකය ගැන හිතන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මේ අය වැයේ අලි-මිනිස් ගැටුම ගැන තිබෙන්නේ මොකක්ද? අපි කවුරුත් දන්න මේ ප්‍රශ්නය විසඳන්න මේ අය වැයෙන් එක රුපියලක් වෙන් කරලා තිබෙනවාද?

මේ ප්‍රශ්නය විසඳීම සඳහා නවීන තාක්ෂණයක් තිබෙනවා කියලා කිව්වා නේ. මේ ප්‍රශ්නය විසඳන්න දන්නවා කියලා කිව්වා නේ. ගරු ඇමතිතුමනි, දන්නා තාක්ෂණය මොකක්ද කියලා කරුණාකරලා කියන්න බලන්න. ඔබතුමාගේ පක්ෂයේ නායකයා,

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

මුදල් ඇමති අනුර කුමාර දිසානායක මහත්මයා මේ අය වැය ඉදිරිපත් කරන්න කලින් ගිහිල්ලා එහෙම දෙයක් කිව්වේ නැද්ද? "අපි දන්නවා නියම ක්‍රමයක්; ඒක විසඳන්න මේ ක්‍රමය පාවිච්චි කරන්න ඕනෑ. අපි තමයි ගමේ ඉන්න මිනිස්සු. අලි එක්ක හැප්පෙන්නේ අපි" කියලා අනුර කුමාර මහත්මයාට ගිහිල්ලා කිව්වාද? මේ ප්‍රශ්නය විසඳන්න මේ අය වැයේ යෝජනා තිබෙන්නේ කොහේද? මේ වෙනුවෙන් එක රුපියලක් වෙන් කරලා තිබෙනවා ද? ඊයේ නොවෙයි, මේ ප්‍රශ්නය ඇති වුණේ. ඒක ඇත්ත. දශක ගණනක් තිස්සේ මේ ප්‍රශ්නය තිබෙනවා. ඒක තමයි ඇත්ත. අලි මැරෙනවා; මිනිස්සු මැරෙනවා. මේ වෙනුවෙන් සාධාරණ විසඳුමක් කවුරුවත් දීලා නැහැ. අපි ඒක පිළිගන්නවා. අය වැය ලේඛනයේ සඳහන් 29වන අයිතමයේ මේ වෙනුවෙන් එක රුපියලක් වෙන් කරලා නැහැ. මොනවාද මේ කථා කරන්නේ? මෙතැනදී ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ කියලා කථාවක් නැහැ. හැමෝම එකතුවෙලා වැඩ කරලා මේ ප්‍රශ්නයට සාධාරණ විසඳුමක් හොයා ගන්නට ඕනෑ.

ඔව්, මේ සඳහා තාක්ෂණික විසඳුම් තිබෙනවා, ගරු ඇමතිතුමනි. ඒ සඳහා ආයෝජනය කරන්නට ඕනෑ. ඒ වාගේම, දේශීය තත්ත්වයන්ට ගැළපෙන විධියට අපි මේ ප්‍රශ්නයට පිළිතුරු සොයන්නට ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තාක්ෂණික ලෝකයේ වෙනත් රටවල තිබෙන ප්‍රශ්නත්, අපේ ප්‍රශ්නත් අතර වෙනසක් තිබෙනවා. ඒ තාක්ෂණික විසඳුම් සෙවීම සඳහා අපි විද්‍යාඥයන් එක්ක කථා කරලා, දුම්රිය විශේෂඥයන් එක්ක කථා කරලා, වන සංරක්ෂණය පිළිබඳ විශේෂඥයන් එක්ක කථා කරලා විසඳුම් සොයා ගන්නට ඕනෑ. කැලෑ ආරක්ෂාව පිළිබඳව ලොකු සටනක් තිබෙනවා නේ. ඒ කියන්නේ, මේ වනසතුන් සම්බන්ධයෙන් වග කියන දෙපාර්තමේන්තු එක ගහක්, එක තණකොළයක් කපන්න දෙන්නේ නැහැ. දුම්රිය දෙපාර්තමේන්තුව එක ආකල්පයක ඉන්නවා. සංචාරක අමාත්‍යාංශය තව ආකල්පයක ඉන්නවා. මේ හැමෝම එකතුවෙලා, ආණ්ඩු පක්ෂය, විපක්ෂය එකතුවෙලා මේක විසඳා ගන්නට ඕනෑ. මේක ආණ්ඩු පක්ෂයේ විතරක් ප්‍රශ්නයක් නොවෙයි. තමුන්නාන්සේලාට දුර දැක්මක් නැති බව මේ අය වැය යෝජනාවෙන් පේනවා. අලි-මිනිස් ගැටුම ගැන කියලා තිබෙන මෙහි 29වන පරිච්ඡේදයේ, දුම්රියේ ගැටී අලින් මිය යාම වැළැක්වීම සඳහා ලබා දෙන විසඳුම මොකක්ද කියලා තමුන්නාන්සේලා කියලා තිබෙන්නේ කොතැනද? ඒ වෙනුවෙන් වෙන් කරපු මුදල කීයද කියලා පුළුවන් නම් මට පෙන්වන්න. එක රුපියලක් වෙන් කරලා නැහැ. ඒ නිසා අපි කවුරුත් අවංකව කථා කරමු; ප්‍රශ්නය තේරුම් ගනිමු. මේක වැදගත් ප්‍රශ්නයක්. මේක පක්ෂ, පාට භේද නැති ප්‍රශ්නයක්. අපි එකතු වෙලා වැඩ කරලා වනඅලින්ටත්, සමාජයටත්, රටටත්, අපේ ආර්ථිකයටත් සාධාරණයක් ඉෂ්ට කරමු. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[පි.ව. 6.16]

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே!

இன்றைய தினம் சபை ஒத்திவைப்புவேளைப் பிரேரணையூடாக மிக முக்கியமானதொரு பிரச்சினை முன்வைக்கப்பட்டு இருக்கின்றது. நான் இந்த ஒத்திவைப்புப் பிரேரணையில் பேசுவதற்கு முக்கிய காரணம், மட்டக்களப்பிலிருந்து கொழும்பு நோக்கி வந்த புகையிரதத்தில் யானைகள் மோதுண்டு இறந்திருப்பதுதான். இது இன்று நேற்று நடைபெறுகின்ற ஒரு விடயமல்ல. மாறாக, காலாகாலமாக நடந்துவருகின்ற ஒரு விடயம்! மட்டக்களப்பு மாவட்டத்தில் யானைகளைக் கட்டுப்படுத்துவதில் பாரிய பிரச்சினை இருக்கின்றது. மட்டக்களப்பில் யானை வெடிகள் இல்லை என்றுதான் நாங்கள் கடைசியாகக் கேள்விப்பட்டோம். அறுவடை செய்கின்ற காலப்பகுதியில் யானைகள் பெருமளவாக வந்து பயிர்களை அழிக்கின்றன. இதனால் பாராளுமன்ற உறுப்பினர்களாகிய நாங்கள் நேரடியாகச் சென்று அதிகாரிகளிடம் யானை வெடிகளைக் கேட்டால், சனவரி மாதம் tender போட்ட பிறகுதான் யானை வெடிகளைத் தரலாமென்று சொல்கிறார்கள். இதுதான் இன்று நாட்டிலுள்ள நிலைமை!

கடந்த ஆட்சிக் காலப்பகுதியிலும் எத்தனையோ இலட்சம் ரூபாய் செலவில் புதிதாக யானை வேலிகளை அமைப்பதாகச் சொல்லப்பட்டது. ஆனால், மட்டக்களப்பில் எந்தவொரு யானை வேலியும் அமைக்கப்படவில்லை. நாங்கள் wildlife officersஐப் பாராட்ட வேண்டும். மட்டக்களப்பு மாவட்டத்தில் wildlife official ஒருவர் யானையைத் துரத்திச் செல்லும்போது, மிதிபட்டு இறந்தார். அவரது குடும்பத்தினருக்கு இந்த இடத்தில் எங்களுடைய அனுதாபங்களைத் தெரிவித்துக் கொள்கின்றோம். கடந்த வருடம் இந்தச் சம்பவம் நடந்தது.

நான் ஆளும் கட்சியைச் சேர்ந்த - NPP அரசாங்கத்தைச் சேர்ந்த - உறுப்பினர்களிடம் ஒரு விடயத்தைச் சொல்ல விரும்புகின்றேன். இப்பொழுது நீங்கள் அரசாங்கத் தரப்பில் இருக்கின்றீர்கள். இந்த ஒத்திவைப்புப் பிரேரணையினூடாக நீங்கள் சொல்கின்ற விடயங்களைப் பார்த்தால், ஏதோ நீங்கள் எதிர்க்கட்சியில் இருப்பதுபோலத்தான் தெரிகின்றது. மட்டக்களப்பு மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டத்தில் நாங்கள் யானை வேலிகளை அமைப்பது பற்றி ஒரு தீர்மானத்தை எடுத்து, அதை உங்களுக்கு அனுப்பினால், அதை நடைமுறைப்படுத்தலாமா, இல்லையா? என்பதைத்தான் நீங்கள் இந்தச் சபையில் சொல்ல வேண்டும்.

අපේ ගරු සභානායකතුමාත් මේ අවස්ථාවේ සභාවේ සිටින නිසා මම මේ කාරණය කියන්න ඕනෑ. යම් මන්ත්‍රීවරයෙක් මේ පාර්ලිමේන්තුව ඇතුළේ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ඉදිරිපත් කිරීම තුළින් බලාපොරොත්තු වන්නේ එම ගැටලුවට යම් විසඳුමක් ලබා ගන්න එකයි. අද මම විශේෂයෙන්ම ආවේ මේ කාරණය සම්බන්ධයෙන් කථා කරන්නයි. මේ වනඅලි ගැටී තිබෙන්නේ ඊයේ මඩකලපුවේ සිට ආපු කෝච්චියේ. මඩකලපුවත් එක්ක මේක සම්බන්ධයි. සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් අපි ඉදිරිපත් කරන්නේ, ඒ අවස්ථාවේ ඇතිවෙලා තිබෙන හදිසි තත්ත්වයක්, ගැටලුවක් පිළිබඳව ආණ්ඩුවෙන් පිළිතුරක් ලබා ගන්නයි. හැබැයි, ඊයේ දවසේ වෙච්ච සිදුවීම ඉතාම කනගාටුදායකයි. ඊයේ දවසේ සභාව කල් තබන අවස්ථාවේදී අපි අම්පාරේ බාර් එකක් සම්බන්ධයෙන් ගෙනාපු යෝජනාවට, ඇමතිවරයා දේශපාලන වේදිකාවල දෙන පිළිතුරක් ලබා දීලා ගියා. අද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවට මේ ඇමතිවරයා මොන විධියේ පිළිතුරක් දෙයි ද කියලා මම දන්නේ නැහැ. හැබැයි, දෙන පිළිතුර සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කර ගන්න ඉඩක් දෙන්න තරම්වත් හය ඇමතිවරයෙක් තමයි ඊයේ පිළිතුරු දුන්නේ. එහෙම නම් සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවට පිළිතුරු දෙන්න එපා. අපි යෝජනාවක් ඉදිරිපත් කරන්නේ නිවැරදි පිළිතුරක් බලාපොරොත්තුවෙන්. අද දවසේත් මඩකලපුව දිස්ත්‍රික්කයේ අලි වෙඩි නැහැ. අලි වෙඩි අවශ්‍යයි කිව්වාම, ඒක ජනවාරිවලින් පස්සේ තමයි එන්නේ, ඇණවුම්

කරලා; ටෙන්ඩර් කරලා ගන්න ඕනෑ කියනවා. මම මේ සභාව ඇතුළට ඇවිදගෙන එනකොට කථා කරපු මන්ත්‍රීවරයා විපක්ෂයේ මොනවාදෝ මිනී මැරුම් ගැන කියනවා මට ඇහුණා. සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ගැන කථා කරන වෙලාවට දේශපාලනය කරන්න එපා. දැන් ඔබතුමන්ලා බලයේ ඉන්නේ. ඔබතුමන්ලාට දැන් තුනෙන් දෙකක බලයක් තිබෙනවා. අපි බලාපොරොත්තු වෙන්නේ මොනවාද? අනාගතයේදී දුම්රිය මාර්ගවලට වනඅලි එනවා නම්, අපි මේ රේල් පාරේ sensors සවි කරමු. Sensor එකක් සවි කරලා වනඅලි එනවා කියන එක කලින්ම හඳුනා ගනිමු. මම Batticaloa Station Master එක්කත් කථා කළා. වංගුවක් ගන්නකොට, වංගුවේ ගල්පරත් එක්ක එතැන වනඅලි ඉන්නවා කියන එක පෙනෙන්නේ නැති නිසා තමයි මේ අනතුර සිදු වුණේ කියලා කියා තිබෙනවා. එවන් කාරණයක් විසඳා ගන්නවා මිසක්, මෙතැනට ඇවිල්ලා විපක්ෂයේ මිනී මැරුම් කරපු ඒවා ගැන කථා කරන එක අදාළ නැති කතන්දරයක්.

ආණ්ඩු පක්ෂයට මම කියනවා, මේක තේරුම් ගන්න කියලා. ඔබතුමන්ලා තමයි දැන් බලයේ ඉන්නේ. දිගින් දිගටම දේශපාලන වේදිකාවල කථා කළා වාගේ සභාව කල්තබන අවස්ථාවේ යෝජනාවලදීත් කථා කරන්න ලැහැස්ති වෙන්න එපා. ඊයේ දවසේ සභාව කල්තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කළ වෙලාවේ ලද අත්දැකීම නිසායි මම මෙහෙම කථා කරන්නේ. සභාව කල්තබන අවස්ථාවේ යෝජනාවකින් අපි බලාපොරොත්තු වෙන්නේ මොකක්ද? ආණ්ඩු පක්ෂයේ ඇමතිවරුන්ටයි, මන්ත්‍රීවරුන්ටයි තමයි මම මේක කියන්නේ. ඔයගොල්ලන්ට ආණ්ඩු බලය හම්බ වුණේ, අපේ පංගුවකුත් ඒකේ තිබුණු නිසායි. අද විපක්ෂයේ හිටියාට එදා අපිත් අරගළ කළා. අපිත් ලංකාව පුරා උද්ඝෝෂණ කළා. අපිත් "Go home, Gota!" කියලා කිව්වා. අපේත් පංගුවක් තිබුණු නිසා තමයි අද මෙච්චර බලයක් ඔබතුමන්ලාට ලැබුණේ. අපි අද විපක්ෂයේ ඉන්නවා කියලා අපි කියන හැම දෙයක්ම හැල්ලුවට ලක් කරන්න එපා. වනඅලි සම්බන්ධව ගැටලුවක් තිබෙනවා නම් මේ ගරු සභාව ඇතුළේ ඒ සම්බන්ධව ප්‍රගතිශීලී අදහස් මන්ත්‍රීවරුන්ට ඉදිරිපත් කරන්න කියන්න, ගරු සභානායකතුමනි. එහෙම නැතිව, විපක්ෂය මිනී මැරුම් කළා, අරවා මේවා කළා කියන එක නොවෙයි බලාපොරොත්තු වෙන්නේ. අපි sensors සවි කරමු. එහෙම නැත්නම් එතැන high focus lights දමමු. මේ වාගේ ප්‍රගතිශීලී අදහස් කියන්න. එහෙම නොවුණොත් ජනතාවටත් මේක එපා වෙනවා.

ඊයේ බාර් පර්මිට් ගැන කථා කරද්දී අපි කිව්වේ, තවම ඒ බාර් එක විවෘත කරලා නැහැ, ඒ බාර් එක සම්බන්ධයෙන් ජනතා විරෝධයක් තිබෙන නිසා ඒ බාර් එක විවෘත කරන්නේ නැතිව මේ ගැන අධ්‍යයනය කරලා, විවෘත කරමු කියලායි. මොකද, බාර් එකක් විවෘත කළාට පස්සේ වහන්න අමාරුයි නේ. ඇමතිවරයාත් ලියාගෙන ආපු කථාවක් තමයි කියෙව්වේ. මේ, ලොකු පොරවල්. මම කියන්නේ මේකයි. උද්ධච්චකමක් පෙනෙනවා; අපේ ඇමතිවරුන් දැන් උද්ධච්චකමක් පෙන්වනවා. අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාගේ මුහුණ නැත්නම් ඇමතිවරුනුත් නැහැ, මන්ත්‍රීවරුනුත් නැහැ. ඒක මතක තබා ගන්න. රටේ මිනිස්සු ඡන්දය දුන්නේ අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාගේ මුහුණට. අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා අපිත් එක්ක මේ ගරු සභාවේ වාඩිවෙලා හිටියා. විපක්ෂයේ නවක මන්ත්‍රීවරයෙකු වන මට එතුමා ගොඩක් උපදෙස් දීලා තිබෙනවා; "ෂාණක්කියන්, ඔබ කථා කරද්දි මේකත් එක්ක මේ කාරණයත් එකතු කර ගත්තා නම් ඔබගේ කථාව තවත් හොඳයි" කියලා මට කියලා තිබෙනවා. එහෙම තමයි අපි හිටියේ. ඇමතිකම් ගත්තා කියලා, තුනෙන් දෙකක බලයක් තිබෙන ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු කියලා, කරුණාකරලා උද්ධච්ච වෙන්න එපා. අපිත් එකතු වෙලා මේ කාරණය පිළිබඳව ප්‍රගතිශීලී විසඳුමක් හොයන්න ලැහැස්තියි.

ජනාධිපතිතුමාත් ඊයේ ගිය Innovation Island Summit එකේ ඉඳලායි මම අද ආවේ. Innovative ideas ගොඩක් තිබෙනවා. අන්න ඒ වාගේ දේවල් කථා කරමු. නිකම් විපක්ෂයට බැණ බැණ කාලය නාස්ති කරන්න එපා. දැන් මැතිවරණය ඉවරයි. මම දන්නේ නැහැ, මම මේ කථාව කළේ ඇමතිවරයාගේ කථාවේදී පැහැදිලි කිරීමක්වත් කර ගන්න අවස්ථාවක් නැති වන නිසායි. අද පිළිතුරු කථාව කරන ඇමතිවරයාගේ උත්තරය සමහර විට ප්‍රගතිශීලී උත්තරයක් වෙන්න පුළුවන්. කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
පිළිතුරු කථාව, ගරු බිමල් රත්නායක ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පිළිතුරු කථාව කරන්නේ දම්මික පටබැඳි ඇමතිතුමා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
පිළිතුරු කථා දෙකක් තිබෙනවා, ගරු ඇමතිතුමනි.

[අ.භා. 6.23]

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මුලින්ම මම සුසන්ත කුමාර නවරත්න මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා, සභාව කල්තබන අවස්ථාවේ මේ යෝජනාව ඉදිරිපත් කිරීම පිළිබඳව. පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව ආණ්ඩු පක්ෂයටත්, විපක්ෂයටත් කල්තැබීමේ යෝජනා ඉදිරිපත් කිරීමට අවස්ථාවක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට හැකියාවක් නැහැ, උදේ වරුවේ මාධ්‍යවේදීන් කැමරා යොමු කරගෙන ඉන්න වෙලාවට විතරක් නිකම් නැඟිටලා ප්‍රශ්න ගැන කථා කරන්න. අපට තමයි අද දවසේ කල්තැබීමේ විවාදය තිබෙන්නේ. ඒ නිසා තමයි ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමා මේ ප්‍රශ්නය ඉදිරිපත් කළේ. ඒ විවාදය අවසන් වෙන්න කලින් මැදින් පැනලා තමන්ට කවදා හරි වෙච්ච අත්දැකීමක් මත පදනම් වෙලා මුළු ආණ්ඩුවක් විවේචනය කරන එකත් වැරදියි.

රාසමාණික්කම් මන්ත්‍රීතුමාගේ නම මම කියනවා. මම කියන්නේ මේකයි. මමත් පිළිගන්නවා, යෝජනාව ස්ථිර කරපු කථාවේදී අදාළ මන්ත්‍රීවරයාගේ පැත්තෙන් මෙවැනි කල්තැබීමේ යෝජනාවකට අවශ්‍ය කරන ගුණය රැකුණේ නැහැ කියලා. අපි ඇත්තටම මෙතැනදී ඒ ගැන සාකච්ඡා කළා. නමුත් ඒකෙන් කියවෙන්නේ නැහැ, රාසමාණික්කම් මන්ත්‍රීතුමා අපට උපදෙස් දීම අවශයි කියලා. මම එහෙම කියන්නේ මේ නිසායි. අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා කියන්නේත් ජනතා විමුක්ති පෙරමුණේ, එහෙම නැත්නම් ජාතික ජන බලවේගයේ

[ගරු බිමල් රත්නායක මහතා]

සාමාජිකයෙක්. ඒ නිසා එතුමා විතරක් හොඳයි, අනෙක් ඔක්කෝම නරකයි කියන එකත් එච්චර සාර්ථක තර්කයක් නොවෙයි. මේ ගරු සභාවේ ඉන්න කිසිම ඇමතිවරයකු ඉදිමිලා නැහැ. මෙතැන තිබෙන ඇත්ත ප්‍රශ්නය මෙයයි. මෙතැන විපක්ෂයේ යම් පිරිසක් ඉන්නවා, ඒගොල්ලන්ගේ ego එක වැඩියි. ඒගොල්ලන්ට දරාගන්න බැහැ, උගත්, සාමාන්‍ය පවුල්වලින් ආපු අය ඇමතිකම් කරන එකට. ඒක තමයි තිබෙන ප්‍රශ්නය. ඒක දරාගන්න පුළුවන් විපක්ෂයේ මන්ත්‍රීවරුන් පිරිසකුත් ඉන්නවා. ඒ නිසා යෝජනාවට පිළිතුරු දෙන්න කලින් එහෙම කියන එක වැරදියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පරිසර ඇමතිතුමා මේ යෝජනාව සම්බන්ධයෙන් පිළිතුරු ලබා දෙනවා. ප්‍රවාහන විෂයය භාර ඇමතිවරයා සහ දුම්රිය සේවය භාර ඇමතිවරයා විධියට පළමුවෙන්ම මම මේ අනතුර පිළිබඳව සමාව ඉල්ලා සිටිනවා, කනගාටු වෙනවා.

මම වනඅලි ගැන විශේෂ අවබෝධයක් තිබෙන පුද්ගලයෙක් නොවෙයි. වනඅලි දුම්රියේ වැදී මැරෙන එක සම්බන්ධයෙන් අපි හරියටම දෙසැම්බර් 9, දෙසැම්බර් 30 සහ ජනවාරි 03 කියන දිනවලදී සාකච්ඡා කළා. එම දිනවලදී අපි දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරින් සමඟ කළ සාකච්ඡාවලදී කිව්වා, දුම්රිය මාර්ගය හරහා යන වනඅලි දුම්රියේ ගැටෙන ප්‍රදේශ හඳුනාගෙන ඒ සඳහා විසඳුම් සොයන්න කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සඳහා යෝජනා කරලා තිබෙන්නේ විශාල වියදමක් යන flyovers හදන ක්‍රම. ඒ නිසා අපි කිව්වා, අධික වියදම් යන යෝජනා ගැන පසුව බලමු, ප්‍රජාව සම්බන්ධ කරගෙන මේ සඳහා විසඳුම් සොයමු කියලා. මොකද, ගම්මාන 10ක පමණ තමයි අලි මාරුවන ස්ථාන තිබෙන්නේ. ඒ තැන්වලදී තමයි අලි දුම්රියේ ගැටිලා මැරෙන්නේ. ඒ ගම්මාන 10 පිළිබඳ විස්තර පරිසර අමාත්‍යාංශයේත්, දුම්රිය දෙපාර්තමේන්තුවේත් තිබෙනවා.

මේ සැරේ අලි හැප්පුණු ගල්ඔය ප්‍රදේශය ගත්තොත්, එම දුම්රිය මාර්ගයේ 133 සැතපුම් කණුවේ ඉඳලා 141 සැතපුම් කණුව දක්වා ප්‍රදේශයේ අලි හැප්පෙන තැන් හොඳින්ම mark කරලා තිබෙනවා. එම නිසා අපි අවස්ථා තුනකදීම දුම්රිය දෙපාර්තමේන්තුවට යෝජනා කළා, කරුණාකරලා මේ ගම්මාන දහයේ සිටින ජනතාව සම්බන්ධ කරගෙන මේ සඳහා යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලා. ජාතික ජන බලවේගයේ කොට්ඨාස සභාවල අතිවිශාල පිරිසක් ඉන්නවා, ස්වේච්ඡාවෙන් වැඩ කරන. ඔවුන්ගේ උදව්වත්, ගම්මුන්ගේ උදව්වත්, ග්‍රාම නිලධාරි මහත්වරුන්ගේ උදව්වත් අරගෙන, කෝච්චි පාර ආසන්නයේ අලි ගැවසෙනවා නම්, දුම්රිය රියදුරන්ට දැන්වීම සඳහා අදාළ station masterට කථා කරලා කියන්න කියලා, මෙහෙම අලි රංචුවක් මේ ප්‍රදේශයේ ඉන්නවා කියලා. ඇත්තටම මේ සිද්ධිය ගැන අපි කනගාටු වෙනවා. දුම්රිය දෙපාර්තමේන්තුව කියන්නේ අවුරුදු 160ක් පැරණි දෙපාර්තමේන්තුවක්. මේ ප්‍රශ්නයට පිළිතුරක් ලබා නොදුන් නිසා, ජනවාරි 8වැනි දා අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමා දුම්රිය සාමාන්‍යාධිකාරිට ලිපියක් යවනවා. එයට පිළිතුරු ලැබෙන්නේ පෙබරවාරි 6වැනි දා. පෙබරවාරි 6වැනි දා දුම්රිය දෙපාර්තමේන්තුවෙන් ලබා දුන් පිළිතුරේත් තිබෙනවා, "දෙපස වන ආවරණ ඉවත් කිරීමෙන් පසු මන්නාරම මාර්ගයේ කිසිදු වනඅලි ගැටීමක් මේ වන තෙක් වාර්තා වී නොමැත" කියලා. ඊයේ උදේ තමයි අපි මේ සිද්ධිය දැනගන්නේ. ඊට පස්සේ ඊයේ හවස පරිසර අමාත්‍යතුමාත් සමඟ අපි සියලුම නිලධාරින් එකතු කරලා, සාකච්ඡාවක් කරලා, මේ සම්බන්ධයෙන් ගත හැකි ප්‍රධාන ක්‍රියාමාර්ග ගණනාවක් හඳුනා ගත්තා. පරිසර ඇමතිතුමා ඒ ගැන කියාවි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
හොඳයි, මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්.

මට කියන්න තිබෙන්නේ මෙයයි. දුම්රියේ ගැටී වනඅලි මැරෙන එක වළක්වා ගැනීම සඳහා කළ යුතු ප්‍රධාන දේවල් පිළිබඳව දුම්රිය සේවයේ නියුතු අයට අවබෝධයක් තිබෙනවා. ඒ අයට අවුරුදු ගණනාවක් තිස්සේ ඒ අවබෝධය තිබිලා තිබෙනවා. ප්‍රශ්නය වෙන්නේ, ඒ අවබෝධයට අනුව අදාළ ක්‍රියාමාර්ග ගැනීම ප්‍රමාද වීමයි. නැත්නම් ක්‍රියාමාර්ග නොගැනීමයි. එම නිසා මෙතැන rocket science මොකුත් නැහැ. ඒකයි මම කියන්නේ, ප්‍රශ්නය දැකලා, ප්‍රශ්නයට උත්තර සොයන්න මහන්සි වෙලා තිබියදී මෙම ඛේදවාචකය සිදු වීම සම්බන්ධයෙන් ඇත්තටම අපි කනගාටු වෙනවා. ඒ ගැන කලකිරීමක් තිබෙනවා. ඒ නිසා අපි ඊයේම මේ සඳහා මැදිහත් වෙලා මේ ප්‍රශ්නය විසඳන්න අවශ්‍ය ක්‍රියාමාර්ග කිහිපයක් ගත්තා. අපි ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව ගරු දම්මික පටබැඳි ඇමතිතුමා එතුමාගේ කථාවේදී පැහැදිලි කරාවි. එම නිසා අලි ඇතුළු වනසතුන් දුම්රියේ වැදිලා මිය යෑම වැළැක්වීම වෙනුවෙන් අපේ උපරිමය යොදා කටයුතු කරන බවට මේ රටේ ජනතාවට මේ අවස්ථාවේදී මා පොරොන්දු වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු සභානායකතුමා මගේ නම සඳහන් කරපු නිසා මට පොඩි අවස්ථාවක් දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු සභානායකතුමනි, මටත් කිසිම ego එකක් නැහැ. මමත් ගමේ අවුරුදු 8ක් ඇවිදලා කරලා තමයි 2020 දී පාර්ලිමේන්තුවට ආවේ. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ඊයේ දවසේ ඉදිරිපත් කරපු සභාව කල්තැබීමේ විවාදයේදී සිදු වුණු දේ බලන්න කියලා. ඒක ගැන විතරයි මම කිව්වේ. ඒ හැර මට වෙනත් කිසිම ගැටලුවක් නැහැ. අපිත් Adjournment Motion එකක් ගේන්නේ ගැටලුවක් විසඳාගන්න මිසක් ගැටුමක් ඇති කර ගන්න නොවෙයි. එච්චරයි මම ඔබතුමාට කියන්නේ. එහෙම නැතුව අනුර කුමාර දිසානායක සහෝදරයා විතරයි හොඳ, ඔබතුමන්ලා නරකයි කියලා මම කිව්වේ නැහැ. මම කිව්වේ, මැතිවරණය වෙලාවේ වුණේ ඒක කියලායි. එච්චරයි මම කිව්වේ. I do not want to mislead the House with wrong information. That is all.

Thank you.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමා කිව්ව දේ සම්බන්ධයෙන් තමයි මම පැහැදිලි කළේ. Ego ප්‍රශ්නවලට අපට උත්තර නැහැ. අපි ego ප්‍රශ්න පොඩ්ඩක්වත් care කරන්නේත් නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දම්මික පටබැඳි අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 6.29]

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේදී මෙම යෝජනාව ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් පළමුවෙන්ම මම ඒ මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම 19වැනි දා රාත්‍රියේ - 20වැනි දා අලුයම - තමයි මින්නේරිය සහ ගල්ඔය අතර තිබෙන 140 සහ 141 කිලෝමීටර් කණු අසලදී අලින් 7දෙනෙක් "මීනගයා" දුම්රියේ ගැටෙන්නේ. ඒ අලි 7දෙනා මියගොස් තිබෙනවා. එම සිදුවීම අපි කවුරුත් කම්පා කරපු සිදුවීමක්. ඒ වාගේම සිදු නොවිය යුතු දෙයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් පසුගිය කාලය මුළුල්ලේ මේ විධියට වනඅලි දුම්රියේ ගැටිලා මරණයට පත් වුණු ඉතිහාසයක් තිබෙනවා. ඒක අපි වළක්වා ගන්න ඕනෑ. ඒ සම්බන්ධයෙන් රජයක් හැටියට, විශේෂයෙන්ම පරිසර අමාත්‍යාංශය සහ ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශයත්, දුම්රිය දෙපාර්තමේන්තුවත් මැදිහත් වෙලා කටයුතු කරන්න අපි අදහස් කරනවා.

දුම්රියේ ගැටීමෙන් මේ අලි මරණ සිදු වූ වහාම අපේ බිමල් රත්නායක ඇමතිතුමා මැදිහත් වෙලා ඊයේ හවස 4.00ට අදාළ පාර්ශ්ව පාර්ලිමේන්තුවට කැඳවලා, ඒ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග මොනවාද කියලා සාකච්ඡා කළා. එම අවස්ථාවට පරිසර අමාත්‍යාංශයේ ලේකම්වරයා ඇතුළු ඒ සියලු අංශවල නිලධාරින් සම්බන්ධ වුණා. ඒ වාගේම, පරිසර නියෝජ්‍ය අමාත්‍යවරයා සම්බන්ධ වුණා; මේ සම්බන්ධයෙන් විශේෂඥතාව දක්වන පරිසරවේදීන් ඒ අවස්ථාවට කැඳවුවා. ඒ වාගේම දුම්රියේ අලි හැපෙන, ඒ ගැටුම් ඇති වන පොළොන්නරුව සහ අනුරාධපුර ප්‍රදේශ නියෝජනය කරන ජාතික ජන බලවේගයේ මන්ත්‍රීවරු ඒ අවස්ථාවට කැඳවා ගත්තා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊට අමතරව අපි එතැනට විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ නිලධාරිනුත් විශේෂයෙන්ම කැඳවුවා, මේ සම්බන්ධව ඉක්මන් ක්‍රියාමාර්ග ගන්න. ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේ නිලධාරිනුත් ඒ අවස්ථාවට කැඳවලා තමයි ඒ සාකච්ඡාව අපි කළේ. ඒ සාකච්ඡාව තුළ අපි ගත්ත තීරණ ප්‍රමාණයක් තිබෙනවා. මම ඒ ටික සඳහන් කරන්නම්.

මීට පෙර විපක්ෂයෙන් කථා කළ මන්ත්‍රීතුමා චෝදනාවක් ඉදිරිපත් කළා, මේ අය වැයෙන් අපි කිසිදු මුදලක් මේ වෙනුවෙන් වෙන් කරලා නැහැ කියලා. අය වැය කථාවේ 38වෙනි පිටුවේ, 29වෙනි අංකය දරන "අලි - මිනිස් ගැටුම් අවම කිරීම සහ වන සංරක්ෂණය" කියන මාතෘකාව යටතේ කරන පැහැදිලි කිරීමේදී මේ ගැන සඳහන් කරලා නැහැ, අපි මුදලක් වෙන් කරලා නැහැ කියලා එතුමා කිව්වා. ඒ නිසා මේ රටේ ජනතාවට සහ මේ ගරු සභාවට අපි ඒ සම්බන්ධයෙන් අවබෝධ කර දෙන්න ඕනෑ. මොකද, ඒ අයව නොමඟ යවන්න දෙන්න බැහැ. ඒ ඡේදයේ තිබෙනවා, "මෙම උත්සාහයන් සඳහා රුපියල් මිලියන 300ක් දැනටමත් අය වැය තුළින් වෙන් කරලා තිබෙනවා" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අලි-මිනිස් ගැටුම කියලා හඳුන්වන එක ඇතුළේ දුම්රියේ ගැටිලා අලි මරණ සිදු වන එකත් තිබෙනවා. ඒකටත් එක්ක තමයි අපි ඒ මුදල වෙන් කරලා තිබෙන්නේ. ඊට අමතරව සමස්තයක් හැටියට ගත්තොත්, අලි සංරක්ෂණයට අදාළ වන ක්ෂේත්‍රය, විශේෂයෙන් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අදාළ කාර්යාල 270ක ධාරිතාව වැඩිදියුණු කිරීමට අපි රුපියල් මිලියන 100ක් මෙවර අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. ඒ අනුව මේ කටයුතු සඳහා මුළු ගණන ලෙස රුපියල් මිලියන 640ක් අපි වෙන් කරලා තිබෙනවා. ඒ නිසා නොමඟ යවනසුලු ප්‍රචාර, පැහැදිලි කිරීම් පිළිගන්න එපා කියලා මම මේ ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වෙනත් සංවාදයකුත් ගිය නිසා අපට සභාවේ කාලය විනාඩි කිහිපයකින් දීර්ඝ කර ගන්න පුළුවන් නම් හොඳයි. මොකද, ඇමතිතුමා සතුව සවිස්තරාත්මක පිළිතුරක් තිබෙනවා. ඒක රටට වැදගත් නිසා එය ඉදිරිපත් කරන්න අවස්ථාව ලැබෙනවා නම් හොඳයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමාගේ පිළිතුරු කථාව අවසාන වන තෙක් කාලය දීර්ඝ කර ගැනීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු ඇමතිතුමනි, ඔබතුමා විනාඩි 5කින් පමණ කථාව අවසන් කරන්න.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඊයේ දිනයේ පරිසරවේදීන්, පරිසර අමාත්‍යාංශයේ නිලධාරින්, දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරින් වාගේම ප්‍රදේශයේ මන්ත්‍රීවරු ඇතුළු සියලුදෙනා එකතුවෙලා, සාකච්ඡා කරලා මේ ගැටුම් ඇති වෙන්න බලපාන ප්‍රධාන හේතු ටික හඳුනා ගත්තා.

මන්ත්‍රීවරුන් එම සාකච්ඡාවේදී කරුණු ඉදිරිපත් කළා වාගේ, වංගුවේදී දුම්රිය මාර්ගයේ ඉන්න අලියා දර්ශනය නොවීම, මාර්ගය අසල සිටින අලි දුම්රිය පැමිණෙන විට බියවී මාර්ගයට පැමිණීම, මාර්ගය දෙපස වැවී ඇති ලඳු කැලෑ, මානා, ඉලුක් වැනි යටි ආවරණ නිසා අලි දර්ශනය නොවීම වැනි හේතු මේ සඳහා බලපානවා කියලා එතැනදී අපි හඳුනා ගත්තා. ඒ හේතු හඳුනාගෙන ඒවා නැති කිරීම සඳහා අවශ්‍ය කරන ක්‍රියාමාර්ග

[ගරු දම්මික පටබැඳි මහතා]

ගැනත් අපි එහිදී සාකච්ඡා කළා. අපි ඒ වෙනුවෙන් කෙටිකාලීන ක්‍රියාමාර්ග හැටියට ඉක්මනින්ම පාර දෙපස සුද්ද කරලා, ඒ මාර්ගයේ වනඅලි සිටිනවා නම් ඒ බව හඳුනා ගැනීම සඳහා ඉක්මන් මැදිහත්වීමක් කරන්නත් කටයුතු යොදා ගත්තා. ඒ වාගේම හෙට ඒ ප්‍රදේශය නිරීක්ෂණය කරන්න දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහභාගි වෙනවා. ඒ ප්‍රදේශය නිරීක්ෂණය කරලා, ඒ ප්‍රදේශයට අදාළව අපට කෙටිකාලීනව ගත හැකි හදිසි ක්‍රියාමාර්ග මොනවාද කියාත් එහිදී අපි හඳුනා ගන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වනඅලි සහ දුම්රිය ගැටුම් ඇතිවෙන අධිඅවදානම් කලාප අපි හඳුනාගෙන තිබෙනවා. ඒ කලාපය තුළ කිලෝමීටර 104ක වාගේ දුරක් තිබෙනවා. ඒ කිලෝමීටර 104ට අදාළ දුර ඇතුළත තමයි වැඩිපුරම අනතුරු සිදු වෙන්නේ. ඒකට අදාළව මොකක්ද අපට කරන්න පුළුවන් මැදිහත්වීම් කියාත් එහිදී සාකච්ඡා කළා. ඒ වාගේම මේ ප්‍රදේශයේ දුම්රිය සමඟ අලි ගැටුම් සිදු වෙන්නේ විශේෂයෙන් රාත්‍රී 10.00ත්, උදෑසන 4.00ත් අතර කාලය තුළයි. විශේෂයෙන් දුම්රිය හතරක් තමයි මේ කාලය තුළ ගමන් කරන්නේ. ඒ දුම්රිය සම්බන්ධ කරගෙන අපි කොහොමද ඒ සඳහා පිළිතුරු සොයන්නේ කියන එක පිළිබඳවත් එහිදී සාකච්ඡා කළා.

මීට කලින් ආණ්ඩු පැවති කාලවලදීත් මේ ප්‍රශ්නයට විවිධ උත්තර හොයලා තිබෙනවා. ඒ හැම උත්තරයක්ම ඒ මොහොතේ සාකච්ඡා කරලා තිබෙනවා. හැබැයි, ඒවා ක්‍රියාත්මක වෙලා නැහැ. සමහර ක්‍රියාමාර්ග සතියක්, දෙකක් ඇතුළත අවසන් වෙලා තිබෙනවා. නමුත් ඒවා අඛණ්ඩව සිදු වෙලා නැහැ. පසුගිය රජයන් විසින් ඒ මොහොතේ ඇති වන කම්පනයට කිසියම් ක්‍රියාමාර්ගයක් තෝරා ගත්තාට, ඒවා අඛණ්ඩව පවත්වාගෙන ගිහිල්ලා නැහැ; ඒවා තිරසාර කරලා නැහැ; ඒ සඳහා අවශ්‍ය කරන දිගුකාලීන මැදිහත්වීම් කරලා නැහැ. අපි ඊයේ තිබුණු සාකච්ඡාවේදී ඒ තත්ත්වයත් හඳුනාගෙන ඒ සඳහා ලබා දෙන කෙටිකාලීන පිළිතුරු කාලයක් තිස්සේ පවත්වාගෙන යන්නේ කොහොමද කියන එක ගැනත් සාකච්ඡා කළා. විශේෂයෙන්ම ඒ සාකච්ඡාවේදී අලි දුම්රියේ ගැටීම වළක්වන්න ඒ ප්‍රදේශයේ මන්ත්‍රීවරුනුත්, ඒ ප්‍රදේශයේ ජනතාවත් ක්‍රියාකාරීව සහභාගි කිරීම සම්බන්ධයෙනුත් විශේෂ අවධානයක් යොමු කළා. කිලෝමීටර 104ක් කියන ඒ ප්‍රදේශයට අදාළ ග්‍රාම නිලධාරි වසම් ටික දින දෙකක් ඇතුළත හඳුනාගෙන, ඒ ග්‍රාම නිලධාරි වසම්වල ජීවත් වෙන ජනතාව සමඟ දුම්රියේ අලි ගැටුම් ඇති වෙන කාරණය සම්බන්ධයෙන් සාකච්ඡා කරලා, එය වැළැක්වීම සඳහා අවශ්‍ය කරන මැදිහත්වීම් කරන්නත් අපි කටයුතු කරනවා. ඒ වාගේම අලි සම්බන්ධයෙන් සැලකිලිමත් වන, අලි සංරක්ෂණය සම්බන්ධයෙන් ඉදිරිපත් වන සංවිධානත් ඒ සඳහා සම්බන්ධ කරගෙන කටයුතු කරන්න අපි බලාපොරොත්තු වනවා. ඒ අනුව පරිසර අමාත්‍යාංශයත්, දුම්රිය දෙපාර්තමේන්තුවත්, දේශපාලන අධිකාරියත්, සාමාන්‍ය ජනතාවත්, අලි සංරක්ෂණය සම්බන්ධයෙන් සැලකිලිමත් වන සියලුදෙනාත් සම්බන්ධ කරගෙන ක්‍රියාමාර්ගයකට යන්න අපි කටයුතු කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධයෙන් දිගුකාලීන පියවරක් හැටියට sensors සවි කරන්නත් අපි එහිදී සාකච්ඡා කර ගත්තා. පැති කිහිපයකින් ඒ කටයුත්ත සිදු කරනවා. දුම්රිය ස්ථාන වාගේම දුම්රිය සම්බන්ධ කරගෙන දුම්රිය මාර්ගය දෙපස sensors සවි කරලා අලි ගැවසෙන මොහොතවල් සම්බන්ධව ඒ දුම්රිය රියදුරන්ට දැනුම් දීමේ ක්‍රමවේදයක් ඇති කරන්න කටයුතු කරනවා. ඒ වාගේම දුම්රිය එන මොහොතක නම් අලින් පලවා හැරීම සඳහා කිසියම් ක්‍රියාමාර්ගයක් සැදීමටත් එහිදී සාකච්ඡා කළා. එතැනදී කරුණු ඉදිරිපත් වුණා, එවැනි sensors මීට කලිනුත් හඳුන්වා දෙන්න උත්සාහ කරලා තිබුණාය කියලා. නමුත් ඒවා ඒ මොහොතේ ඒ බලධාරීන් විසින් නොසලකා හැර තිබෙනවා. එවැනි අවස්ථා කිහිපයක් සම්බන්ධයෙනුත් ඒ අවස්ථාවේදී සාකච්ඡා වුණා. අපි එතැනදී පරිසර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ මූලිකත්වයෙන් දුම්රිය දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේ නිලධාරීන් සම්බන්ධ කරගනිමින් දිගුකාලීන පියවරක් හැටියට විශේෂ කමිටුවක් පත් කර ගත්තා.

මේ සඳහා නවීන තාක්ෂණය යොදාගෙන, දුම්රිය මාර්ගයේ වනඅලි සිටිනවා නම් දුම්රිය රියැදුරන්ට එය දැනුම් දීම සඳහා ක්‍රමයක් හැදීම පිළිබඳව, ඒ වාගේම දුම්රියක් එන මොහොතකදී අලින් පලවා හැරීම සඳහා මේ තාක්ෂණය පාවිච්චි කර ගන්නේ කොහොමද කියන කාරණා සම්බන්ධයෙන් ඉක්මන් වැඩ පිළිවෙළක් හඳුන්වා දීම පිළිබඳවත් එතැනදී සාකච්ඡා කර ගත්තා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වුණු සිදුවීම අපි කවුරුත් කම්පා කරවපු සිදුවීමක්. අපේ බලාපොරොත්තුව, එය අවසන් සිදුවීම බවට පත් කර ගන්නයි. ඒ සම්බන්ධයෙන් ක්ෂණිකව මැදිහත් වීම පිළිබඳව ගරු බිමල් රත්නායක ඇමතිතුමාට අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ඒ වාගේම ඒ සඳහා දායකත්වය ලබා දෙන්න ඉතා ක්‍රියාශීලීව හා ක්ෂණිකව මැදිහත් වුණු පරිසරවේදීන් සහ අමාත්‍යාංශ නිලධාරීන් අපි අගය කරන්න ඕනෑ. අපි සූදානම් අපේ රජය යටතේ පළමු මොහොතේදීම මේ සඳහා මැදිහත් වෙලා දුම්රියවල ගැටිලා අලින් මිය යෑම නවතා දමන්න. ඒ සඳහා අපි දැනට කෙටි කාලීන සහ දිගු කාලීන වශයෙන් ක්‍රියාමාර්ග ගනිමින් තිබෙනවා. අපි මේ රටේ ජනතාවගෙන්, පරිසරවේදීන්ගෙන් සහ අලි සංරක්ෂණය සම්බන්ධයෙන් සැලකිලිමත් වන සියලුදෙනාගෙන් ඉල්ලා සිටිනවා අපි සමඟ අත්වැල් බැඳගෙන කටයුතු කරන්න කියලා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
වෙඩි බෙහෙතුත් දෙන්න ඕනෑ.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)
අපි ඒ ගැනත් සලකා බලන්නම්. ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමනි, අපි මේ මොහොතේ කථා කරන්නේ, අලින් දුම්රියවල ගැටීම නිසා සිදුවන අනතුරු පිළිබඳවයි. මේ කාරණය සම්බන්ධයෙන් රජයක් හැටියට උපරිම මැදිහත්වීම කරන්න අපි සූදානම්. අපි මේ සඳහා ඔබ සියලුදෙනාගේ සහාය ඉල්ලා සිටිනවා. අපි මේ අනතුරු වළක්වා අපේ රටේ සම්පතක් හැටියට සලකන අලි ඇතුන් ආරක්ෂා කිරීම සඳහා මැදිහත් වෙමු කියන ඉල්ලීම කරමින්, මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

***එකල්හි වේලාව අ. භා. 6.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ. භා. 6.42ට, 2025 පෙබරවාරි 06 වන දින සභා සම්මතිය අනුව, 2025 පෙබරවාරි 22 වන සෙනසුරාදා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 6.30 மணிக்குப் பிந்திவிட்டமையால், மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 6.42க்கு, பாராளுமன்றம் அதனது 2025 பெப்ருவரி 06ஆம் திகதிய தீர்மானத்திற்கிணங்க, 2025 பெப்ருவரி 22, சனிக்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*And it being past 6.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 6.42 p.m until 9.30 a.m. on Saturday, 22nd February, 2025, pursuant to the Resolution of Parliament of 06th February, 2025.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.